කාර්යසාධන වාර්තාව
செயலாற்றுகை அறிக்கை
PERFORMANCE REPORT
2021



කෘෂිකර්ම අමාත්‍යාංශය
கமத்தொழில் அமைச்சு
Ministry of Agriculture

වැයශීර්ෂ අංකය
செலவுத் தலைப்பு இலக்கம்
Expenditure Head No

118

වාර්ෂික කාර්යසාධන වාර්තාව - 2021

වැය ශීර්ෂ අංකය - 118

කෘෂිකර්ම අමාත්‍යාංශය

නො.80/5, ගොවිජන මන්දිරය, රජමල්වත්ත පටුමඟ, බත්තරමුල්ල

දුරකථන	011-2034300
ෆැක්ස්	011-2868910
විද්‍යුත් තැපෑල	info@agrimin.gov.lk pmeagri@gmail.com
වෙබ් අඩවිය	www.agrimin.gov.lk

වාර්ෂික කාර්යසාධන වාර්තාව - 2021

(2021.12.31 දක්වා කෘෂිකර්ම අමාත්‍යාංශය මඟින් සිදුකරන ලද සංවර්ධන වැඩසටහන් වල ප්‍රගතිය)

වැය ශීර්ෂ අංකය - 118

කෘෂිකර්ම අමාත්‍යාංශය

අමාත්‍ය - ගරු මහින්දානන්ද අළුත්ගමගේ මැතිතුමා

ලේකම් - ඩී.එම්.එල්.බණ්ඩාරනායක මහතා

රාජ්‍ය අමාත්‍යාංශ

කාබනික පොහොර නිෂ්පාදන ප්‍රවර්ධන හා සැපයුම් නියාමන සහ වී හා ධාන්‍ය, කාබනික ආහාර, එළවළු, පළතුරු, මිරිස්, ඇෑණු හා අර්තාපල් වගා ප්‍රවර්ධන, බීජ නිෂ්පාදන හා උසස් තාක්ෂණ කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශය (වැයශීර්ෂ 425/426)

අමාත්‍ය - ගරු ශෂීන්ද්‍ර රාජපක්ෂ මැතිතුමා

ලේකම් - එම්.එන් රණසිංහ මහතා

පශු සම්පත්, ගොවිපොළ ප්‍රවර්ධන සහ කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය

අමාත්‍ය - ගරු ඩී.බී.හේරත්. මැතිතුමා

ලේකම් - ආර්.එම්.ඩබ්.එස්.සමරදිවාකර මහතා

පසුගාමී ප්‍රදේශ සංවර්ධන සහ ගෘහාශ්‍රිත සත්ත්ව පාලන හා සුළු ආර්ථික භෝග වගා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

අමාත්‍ය - ගරු සතාසිවම් වියාලේන්ද්‍රන් මැතිතුමා

ලේකම් - වෛද්‍ය අමල් හර්ෂ ද සිල්වා මහතා

අන්තර්ගතය

කෘෂිකර්ම අමාත්‍යාංශය සහ රාජ්‍ය අමාත්‍යාංශ	i
පටුන	ii
කෙටියෙදුම්	iii
ප්‍රධාන සංවර්ධන වැඩසටහන් වල ප්‍රගතිය සාරාංශය (කෘෂිකර්ම අමාත්‍යාංශය, කාබනික පොහොර නිෂ්පාදන ප්‍රවර්ධන හා සැපයුම් නියාමන සහ වී හා ධාන්‍ය, කාබනික ආහාර, එළවළු, පළතුරු, මිරිස්, ළූණු හා අර්තාපල් වගා ප්‍රවර්ධන, බීජ නිෂ්පාදන හා උසස් තාක්ෂණ කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශය (වැයශීර්ෂ 425/426), පශු සම්පත්, ගොවිපොළ ප්‍රවර්ධන සහ කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය, පසුගාමී ප්‍රදේශ සංවර්ධන සහ ගෘහාශ්‍රිත සත්ත්ව පාලන හා සුළු ආර්ථික භෝග වගා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය)	iv-ix
පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය	1-4
පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම (අමාත්‍යාංශය සහ ඒ යටතේ ඇති ආයතනවල)	5-67 68-102
පරිච්ඡේදය 03 - වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය	104-115
පරිච්ඡේදය 04 - කාර්යුසාධන දර්ශක	116
පරිච්ඡේදය 05 - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය	116-118
පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ	119- 121
පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව	122-127
වාර්තාව සකස් කිරීම සඳහා දායකත්වය - නාමාවලිය	128

කෙටි යෙදුම්

MOA	කෘෂිකර්ම අමාත්‍යාංශය
PPE	ප්‍රතිපත්ති හා ව්‍යාපෘති අගයුම් ඒකකය - කෘෂිකර්ම අමාත්‍යාංශය
DOA	කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
HORDI	උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය
NRMC	ස්වභාවික සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානය
FCRDI	ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය
ETC	ව්‍යාප්ති හා පුහුණු ආයතනය
NPQS	ජාතික ශාක නිරෝධායන සේවය
RRDI	වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය
NAICC	ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානය
DOAD	ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
PDOA	පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
DS	දිස්ත්‍රික් ලේකම්
AI	කෘෂි උපදේශක
ARPAS	කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර
AAIB	කෘෂිකර්ම හා ගොවිජන රක්ෂණ මණ්ඩලය
PMB	වී අලෙවි මණ්ඩලය
CARP	ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව
IPHT	ජාතික පසු අස්වනු කළමනාකරණ ආයතනය
LPL	සී/ස.ලංකා පොහොර සමාගම
HARTI	හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු ආයතනය
NFS	ජාතික පොහොර ලේකම් කාර්යාලය
ASMP	කෘෂි නව්‍යකරණ ව්‍යාපෘතිය
CSIAP	දේශගුණික සුහුරු වාරිකෘෂිකාර්මික ව්‍යාපෘතිය
SAPP	කුඩා පරිමාණ කෘෂිව්‍යාපාර සංවර්ධන ව්‍යාපෘතිය
FTF	ගොවීන්ගේ භාරකාර අරමුදල
CERC	හදිසි තත්ත්ව මත ක්‍රියාත්මක වැඩසටහන් යටතේ ගබඩා පහසුකම් ඇති කිරීම
EU	යුරෝපානු සංගමය
FAO	එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානය
SSC	දක්ෂිණ දක්ෂිණ සහයෝගීතාව
SDF	දක්ෂිණ සංවර්ධන අරමුදල
AARDO	ආසියානු අප්‍රිකානු ග්‍රාමීය සංවර්ධන සංවිධානය
JICA	ජපාන අන්තර් ජාතික සහයෝගිතා ඒකකය
KOICA	කොරියා ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිත ආයතනය -
WFP	ලෝක ආහාර වැඩසටහන
KOPIA	ජාත්‍යන්තර කෘෂිකර්මය සඳහා වූ කොරියානු ව්‍යාපෘති
AFASI	ආසියානු ආහාර හා කෘෂිකර්ම සහයෝගීතා මූලපිරුම
WB	ලෝක බැංකුව
GAP	යහපත් කෘෂිකාර්මික කටයුතු
UNDP	එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන
NARP/NUS	විශ්වවිද්‍යාල සමඟ සිදුකරන ජාතික කෘෂිකාර්මික ප්‍රතිපත්ති සැලැස්ම පිළිබඳ පර්යේෂණ

ප්‍රධාන සංවර්ධන වැඩසටහන් වල ප්‍රගතිය - සාරාංශය

කෘෂිකර්ම අමාත්‍යාංශයේ ප්‍රධාන සංවර්ධන වැඩසටහන් වල මූල්‍ය ප්‍රගතිය - සාරාංශය

මූල්‍ය ප්‍රගතිය

අ/අ	විස්තරය	වෙන් කළ මුදල (රු.)	වියදම	
			(රු.)	(%)
1	**සමස්ත අයවැය**	16,786,821,469	11,924,226,832	71%
1.1	**පුනරාවර්තන**	4,959,377,000	4,874,063,428	98%
1.2	**ප්‍රාග්ධන**	11,827,444,469	7,050,163,404	60%

2021 වසර තුල සිදුකරනලද ප්‍රධාන සංවර්ධන වැඩසටහන් හා එහි මූල්‍ය ප්‍රගතිය

අ/අ	වැඩසටහන	ක්‍රියාත්මක ආයතනය	*වෙන්කළ මුදල (රු.මි)*	*වියදම් කළ මුදල (රු.මි)*	මූල්‍ය ප්‍රගතිය %	බැඳීම්හා බැරකම්
1	කෘෂිකාර්මික තරුණ ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන	DOA	*75.00*	*45.41*	61%	1.18
උප එකතුව - i			*75.00*	*45.41*	*61%*	*1.18*
1	දේශගුණික සූහුරු වාරිකෘෂි ව්‍යාපෘතිය (CSIAP) ලෝක බැංකු ණය	MOA	3210.00	1388.66	43%	0.00
2	කුඩා පරිමාණ කෘෂිව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන (SAPP) - IFAD		2100.00	1637.93	78%	*0.00*
3	කෘෂිකාර්මික අංශය නවීකරණ ව්‍යාපෘතිය (ASMP) උපාංග 2 - ලෝක බැංකු ණය		2959.00	1146.07	39%	*693.40*
4	බඩල්ගම නව කිරි සැකසුම් කර්මාන්ත ශාලාවක් ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය - ඩෙන්මාර්ක් ආධාර		313.00	62.98	20%	0.00
5	කුඩා පරිමාණ කිරි නිෂ්පාදන සමූපකාර සමිති සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය (ප්‍රංශ ආධාර)		1981.00	1710.91	86%	0.00
උප එකතුව -ii			*10,563.00*	*5,946.56*	*56%*	*693.40*
1	පර්යේෂණ හා සංවර්ධන	DOA	*269.50*	*215.09*	80%	24.55
2	කෘෂි ව්‍යාප්ති හා පුහුණු		*363.00*	235.02	65%	18.87
3	බීජ සහතික කිරීම සහ පැලෑටි ආරක්ෂණ		*1024.80*	825.29	81%	81.42
උප එකතුව -iii			*1,657.30*	*1,275.40*	77%	*124.84*
1	ජාතික ශාක නිරෝධායන සේවයේ උපකරණ නඩත්තුව (JICA)	DOA	40.00	0.34	1%	38.74
2	ජාතික ශාක නිරෝධායන සේවයේ විද්‍යාගාර පහසුකම් සංවර්ධනය		25.00	1.42	6%	0.00
උප එකතුව -iv			*65.00*	*1.76*	3%	*38.74*

අ/අ	වැඩසටහන	ක්‍රියාත්මක ආයතනය	වෙන්කළ මුදල (රු.මි)	වියදම් කළ මුදල (රු.මි)	මූල්‍ය ප්‍රගතිය %	බැඳීම්හා බැරකම්
1	ගොවීන් සඳහා ආයකත්ව රක්ෂණ ක්‍රමයක් හඳුන්වා දීම	AAIB	1000.00	1000	100%	1950.00
2	කෘෂිකාර්මික හා කෘෂි රක්ෂණ මණ්ඩලය		40.00	20.00	50%	20.00
3	ගොවීන් සහ ධීවරයන් සඳහා විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ක්‍රමයක් හඳුන්වා දීම		4000.00	4000.00	100%	0.00
උප එකතුව -v			***5040.00***	***5020.00***	***100%***	***1970.00***
1	හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු ආයතනය	*HARTI*	***35.00***	***8.70***	***25%***	***0.46***
2	විශ්ව විද්‍යාල සමග ජාතික කෘෂිකර්ම ප්‍රතිපත්තිය සකස් කිරීම	*CARP*	***40.00***	***26.05***	***65%***	***0.50***
3	වී අළෙවි මණ්ඩලය	*PMB*	***2671.00***	***2176.25***	***81%***	
උප එකතුව -vi			***2746.00***	***2211.00***	***81%***	***0.96***
මුළු එකතුව - (i+ii+iii+iv+v+vi)			***20,146.30***	***14,500.14***	***72%***	***2,829.12***

2.කාබනික පොහොර නිෂ්පාදන ප්‍රවර්ධන හා සැපයුම් නියාමන සහ වී හා ධාන්‍ය, කාබනික ආහාර, එළවළු, පළතුරු, මිරිස්, එෑණු හා අර්තාපල් වගා ප්‍රවර්ධන, බීජ නිෂ්පාදන හා උසස් තාක්ෂණ කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශය (වැයශීර්ෂ 425/426)

2.1 වී හා ධාන්‍ය, කාබනික ආහාර, එළවළු, පළතුරු, මිරිස්, එණු හා අර්තාපල් වගා ප්‍රවර්ධන, බීජ නිෂ්පාදන හා උසස් තාක්ෂණය ප්‍රවර්ධනය, (වැයශීර්ෂ 425)

මූල්‍ය ප්‍රගතිය

අ/අ	විස්තරය	වෙන් කළ මුදල (රු.මි)	වියදම	
			(රු.මි)	*(%)*
1	**සමස්ත අයවැය**	**8720.56**	**5463.64**	**62.65**
1.1	**පුනරාවර්තන**	**217.56**	**179.30**	**82.41**
1.2	**ප්‍රාග්ධන**	**8503.00**	**5264.34**	**62.14**
1.3	**බෝග 13**	51.259	21.903	42.7%

බෝග නිෂ්පාදනය හා ප්‍රවර්ධනය,

	බෝග වර්ග	වෙන් කළ මුදල (රු.මි.)	වියදම් කළ මුදල(රු.මි.)
1	වී	94.209	57.683
2	මිරිස්	596.695	305.989
3	අර්තාපල්	307.453	107.667
4	ලොකු ඵෑණු	292.162	247.903
5	රතු ඵෑණු	231.39	233.248
6	බඩ ඉරිඟු	244.254	180.030
7	උඳු	89.410	76.173
8	මුං ඇට	211.444	170.880
9	කව්පි	53.835	39.066
10	සෝයා	31.564	22.280
11	තල	20.526	19.797
12	කුරක්කන්	7.096	4.056
13	රටකජු	51.259	21.903

සංවර්ධන වැඩසටහන් වල මූල්‍ය ප්‍රගතිය (සාරාංශය) - 2021/12/31 දින වනවිට

අ/අ	වැය ශීර්ෂය	ආයතනය	අයවැය ප්‍රතිපාදන (රු.මි.) (1)	අනුමත වැඩසටහන් සඳහා ප්‍රතිපාදන (රු.මි.) (2)	සමුච්ඡිත වියදම (රු.මි.) (3)	(3)/(2) (%)
1	425-2-03-004-2509	ආහාර සුරක්ෂිතතාව සඳහා විශේෂ වැඩසටහන	4,630.00	4,119.46	2,502.65	61
	උප එකතුව - i		**4,630.00**	**4,119.46**	**2,502.65**	**61**
2	425-2-03-002-2201	ජාතික පසු අස්වනු කළමනාකරණ ආයතනය - ප්‍රාග්ධන වියදම්	34.00	9.85	4.38	45
3	425-2-03-008-2506	ආර්ථික මධ්‍යස්ථාන	300.00	250.00	35.34	14
4	425-2-03-010-2202	පරිසර හිතකාමී කාබනික වගාව සහ කාබනික පොහොර ප්‍රවර්ධනය කිරීමේ ජාතික වැඩසටහන	70.00	70.00	58.55	84
	උප එකතුව - ii		**404.00**	**329.85**	**98.27**	**30**
5	වැය ශීර්ෂ - 281	ගොවිජන සංවර්ධනය - ප්‍රාග්ධන වියදම්	1,984.00	1,984.00	1535.73	77
	උප එකතුව- iii		**1,984.00**	**1,984.00**	**1535.73**	**77**
	මුළු එකතුව- (i+ii+iii)		**7,018.00**	**6,433.31**	**4,136.65**	**64**

2.කාබනික පොහොර නිෂ්පාදන ප්‍රවර්ධන හා සැපයුම් නියාමන සහ වී හා ධාන්‍ය, කාබනික ආහාර, එළවළු, පළතුරු, මිරිස්, ළෑණු හා අර්තාපල් වගා ප්‍රවර්ධන, බීජ නිෂ්පාදන හා උසස් තාක්ෂණ කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශය (වැයශීර්ෂ 425/426)

2.2 කාබනික පොහොර නිෂ්පාදන ප්‍රවර්ධන හා සැපයුම් නියාමනය, (වැයශීර්ෂ 426)

මූල්‍ය ප්‍රගතිය

අ/අ	විස්තරය	වෙන් කළ මුදල (රු.මි)	වියදම	
			(රු.මි)	(%)
1	සමස්ත අයවැය	35,745.7	21,627.36	80.16
1.1	පුනරාවර්තන	35,539.5	21,587.33	60.74
1.2	ප්‍රාග්ධන	206.2	40.033	19.41

සංවර්ධන වැඩසටහන් - වැය ශීර්ෂ අංක 426

අ/අ	විස්තරය	ක්‍රියාත්මක කරනු ලබන ආයතනය	වෙන් කළ මුදල (රු.මි)	වියදම		වෙනත් කරුණු
				(රු.මි)	(%)	
1	ජාතික පොහොර කළමණාකරණ තොරතුරු පද්ධතිය (National Fertilizer Management Information System)	රාජ්‍ය අමාත්‍යාංශය / ජාතික පොහොර ලේකම් කාර්යාලය	30	0.132	0.44	තොරතුරු පද්ධතිය සංවර්ධනය කිරීම ප්‍රසම්පාදන කටයුතු වලින් පසුව මොබිටෙල් පුද්ගලික සමාගම වෙත පවරා ඇත.
2	ජාතික පොහොර ලේකම් කාර්යාලයේ දිස්ත්‍රික් කාර්යාල වැඩිදියුණු කිරීම	රාජ්‍ය අමාත්‍යාංශය / ජාතික පොහොර ලේකම් කාර්යාලය	30	19.839	66.13	දිස්ත්‍රික් කාර්යාල සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය සියළු පරිගණක, සන්නිවේදන හා කාර්යාල උපකරණ මිල දී ගැනීම සම්පූර්ණ කර ඇත.
3	ලංකා පොහොර සමාගමේ පොහොර පරීක්ෂණාගාරය වැඩිදියුණු කිරීම	රාජ්‍ය අමාත්‍යාංශය / ලංකා පොහොර සමාගම	19	3.383	17.8	පොහොර පරීක්ෂණාගාරය සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය විද්‍යාගාර උපකරණ මිල දී ගැනීම.

3. පශු සම්පත්, ගොවිපොළ ප්‍රවර්ධන සහ කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය (වැයශීර්ෂය - 427)

මූල්‍ය ප්‍රගතිය - සාරාංශය

අ/අ	විස්තරය	වෙන් කළ මුදල (රු.මි.)	වැය කළ මුදල (රු.මි.)	%
1.	පුනරාවර්තන වියදම්	334.15	306.799	91.815
2.	ප්‍රාග්ධන වියදම්	1,068.939	778.684	72.846

සංවර්ධන වැඩසටහන් - සාරාංශය වැය ශීර්ෂය (427)

අ/අ	විස්තරය	ක්‍රියාත්මක කරනු ලබන ආයතනය	වෙන් කළ මුදල(රු.මි.)	වියදම	
				(රු.මි.)	%
1.	දියර කිරි පරිභෝජනය ප්‍රවර්ධනය හා ප්‍රචලිත කිරීම	පශු සම්පත්, ගොවිපොළ ප්‍රවර්ධන සහ කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය	136.0	92.169	67.77
2.	අභිජනන ගොවිපොළවල් ස්ථාපනය කිරීම		100.0	81.839	81.84
3.	පශු සම්පත් සංවර්ධන මධ්‍යකාලීන වැඩසටහන		46.0	27.180	59
4.	කුඩා හා මධ්‍ය පරිමාණ කුකුළු ගොවිපොළ සංවර්ධනය		45.0	44.532	98.96
5.	සූකර කර්මාන්ත සංවර්ධන වැඩසටහන		15.0	13.071	87.14
6.	කුඩා හා මධ්‍ය පරිමාණ කිරි ගොවිපොළ කළමනාකරණය තුළින් ඵලදායීතාවය ඉහළ නැංවීම		450.0	275.240	61.16
7.	ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට අයත් පොළොන්නරුව ගොවිපොළෙහි පෝෂ්‍ය තෘණවලින් සයිලේජ් නිපදවීමේ ව්‍යාපෘතිය		250.0	222.587	89.03
	එකතුව		**1,042.0**	**756.618**	**72.62**

විදේශ අරමුදල් මගින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති (කෘෂිකර්ම අමාත්‍යාංශයේ ප්‍රතිපාදන -වැයශීර්ෂ 118)					
8.	බඩල්ගම නව කිරි සැකසුම් මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම (ශ්‍රී ලංකා /ඩෙන්මාර්ක්)	පශු සම්පත්, ගොවිපොළ ප්‍රවර්ධන සහ කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කරනු ලැබේ.	313.0	62.98	20.13
9.	කුඩා පරිමාණ කිරි සැකසුම් මධ්‍යස්ථාන ස්ථාපනය කිරීම (ශ්‍රී ලංකා /ප්‍රංශ)		1981.00	1710.91	86
	එකතුව		**2,294**	**1773.89**	**77**

4.පසුගාමී ග්‍රාමීය ප්‍රදේශ සංවර්ධන සහ ගෘහාශ්‍රිත සත්ත්ව පාලන හා සුළු ආර්ථික භෝග වගා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

මූල්‍ය ප්‍රගතිය - සාරාංශය

අ/අ	විස්තරය	වෙන් කළ මුදල (රු.මි.)	වැය කළ මුදල (රු.මි.)	%
1.	පුනරාවර්තන වියදම්	212,355,600.00	191,492,679.33	90.2
2.	ප්‍රාග්ධන වියදම්	267,567,400.00	216,121,680.68	80.8

සංවර්ධන වැඩසටහන් සාරාංශය - වැයශීර්ෂය (407)

අ/අ	විස්තරය	ක්‍රියාත්මක කිරීම භාරව සිටින නිලධාරී ආයතනය	වෙන් කළ මුදල (රු.මි.)	වියදම		වෙනත් කරුණු
				(රු.මි.)	(%)	
1.	**උඳු සහ මුං භෝග වගා ව්‍යාපෘතිය** (උතුරු නැගෙනහිර පළාත්වල සියලුම දිස්ත්‍රික්කවල)	අධීක්ෂණය: දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ක්‍රියාත්මක කිරීම: දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාල	50.00	48.394	97	(ප්‍රතිපාදන -වැයශීර්ෂ 425)
2.	**එළුවන් ඇතිකිරීමේ ව්‍යාපෘතිය**	අධීක්ෂණය: දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ක්‍රියාත්මක කිරීම: දිස්ත්‍රික් පශු වෛද්‍ය නිලධාරී කාර්යාල	50.00	40.411	81	අයවැය අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක BD/RE/118/407/**05**/2021 හා 2021.06.11 දිනැති ලිපියෙන් ලද ප්‍රතිපාදන
3.	**උඳු, මුං සහ ඉඟුරු භෝග වගා ව්‍යාපෘතිය**	අධීක්ෂණය: දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ක්‍රියාත්මක කිරීම: දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාල	100.00	87.813	87	අයවැය අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක BD/RE/118/407/01/2020 දරණ 2021.03.29 දිනැති ලිපියෙන් ලද ප්‍රතිපාදන
		එකතුව	200.00			
විදේශ අරමුදල් මගින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති						
1.	ඉන්දියානු රජයේ ප්‍රදානයන් යටතේ සනීපාරක්ෂක ඒකක 3,400 ක් ඉදිකිරීම (මඩකලපුව දිස්ත්‍රික්කය)ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය සහ පසුගාමී ප්‍රදේශ සංවර්ධන අමාත්‍යාංශය		200.00 (දේශීය 100.00 විදේශීය 100.00)	මෙම අමාත්‍යාංශය 2020.10.06 දින රාජ්‍ය අමාත්‍යාංශයක් වශයෙන් ස්ථාපිත කිරීමෙන් පසු 2021 වර්ෂයේ අමාත්‍යාංශය යටතට මෙම ව්‍යාපාතිය පත් කර ඇත. මුල් අවබෝධතා ගිවිසුමේ කාලය අවසන් වී ඇති බැවින් ගිවිසුම සංශෝධනය කිරීමට නියමිතය.	

කෘෂිකර්ම අමාත්‍යාංශය

01) පරිච්ඡේදය - ආයතනික පැතිකඩ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 දැක්ම

- ආහාර සුරක්ෂිතතාවය හා ජාතික සමෘද්ධිය උදෙසා කාර්යක්ෂම, ඵලදායී හා ශක්තිමත් කෘෂිකාර්මික අංශයක්

1.2 මෙහෙවර

- ස්වභාවික සම්පත් තිරසාර කළමනාකරණය තුළින් සමාජීය වශයෙන් පිළිගත් හා වාණිජමය නැඹුරුවකින් යුතුව, ගෝලීය තරහකාරී නිෂ්පාදනයක් බිහි කරන ව්‍යවසායකත්ව කෘෂිකර්මාන්තයක් සාක්ෂාත් කර ගැනීම.

1.3 අරමුණු

- දේශීය වශයෙන් නිෂ්පාදනය කළහැකි ආහාර සහ අතිරේක ආහාර සංචිත විධිමත්ව කළමනාකරණය මඟින් සුරක්ෂිතතාවය ඇති කිරීම.
- ආහාර නිෂ්පාදනයේදී රසායනික පොහොර හා පළිබෝධනාශක හා විස අවම කර, ඉවතලන අපද්‍රව්‍ය කළමනාකරණය තුළින් වසවිසෙන් තොර, පරිසර හිතකාමී සහ සෞඛ්‍යාරක්ෂිත කෘෂි නිෂ්පාදන ජනතාව වෙත ලබා දීම. රසායනික පොහොර භාවිතය විධිමත් කිරීම.
- යාන්ත්‍රීකරණය නව තාක්ෂණය, කාර්යක්ෂම ජල කළමනාකරණය, භෝග විවිධාංගීකරණය පාංශු සංරක්ෂණ ක්‍රම හඳුන්වාදීම මඟින් බෝගවල නිෂ්පාදන ඵලදායීතාවය ඉහළ නැංවීම සහ නිෂ්පාදන පිරිවැය අවම කිරීම.
- ඉහළ ගුණාත්මයෙන් යුත් ස්වයං බීජ නිෂ්පාදනය, අගය එකතු කළ නිෂ්පාදන ක්‍රමවේද ගොවීන් අතර ප්‍රචලිත කිරීම, යහපත් කෘෂිකාර්මික පිළිවෙත්(GAP) සහ යහපත් නිෂ්පාදන පිළිවෙත් හඳුන්වාදීම මඟින් දේශීය සහ විදේශීය වෙළඳපල සඳහා ප්‍රමිතියෙන් උසස් කෘෂි නිෂ්පාදන සඳහා නිෂ්පාදකයන් යොමු කිරීම.
- සියළු කැඩී බිඳී ගිය වැව් අමුණු සහ ඇළමාර්ග ප්‍රතිසංස්කරණය සහ පුරන් කුඹුරු අස්වැද්දීම මඟින් වී නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා දායක වීම.

1.3 ප්‍රධාන කාර්යයන්

- කෘෂිකර්ම විෂයට අදාල ප්‍රතිපත්ති සම්පාදනය
- අදාල රාජ්‍ය අමාත්‍යාංශ වෙත ප්‍රතිපත්තිමය මග පෙන්වීම
- ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවල් යටතේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
- අමාත්‍යාංශය යටතේ ඇති ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාල ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

1.4 දෙපාර්තමේන්තු ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා

ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්

1	කෘෂිකර්ම දෙපාර්තමේන්තුව	2003 අංක 22 දරණ බීජ පනත 1980 අංක 33 දරණ පලිබෝධ නාශක පනත 1951 අංක 25 දරණ පස සංරක්ෂණය පිළිබඳ පනත 1951 අංක 9 දරණ ගස් හෙලීමේ (පාලන) පනත
2	කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය	1999 අංක 20 දරණ කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ පනත
3	ජනතා වතු සංවර්ධන මණ්ඩලය	1972 අංක 11 දරණ රාජ්‍ය කෘෂිකාර්මික සහයෝගිතා පනත
4	සීමා සහිත ලංකා පොස්පේට් සමාගම	2007 අංක 7 දරණ සමාගම් ආඥා පනත
5	වී අළෙවි මණ්ඩලය	1971 අංක 14 දරණ වී අළෙවි මණ්ඩල පනත
6	හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු ආයතනය	1972 අංක 5 දරණ ගොවි කටයුතු ආඥා පනත
7	ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව	කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්තිය සඳහා වන ශ්‍රී ලංකා සභාව පනත (1987 අංක 47)
8.	ගොවිභාරකාර අරමුදල	

විදේශ ආධාර මඟින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති වල මූල්‍ය ප්‍රගතිය

2021.12.31 දක්වා මූල්‍ය ප්‍රගතිය (රු.මි.)					
අ/අ	ව්‍යාපෘතිය	මුලු ආයෝජනය (රු.මි.)		මූල්‍ය ඉලක්ක හා ප්‍රගතිය	
		වෙන් කළ මුදල (රු.මි)	සංශෝධිත මුදල	**2021** සඳහා වෙන් කළ මුදල (රු.මි)	**2021.12.31** දක්වා සමුච්ඡිත වියදම සහ මූල්‍ය ප්‍රගතිය % ලෙස (රු.මි)
1	කෘෂිකාර්මික අංශය නවීකරන ව්‍යාපෘතිය	9374.37	යුරෝපා සංගමයේ ප්‍රධානයක් ලෙස ලැබුන එක්සත් ජනපද ඩොලර් මිලියන 28	2,959	1146.07 ප්‍රගතිය 39%
2	දේශගුණික සුහුරු වාරි කෘෂි ව්‍යාපෘතිය	25,200	22,500	3,210	1388.66 ප්‍රගතිය 43%
3.	කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන	17,171	-	2,100	1,637.93 ප්‍රගතිය 78%
4.	බඩල්ගම නව කිරි සැපයුම් කර්මාන්ත ශාලාවක් ස්ථාපිත කිරීම	11,783	-	313	62.98 ප්‍රගතිය 20%
5.	කුඩා පරිමාණ කිරි නිෂ්පාදන සමූපකාර සමිති සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය	4,086	-	1,981	1710.91 ප්‍රගතිය 86%
6.	ජාතික ශාක නිරෝධායන සේවයේ උපකරණ නඩත්තුව සහ ප්‍රසම්පාදනය (JAICA)			40	0.34 ප්‍රගතිය 1%
7.	ශාක නිරෝධායන මධ්‍යස්ථාන වල විද්‍යාගාර පහසුකම් වැඩි දියුණු කිරීම			25	1.42 ප්‍රගතිය 6%

1.6 සංවිධාන සටහන



02) පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම, විශේෂ ජයග්‍රහණ, අභියෝග හා ඉදිරි ඉලක්ක

සංක්ෂේපය හා හැඳින්වීම

ශ්‍රී ලංකා ආර්ථිකයේ වැදගත්ම අංශය කෘෂිකර්මාන්තය වුවත් COVID-19 වසංගත තත්ත්වය කෘෂිකර්මාන්තයට සහ ආහාර පද්ධතිවල සුරක්ෂිතතාවය ඇති කිරීම කෙරෙහි පෙර නොවූ විරූ ලෙස බාධා කර ඇත. ලංකාවේ සමස්ත දිළිඳු ජනතාවගෙන් 90% කට වඩා සංකේන්ද්‍රණය වී ඇත්තේ ග්‍රාමීය හෝ වතු ප්‍රදේශවලය .ශ්‍රී ලංකාවේ ගොවිතැන ප්‍රධාන ජීවනෝපාය කරගත් ග්‍රාමීය දිළිඳු ජනතාවට සේවා නියුක්ති අවස්ථා සැපයීම සඳහා විශේෂ කාර්යභාරයක් කෘෂි අංශය මඟින් සිදුකරනු ලැබේ.

වසංගත තත්ත්වයක් පැවතියේ වුවද පසුගිය වසර කිහිපය දළ දේශීය නිෂ්පාදිතයට එහි දායකත්වය අඩු අගයක් ගත්තද එය ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකායෙන් බහුතරයකට දැනුදු වැදගත් රැකියා මූලාශ්‍රය ලෙස හඳුනාගත හැකිවේ. එය වසර 2020 වන විට සමස්ත ජනගහනයෙන් ආසන්න වශයෙන් පුද්ගලයින් 2,169,679 ක් හෝ සමස්ත රැකියා නියුක්ත ජනගහනයෙන් 27.1% ක් වන වගාව සහ ධීවර කර්මාන්තය ඇතුළුව කෘෂිකර්මාන්තයේ නියැලී සිටිති. සේවා නියුක්ති ව්‍යුහය තුල කෘෂිකාර්මික අංශය 27.1%, කාර්මික අංශය 26.9%, සේවා අංශය 46.0% , දායකත්වය සපයා ඇත.

2020 වර්ෂය දළ දේශීය නිෂ්පාදිතයට දක්වන දායකත්වය කෘෂි (8.36%)කාර්මික, (26.25 %) සේවා (59.67%) වේ. ඒ අනුව ව්‍යවසායකත්වය නංවාලීම තුලින් තරුණ තරුණියන් ශ්‍රම බලකායට අතුලත් වීමට දිරිමත් කළ හැකිය. ස්ත්‍රී ශ්‍රම බලකායේ සහභාගීත්වය වැඩිදියුණු කිරීම තුලින් ආර්ථික වර්ධනයට අහිතකර ලෙස බලපෑ හැකි ජනගහන සංයුතියේ වෙනස් වීම් වල බලපෑම අවම කල හැක. කෘෂිකාර්මික අංශයේ දී ස්ත්‍රී යට ලබා දිය හැකි දායකත්වය විශාල වේ.

2020 වසරේ ශ්‍රී ලංකාවේ ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ශ්‍රම බලකා සමීක්ෂණ වාර්තාව අනුව කෘෂිකාර්මික අංශයේ සේවා නියුක්තිය 27.1% ක් හා ස්ත්‍රී / පුරුෂ භාවය අනුව ශ්‍රම බල සහභාගීත්වය පුරුෂ 71.9% ක් සහ ස්ත්‍රී 32.0% ක් වන බවට ගණනය කර ඇත. එමෙන්ම ආර්ථික සංවර්ධනය සඳහා කෘෂිකර්ම ක්ෂේත්‍රයේ විධිමත් ලෙස රැකියා වල නිරත ප්‍රතිශය 41.9% වන අතර කෘෂිකර්ම අංශයේ අවිධිමත් ආකාරයේ රැකියා වල නිරත වන්නන්ගේ ප්‍රතිශතය 58.1% ක් වන බවට ගණනය කර තිබේ.

එසේම ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකායේ ප්‍රමුඛ සේවා යෝජකයා කෘෂිකර්ම අංශයයි. ග්‍රාමීය අංශයේ එහි දායකත්වය 51.3% කි. ඒ අනුව ග්‍රාමීය ජනතාව කෘෂි කර්මාන්තයට නැඹුරු වීමක් - පෙන්වන අතර රටේ කම්කරු පිරිසෙන් 27.1% ක් කෘෂිකර්ම අංශයේ සේවයේ යෙදී සිටී. ලංකාවේ මිලියන 22 ක ජනගහනයෙන් යුත් රටක් වන අතර ඉන් 74% ක්ම සිය ජීවනෝපාය සලසා ගන්නේ කෘෂිකාර්මික අංශයේ රැකියාවල නිරත වීමෙනි. මෙහි දී භූමියෙන් 30% වැවිලි භෝග සඳහා ද ඉඩම් - මිලියන 1.45% සුළු ඉඩම් වශයෙන් ද යොදා ගන. කෘෂිකාර්මික අංශයේ වර්ධනය කෘෂිඅංශයේ සංවර්ධනයට පමණක් නොව කාර්මික අංශයේ සංවර්ධනයට ද ප්‍රධාන වශයෙන් බලපායි. කෘෂි නිෂ්පාදන කේන්ද්‍රකොටගත් කාර්මික නිෂ්පාදන පුළුල් වීම හේතුවෙන් කෘෂි අංශයෙන් කාර්මික අංශයට දක්වන දායකත්වය ද පුළුල් වී ඇත.

තවද, ආර්ථික වශයෙන් සක්‍රීය නොවන ජනගහනය 2019 වාර්තා වූ මිලියන 7.832 සිට 2020 වසරේ මිලියන 8.273 ක් දක්වා ඉහළ ගොස් ඇත. කොවිඩ් 19 වසංගත තත්ත්වය ආර්ථික වශයෙන් සක්‍රීය නොවන ජනගහනයේ වර්ධනය සඳහා රැකියා අහිමි වූ පුද්ගලයන්ට රැකියාවක නියුතු - වීමට ඇති අවස්ථාව හා රැකියා අවස්ථා සක්‍රීය වශයෙන් සෙවීමට ඇති අවස්ථා තාවකාලිකව අහිමි වී ගිය අතර වසංගත තත්ත්වය පැතිරී ගිය ස්වභාවය අනුව සක්‍රීය ලෙස ආර්ථික කටයුතු වල නිරත වීම තවදුරටත් මන්දගාමී කරන ලදී. එසේ මන්දගාමී තත්ත්වයක් පැවතුනද කොවිඩ් 19 හදිසි තත්ව යටතේ වුවද කෘෂිකාර්මික කටයුතු සක්‍රීයව පවත්වා ගැනීමට රාජ්‍ය යාන්ත්‍රණය ඉහළ දායකත්වයක් ලබා දී ඇත. (දත්ත මූලාශ්‍රය- ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ දත්ත)

හැදින්වීම

කෘෂිකර්මාන්තය වසර දස දහස් ගණනාවක පටන් මානව සමාජයේ ප්‍රධානතම ජීවනෝපාය මාර්ගය ලෙස මෙන්ම එය සමස්ත ලෝකවාසීන්ගේ ආර්ථික සංස්කෘතිය ලෙස හැඳින්විය හැකිය. කෘෂිකර්මය යනු මහපොළොවට ආදරය කරමින් ස්වාභාව ධර්මය සමඟ එකඟත්වයක් සහිතව ආදරණීයව කරනු ලබන සංස්කෘතිකමය බෙදාහදා ගැනීම වේ. ගංගා නිම්න ශිෂ්ටාචාරයන් සමඟ බිහි වූ කෘෂිකර්මය අද වන විට විවිධ පැතිකඩයන් ඔස්සේ පැතිරී පවතී. එය ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් සැලකිය යුතු කොටසකට, විශේෂයෙන් ග්‍රාමීය ප්‍රදේශවල ජනතාව හට ජීවනෝපාය අවස්ථා උත්පාදනය කර දී ඇත. නමුත් වර්තමානය වන විට මුහුණ පෑමට සිදුවී ඇති දේශගුණික අභියෝග සහ දුර්වල ආදායම හමුවේ, ගොවි ප්‍රජාව තම සුපුරුදු කෘෂිකර්මාන්තය අතහැර වෙනත් ජීවනෝපාය අවස්ථා සඳහා අවතීර්ණ වන බවක් දක්නට ලැබේ. මෙම දේශගුණික අභියෝගයන් අතර නියඟය, අධික වර්ෂාව, අකල් වර්ෂාපතනය, සෘතු මාරුව සහ පළිබෝධ නිසා ඇතිවන රෝග සහ වර්තමානය වන විට කොවිඩ් වැනි ගෝලීය වසංගත තත්ත්ව යටතේ ආහාර සැපයුම් ජාලය බිඳ වැටීම කෘෂිකර්මාන්තයේ අභියෝග ලෙස හඳුනාගෙන ඇත.

සැලසුම්සහගත කෘෂිකර්මය - (ජාතික කෘෂිකර්ම ප්‍රතිපත්තිය),

ඉහත අභියෝග අතර වුවද, කෘෂිකර්මාන්තය, කාර්මික හා අනෙකුත් සේවා අංශයන්ට අවශ්‍ය කරන පදනම සකස් කර දෙන අතරම පරිසර හිතකාමී චිරස්ථායි සංවර්ධනයක් ඇති කිරීම සඳහා වැදගත්වේ. ලොව සෑම රටකම සංවර්ධන ක්‍රියාවලියේ දී කෘෂිකර්ම අංශයට ප්‍රමුඛස්ථානයක් ලබාදී ඇති අතර ලෝකයේ ආර්ථික, කාර්මික හා තාක්ෂණික බලවතුන් වන ඇමෙරිකාව , ජපානය වැනි රටවල තිබූ සැලසුම් සහගත කෘෂිකර්මය ජාතික සංවර්ධනයට පදනම් වී ඇති බව අප සිතට ගත යුතුය. එම රටවල කෘෂිකාර්මික ප්‍රතිපත්තිය කෙරෙහි දැක්වූ සුවිශේෂී අවධානය, රැකියා සහ ජාතික ආදායම ඉහළ නැංවීමේ වෙනස් නොවන ප්‍රධාන ශක්තිමත් මූලාශ්‍රය බවට පත්කර ඇත. එමෙන්ම ආසියානු, අප්‍රිකානු සහ ලතින් අමෙරිකානු රටවලද වැඩිවන ජනගහනයට සාපේක්ෂව ආහාර නිෂ්පාදනය වේගවත් කිරීම සහ ආහාර සුරක්ෂිතතාවය ඇති කිරීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කර ඇත. එමෙන්ම ශ්‍රී ලංකාවද සැලසුම්සහගත කෘෂිකර්මයක් සහ රජයේ ප්‍රතිපත්තිය වන සෞභාග්‍යයේ දැක්ම ***("Vistas of Prosperity and Splendor")*** *අරමුණු සාක්ෂාත් කර ගැනීම අතර ජනතාව කේන්ද්‍ර කොටගත් ආර්ථිකයක් (People Centric Economic Development) සඳහා ජාතික කෘෂිකර්ම ප්‍රතිපත්තිය සකස් කර තිබේ.*

(ගෝලීය උදාහරණ - තරුණ ව්‍යවසායකත්වය, (TEF- UNDP සහෙල් තරුණ ව්‍යවසායකත්වය ගැන),

තවද,ගෝලීය උදාහරණ ගෙන බැලීමේ දී එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) සහ Tony Elumelu පදනම (TEF) (රාජ්‍ය හා පෞද්ගලික අංශයේ දායකත්ව) අප්‍රිකාවේ සහෙල් කලාපය සඳහා තරුණ ව්‍යවසායකත්ව වැඩසටහනක් දියත් කර ඇත. දියුණු කරන ලද මතවාද සැලකිල්ලට ගෙන මෙම ව්‍යවසායකත්ව වැඩසටහන මඟින් තරුණ, තරුණියන් 100,000ක් පුහුණු කිරීම, උපදේශකත්වය සහ මූල්‍යමය ආධාර ලබා දෙනු ඇත. ඉලක්කය වන්නේ අප්‍රිකාව පුරා අවම වශයෙන් නව රැකියා මිලියන 10 ක් සහ නව වාර්ෂික ආදායමෙන් ඩොලර් බිලියන 10 ක් උත්පාදනය කිරීමේ සමස්ත ඉලක්කයට දායක වීමයි. මෙවැනි උදාහරණ ඇතත්, ශ්‍රී ලංකාවේ ද විවිධ පැතිකඩ අනුව තරුණ ව්‍යවසායකත්වය, නවෝත්පාදන බිහිකරමින් තිබෙන අතර ශ්‍රී ලංකාවේ කෘෂිකර්ම සංවර්ධනය සඳහා ද තරුණ ප්‍රජාව ආකර්ශනය කරමින් කෘෂිකාර්මික තරුණ කෘෂිව්‍යාසායකයන් සහ නවෝත්පාදන බිහිකිරීම දිරිගන්වා ඇති අතර එය ජාතික කෘෂිකර්ම ප්‍රතිපත්තියේ ද සඳහන් ප්‍රධාන සංවර්ධන සංරචකයක් කර ඇත.

ඩිජිටල්කරණය සහ සේවා ප්‍රමුඛ කරගන්නා සංවර්ධනය (Shifting Gears: Digitization and Services-Led Development) සහ දරිද්‍රතාවය ,

එසේම, ඩිජිටල්කරණය සහ සේවා ප්‍රමුඛ කරගන්නා සංවර්ධනය (Shifting Gears: Digitization and Services-Led Development) යනුවෙන් හැඳින්වෙන නවතම දකුණු ආසියානු ආර්ථික දැක්ම මඟින් මෙම කලාපයේ ආර්ථිකය 2021 සහ 2022 වසර වලදී 7.1% කින් වර්ධනය

වන බවට පුරෝකථනය කර ඇත. තවද 2020-23 කාලය තුලදී දකුණු ආසියාවේ සාමාන්‍ය ආර්ථික වර්ධනය 3.4% ක් වනු ඇතැයි අනාවැකි පළ කර තිබේ. මෙය වසංගතයට පෙර පැවැති වසර 4 ක තත්ත්වය හා සසඳන විට 3% අඩු තත්ත්වයකි. කොවිඩ් 19 වසංගතය මඟින් කළාපයේ ආර්ථිකයට දීර්ඝකාලීන හානි සිදුවී ඇත. දිනකට ඇමෙරිකානු ඩොලර් 3.20 වන දරිද්‍රතා රේඛාව සලකා බැලීමේදී 2021 වසරේදී ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව 10.9% ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර මෙය 2019 වසරේදී පැවැති 9.2% ට වඩා පැහැදිලිව ඉහළ අගයකි. රුපියල අවප්‍රමාණය වීම, ලෝක වෙළඳපලේ මිල මට්ටම ඉහළයාම, ආහාර මිල ගණන් ඉහළයාම සහ සැපයුමේ හිඟකම ආහාර සුරක්ෂිතභාවයට අහිතකර ලෙස බලපා ඇත. රටවල් නැවත යථා තත්වයට පත්වෙමින් සිටින බැවින් අපගේ දීර්ඝකාලීන සංවර්ධන ආකෘතීන් පිළිබඳව නැවත සිතා බැලීමට අවස්ථාව උදාවී තිබේ. නව ඩිජිටල් තාක්ෂණයේ වර්ධනයත් සමඟ දකුණු ආසියාවට සාම්ප්‍රදායික නිෂ්පාදන පෙරටු කරගත් ආර්ථික ක්‍රමෝපායයන්ගෙන් වෙනස් මඟක් ගනිමින් සේවා අංශය වර්ධනය කිරීමට අවස්ථාව උදාවී ඇත.ඒ අනුව කෘෂි අංශයද ඩිජිටල් තාක්ෂණය සමඟ විවිධ සේවා පහසුකම් සංවර්ධනය කිරීම මඟින් වෙලඳපොළ සබඳතා ශක්තිමත් කර ගත යුතුය. කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් දියුණු කරමින් පවතින "E-agriculture" උපාය මාර්ගය, කෘෂිකාර්මික දත්ත කළමනාකරණ පද්ධතිය මෙම කඩඉම ජයගැනීම සඳහා සහාය වනු ඇතැයි අපේක්ෂා කරන අතර විශේෂයෙන් වෙළඳපොළ තිරසාර ලෙස හැසිරවීම සඳහා ඩිජිටල් තාක්ෂණය ද සහාය වනු ඇත.

දේශගුණ විපර්යාස, සාගින්න හා මන්ද පෝෂණය ,

තවදුරටත්, ලෝක ආහාර සහ කෘෂිකර්ම සංවිධානයට අනුව ලොව සමස්ත ජනගහනයෙන් 8% එනම් මිලියන 690 ක පමණ ජනතාවක් මන්දපෝෂණයෙන් පෙළෙන බවට ඇස්තමේන්තු කර ඇත. නමුත් කණගාටුවට කරුණ වන්නේ වර්තමානයේ තීව්‍ර වී ඇති දේශගුණික විපර්යාසයන් සහ කොවිඩ්-19 වසංගත තත්ත්වය හමුවේ මෙම ප්‍රමාණය ඉතා ඉහළ අගයක් දක්වා වර්ධනය වීමයි. ශ්‍රී ලංකාව තුල පුද්ගලයන් මිලියන 1.7 ක් මන්දපෝෂණයෙන් පෙළෙන අතර එය ජනගහනයෙන් දළ වශයෙන් 8% ක් ලෙස සැලකිය හැකිය. ශ්‍රී ලංකාව තුල වයස අවුරුදු 5 ට අඩු ළමුන් අතර මන්දපෝෂණය බහුලව දක්නට ලැබෙන අතර, එය ගෝලීය වශයෙන් ගත් විට ද ශ්‍රී ලංකාව ඉහළ අනුපාතයකට හිමිකම් කියනු ලබයි. දේශීය මව්වරුන් අතරද මන්දපෝෂණය බහුලව දක්නට ලැබෙන අතර එය වතුකරයේ ඉතා ඉහළය. මන්දපෝෂණ තත්ත්වයන්ට සමගාමීව කෘෂිකාර්මික, ධීවර හා පශු සම්පත් අංශ විසින් නිෂ්පාදනය කරනු ලබන ආහාර වලින් 30% ක් පමණ අකාර්යක්ෂම නිෂ්පාදනය, පාරිභෝගික නාස්තිය සහ ප්‍රවාහන හා බෙදා හැරීමේ ගැටළු හේතුවෙන් විනාශයට පත්වේ. දේශගුණික විපර්යාස සහ වර්තමානයේ COVID-19 වැනි අනෙකුත් අර්බුදකාරී තත්ත්වයන් සැලකිල්ලට ගනිමින්, ශ්‍රී ලංකාවේ ආහාර පද්ධතියේ ක්‍රියාකාරිත්වය සහ එහි සැපයුම් දාමයන් සහ එයට දේශගුණික විපර්යාසයගෙන් සිදුවන බලපෑම අවම කර ගැනීමට අප වෙහෙස වී ඇත.

දේශගුණික විපර්යාස හමුවේ ආහාර ප්‍රවේශය සහතික කිරීම,

දේශගුණික විපර්යාස සහ ආහාර අනාරක්ෂිත භාවය සෘජුවම එකිනෙකට සම්බන්ධ වන අංශයන් වේ. දේශගුණික විපර්යාස ආශ්‍රිත උපද්‍රව වන ගංවතුර, සුළි කුණාටු, නියඟ සහ වෙනත් අවදානම් ආහාර සුරක්ෂිතතාවය දුර්වල කළ හැකි උවදුරු වන අතර කෘෂිකාර්මික කටයුතුවලට මෙමඟින් දැඩි ලෙස බලපෑම් ඇති කරයි. එහි ප්‍රතිඵලය ලෙස මෙය වෙළඳපොළ ප්‍රවේශය , වෙළඳාම, ආහාර සැපයුම, ආහාර මිල ඉහළ යාම, ගොවි ආදායම අඩුවීම සහ සේවා නියුක්තිය යන විවිධ විෂයන් කෙරෙහි දැඩි බලපෑම් ඇති කරයි. මෙම දේශගුණික විපර්යාස මඟින් දරිද්‍රතාවයට මඟ සැලසෙන අතර එමඟින් ආහාර අනාරක්ෂිතතාවය සහ මන්දපෝෂණය ඉහළ යාමද සිදුවේ. ඒ අනුව ශ්‍රී ලංකාවේ බෝග වගා ක්ෂේත්‍රයේ දේශගුණික වශයෙන් අවදානම් සහිත ප්‍රදේශවල වාසය කරන ගොවීන්ගේ දේශගුණික අනුවර්තික හැකියාව වැඩි දියුණු කිරීම සහ තෝරාගත් එබඳු ප්‍රදේශ වල වාරි ක්ෂේත්‍රයේ ඵලදායීතාවය ඉහළ නැංවීමට කටයුතු කර ඇත.

තිරසාර සංවර්ධනය - ආහාර පද්ධති සුරක්ෂිතභාවය -"අපට අවශ්‍ය අනාගතය සඳහා වූ පියවර වේගවත් කිරීම,"



රියෝ 20+ සමුළුවේ ප්‍රතිඵලයක් ලෙස ගොඩනැගුණු තිරසාර සංවර්ධන ඉලක්කයන් (SDGs) සහස්‍ර සංවර්ධන ඉලක්කයන් වල ඉදිරි පියවරක් වන අතර 2015 වර්ෂයේ සිට 2030 වර්ෂය දක්වා පැතිර පවතින අතර තිරසාර සංවර්ධන ඉලක්කයන් 17ක් අන්තර්ගත වේ. මෙම ඉලක්ක ආර්ථික සමාජ හා පාරිසරික යන සියළුම අංශයන් වල තිරසාර බව ඇති කිරීම සඳහා ගොඩනැගුණු පැහැදිලි අන්තර්ජාතික ක්‍රියාදාමයකි.තවද,ජනතාව, පෘථිවිය,හවුල්කටයුතු, සාමය, සහ සෞභාග්‍ය පවත්වා ගැනීම සඳහා කිසිවකුත් අත්නොහැර යන වසර 2030 දක්වා දිවෙන ගමනක් ලසෙ මෙම ඉලක්ක සපුරා ගැනීම සකස් කර ඇත. තවදුරටත් , තිරසාර සංවර්ධන ඉලක්කයන් හී සංකල්ප අතර මානව වර්ගයා දරිද්‍රතාවයෙන් නිදහස් කර ගැනීම, සාගින්න තුරන් කිරීම, කාන්තවාන් සවිබල ගැන්වීම, දේශගුණික විපර්යාස කෙරෙහි අනුවර්තනය වීම, සාමය, ආරක්ෂාව සහ යහපාලනය වැනි ඉතා වැදගත් පැතිකඩයන් අන්තර්ගත වේ.

දේශගුණික විපර්යාස, ආහාර සුරක්ෂිතභාව සහ කෘෂිකර්මාන්තය ගත් විට එයට බලපාන මූලිකම තිරසාර සංවර්ධන ඉලක්කයන් වන්නේ දෙවන, දොළොස්වන, දහතුන්වන, පහළොස්වන තිරසාර සංවර්ධන ඉලක්කයන් වේ.

එනම් දෙවන තිරසාර සංවර්ධන ඉලක්කය (2. Zero Hunger) වන්නේ කුසගින්න දුරලීම, ආහාර සුරක්ෂිතභාව සහ ඉහළ පෝෂණයක් අත්පත් කරගැනීම සහ තිරසාර කෘෂිකර්මාන්තයක් ප්‍රවර්ධනය කිරීමය. එයට සමගාමීව දහතුන්වන තිරසාර සංවර්ධන ඉලක්කය (13. Climatic Action) වන්නේ දේශගුණික වෙනස්වීම් හා එහි බලපෑම් වැළැක්වීම සඳහා කඩිනම් පියවර ගැනීමයි. තවදුරටත් මෙහිදී දෙවන තිරසාර සංවර්ධන ඉලක්කයේ අරමුණු වන්නේ 2030 වන විට කුඩා ළදරුවන්, දිළිඳු අසරණ පුද්ගලයන්, කාන්තාවන් ඇතුළු සියළුම පිරිස් සඳහා ආහාර ප්‍රවේශය සැපයීම සහ ඔවුන්ගේ දිළිඳුකම පිටු දැකීමය. මීට අමතරව ඉඩම්, යෙදවුම් , දැනුම, මූල්‍ය සේවාවන් ආදිය ලබාදෙමින් කෘෂිකාර්මික අංශයට ප්‍රවේශ වීම සඳහා ආරක්ෂිත මාර්ගයක් සලසමින් කෘෂිකාර්මික ඵලදායිතාවය 2030 වන විට දෙගුණ කිරීමය.

මෙහි දහතුන්වන තිරසාර සංවර්ධන ඉලක්කය මගින් තවදුරටත් කියවෙන්නේ ජාතික ප්‍රතිපත්ති සහ උපායමාර්ග සැළසුම් කිරිමේදී දේශගුණික වෙනස්වීම් සඳහා බලපාන සාධක ඇතුළත් කිරීමය. මීට අමතරව දේශගුණික සහ ස්වභාවික විපත් සඳහා මහජනයා සුදානම් කිරීම ජාතික ප්‍රතිපත්ති වලට ඇතුලත් කිරීමයි . එමෙන්ම පහළොස්වන තිරසාර සංවර්ධන අරමුණු (15. Life on Land) ජෛව පද්ධිත සුරක්ෂිතභාවයේ වැදගත්කම පැහැදිලි කර තිබෙන අතර ඒ අනුව අප ජෛව විවිධත්වය සහ ආහාර පද්ධති ආරක්ෂා කර ගනිමින් පාරිසරික කෘෂිකර්මාන්තය ප්‍රවලිත කර ඇත.

තිරසාර සංවර්ධනය හා කෘෂි අංශයේ දායකත්වය,

මේ අනුව ශ්‍රී ලංකාවේ පිහිටුවා ඇති තිරසාර සංවර්ධන සභාවේ උපදෙස් අනුව වසර 2021 සිට කෘෂිකර්ම අංශය ප්‍රධාන වශයෙන් දෙවන තිරසාර අරමුණු සහ දෙළොස් වන තිරසාර සංවර්ධන අරමුණ එනම්,තිරසාර පරිභෝජන රටා වල පැවැත්ම ඇති කිරීම සහ එම ඉලක්ක සපුරා ගැනීම කෙරෙහි අවධානය යොමු කර ඇත.

ආහාර පද්ධති සුරක්ෂිතභාවය,



COVID-19 වසංගත තත්ත්වයේ අභියෝගයක් සමඟම ලොව පුරා ආහාර නිෂ්පාදන සහ සැපයුම් ජාලය තාවකාලිකව බිඳ වැටී ගියද වසර 2030 වන විට තිරසර ආහාර නිෂ්පාදන පද්ධති පැවැත්ම තහවුරු කිරීම සහ ජෛව පද්ධති පවත්වා ගැනීමට උපකාරී වන දේශගුණික සුහුරු කෘෂිකාර්මික භාවිතාවන් ක්‍රියාවට නැංවිය යුතු බව , "අපට අවශ්‍ය අනාගතය සඳහා වූ පියවර වේගවත් කිරීම" යන මැයෙන් එක්සත් ජාතීන්ගේ සංවිධානය මඟින් 2021.09.23 දින ප්‍රථම වතාවට සාකච්ඡා කරන ලද ලෝක ආහාර පද්ධති සමුළුව මඟින් පෙන්වා දී ඇත. ආහාර සුරක්ෂිතභාව සහ දේශගුණික ආපදා අවදානම

කළමනාකරණය කෙරෙහි තවදුරටත් ජාත්‍යන්තර මැදිහත්වීම ලබාදීම සඳහා මෙම ආහාර පද්ධති සමුළුව කැඳවනු ලැබ ඇති අතර මෙම සමුළුව මඟින් වසර 2030 දී අත්පත් කර ගත යුතු තිරසාර අරමුණු 17 අතර ආහාර පද්ධති වල සුරක්ෂිතවය තහවුරු කර ගැනීම සඳහා විශේෂිත ක්‍රියාපථයන් පහක් (Action Tracks) යළින් වනාවක් කැටි කොට ඉදිරිපත් කර ඇත.



- විශේෂිත ක්ෂේත්‍රය 01 - සැමට ආරක්ෂිත සහ පෝෂ්‍යදායී ආහාර සඳහා ප්‍රවේශය සහතික කිරීම
- විශේෂිත ක්ෂේත්‍රය 02 - තිරසාර පරිභෝජන රටා වෙත යොමු වීම
- විශේෂිත ක්ෂේත්‍රය 03 - සොබාදහම මූලික කරගත් නිෂ්පාදන සඳහා ප්‍රමුඛතාවය ලබා දීම
- විශේෂිත ක්ෂේත්‍රය 04 - අවදානම්, ප්‍රකම්පන, ආතතීන් සඳහා අනුහුරු වීම
- විශේෂිත ක්ෂේත්‍රය 05 - ප්‍රජාව බලගැන්වීම, ඉහල ජීවන මට්ටමක් ලබා දීම හා සැමට සමාන රැකියා

මෙම ක්‍රියා පථයන් මඟින් විශේෂයෙන්ම ලොව පුරා ආහාර පද්ධතිවල විශේෂතාව හඳුනා ගනු ලබන අතර මානව හිමිකම්, මූල්‍ය නවෝත්පාදනය, කාන්තාවන් සහ තරුණ ප්‍රජාව සවිබල ගැන්වීම වැනි කරුණු ගවේෂණය කරනු ලබයි. විශේෂයෙන්ම මෙහි සඳහන් පස්වන ක්‍රියා පථය මඟින් ස්වභාවික විපත් ඇතිවිය හැකි ප්‍රදේශවල තිරසාර ආහාර පද්ධතිවල අඛණ්ඩ ක්‍රියාකාරිත්වය සහතික කිරීම පිළිබඳ විමසනු ලැබෙයි. වර්තමානයේ වසංගතයේ බලපෑමෙන් ආහාර සැපයුම් ආරක්ෂා කරගැනීම පිළිබඳවත් තවදුරටත් පස්වන ක්‍රියා පථය මඟින් විමසයි. මෙම ක්‍රියා පථයේ මූලිකම අභිලාෂය වන්නේ ආහාර පද්ධතියක් තුළ සිටින සියළුම පුද්ගලයන්ට ආහාර අස්ථාවරභාවයට සුදානම් වීමට සහ අනුහුරු වීමේ ක්‍රියාවලිය සහතික කිරීමයි.



ඒ අනුව අප විසින් ආහාර පද්ධති සුරක්ෂිතතාවය ඇති කිරීම සඳහා පහත පියවර ගෙන ඇත.

වසවිසෙන් තොර ආහාර නිෂ්පාදනය හා සැපයීම,

රෝමයේ පැවැත්වූ එක්සත් ජාතීන්ගේ ආහාර පද්ධති සමුළුවේ (UN Food Systems Summit) පූර්ව සමුළු සැසියේ (Pre-summit) දී ශ්‍රී ලංකාව වසවිසෙන් තොර ආහාර පරිභෝජනයේ ප්‍රවේශය හඳුන්වා දී ඇත. කෘත්‍රිම පොහොර, පළිබෝධ නාශක සහ වල් නාශක ආනයනය කිරීම තහනම් කිරීම මඟින් මිනිසා ඇතුළු පරිසර පද්ධතියට හිතකාමී ලෙස ආහාර සුරක්ෂිතතාවය ඇති කිරීමට පියවර ගෙන ඇත. ප්‍රධාන වශයෙන් කුඩා කණ්ඩායම් වලින් යුතු කෘෂිව්‍යවසායකයන් බිහිකිරීම, දේශගුණික අනුහුරු බීජ නිෂ්පාදනය, කෘෂිපාරිසරික කළාප අනුව වගා කටයුතු සිදු කිරීම, කුමන තත්වයක් යටතේ වුවද සැපයුම් ජාලය අඛණ්ඩව පවත්වා ගැනීම සඳහා දිවයින පුරා ගබඩා පහසුකම් ඇති කිරීම, කාබනික වගාව සහ කාබනික පොහොර ප්‍රචලිත කිරීම, හරිත කෘෂිකර්මය, ගෙවතු වගා සංග්‍රාමය, කෘෂිකාර්මික ජෛව විවිධත්වය ආරක්ෂා කිරීම, නිශ්චිත කාලරාමුවක් තුළ තෝරාගත් බෝග සඳහා ආනයන සීමා කිරීම, බීජ සහනාධාර ලබා දීම, කාලගුණික විපර්යාස හමුවේ ඔරොත්තු දෙන බීජ වර්ග නිපදවීම වැනි පියවර රාශියක් සිදුකර ඇත.



එමෙන්ම කෘෂිකර්මයෙන් ඈත් වී යන ග්‍රාමීය තරුණ ප්‍රජාව කෘෂිකර්මාන්තය වෙත යළිත් ආකර්ෂණය කර ගැනීම සඳහා කෘෂිකාර්මික තරුණ ව්‍යවසායකත්ව වැඩසටහන දියත් කර ඇති අතර තවදුරටත් දළ දේශීය නිෂ්පාදිතයට කෘෂිකර්මයේ දායකත්වය ඉහළ නංවමින් ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා ගත් පියවර මෙහි ඇතලත් කර ඇත.

අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කර ඇති විශේෂ ව්‍යාපෘති

කොවිඩ් 19 - හදිසි තත්ත්ව මත ක්‍රියාත්මක වැඩසටහන් යටතේ යටතේ ගබඩා පහසුකම් ඇති කිරීම (Contingent Emergency Response Component (CERC)

හැඳින්වීම

ලෝක බැංකුවේ (CERC) ණය පහසුකම යටතේ 2021 වර්ෂයේ දී රු.මි. 1036ක පිරිවැයක් දරා COVID වසංගතයෙන් අගතියට පත් කෘෂිකර්මාන්තය නඟා සිටුවීම සඳහා බීජ හා පැළෑටි බෙදා දීමත්, දිවයින පුරා ගබඩා 102 ක් ඉදි කිරීමට නියමිතය. ගබඩා පහසුකම් ප්‍රධාන බෝග කාණ්ඩ 3 ක් සඳහා ලබා දෙන අතර එම ගබඩා, අර්තාපල් ගබඩා 5ක් , ඵෑණු ගබඩා 6ක් , අතිරේක ක්ෂේත්‍ර බෝග ගබඩා 91 කින් සමන්විත වේ. එසේම අර්තාපල් සඳහා ශීතාගාර පහසුකම් සහිත ගබඩා ඉදි කිරීමට නියමිතය. කෘෂිකාර්මික ක්ෂේත්‍රයට කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් සිදුවී ඇති බලපෑම සැලකිල්ලට ගෙන ආහාර සුරක්ෂිතතාවය සහතික කිරීම හා බෝග අස්වනු සඳහා නිසි මිලක් ලබා දීමේ ජාතික වැඩපිළිවෙල යටතේ ගොවීන් සඳහා කෙටි කාලීනව ගබඩා පහසුකම් ලබා දීමේ අවශ්‍යතාවය පදනම් කරගනිමින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කර ඇත.

අරමුණ:-

- අස්වනු හානිය අවම කිරීම සහ වැඩි නිපැයුම් ප්‍රමාණයක් නියමිත වෙලාවට පාරිභෝගිකයා වෙත ලබා දීමට කටයුතු කිරීම
- ආහාර සුරක්ෂිතතාවය ඇතිකිරීම සඳහා කෘෂිනිෂ්පාදන ආරක්ෂා කිරීම

උපාංග

- කුඩා පරිමාණ ගොවීන් සඳහා ගබඩා පහසුකම් ලබා දීම

ක්‍රමවේදය:-

- ගබඩා ඉදි කිරීම, උපකරණ මිලදී ගැනීම ඇතුළු සෑම ක්‍රියාකාරකමක්ම ලෝක බැංකු මාර්ගෝපදේශ අනුව සිදු කිරීම
- මාසික ප්‍රගතිය ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම
- ඉදිකිරීම් නිම වීමෙන් අනතුරුව ගොවීන් සමග ඒකාබද්ධව ගබඩා නිසිපරිදි භාවිතා කිරීම නඩත්තු කිරීම හා පවත්වා ගෙන යාම. ඒ සඳහා ගොවි සංවිධාන තෝරා ගැනීම
- ගබඩා වල මෙහෙයුම් හා නඩත්තු වියදම් අදාල ගොවි සංවිධානය හෝ ආයතන මඟින් සිදුකිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීම

ව්‍යාපෘති කාලය

- 2020 වර්ෂයේ ජනවාරි මස සිට වැඩ ආරම්භ කරන ලද **ගබඩා ඉදිකිරීම සඳහා වෙන් කළ මුදල (රු.මි)**

අ/අ	**ක්‍රියාකාරකම්**	වෙන්කළ මුදල(රු.මි)	
		ඇ.එ.ජ.ඩො.මිලියන (US$ Mn)	රු.මි
1.	**ගබඩා පහසුකම් ලබා දීම**	5.60	1,036

ගබඩා පහසුකම් සැපයීම සඳහා 2021.12.31 දක්වා වෙන් කළ මුදල

අ/අ	වෙන්කළ මුදල (රු.මි)	මුළු එකතුව (රු.මි)
1.	ගබඩා ඉදි කිරීම සඳහා - රු.මි 1,021	**1,036**
2.	ගබඩා සඳහා වන උපාංග සඳහා - රු.මි 15	

එක් එක් ආයතන මඟින් සිදුකරන ලද ගබඩා ඉදිකිරීමවල ප්‍රගතිය

31.12.2021 දක්වා ගබඩා ඉදිකිරීම් වල මූල්‍ය හා භෞතික ප්‍රගතිය

	උප ව්‍යාපෘති වල ඉදිකිරීම් තත්වය										
අ/අ	පළාත	ක්‍රියාත්මක කරනු ලබන ආයතනය								මුළු ව්‍යාපෘති	ප්‍රතිපාදන (රු.මී Vat බදු සමඟ)
		කෘෂිකර්ම දෙපාර්තමේන්තුව		ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව		පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව		දිස්ත්‍රික් ලේකම්			
		ව්‍යාපෘති ගණන	වෙන් කළ මුදල	ව්‍යාපෘති ගණන	වෙන්කළ මුදල	ව්‍යාපෘති ගණන	වෙන් කළ මුදල	ව්‍යාපෘති ගණන	වෙන් කළ මුදල		
1	මධ්‍යම	3	34.93	2	14.03	0	0	1	12.13	6	61.09
2	නැගෙනහිර	4	19.77	0	0.00	6	62.23	1	10.63	11	92.63
3	උතුරු මැද	3	13.68	4	47.01	0	0	5	65.78	12	126.47
4	උතුර	1	5.18	1	13.91	10	99.33	0	0.00	12	118.42
5	ඌව	1	4.94	1	5.91	8	77.12	0	0.00	10	87.97
6	වයඹ	1	4.75	3	15.73	7	58.36	0	0.00	11	78.84
7	දකුණ	1	4.54	0	0.00	4	27.42	3	32.03	8	63.99
8	බස්නාහිර	0	0.00	0	0.00	5	25.61	0	0.00	5	25.61
9	සබරගමුව	0	0.00	1	11.88	0	0	0	0.00	1	11.88
	මුළු එකතුව	**14**	**87.79**	**12**	**108.47**	**40**	**350.07**	**10**	**120.60**	**76**	**666.9**

ක්ෂේත්‍ර නිරීක්ෂණ

අතිරේක ආහාර බෝග සඳහා මෙ.ටො.50 ගබඩා ඉදිකිරීම (SP/01 /ලබුදුව -ගාල්ල) (NP/5කිලිනොච්චිය/ වල්පිට - ගම්පහWP/2 සහ අම්පාර EP/2)



2.1.2 2021 වර්ෂයේ කෘෂිකර්ම සංවර්ධන වැඩසටහන් වල ප්‍රගතිය

කෘෂිකාර්මික තරුණ ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන
වැයශීර්ෂය 118-02-03-062-2509

හැඳින්වීම

පීඩාවට පත්ගොවි ජනතාව මෙන්ම දරිද්‍රතාවයෙන් පෙලෙන ග්‍රාමීය ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමේ දී සහ දරිද්‍රතාවය අඩු කිරීමේදී ශ්‍රී ලංකාව ඉහළ ප්‍රගතියක් ලබා ඇති නමුත් කොවිඩ්-19 අර්බුදය ජීවනෝපාය මාර්ග හා ආදායම් ඉපැයීම අඩු වීම කෙරෙහි දැඩි ලෙස බලපා තිබේ. එමෙන්ම ඉහත සටහනේ විස්තර කළ පරිදි 2021 වසරේ තිරසාර සංවර්ධනයේ ගෝලීය අරමුණු වල නව මානය වන දේශගුණය, ආහාර පද්ධති සහ ආහාර සුරක්ෂිතතාව ඇති කිරීම සඳහා තරුණ සහභාගීත්වය වඩාත් ඉහල අගයකින් ලබා ගැනීම පිළිබඳව අවධානය යොමු කර ඇත. රැකියා වියුක්ත තරණ ප්‍රජාව මෙන්ම, සාම්ප්‍රදායික කෘෂිකර්මාන්තයෙන් ඈත් වෙමින් සමාජයේ හුදකලා වන විවිධ අධ්‍යාපන මට්ටම් වලින් යුත් තරුණ ප්‍රජාව වෙත වාණිජ කෘෂි ව්‍යාපාර සඳහා ඇති අවස්ථාව හඳුන්වා දීමත්, ප්‍රාදේශීය මට්ටමින් තරුණ ව්‍යවසායකයින් කෘෂි සංවර්ධන වැඩසටහන් සඳහා සම්බන්ධ කර ගැනීම මඟින් තවදුරටත් දළ දේශීය නිෂ්පාදිතයට කෘෂිකාර්මික අංශයේ දායකත්වය ඉහළ නැංවීම කෘෂිකාර්මික තරුණ ව්‍යවසායකත්ව වැඩසටහන යටතේ අවධානය යොමු කර ඇත.

ක්‍රියාත්මක කරනු ලබන කාල සීමාව:- 2021.01.01-2021.12.31

වගකීම හා ක්‍රියාත්මක කරනු ලබන පුද්ගලයන්/ආයතන:-

- කෘෂිකර්ම අමාත්‍යාංශය
- දිස්ත්‍රික් ලේකම් /දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ
- කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

කෘෂිකාර්මික තරුණ ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන්;

- ජාතික කෘෂිකර්ම ප්‍රතිපත්තිය එළිදැක්වීම
- කෘෂිකාර්මික කළමනාකරණ තොරතුරු පද්ධතිය ස්ථාපනය කර ක්‍රියාත්මක කිරීම
- ගොවිජන සේවා මධ්‍යස්ථාන සඳහා පස් පරීක්ෂණ පහසුකම් ස්ථාපනය කිරීම
- තරුණ කෘෂිව්‍යවසායකයන් බලගැන්වීමේ වැඩසටහන
- කෘෂි අපනයන ගම්මාන ස්ථාපිත කිරීම
- තරුණ ව්‍යවසායකයින් සඳහා නව කෘෂි තාක්ෂණික සොයා ගැනීම් සඳහා පහසුකම්කරණය
- සංවර්ධන වැඩසටහන් හා ව්‍යාපෘති මෙහෙයවීම හා අගයීම
- කෘෂිකර්ම අංශයේ ක්ෂේත්‍ර නිලධාරීන්ගේ මානව සම්පත් කුසලතා ඉහළ නැංවීම

කෘෂිකාර්මික තරුණ ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් වල මූල්‍ය හා භෞතික ප්‍රගතිය

උක්ත වැඩසටහනට රු.මි. 75.00 ක් වෙන් කර ඇත. වැඩසටහන සඳහා රු.මි 49.45 ක් වියදම් වී ඇත. මූල්‍ය ප්‍රගතිය 61% ක් වන අතර අතර ආයෝජන බැඳීම් රු.මි 1.18 කි. ඒ යටතේ පහත ප්‍රධාන වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.

1.ජාතික කෘෂිකර්ම ප්‍රතිපත්තිය සකස් කිරීම

ජාතික කෘෂිකර්ම ප්‍රතිපත්තිය - විෂය පථය

සෞභාග්‍යයේ දැක්ම රාජ්‍ය ප්‍රතිපත්ති ප්‍රකාශයේ අරමුණු වලට අනුකූලව යැපුම් ආර්ථිකය වෙනුවට නිෂ්පාදන ආර්ථිකයක් ඇති කිරීම සඳහා කෘෂි අංශයේ දායකත්වය ඉහල නැංවීම සඳහා ජාතික කෘෂිකර්ම ප්‍රතිපත්තිය සකස් කර ඇත. තවද, ආහාර පද්ධති තිරසාර ලෙස සුරක්ෂිත කිරීම, හරිත කෘෂිකර්මාන්තය ප්‍රචලිත කිරීම,රසායනික පොහොර භාවිතය අවම කිරීම, වගා සහ අස්වැන්න ආරක්ෂා කර ගැනීම ප්‍රමුඛව දේශීයව ස්වයං පෝෂිත වෙමින් අපනයනය ප්‍රමුඛ කරගන්නා කෘෂි ව්‍යාපාරයකයන් ගොඩනැගීම සඳහා තරුණ ප්‍රජාව කෘෂිකර්මයේ විවිධ අංශයන් වෙත ආකර්ශණය කර ගැනීම විශේෂයෙන් අවධානයට යොමුකර ඇත. සැලසුම් සහගත කෘෂිකර්ම ප්‍රතිපත්තියක් මඟින් ගොවි ජනතාවගේ ජීවනෝපාය සංවර්ධනය කිරීම අපේක්ෂා කර ඇති අතර සියළු පාර්ශවකරුවන්ගේ එකඟතාවන් මත හා නිරීක්ෂණයන් ඔස්සේ සෘජු ඇගයීමක් කළ හැකි පරිදි ජාතික කෘෂිකර්ම ප්‍රතිපත්තියට ඉලක්ක දහතුනක් (13) ඇතුලත් කර ඇත.

ජාතික කෘෂිකර්ම ප්‍රතිපත්තිය මඟින් අවධානයට යොමු වන ප්‍රධාන අංශ,

ජාතික කෘෂිකර්ම ප්‍රතිපත්තියේ අවධානය ප්‍රධාන වශයෙන් අංශ දෙකක් වෙත යොමු වේ. එනම්,

1. ආහාර හා සත්ත්ව ආහාර බෝග
2. ගුණාත්මක ආහාර නිෂ්පාදන සබැදි තිරසාර ආහාර සුරක්ෂිතතාව

සළකා බැලිය යුතු ප්‍රධාන ක්ෂේත්‍ර,

ජාතික කෘෂිකර්ම ප්‍රතිපත්තිය සම්පාදනය කිරීමේදී සිදුකෙරුණු පුළුල් කතිකාවත තුළින් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍ය වන, පහත දැක්වෙන ප්‍රධාන ක්ෂේත්‍ර අටක් (08) හඳුනාගෙන තිබේ.

1. භෝග නිෂ්පාදනය හා ඵලදායීතා වර්ධනය
2. ආහාර හා සත්ත්ව ආහාර භෝග සඳහා වන මූලික අවශ්‍යතාවය සම්බන්ධයෙන් ස්වාධීන හා ස්වයංපෝෂිතාවය ලඟා කරගැනීම
3. සැලසුම් සහගත සම්පත් පරිහරණය
4. වෙළෙඳපොළ තරඟකාරිත්වය ඇති කිරීම
5. දේශගුණ අනුවර්තිත කෘෂිකර්මාන්තය
6. සියලු ආකාරයේ අවදානම් සහ අවිනිශ්චිතතාවයන් අවම කිරීම
7. කෘෂිකර්මාන්තය සඳහා වැඩි වශයෙන් තරුණයන් හා කාන්තාවන් අනුගත කර ගැනීම
8. මධ්‍යගත ආණ්ඩුව හා පළාත් අතර මනා සම්බන්ධතාවය පවත්වා ගැනීම හා අදාළ සියළු පාර්ශවයන්ගේ එකඟතාවය තුළින් නිර්මිත ජාතික කෘෂිකර්ම ප්‍රතිපත්තියේ දැක්ම හා මෙහෙවර පහත දැක්වේ.

දැක්ම:

ජාතික සමෘද්ධිය සාක්ෂාත් කර ගැනීම සඳහා තිරසාර ආහාර සුරක්ෂිතතාව

මෙහෙවර :

ගෝලීයව තරඟකළ හැකි මට්ටමේ කෘෂිකාර්මික නිෂ්පාදන, සැකසුම්කරණය සහ වෙළඳපොළ යාන්ත්‍රණයක් තුලින් නිෂ්පාදකයා සහ පාරිභෝගිකයා තෘප්තිමත් වන පරිදි සමාජයීය වශයෙන් පිළිගත හැකි තිරසාර, හා පරිසර හිතකාමී ආහාර පද්ධතියක් ස්ථාපිත කිරීම

ඉලක්ක

- වසර 2030 දී සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂිත ජාතික කෘෂිකර්ම ප්‍රතිපත්තියේ ඉලක්ක
- තිරසාර හා පරිසර හිතකාමී කෘෂිකාර්මික පිළිවෙත් අනුගමනය කිරීම මඟින් සම්පත් ඵලදායිතාව (2020 ඇස්තමේන්තුවලට අනුව) දෙගුණ කර ගැනීම.
- ගොවීන්ගේ / කෘෂි නිෂ්පාදකයින්ගේ ආර්ථික ලාභදායිත්වය දෙගුණ කිරීම(2020 ඇස්තමේන්තුවලට අනුව)
- ජාතික ආර්ථිකයට කෘෂි ආහාර පද්ධතියේ දායකත්වය 15% කින් ඉහළ නැංවීම.

- කෘෂි ආහාර අගයදාමය සඳහා දේශීයව දියුණු කරන ලද තාක්ෂණය භාවිතා කිරීම, වර්තමාන තත්ත්වයට සාපේක්ෂව අවම වශයෙන් 50% කින් වැඩි කිරීම.
- ඉහල අස්වනු ලබා දෙන දේශීය ව නිපදවන ලද ගුණාත්මක බීජ හා රෝපණ ද්‍රව්‍ය වල දේශීය නිෂ්පාදන මට්ටම ජාතික අවශ්‍යතාවයෙන් 50% දක්වා වැඩි කිරීම.
- භෝග නිෂ්පාදනයේදී පරිසර හිතකාමී යෙදවුම් භාවිතය සඳහා වන අවශ්‍යතාවය 100% දක්වා ඉහළ නැංවීම.
- රටේ පවතින ආහාර/ සත්ව ආහාර පාලන රෙගුලාසිවලට අනුකූලව සුරක්ෂිත මෙන්ම ගුණාත්මක ආහාර/සත්ව ආහාර සැපයීම.
- සහතිකකරණය, ප්‍රමිතිකරණය සහ වෙනත් සැපයුම් දාම වලට සහාය වන රජයේ නියාමනයට යටත් ආහාර හා සත්ව පාලන පද්ධතියක් ස්ථාපිත කිරීම.
- කාර්යක්ෂම වෙළඳ යාන්ත්‍රණයක් සමඟ බැඳුණු කෘෂි ව්‍යාසායකත්ව හැකියාව සහිත ගොවි/ කෘෂි නිෂ්පාදක කණ්ඩායම් ස්ථාපිත කිරීම.
- තීරණ ගැනීමේ ක්‍රියාවලියේ දී ගොවීන්ගේ හා කෘෂි නිෂ්පාදකයින්ගේ කාර්යභාරය හා අනිවාර්ය සහභාගිත්වය සහතික කිරීම.
- දේශගුණික හා වෙනත් ආපදා තත්ත්වයන්ට මුහුණ දිය හැකිවන පරිදි කෘෂි ආහාර පද්ධතියක් ශ්‍රී ලංකාවේ ස්ථාපිත කිරීම.
- තීරණ ගැනීම සඳහා විනිවිදභාවයෙන් යුතු වගවීම හා වගකීම සහිත සහභාගිත්ව පාලන ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම.

තේමා ගත ක්ෂේත්‍ර

- පාර්ශවකරුවන්ගේ එකඟතාවය ලද තේමා ගත ක්ෂේත්‍රයන් දහයක්(10) සහ එම තේමා ගත ක්ෂේත්‍ර යටතේ හඳුනාගත් ප්‍රතිපත්ති ප්‍රකාශන පහළොවක්(15) පහත දැක්වේ.

(1). තේමා ගත ක්ෂේත්‍රය : භෝග නිෂ්පාදනය හා ඵලදායිතාවය

1. කෘෂි පාරිසරික විභවතා ප්‍රයෝජනයට ගනිමින් සහ ආහාර නිෂ්පාදන පද්ධති ශක්තිමත් කරමින් සංවිධානාත්මක කෘෂි නිෂ්පාදන පද්ධතියක් ස්ථාපනය කිරීම මගින් ආහාර /සත්ව ආහාර නිෂ්පාදනය හා ඵලදායිතාවය වර්ධනය කිරීම.

(2). තේමා ගත කේෂ්ත්‍රය: යෙදවුම් කළමනාකරණය

2. භෞතික යෙදවුම් ලබා දීම හා කළමනාකරණය කාර්යක්ෂම කිරීම හා එම යෙදවුම් සුපරීක්ෂාකාරීව පරිභෝජනය සඳහා අවකාශ සැලසීම.

3. ගොවි ප්‍රජාව හා පාරිසරික සුරක්ෂිතභාවය සහතික කරමින් යෙදවුම් උපරිම මට්ටමෙන් ප්‍රයෝජනයට යොදා ගැනීම සහ මනා කළමනාකරණයක් තුලින් වගා බිම්වල ඵලදායිතාව හා තිරසාර පැවැත්ම වැඩි දියුණු කිරීම.

4. වාරි ජල පරිහරණ කාර්යක්ෂමතාව වැඩි දියුණු කරනු වස් සහභාගීත්ව කළමනාකරණ ප්‍රවේශය හරහා වාරි ජලය ක්‍රමවත්ව පරිහරණය කිරීම.

(3). තේමා ගත ක්ෂේත්‍රය : උසස් තාක්ෂණික ක්‍රමවේද

5. කෘෂි නිෂ්පාදන ක්‍රියාදාමයේ තිරසාර බව සහතික කිරීම සඳහා පෙර/ පසු අස්වනු කළමනාකරණයේදී යෝග්‍ය නවීකරණ සහ තාක්ෂණය උපයෝගී කර ගැනීම හා ඒවා වැඩි දියුණු කර ගැනීම දිරිමත් කිරීම.

(4). තේමා ගත ක්ෂේත්‍රය : ආහාර සුරක්ෂිතතාව හා ගුණාත්මකබව කළමනාකරණය

6. මානව සහ සත්ව සෞඛ්‍ය ආරක්ෂා කිරීම සඳහා ජාතික හා අන්තර්ජාතික ප්‍රමිතීන් මත පදනම්ව සුරක්ෂිත වුත් ඉහළ ගුණාත්මයෙන් යුක්ත වුත් ආහාර හා සත්ව ආහාර ලබා ගැනීමේ හැකියාවන් වර්ධනය කිරීම.

(5). තේමා ගත ක්ෂේත්‍රය : පාරිසරික හිතකර මෙහෙයුම්

7. පාරිසරික පද්ධතිවල සුරක්ෂිත බව සහතික කරමින් ස්වභාවික සම්පත් සංරක්ෂණය කිරීම සහ ප්‍රයෝජනයට යොදා ගැනීම සහ එමඟින් කෘෂි සංවර්ධනයේ තිරසාරබව ශක්තිමත් කිරීම.

(6). තේමා ගත ක්ෂේත්‍රය : කෘෂි ව්‍යාසායකත්ව හා වෙළෙඳපොළ

8. අගයදාම ක්‍රියාවලියේ ක්‍රමෝපායික සහයෝගීතාව තුළින්, විශේෂයෙන් දේශීය හා අන්තර්ජාතික වෙළෙඳපොළ ඉලක්ක කර ගනිමින් අගය එකතු කරන ලද නිෂ්පාදන දිරිගැන්වීම.

9. ජාතික හා අන්තර්ජාතික ප්‍රමිතීන්ට අනුගත වෙමින් සුදුසු සැපයුම් සේවා විධිමත්ව උපයෝගී කර ගැනීම තුළින් දේශීය හා විදේශීය වෙළෙඳපළ ප්‍රවේශයන් යථාවත් කිරීම හා ගවේශණය කිරීම.

(7). තේමාගත ක්ෂේත්‍රය : නිෂ්පාදකයා බලගැන්වීම

10. ග්‍රාමීය හා ගොවි ප්‍රජාව විසින් කෘෂිකාර්මික විශේෂඥතා ඥානය ලබා ගැනීම, ආර්ථිකමය ස්වාධීනත්වය ලභා කර ගැනීම සඳහා සුදුසු තීරණ වලට එළැඹීමේ හැකියාවන් වර්ධනය කිරීම සඳහා සහභාගිත්ව හා උපදේශකත්ව වැඩසටහන් ශක්තිමත් කිරීම.

11. කෘෂි යාන්ත්‍රිකරණය ට යොමු කෙරෙන්නාවූ හා නව තාක්ෂණයන්ට ප්‍රවේශය ලබා දෙන්නාවූ ඵලදායිතා පාදක දිරිගැන්වීම් ක්‍රමවේදයක් මඟින් කෘෂිකාර්මාන්තයෙහි නියැලෙන තරුණ හා කාන්තා ප්‍රජාව බලගැන්වීම.

(8). තේමා ගත ක්ෂේත්‍රය : දේශගුණ අනුවර්තනය හා අවදානම් කළමනාකරණය

12. ආහාර භෝග ක්ෂේත්‍රයන්හි දේශගුණික වෙනස්වීම් වලට ඔරොත්තුදීමේ හැකියාව වැඩි දියුණු කෙරෙන යෝග්‍ය අනුවර්තන හා බලපෑම් අවම කිරීමේ ක්‍රියාමාර්ග අනුගමනය කිරීම දිරිගැන්වීම.

13. දේශගුණික බලපෑම් හා වෙනත් ආකාරයේ ආපදා තත්ත්වයන්ට මුහුණ දීමට හැකි වන පරිදි නාගරික හා ග්‍රාමීය ප්‍රජාව සම්බන්ධ කර ගනිමින් ආහාර නිෂ්පාදන/ සැපයුම් පද්ධති ශක්තිමත් කිරීම.

(9). තේමා ගත ක්ෂේත්‍රය : දැනුම කළමනාකරණය සහ කෘෂි ව්‍යාපෘති සේවා

14. පර්යේෂණ , සංවර්ධන හා ව්‍යාපෘති සේවා කළමනාකරණය සහ කෘෂිකාර්මික අංශයට බඳවා ගැනීම් සම්බන්ධයෙන් මධ්‍යගත පාලනයක් සහිත තොරතුරු සංවර්ධන හා ප්‍රචාරණ පද්ධතියක් ස්ථාපිත කිරීම.

(10). තේමා ගත ක්ෂේත්‍රය: පාලනය හා මෙහෙයුම් කළමනාකරණය

15. තිරසාර කෘෂිකාර්මික සංවර්ධනයක් උදෙසා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, සුපරීක්ෂණය කිරීම හා ඇගයුම් සාර්ථකව ඉටුකර ගැනීම සඳහා ජාතික හා පළාත් පාලන මට්ටමින් වන පුළුල් පාර්ශවකාර සහභාගිත්වයත් සහිත ආයතනික සම්බන්ධීකරණ යාන්ත්‍රණයන් ශක්තිමත් කිරීම.

මූල්‍ය ප්‍රගතිය

ක්‍රියාත්මක සැලැස්මේ සඳහන් ක්‍රියාකාරකම්	සපුරාගත යුතු ඉලක්කය	වියදම් කළ මුදල	ඉලක්කය
1. ජාතික කෘෂිකර්ම ප්‍රතිපත්තියේ කෙටුම්පත සකස් කිරීම සඳහ වන උපදේශක කාරක සභා රැස්වීම්	0.80	1.33	වාර්තා 01
2. පාර්ශව කරුවන්ගේ උපදේශනය	0.41		උපදේශන 15
3. දැන්වීම්	1.35		
4.පත්‍රිකා හා ලේඛන සකස් කිරීමට අදාල ක්‍රියාකාරකම්	0.35		පුවත්පත් දැන්වීම් 1
5. පරිපාලන වියදම්	0.09		මුඟ්‍ය ප්‍රගතිය 44%
එකතුව	3.00		

අත්කරගත් භෞතික ප්‍රගතිය

ගරු කෘෂිකර්ම අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් පත්කරන ලද විද්වත් කමිටුවේ මූලිකත්වයෙන් සකස් කරන ලද ජාතික කෘෂිකර්ම ප්‍රතිපත්තියෙහි කෙටුම්පත ප්‍රධාන තේමා 10ක් යටතේ ප්‍රතිපත්ති ප්‍රකාශන 15ක් මගින් ප්‍රධාන ඉලක්ක 13 ක් සපුරා ගැනීම සඳහා සකසා ඇත.

එම කමිටුව මඟින් ජාතික කෘෂිකර්ම ප්‍රතිපත්තියෙහි කෙටුම්පත සකස් කිරීමෙන් අනතුරුව ත්‍රිභාෂාවෙන් සකස් කරන ලද පුවත්පත් දැන්වීමක් මඟින් මහජන අදහස් හා යෝජනා ලබා ගැනීමට කටයුතු කර කරන ලදි.

අනතුරුව ගොවි සංවිධාන, පුද්ගලික අංශය, විශ්ව විද්‍යාල ආචාර්යවරුන්, රජයේ නිලධාරීන් දැනුවත් කර අදහස් හා යෝජනා ලබා ගත් අතර එම අදහස් හා යෝජනා සියල්ල නැවත සමාලෝචනය කර මෙම ජාතික කෘෂිකාර්මික ප්‍රතිපත්තියෙහි වාර්තාව ත්‍රිභාෂාවෙන් සකස් කර අවසන් කරන ලදි.

ඒ අනුව යැපුම් කෘෂිකර්මයෙන් මිදී ඉල්ලුම මත පදනම් වූ නිෂ්පාදන ආර්ථිකයක් කරා ගමන් කිරීමට පරිසර හිතකාමී කෘෂිකාර්මික පද්ධතියක් ස්ථාපිත කිරීම සහ ඒ ඔස්සේ වස විසෙන් තොර ආහාර වේලක් පොදු ජනතාවට ලබාදීම ආනයන ආදේශ සහ අපනයනාභිමුඛ කෘෂිව්‍යාපාරයකත්වයක් ගොඩනැඟීම සහ ඒ සඳහා දිවයිනේ තරුණ ප්‍රජාව කෘෂිකර්මයේ විවිධ අංශයන් වෙත ආකර්ශණය කර ගැනීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින්, ඉහත දැක්වෙන ප්‍රතිපත්ති ඉලක්ක දහතුන 13 සාක්ෂාත් කර ගැනීම පිනිස ජාතික කෘෂිකර්ම ප්‍රතිපත්තියේ කෙටුම්පත ඉදිරිපත් කර ඇත.

2.කෘෂිකාර්මික කළමනාකරණ තොරතුරු පද්ධතිය ස්ථාපනය කර ක්‍රියාත්මක කිරීම

කෘෂිකර්ම ක්ෂේත්‍රයේ සියළුම පාර්ශවකරුවන්ගේ කාෂිකාර්මික තොරතුරු අවශ්‍යතාවය සපුරාගත හැකි වන පරිදි මෙම තොරතුරු පද්ධතිය නිර්මාණය කර ඇත. එමෙන්ම ප්‍රතිපත්ති සම්පාදකයන් හා සංවර්ධන සැලසුම් කරුවන්ට හට අවශ්‍ය කාලානුරූපී නිවැරදි යාවත්කාලීන දත්ත ලබා ගැනීමට හැකිවේ. වෙලඳපල මිල තීරණය , වගා හානි තීරණය කිරීම, නිෂ්පාදන විඛවතාවයන් මැන බැලීම, සහ ආර්ථික මධ්‍යස්ථාන, ගබඩා මෙම ජාලයට ඇතුලත් කිරීම මඟින් නිෂ්පාදන අතිරික්තය පිළිබඳ නිවැරදි තොරතුරු ලබා දිය හැකි වේ.

භෞතික හා මූල්‍ය ප්‍රගතිය

ක්‍රියාත්මක සැලැස්මේ සඳහන් ක්‍රියාකාරකම්	සපුරාගත යුතු මූල්‍ය ඉලක්කය(රු.මි)	වියදම් කළ මුදල (රු.මි)	ඉලක්කය	අත්කරගත් භෞතික ප්‍රගතිය
1. දැනුවත් කිරීමේ වැඩමුළු සහ සම්මන්ත්‍රණ පැවැත්වීම	1.91	0.24	දිස්ත්‍රික්ක 25	වැඩමුළු සහ සම්මන්ත්‍රණ සඳහා ප්‍රශ්නාවලියක් සකස් කර ඇත. මූලික නියැදි පරීක්ෂණ සිදුකර ඇත.ටැබ් පරිගනක මිලදි ගැනීම සඳහා අමාත්‍යමණ්ඩල අනුමැතිය ලැබී ඇත. කාෂිකර්ම දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් 06 පුහුණු වැඩමුළු පවත්වා ඇත.
2. තොරතුරු තාක්ෂණ අපකරණ මිලදි ගැනීම	1.00		පරිගණක කට්ටල 02	
3. පරිපාලන වියදම්	0.09			
එකතුව	**3.00**		ලබා ගත් මූල්‍ය ප්‍රගතිය 8%	

3.ගොවිජනසේවා මධ්‍යස්ථාන මට්ටමින් පාංශු පරීක්ෂණ පහසුකම් ස්ථාපනය කිරීම

හැඳින්වීම

තිරසාර සංවර්ධන අරමුණු (Zero Hunger -2) 2.1 සාගින්න තුරන් කිරීම 2.3, කෘෂිකාර්මික ඵලදායීතාවය දෙගුණ කිරීම, 2.4, ආහාර නිෂ්පාදන පද්ධති පැවැත්ම තහවුරු කිරීම සහ (Life on Land -15)15.9 වසර 2020 වනවිට ජාතික හා ප්‍රාදේශිය සැලසුම් වලට, සංවර්ධන ක්‍රියාවලියට. දරිද්‍රතාවය පිටුදැකීමේ ක්‍රමෝපායන්ට සහ ගිනුම්වලට පරිසර පද්ධති සහ ජීව විවිධත්වයේ වටිනාකම ඒකාබද්ධ කිරීම හා ජීව විවිධත්වයන් සහ පරිසර පද්ධති සංරක්ෂණය සහ තිරසාර අන්දමින් භාවිතයට ගැනීම හා තිරසාර ජීවනෝපාය පවත්වා ගැනීම (15.a) කරුණු සලකා බලමින් පාංශු ජෛවවිවිධත්වය ආරක්ෂා කර ගනිමන් නිෂ්පාදනය වේගවත් කිරීම සඳහා ගුණාත්මක පොහොර භාවිතයට යොමු විය යුත ඛ අවධාරණය කර ඇත. රසායනික පොහොර භාවිතය නිසා පසට සහ පාංශු ජලයට වන බලපෑමත් මිනිසාට වන අයහපත් බලපෑම් අවම කිරීමටත් වර්තමාන රජය මඟින් රසායනික පොහොර භාවිතය අවම කර කාබනික පොහොර භාවිතය සඳහා යොමු කිරීමට අරමුණු කර ඇත.

පාංශු පරීක්ෂාව,

ඉහත සඳහන් කරුණු හේතුකොට ගෙන පස් පරීක්ෂා කර වගා කරනු ලබන බෝග වර්ගය අනුව අවශ්‍ය පෝෂක ප්‍රමාණය නිර්දේශ කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කර ඇත.මෙම වැඩසටහන සඳහා පාංශු පරීක්ෂණ කට්ටල මිලදී ගැනීම හා ඒවා ගොවිජන සේවා මධ්‍යස්ථාන වලට බෙදා දීමේ කටයුතු ආරම්භ කර ඇත. මේ යටතේ එක් ගොවිජන මධ්‍යස්ථානයකට එක බැඟින් ගොවිජන මධ්‍යස්ථාන 562 ක සඳහා පාංශු පරීක්ෂණ කට්ටල ලබා දීමට තීරණය කර ඇත. ගොවි ජන සේවා මධ්‍යස්ථාන වල පාංශු පරීක්ෂණ පහසුකම් ස්ථාපනය කිරීම, (PH මීටර්, EC මීටර්, රසායනික ද්‍රව්‍ය ලබා දීම, නිලධාරීන් සඳහා පුහුණු වැඩමුළු 20 ක් පැවැත්වීම, පාංශු පරීක්ෂණ කාඩ්පත් 100,000 ක් සහ බැනර් 03 ක් සකස් කිරීමට සැලසුම් කර ඇත. මේ සඳහා වෙන් කරන ලද මුදල රු.මි 26.68 කි.

භෞතික ප්‍රගතිය

ක්‍රියාත්මක සැලසුම් අනුව ක්‍රියාකාරකම්	වෙන්කළ මුදල (රු.මි)	වියදම් කළ මුදල (රු.මි)	භෞතික ප්‍රගතියේ ඉලක්ක
ගොවිජන මධ්‍යස්ථාන 562 ක සඳහා පාංශු පරීක්ෂණ කට්ටල ලබා දීමට තීරණය කර ඇත. ගොවි ජන සේවා මධ්‍යස්ථාන වල පාංශු පරීක්ෂණ පහසුකම් ස්ථාපනය කිරීම,(PH මීටර්, EC මීටර්, රසායනික ද්‍රව්‍ය ලබා දීම,	**15.4**	23.12	ගොවිජන මධ්‍යස්ථාන 562 ක සඳහා පාංශු පරීක්ෂණ කට්ටල ලබා දීම
පුහුණු හා දැනුවත් කිරීම්	**1.0**		පුහුණු වැඩසටහන් 20 පැවැත්වීම
පාංශු පරීක්ෂණ කාඩ්පත් හා බැනර් මුද්‍රණය	**9.5**		කාඩ්පත් 1,000,000 හා බැනර් 3
පරිපාලන වියදම්	**0.78**		
එකතුව	**26.68**		

මූල්‍ය හා භෞතික ප්‍රගතිය

- මෙම ව්‍යාපෘතිය සඳහා රු.මි.26.68 වෙන් කර ඇත. රු.මි.23.12 ක් වියදම් කර ඇත. මූල්‍ය ප්‍රගතිය 87%කි.

ප්‍රගතිය -ප්‍රධාන ක්‍රියාකාරකම් අනුව

1. ගොවිජනසේවා මධ්‍යස්ථාන 562 සඳහා ජංගම පාංශු පරීක්ෂණ කට්ටල ලබා දීම

- ආහාර හා කෘෂිකර්ම සංවිධානය පාංශු පරීක්ෂණ කට්ටල 100 ක් ලබා දී ඇත.
- කෘෂිකර්ම අමාත්‍යාංශය මඟින් මිලදී ගන්නා පාංශු පරීක්ෂණ කට්ටල 362 මිලදීගෙන ඇත.
- දේශගුණ සුහුරු ව්‍යාප්තිය මඟින් පාංශු පරීක්ෂණ කට්ටල 100 ක් මිලදීගෙන ඇත.

2. කෘෂිකර්ම උපදේශකවරු හා කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන් පාංශු පරීක්ෂණ කට්ටල භාවිතා කර පස් පරීක්ෂා කිරීම සඳහා පුහුණු කිරීම

- මේ වනවිට මහනුවර. මාතලේ, ත්‍රිකුණාමලය, නුවරඑලිය, බදුල්ල, මොනරාගල, මාතර, ගාල්ල, හම්බන්තොට, මඩකලපුව, අම්පාර, අනුරාධපුරය, පොලොන්නරුව යන දිස්ත්‍රික් වැඩසටහන් පවත්වන ලදි.
- පුහුණු වැඩමුළු 40 ක් පවත්වා ඇත. (435 AI /ARPAS)
- නැගෙනහිර පලාත තුළ 50% පමණ පාංශු පරීක්ෂන සිදුකර ඇත. සාම්පල 3400 පරීක්ෂා කර ඇති අතර 750,000 පාංශු පරීක්ෂණ කාඩ් පත් මුද්‍රණය කර බෙදා ඇත.

4. තරුණ කෘෂිව්‍යවසායකයන් බලගැන්වීමේ වැඩසටහන

හැඳින්වීම

හදිසි වසංගත තත්ව යටත් අවදානම් කළමනාකරණය කර ගනිමින් වසර 2030 වන විට ළඟා කර ගැනීමට අපේක්ෂිත තිරසාර සංවර්ධන අරමුණ 2.3 අනුව කුඩා පරිමාණ ආහාර නිෂ්පාදකයන්ගේ, විශේෂයෙන් කාන්තාවන්ගේ, ස්වදේශික ජනයාගේ, (ග්‍රාමීය ගොවිජනතාව) ගොවිපවුල් වල කෘෂිකාර්මික ඵලදායීතාවය සහ ආදායම් සමාන ලෙස ඉහළ නැංවීම, අනෙකුත් නිෂ්පාදන සම්පත් හා ප්‍රදානයන්, දැනුම, මූල්‍ය සේවා , වෙළඳපොළ සහ වටිනාකම් එකතු කිරීම, ගොවිපල හා ගොවිපළ නොවන අංශයේ රැකියා අවස්ථාවන් ලබා දීම මඟින් නිෂ්පාදනය දෙගුණ කිරීම අපේක්ෂා කෙරේ. ජාතික කෘෂිකර්ම ප්‍රතිපත්තියේ සැලසුම් අනුව සහ අවශ්‍යතා ඇති ප්‍රජාවන්හි ග්‍රාමීය තරුණ තරුණියන් ඉලක්ක කර ඔවුන්ට සක්‍රීය ලෙස ආදායම් උත්පාදනය සඳහා අතහිත දීමට ගෙන ඇති පියවරක් ලෙස තරුණ කෘෂිව්‍යවසායකයන් බලගැන්වීමේ වැඩසටහන සිදුකර ඇත.

ක්‍රියාත්මක කරනු ලබන ආයතනය/අංශය,

- කෘෂි යෙදවුම් කළමනාකරණ අංශය / කෘෂිකර්ම අමාත්‍යාංශය
- දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ (මාතර/ගාල්ල/හම්බන්තොට/කළුතර)

මූල්‍ය ප්‍රගතිය

විස්තරය	වෙන් කළ මුදල (රු.මී)	වියදම් කළ මුදල (රු.මී)	මූල්‍ය ප්‍රගතිය (%)
කෘෂිකාර්මික තරුණ ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන	**6.5**	**1.91**	**29% බැඳීම් 0.15 (රු.මී)**

දිස්ත්‍රික්ක අනුව ලබා ගත් ප්‍රගතිය පහත දක්වා ඇත.

ගාල්ල දිස්ත්‍රික්කය

01) ව්‍යාපෘතිය - දෙහි සහ දොඩම් වගාව ප්‍රචලිත කිරීම -කරන්දෙණිය

හැඳින්වීම

ගාල්ල දිස්ත්‍රික්කයේ කරන්දෙණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ තෝරාගන්නා ලද පලතුරු ආශ්‍රිත කෘෂි නිෂ්පාදකයන් දිරි ගැන්වීම මෙන්ම වැල් දොඩම් වැනි පෝෂණ ගුණයෙන් අනූන එහෙත් සුලභව භාවිතයට නොගන්නා පලතුරු ආශ්‍රිත නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම මෙම ව්‍යාපෘතිය මඟින් අරමුණු කර ඇත. ව්‍යාපෘතිය සඳහා රු.මි 0.128 වෙන් කර ඇති අතර එම රු.මි. 0.128 වියදම් කර 100% මූල්‍ය ප්‍රගතියක් ලබා ඇත. ප්‍රදේශයේ කාන්තා ව්‍යාසායකයන් වැඩි වශයෙන් මෙම ව්‍යාපෘතියට දායක වී ඇත.

ක්ෂේත්‍ර නිලධාරීන් විසින් දෙහි සහ වැල්දොඩම් පැල බෙදා දීම සහ දැනුම්වත් කිරීම සිදුකරන ආකාරය පහත ක්ෂේත්‍ර ඡායාරූප මඟින් දක්වා ඇත.

ක්ෂේත්‍ර නිරීක්ෂණ දිනය - 2021.12.13 - 14





ස්ථානය - ඒ /හිපන්කන්ද ප්‍රජාශාලාව

සම්පත් දායකත්වය - කෘෂිකර්ම උපදේශක බුද්ධික මදුරංග (උරගස්මංහන්දිය)

සම්බන්ධීකරණ සංවර්ධන නිලධාරීන් - අයෝමා තිලකරත්න, නිලංකා හේමන්තමාලා

භෞතික ප්‍රගතිය

ක්‍රියාකාරකම් (ක්‍රියාත්මක සැලැස්ම අනුව)	ප්‍රතිපාදන (රු.මි.)	භෞතික ඉලක්කය	භෞතික ප්‍රගතිය
පුහුණු වැඩසහටන් පැවැත්වීම	0.0094625	පුහුණුවන්නන් 60	මූලික වටයේ ගොවීන් 90 ක් සඳහා පුහුණු වැඩසටහන් 1 පවත්වා ඇත.
දෙහි පැල මිලදී ගැනීම	0.065	පැල 300	එක් ප්‍රතිලාභියෙකුට දෙහි පැල 5 බැගින් දෙහි පැල 450 ක් ලබා දී ඇත.
වැල් දොඩම් පැල මිලදී ගැනීම	0.053	පැල 600	එක් ප්‍රතිලාභියෙකුට වැල්දොඩම් පැල 10 බැගින් පැල 900 ක් ලබා දී ඇත.
පරිපාලන වියදම් (3%)	0.0012875	ක්‍රියාත්මක සැලැස්ම අනුව භෞතික ඉලක්ක සපුරා ගෙන ඇත.	
මුළු මුදල	0.12875	රු.මි 0.128 වියදම් කර ඇත.	

02) ව්‍යාපෘතිය - මී මැසි පාලන ව්‍යාපෘතිය - කඩවත්සතර

හැඳින්වීම

ගාල්ල දිස්ත්‍රික්කයේ කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මී මැසි පාලනයට රුචිකත්වයක් දක්වන අඩු ආදායම් ලාභී ප්‍රතිලාභීන් 15 දෙනෙක් තෝරා දේශීය මී පැණි නිෂ්පාදනය වැඩි කිරීම හා වෙළඳපොළට ගුණාත්මයෙන් යුත මී පැණි ලබා දීම හා මී පැණි නිෂ්පාදන ව්‍යවසායකයන් බිහිකිරීම මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වේ . මී ඉටි වැනි අතුරු නිෂ්පාදන වැඩි දියුණු කිරීමත්, ඖෂධ නිෂ්පාදන සඳහා මී පැණි ලබා දීමත් මඟින් ග්‍රාමීය ව්‍යවසායකයන්ගේ ආර්ථිකය නගා සිටුවීමට උපකාරී වේ. තවද මීමැසි වගාව ආශ්‍රිතව ආර්ථිකව වාසිදායක මල් වගාවද ප්‍රචලිත කළහැකි වේ. ප්‍රාදේශීයව කුඩා ගොවි ඒකක මඟින් සිදුකරන මීපැණි නිෂ්පාදන ඒකක වැඩි කිරීම මඟින් වඩාත්

ආර්ථික ප්‍රතිලාභ ලබා ගත හැකිවනු ඇත. ව්‍යාපෘතිය සඳහා රු.මි 0.112 ක් ලබා දී ඇති අතර රු.මි 0.112 වියදම් කර 100 % මූල්‍ය ප්‍රගතියක් ලබා ගෙන ඇති අතර තෝරාගත් ප්‍රතිලාභීන් 15 ගේ පුහුණු අවශ්‍යතා සපුරාගන්නා ආකාරය සහ අවශ්‍ය තාක්ෂණික යෙදවුම් ලබා දී ඇති ආකාරය පහත දක්වා ඇත.





ක්ෂේත්‍ර නිරීක්ෂණ දිනය - 2021.11.19
ස්ථානය - කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානය, පෝද්දිවල
සම්පත් දායකත්වය - ගොවිපළ කළමනාකරු
සංවර්ධන නිලධාරී - එන්.එම්.ඩබ්. චන්ද්‍රකාන්ති

භෞතික ප්‍රගතිය

ක්‍රියාකාරකම් (ක්‍රියාත්මක සැලසුම් අනුව)	ප්‍රතිපාදන (රු.මී.)	භෞතික ඉලක්කය	භෞතික ප්‍රගතිය
පුහුණු වැඩසහටන්	0.00965	ප්‍රතිලාභීන් 15	ප්‍රතිලාභීන් 15 සඳහා පුහුණු වැඩසටහන පවත්වා ඇත. ඉලක්ක කරන ලද මී මැසි පෙට්ටි 15, ජනපද 15, මුහුණු ආවරණ 15, සහ දුම් විසුරුවන 15 තෝරාගත් ප්‍රතිලාභීන් 15 සඳහා ලබා දී ඇත.
මීමැසි පෙට්ටි මිලදී ගැනීම	0.0275	මී මැසි පෙට්ටි 15	
මීමැසි ජනපද මිලදී ගැනීම	0.03375	මීමැසි ජනපද 15	
මුහුණු ආවරණ මිලදී ගැනීම	0.01125	මුහුණු ආවරණ 15	
දුම් විසුරුවන මිලදී ගැනීම	0.03	දුම් විසුරුවන 15	
පරිපාලන වියදම්	0.00335	ක්‍රියාත්මක සැලැස්මේ සඳහන් මූල්‍ය හා භෞතික ඉලක්කය 100% සපුරාගෙන ඇත.	
මුළු මුදල	0.1155		

03) ව්‍යාපෘතිය - තුඹ කරවිල වගා ව්‍යාපෘතිය - ගාල්ල

හැඳින්වීම

ගාල්ල දිස්ත්‍රික්කයේ කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ තෝරා ගන්නා ලද ව්‍යවසායකින් 50 දෙනෙකුගේ පවතින භූමිය ඵලදායී ලෙස භාවිතයට ගනිමින් පෝෂණ ගුණය සහිත පාරම්පරික ආහාරයක් වන තුඹ වගාව සුලභ කිරීම අරමුණු කර ඇත. වෙළඳ පොළෙහි තුඹ කරවිල මිල ඉතා ඉහළ බැවින් ග්‍රාමීය තුඹ වගා කරුවන්ගේ ආර්ථිකය ශක්තිමත් කිරීමට හැකිවනු ඇත. මෙම ව්‍යාපෘතිය සඳහා වෙන් කළ මුදල රු.මි 0.04325 ක් වන අතර වියදම් කළ මුදල රු.මි 0.04275 ක්වේ.එමෙන්ම 2022 වසරේ දී කඩවත් සතර ප්‍රදේශීය ලේකම් කොට්ඨාශය තුළ **තුඹ** කරවිල වගාව සඳහා යොමුවන්නන්ගේ ප්‍රතිශතය 25% කින් ඉහළ නැංවීමද ඉලක්ක කර ඇත.කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල තුඹ කරවිල වගාකරුවන් හට පැල බෙදා දීම සහ එම පැල සිටුවා ඇති ආකාරය පිළිබඳ නිරීක්ෂණ පහත දක්වා ඇත.




2021.11.01
ස්ථානය - ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
සම්පත් දායකත්වය - කෘෂිකර්ම උපදේශක
සම්බන්ධීකරණය - කේ.එච්. මිහිෂාණි (සංවර්ධන නිලධාරී)

භෞතික ප්‍රගතිය

ක්‍රියාකාරකම් (ක්‍රියාත්මක සැලසුම් වලට අනුව)	ප්‍රතිපාදන (රු.මී.)	භෞතික ඉලක්කය	භෞතික ප්‍රගතිය
පුහුණු වැඩසහටන් පැවැත්වීම	0.01149	ප්‍රතිලාභීන් 50	ප්‍රතිලාභීන් 50 ක් සඳහා පුහුණු වැඩසටහන පවත්වා රු.500.00 මුදලක් නැවත ප්‍රතිපූර්ණය කර ඇත.
රෝපණ ද්‍රව්‍ය ලබා ගැනීම	0.0305	පැල 400	එක් ප්‍රතිලාභියෙකුට පැල 8 බැගින් පැල 400 ලබා දී ඇත.
පරිපාලන වියදම්	0.00126	රුපියල් 500/= නැවත ප්‍රතිපූර්ණය කර ඇත.	
මුළු මුදල	0.04325		

04) ව්‍යාපෘතිය - බිම්මල් වගාව - හබරාදූව

හැඳින්වීම

නිර්මාංශයෙන් හා වසවිසෙන් තොර ආහාර සඳහා ජනතාවගේ උනන්දුව ඇති වීමත් සමඟ වෙළඳපොළ තුළ බිම්මල් ආශ්‍රිත නිෂ්පාදන සඳහා ඉහළ ඉල්ලුමක් නිර්මාණය වී ඇත. බිම්මල් වගාව සඳහා ඉහළ විභවයක් පවතින ගාල්ල දිස්ත්‍රික්කයේ හබරාදූව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වාණිජ බිම්මල් වගාව ප්‍රචලිත කිරීම තුලින් වගාව නිෂ්පාදනය ප්‍රවර්ධනය, පෝෂණ අවශ්‍යතා නැංවීම හා ස්වයං රැකියා බිහිකිරීම මෙන්ම ගෘහාශ්‍රිත කාන්තා ව්‍යාසායකයන් ඉහළ නැංවීම අපේක්ෂා කර ඇත. කෘමි පලිබෝධ හානිවලින් තොර බිම්මල් නිෂ්පාදන ය මඟින් ගුණාත්මක බවින් ඉහළ නිෂ්පාදන ග්‍රාමීය වළෙඳපොලට ලබා දීමට හැකි වනු ඇත. මෙම ව්‍යාපෘතිය සඳහා රු.මී 0.106 ක් වෙන් කරන ලද අතර රු.මී 0.095 ක් වියදම් කර ඇත.

ක්ෂේත්‍ර නිරීක්ෂණය -2021.10.11
ස්ථානය - ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, හබරාදූව
සම්පත් දායකත්වය - කෘෂිකර්ම උපදේශක
සම්බන්ධීකරණය - කේ.එස්.අමාලි (සංවර්ධන නිලධාරී)





ක්‍රියාකාරකම (ක්‍රියාත්මක සලසුම් අනුව)	ප්‍රතිපාදන (රු.මී.)	භෞතික ඉලක්කය	භෞතික ප්‍රගතිය
දැනුවත් කිරීමේ වැඩසහටන්	0.005	වැඩසටහන් 1	පුහුණු වැඩසටහන පවත්වා ඇත
කෘමි ප්‍රතිරෝධී ඊශ්‍රායල් දැල ලබා දීම	0.10185	කෘමි ප්‍රතිරෝධී දැල් 21	ප්‍රතිලාභීන් 17 ක් සඳහා ඊශ්‍රායල කෘමි ප්‍රතිරෝධී දැල් 18 ක් ලබා දී ඇත. රු.12,047 ප්‍රතිපූර්ණය කර ඇත.
පරිපාලන වියදම්	0.0013	රුපියල් 0.012 ක් ප්‍රතිපූර්ණය කර ඇත.	
මුළු මුදල	0.10815		

05) ව්‍යාපෘතිය- බිම්මල් වගාවේ ඵලදායීතාව ඉහල නැංවීමට වගා ගෘහ සඳහා ස්වයංක්‍රීය ජල විහිදුම් කට්ටල ලබා දීම - යක්කලමුල්ල

හැඳින්වීම

ගාල්ල දිස්ත්‍රික්කයේ යක්කලමුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සාර්ථකව බිම්මල් වගාවේ නිරත වන ව්‍යවසායකයින් 05 සඳහා බිම්මල් වගාවේ ඵලදායීතාව ඉහළ නැංවීමට වගා ගෘහ සඳහා ස්වයංක්‍රීය ජල විහිදුම් කට්ටල ලබා දීම මඟින් ප්‍රාථමික මට්ටමේ සිටින බිම්මල් වගාකරුවන් නගා සිටුවීම, නව කෘෂි ව්‍යවසායකයින් දිරිමත් කිරීම, බිම්මල් වගාවට පවතින රෝග හා පළිබෝධ පාලනය කිරීම හා අගය එකතු කළ නිෂ්පාදන කරන ව්‍යාවසායකයින්ට අමුද්‍රව්‍ය සැපයීමට අවස්ථාවක් සලසා දීම මෙම ව්‍යාපෘතියෙන් අරමුණු කර ඇත. ඒ සඳහා වෙන් කළ මුදල රු.මී 0.04 වන අතර වියදම් කළ මුදල රු.මී0.04 ක් වේ.

2021.10. 26
ස්ථානය- වෙළන්දාව වසම - කේ.ඒ. මානෙල් රේණුකා මිය





භෞතික ප්‍රගතිය

ක්‍රියාකාරකම	ප්‍රතිපාදන (රු.මී.)	භෞතික ඉලක්කය	භෞතික ප්‍රගතිය
ස්වයංක්‍රීය ජල විහිදුම් කට්ටල ලබා දීම (50% ප්‍රතිලාභීදායකත්වය)	0.0375	ජල විහිදුම් කට්ටල 5	ප්‍රතිලාභීන් 3 ක් සඳහා ස්වයංක්‍රීය ජල විහිදුම් කට්ටල ලබා දී ඇත.
පරිපාලන වියදම් (3%)	0.001125		
මුළු මුදල	0.038625		

හම්බන්තොට දිස්ත්‍රික්කය

01) විසිරුම් ජල සම්පාදනය යටතේ එළවළු වගාව බදගිරිය - රු.මී. 0.9579

හැඳින්වීම

හම්බන්තොට දිස්ත්‍රික්කයේ හම්බන්තොට හා ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වලට අයත් බදගිරිය ගොවිජන සේවා බල ප්‍රදේශයේ බදගිරිය කෘෂිකර්ම උපදේශක කොට්ඨාශය තුල වාණිජ මට්ටමින් එළවළු වගා කරන ගොවීන් 15 දෙනෙකු සඳහා ජල ගැටළුව විසඳීම මඟින් යහපත් කෘෂිකාර්මික පිළිවෙත් (GAP) නිර්දේශ වලට අනුගත කරවීමෙන් බෝග ඵලදායීතාව සහ නිෂ්පාදනය ප්‍රමාණාත්මකව හා ගුණාත්මකව ඉහළ දැමීමත් අඛණ්ඩව එළවළු නිෂ්පාදනය කිරීම තුලින් ආහාර සුරක්ෂිතතාවය ඇති කිරීම මෙම ව්‍යාපෘතිය මඟින් අරමුණු කර ඇත. වෙන්කල මුදල (රු.මී) 0.95ක් වන අතර වියදම් කළ මුදල (රු. මිලි.) 0.07 ක් වේ. බදගිරිය කෘෂිකර්ම උපදේශක විසින් සිදුකරන ලද ක්ෂේත්‍ර නිරීක්ෂණ ඇතුලත් ඡායාරූප මඟින් එළවළු වගා කටයුතු සිදුකරන ආකාරය පහත දක්වා ඇත.





භෞතික ප්‍රගතිය

ක්‍රියාකාරකම	ප්‍රතිපාදන (රු.මී.)	භෞතික ඉලක්කය	භෞතික ප්‍රගතිය
අක්කර ½ ජල විසුරුම් පද්ධති මිලදී ගැනීම	0.675	ජල විසුරුම් පද්ධති 15	ඩොලරයට සාපේක්ෂව විසුරුම් ජල පද්ධති වල මිල ඉහල යාම, නියමිත සැපයුම් කරුවෙකු නොමැති වීම, ගොවීන්ගේ දායකත්වය පසුගාමී වීම වැනි ගැටළු හේතුවෙන් ඉලක්ක කළ ආකාරයෙන් ව්‍යාපෘතිය සිදු කිරීමට නොහැකි වී ඇත.
ඩීසල් ජල පොම්ප මිලදී ගැනීම (අහල් 3 අශ්ව බල 7)	0.13	ජල පොම්ප 2	
ඩීසල් ජල පොම්ප මිලදී ගැනීම (අහල් 2 අශ්ව බල 5)	0.55	ජල පොම්ප 1	
නැප්සැක් දියර ඉසින යන්ත්‍ර මිලදී ගැනීම (ලීටර 16)	0.07	නැප්සැක් දියර ඉසින යන්ත්‍ර 7	
ප්‍රතිලාභීන් සංඛ්‍යාව		15	15 බදගිරිය
පුහුණු වැඩමුළු		1	පුහුණු වඩමුළුව පවත්වා ක්ෂේත්‍ර නිරීක්ෂණ සිදුකර ඇත.
ක්ෂේත්‍ර නිරීක්ෂණ සංඛ්‍යාව		30	
පරිපාලන වියදම් (3%)	0.0279		
මුළු මුදල	0.9579		

03) හම්බන්තොට දිස්ත්‍රික්කය තුල උඳු වගාව හඳුන්වා දීම සහ නිෂ්පාදනය ඉහළ නැංවීම

හැඳින්වීම

හම්බන්තොට අන්තර් පලාත් බල ප්‍රදේශයේ බෙරළිහෙල, වීරවිල, බඳගිරිය, ලුණම, අම්බලන්තොට සහ මයුරපුර යන ගොවිජන සේවා බල ප්‍රදේශයන් වල තෝරාගත් ගොවීන් 25 දෙනෙකු යොදා ගනිමින් 2021 යල කන්නය තුලදී හෙක්ටයාර 100 ක භූමි ප්‍රමාණයක් සඳහා අවශ්‍ය උඳු බීජ කි.ග්‍රෑ. 3,000 ක් නිපදවා ගැනීම අපේක්ෂා කර ඇත. මෙම ව්‍යාපෘතිය සඳහා වෙන්කල මුදල (රු. මිලි.) 3.780000 ක් වන අතර වියදම් කළ මුදල (රු. මිලි.) 0.227868 ක් වේ. බෙරලිහෙල කෘෂිකර්ම උපදේශක විසින් සිදුකරන ලද ක්ෂේත්‍ර නිරීක්ෂණ පහත දක්වා ඇත.





ක්ෂේත්‍ර නිරීක්ෂණ - බෙරලිහෙල කෘෂිකර්ම උපදේශක විසින් සිදුකරන ලද ක්ෂේත්‍ර නිරීක්ෂණ

භෞතික ප්‍රගතිය

ක්‍රියාත්මක සැලැස්මේ සඳහන් ක්‍රියාකාරකම්	සපුරාගත යුතු ඉලක්කය	අත්කරගත් භෞතික ප්‍රගතිය
1. අක්කර ½ විසිරුම් පද්ධති 25	25	-
2. උඳු බීජ 125kg	125kg	125kg නිෂ්පාදනය කර ඇත.
3. උඳු බීජ 2000kg වගා කල ගොවින්ගෙන් මිලදී ගැනීම	2000kg	-
4. පුහුණු වැඩමුළු 07	07	01
සංවර්ධන වැඩසටහන සිදුකල ප්‍රදේශය	බෙරලිහෙල, වීරවිල, බඳගිරිය, ලුණම, අම්බලන්තොට, මයුරපුර, කල්තොට.	
ප්‍රතිලාභීන් සංඛ්‍යාව	24	
සිදු කරන ලද පුහුණු වැඩමුළු	01	
ක්ෂේත්‍ර නිරීක්ෂණ සංඛ්‍යාව	50	

02) බිත්තර වී නිෂ්පාදනයට යාන්ත්‍රීකරණය හඳුන්වාදීම, වීරවිල කෘෂිකර්ම උපදේශක කොට්ඨාශය -

හම්බන්තොට දිස්ත්‍රික්කයේ ලුණුගම්වෙහෙර හා තිස්සමහාරාමය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වලට අයත් විරවිල කෘෂිකර්ම උපදේශක කොට්ඨාශය තුල වී වගාවන් සඳහා යාය 2 වැඩසටහන යටතේ ගුණාත්මක බිත්තර වී නිෂ්පාදනයට හා බිත්තර වී වල පාරිශුද්ධතාවය වැඩි කිරීමට වල් පැල මර්ධනය අඛණ්ඩව සිදු කිරීමට තණකොළ කපන යන්ත්‍ර ලබා දීම. වෙන්කල මුදල (රු. මිලි.) 0.72වියදම් කල මුදල (රු. මිලි.) 0.61කි.

ක්ෂේත්‍ර නිරීක්ෂණ සහ භෞතික ප්‍රගතිය පහත දක්වා ඇත.
ක්ෂේත්‍ර නිරීක්ෂණය - ලුනම කෘෂිකර්ම උපදේශක විසින් සිදු කර ඇත.





භෞතික ප්‍රගතිය

ක්‍රියාකාරකම	ප්‍රතිපාදන (රු.මි.)	භෞතික ඉලක්ක	භෞතික ප්‍රගතිය
බිත්තර වී නිෂ්පාදනය කරන ගොවීන් සඳහා තණ කොළ කපන යන්ත්‍ර මිලදී ගැනීම හා බෙදා හැරීම	0.70	කොළ කපන යන්ත්‍ර 70	තණ කොළ කපන යන්ත්‍ර 70 ගොවීන්ට ලබා දී ඇත.
ප්‍රතිලාභීන්		70	ප්‍රතිලාභීන් 70 සඳහා යන්ත්‍ර ලබා දී ඇත.
ක්ෂේත්‍ර නිරීක්ෂණ		80	රු.මි 0.61ක් වියදම් කර ඇති අතර මූල්‍ය ප්‍රගතිය 84%
පරිපාලන වියදම් 3%	0.021		
එකතුව	0.721		

මාතර දිස්ත්‍රික්කය

01) ව්‍යාපෘතිය - මී මැසි පාලනය ප්‍රචලිත කිරීම - මාලිම්බඩ

මාතර දිස්ත්‍රික්කයේ මාලිම්බඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ජීවත් වන ග්‍රාමීය ජනතාවගේ ආර්ථිකය ශක්තිමත් කිරීම, මී මැසි පාලනය වැඩිදියුණු කිරීම තුළින් මී පැණි නිෂ්පාදනය ඉහළ නැංවීම, කොට්ඨාශය තුළ මී මැසි ගම්මානයක් ස්ථාපිත කිරීම, මී මැසි ජනපද බෝකර ගැනීම පිළිබඳ නිපුනතා සහිත ව්‍යවසායකයින් බිහිකිරීම, අදායම් උත්පාදනය සඳහා තරුණ කෘෂි ව්‍යවසායකත්වය දිරිගැන්වීම අරමුණු කර ඇත. වෙන්කළ මුදල (රු.මි) 0.173 ක් වන අතර වියදම් කළ මුදල, රු.මි 0.17 ක් වේ.





ක්ෂේත්‍ර නිරීක්ෂණය

2021.12.24 දින හොරගොඩ බටහිර - හොරගොඩ ප්‍රදේශයේ මී මැසි ව්‍යාපෘතිය සාර්ථකව සිදුවන ආකාරය සංවර්ධන නිලධාරී බිමාලී උදයංගිකා විසින් නිරීක්ෂණය කර ඇති ආකාරය පහත දක්වා ඇත

අත්කර ගත් භෞතික ප්‍රගතිය

ක්‍රියාකාරකම	ප්‍රතිපාදන (රු.මි.)	භෞතික ඉලක්කය	භෞතික ප්‍රගතිය
තෝරාගත් ප්‍රතිලාභීන් සඳහා පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසහටන්	0.00626	වැඩසටහන් 2	පුහුණු වැඩසටහන් 2ක් පවත්වා ඇත.
මීමැසි පාලනය සඳහා මීමැසි පාලක උපකරණ, මුහුණු ආවරණ සහ ධූම යන්ත්‍ර මිලදී ගැනීම සහ ප්‍රවාහනය කිරීම	0.1625	ගොවීන් 30 සඳහා	ඉලක්ක කරන ලද ප්‍රතිලාභීන් 30 සඳහා මීමැසි පාලක උපකරණ, මුහුණු ආවරණ සහ ධූම යන්ත්‍ර මිලදී ගෙන ප්‍රවාහනය කර ඇත. ව්‍යාපෘතිය 70 % භෞතික ප්‍රගතියක් අත්පත් කරගෙන ඇත.
ප්‍රතිලාභීන් සංඛ්‍යාව		30	
සිදුකරන ලද පුහුණු වැඩමුළු ක්ෂේත්‍ර නිරීක්ෂණ සංඛ්‍යාව		02 02	පුහුණු වැඩමුළු සහ ක්ෂේත්‍ර නිරීක්ෂණ අවසන් කර ඇත.
පරිපාලන වියදම්	0.0065925		වියදම් කළ මුදල, රු.මී 0.17 ක් වන අතර මූල්‍ය ප්‍රගතිය 100%
මුළු මුදල	0.1738228		

02) මී මැසි පාලන ව්‍යාපෘතිය - මාතර (කොටපොළ)

මාතර දිස්ත්‍රික්කයේ කොටපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බෙලිඅත්ත කුඹුර ග්‍රාම නිලධාරී වසම තුළ මී මැසි පාලනය සිදු කරනු ලබන තරුණ ප්‍රතිලාභීන් 30 කෘෂිකාර්මික ව්‍යවසායකත්වය සඳහා මී මැසි පාලනය වැඩිදියුණු කිරීම මඟින් එම ග්‍රාමීය ජනතාවගේ ආර්ථිකය ශක්තිමත් කිරීම,කොට්ඨාසය තුල මී පැණි සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන ඉහල නැංවීම (මී පැණි, මී ඉටි, රාජ ජල්ලි) මඟින් මී පැණි නිෂ්පාදනයේ යෙදෙන ප්‍රජාවගේ ආර්ථිකය ශක්තිමත් කිරීම අරමුණු කර ඇත. මෙම ව්‍යාපෘතිය සඳහා වෙන් කළමුදල රු.මී 0.72ක් වන වියදම් කළ මුදල රු.මී 0.17 කි.

ක්ෂේත්‍ර නිරීක්ෂණය - 2021.12.03 දින බෙලිඅත්ත කුඹුර - වතුරාව ප්‍රදේශයේ මී මැසි ජනපද පිහිටුවා ඇති ආකාරය පිළිබඳව ක්ෂේත්‍ර නිරීක්ෂණය සිදුකරන ආකාරය -

පී.රසිකා කුමාරී,ඩබ්. කේ . නුවන් දර්ශන, චන්දන හෙට්ටිආරච්චි යන නිලධාරීන් මෙම ක්ෂේත්‍ර නිරීක්ෂණයන් සිදුකර ඇත.





භෞතික ප්‍රගතිය

ක්‍රියාකාරකම	ප්‍රතිපාදන (රු.මි.)	භෞතික ඉලක්කය	භෞතික ප්‍රගතිය
තෝරාගත් ප්‍රතිලාභීන් සඳහා පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසහටන්	0.01066	වැඩසටහන් 1	පුහුණු වැඩසටහන සාර්ථකව පවත්වා ඇත.
මී මැසි පාලන පෙට්ටි මිලදී ගැනීම හා ප්‍රවාහනය	0.1535	මී මැසි පාලන පෙට්ටි 150 (එක් ගොවියෙක් සඳහා 5)	ප්‍රතිලාභීන් 32 ක් සඳහා මී මැසි පෙට්ටි 170 ක් ලබාදීම මඟින් ව්‍යවසායකත්වය සඳහා දිරිගැන්වීම
සිදුකරන ලද පුහුණු වැඩමුළු ක්ෂේත්‍ර නිරීක්ෂණ සංඛ්‍යාව		02 08	02 08
පරිපාලන වියදම් (3%)	0.0049248		වියදම් කළමුදල (රු.මි 0.17කි.)
මුළු මුදල		0.1690848	

<u>කළුතර දිස්ත්‍රික්කය</u>

01) කළුතර දිස්ත්‍රික්කය තුල අගය එකතු කළ නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම තුළින් කුඩා කෘෂි ව්‍යාපාර දිරි ගැන්වීම

ප්‍රා.ලේ.කො : මිල්ලනිය (ග්‍රා.නි.වසම් : බැල්ලන්තුඩාව, පරගස්තොට, කෙසෙල්ගමුව) ඉංගිරිය (ග්‍රා.නි.වසම : කැකුළුදොළ) ප්‍රාදේශීයව අතිරික්තව නිෂ්පාදනය වන කෘෂි නිෂ්පාදනය සඳහා අගය එක් කල නිෂ්පාදනය සැකසීම තුලින් කුඩා ව්‍යාපාර දිරි ගැන්වීම මූලික අරමුණු කර ගෙන කෘෂි නිෂ්පාදන අළෙවිය ප්‍රවර්ධනය, ස්වයං රැකියා ඇති කිරීම හා කෘෂි නිෂ්පාදන සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේදයන්ට අනුව සංරක්ෂණය කිරීම වෙන්කළ මුදල (රු.මි) 0.2678 වියදම් කළ මුදල (රු.මි) 0.2678

ක්ෂේත්‍ර නිරීක්ෂණය- 2021.11.17 / 2021.11.30 දින මිල්ලනිය - කෙලෙස්ගමුව ක්ෂේත්‍ර අධීක්ෂණ කමිටුව / විෂයභාර නිලධාරී හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කෘෂි සංවර්ධන නිලධාරී විසින් සිදුකරන ක්ෂේත්‍ර නිරීක්ෂණ ඇතුලත් ඡායාරූප පහත දක්වා ඇත.



2021.11.30 -තැම්බූ සහල් නිෂ්පාදනය සඳහා වූ ස්ටීමරය සහ තැම්බූ සහල් නිෂ්පාදනය සඳහා වී



භෞතික ප්‍රගතිය

ක්‍රියාත්මක සැලැස්මේ සඳහන් ක්‍රියාකාරකම්	සපුරාගත යුතු ඉලක්කය	අත්කරගත් භෞතික ප්‍රගතිය
ප්‍රතිලාභීන් තෝරාගැනීම	ප්‍රතිලාභීන් 10	ප්‍රතිලාභීන් 04
පුහුණු වැඩසටහන් පැවැත්වීම	පුහුණු වැඩමුළු 01	පුහුණු වැඩමුළු 01
ප්‍රතිලාභ ලබා දීම	නිෂ්පාදන ඒකක 10	නිෂ්පාදන ඒකක 04
ප්‍රතිලාභීන් සංඛ්‍යාව	04	
සිදුකරන ලද පුහුණු වැඩමුළු ක්ෂේත්‍ර නිරීක්ෂණ සංඛ්‍යාව	01 08 (ප්‍රතිලාභීන් තෝරාගැනීම -04, ප්‍රතිලාභ ලබා දීමෙන් පසු - 04)	

02) කෘෂි අපනයන ගම්මාන ස්ථාපිත කිරීමේ වැඩසටහන - රු.මි. 25.0

හැඳින්වීම

මෙම වැඩසටහන මඟින් ග්‍රාමීය තරුණ ප්‍රජාව ඇතුළු ගොවි ජනතාව ඒකරාශි කරමින් ජාතික හා ජාත්‍යන්තර වෙළඳපොළ යන වෙළඳ පළ ද්විත්වයම ඉලක්ක කොට නිෂ්පාදන සිදු කිරීමට අපේක්ෂිතය. මෙම ව්‍යාපෘතිය සඳහා වෙන් කළ මුදල රු. 10,238,400.00 කි. වියදම් කළ මුදල රු. 7,581,008.00 කි.

අරමුණු

- තරුණ ව්‍යවසායකයින් සඳහා නව කෘෂි තාක්ෂණික සොයා ගැනීම් සඳහා පහසුකම්කරණය

ක්‍රියාත්මක කරනු ලබන ආයතනය/අංශය,

- කෘෂි යෙදවුම් කළමනාකරණ අංශය / කෘෂිකර්ම අමාත්‍යාංශය
- දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ (මාතර/ගාල්ල/හම්බන්තොට/කළුතර)

නුවරඑළිය දිස්ත්‍රික්කය

01) ව්‍යාපෘතිය - නව වගා තාක්ෂණය හා යහපත් කෘෂිකාර්මික පිළිවෙත් භාවිතයෙන් බෝග වගා කිරීම, හඟුරන්කෙත

හැඳින්වීම

මධ්‍යම පළාතේ නුවරඑළිය දිස්ත්‍රික්කයේ හඟුරන්කෙත සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ කලාපයේ සාම්ප්‍රදායික එළවළු වගා කරන ගොවීන් සඳහා නව කෘෂිකාර්මික තාක්ෂණික ක්‍රම හා යහපත් කෘෂිකාර්මික පිළිවෙත් හඳුන්වාදීම තුලින් දේශීය හා විදේශීය වෙළඳපොළ වෙත ගුණාත්මක නිෂ්පාදනයන් ඉදිරිපත් කිරීම යහපත් කෘෂිකාර්මික පිළිවෙත් මගින් කෘෂි නිෂ්පාදන වල ගුණාත්මක තත්ත්වය ආරක්ෂා කිරීම, ජලය කාර්යක්ෂමව භාවිතා කිරීම, නව තාක්ෂණය හරහා බෝග නිෂ්පාදනය සඳහා වන පිරිවැය අවම කිරීම, අපනයන වෙළඳපොල ඉලක්ක කරගත් වගාවක් තුළින් රටට විදේශ පිරිවැය ලබා ගැනීම හා ගොවීන්ගේ ආදායම ඉහළ නැංවීම වෙන් කළ මුදල රු. මි.4.8 වියදම් කළ මුදල (රු.මි) රු. මිලියන 4.49කි.

ක්ෂේත්‍ර නිරීක්ෂණය

හඟුරන්කෙත සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ කලාපය,ජයලත් බණ්ඩාර මහතා දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ සහ ආර්.එස්.සිරිවන්ද්‍ර, නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ විසින් 2022.01.27 දින සිදුකරන ලද ක්ෂේත්‍ර නිරීක්ෂණය.

හඟුරන්කෙත සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ කලාපය - මිලදී ගත් බිංදු ජලසම්පාදන කට්ටල සහ පොලිතීන් වසුන් යොදා ඇති ආකාරය පහත දක්වා ඇත.



භෞතික ප්‍රගතිය -

ක්‍රියාත්මක සැලැස්මේ සඳහන් ක්‍රියාකාරකම්	සපුරාගත යුතු ඉලක්කය	අත්කරගත් භෞතික ප්‍රගතිය
1.ප්‍රතිලාභීන් තෝරාගැනීම	ප්‍රතිලාභීන් 30	ප්‍රතිලාභීන් 30
2.විදුලි වැට මිළදී ගැනීම	විදුලි වැට 30	විදුලි වැට 30
3.බිංදු ජල සම්පාදන කට්ටල හා පොලිතින් වසුන් මිළදී ගැනීම	බිංදු ජල සම්පාදන කට්ටල 30 පොලිතින් වසුන් 60	බිංදු ජල සම්පාදන කට්ටල 30 පොලිතින් වසුන් 60
4.කාබනික පොහොර මිළදී ගැනීම	කාබනික පොහොර 7200 KG	කාබනික පොහොර 7200 KG
5.කෘමි ප්‍රතිරෝදක දැල් මිළදී ගැනීම	කෘමි ප්‍රතිරෝදක දැල් 30	කෘමි ප්‍රතිරෝදක දැල් 30
6.පරිපාලන වියදම්	රු. 180000	-
සංවර්ධන වැඩසටහන සිදුකළ ප්‍රදේශය (දිස්ත්‍රික්කය/ග්‍රාම නිලධාරී වසම)	නුවරඑළිය දිස්ත්‍රික්කය - හඟුරන්කෙත සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ කලාපය	
ප්‍රතිලාභීන් සංඛ්‍යාව	30 යි	
සිදුකරන ලද පුහුණු වැඩමුළු ක්ෂේත්‍ර නිරීක්ෂන සංඛ්‍යාව	පුහුණු වැඩමුළු - 05 ක්ෂේත්‍ර නිරීක්ෂන - 20	

මහනුවර දිස්ත්‍රික්කය

01) ව්‍යාපෘතිය - උසස් තාක්ෂණය හඳුන්වා දීම තුලින් මහනුවර දිස්ත්‍රික්කයේ එළවළු සැපයුම් දාමය ශක්තිමත් කිරීම

හැඳින්වීම

උසස් තාක්ෂණය හා යහපත් කෘෂිකාර්මික පිළිවෙත් හරහා උසස් තත්ත්වයේ එළවළු ලබා ගැනීමේ හැකියාව වැඩි කිරීම මඟින් දේශීය පාරිභෝගිකයින් ආරක්ෂා කිරීම සහ දේශීය නිෂ්පාදකයින්ට හොඳ අපනයන වෙළඳපොළක් ඇති කිරීම, උසස් තාක්ෂණය හඳුන්වාදීම තුළින් මහනුවර දිස්ත්‍රික්කයේ එළවළු සැපයුම් දාමය ශක්තිමත් කිරීම **සඳහා** වෙන් කළ මුදල රු.මි 4.635 වියදම් කළ මුදල රු.මි 2.029 ක් වේ.

ක්ෂේත්‍ර නිරීක්ෂණ

දිනය- 2021.12.30 පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ දැල් බෙදාදීම. එස්. ජී. ජී. එස්. ජයසිංහ - සංවර්ධන නිළධාරි,(පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය) සහ 2021.12.30 පාතහේවාහැට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ දැල් බෙදාදීම. සාගරිකා දිල්හානි - ප්‍රාදේශීය ලේකම්, මිහිර බණ්ඩාර සහ දිමුතු රත්නායක (සංවර්ධන නිළධාරි) විසින් සිදුකර ඇත.






භෞතික ප්‍රගතිය

ක්‍රියාත්මක සැලැස්මේ සඳහන් ක්‍රියාකාරකම්	වෙන් කල මුදල (රු.මි)	සපුරාගත යුතු ඉලක්කය	අත්කරගත භෞතික ප්‍රගතිය
1.විසුරුම් ජල සම්පාදන පද්ධති 14ක් බෙදාදීම.	4.2	14	4
2.ආරක්ෂිත ගෘහ 10ක් ස්ථාපිත කිරීම.		10	-
3.කෘෂි වැට (කම්බි දැල්) 555ක් බෙදාදීම.		555	555
සංවර්ධන වැඩසටහන සිදුකළ ප්‍රදේශය (දිස්ත්‍රික්කය/ග්‍රාම නිලධාරී වසම)	මහනුවර දිස්ත්‍රික්ක මැදදුම්බර, පූජාපිටිය, පාතහේවාහැට, ගහඉහළ කෝරළේ, පස්භාගේ කෝරළේ හා හතරලියද්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 6 සඳහා කෘෂි දැල් ලබාදී ඇත. මැදදුම්බර, උඩපළාත, හාරිස්පත්තුව හා අකුරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 4සඳහා විසුරුම් ජල සම්පාදන පද්ධති ලබාදී ඇත.		
ප්‍රතිලාභීන් සංඛ්‍යාව		108 + 4 = 112	
පුහුණුව හා තොරතුරු සැපයීම	0.2	ප්‍රතිලාභීන් 40	
සුපිරි වෙළඳසැල් සහ අපනයනකරුවන් සමඟ රැස්වීම්, වැඩමුළු සහ සාකච්ඡා සංවිධානය කිරීම	0.1	04	
පරිපාලන වියදම්	0.135		
	4.635		

හම්බන්තොට දිස්ත්‍රික්කය

එළවළු නිෂ්පාදන එලදායීතාවය ඉහල නැංවීම - හම්බන්තොට



ක්ෂේත්‍ර නිරීක්ෂණය - ලුණුම කෘෂිකර්ම උපදේශක විසින් සිදුකර ඇත.



භෞතික ප්‍රගතිය

සංවර්ධන වැඩසටහන		එළවළු වගාවේ එළදායීතාවය ඉහළ නැංවීම	
වෙන්කල මුදල (රු. මි.)	0.803400	වියදම් කල මුදල (රු. මි)	0.65131803
අරමුණ	එළවළු වගාවේ එළදායීතාවය ඉහළ නැංවීම තුලින් නිෂ්පාදනය ඉහල නැංවීම		
ක්‍රියාත්මක සැලැස්මේ සඳහන් ක්‍රියාකාරකම්		**සපුරාගත යුතු ඉලක්කය**	**අත්කරගත් භෞතික ප්‍රගතිය**
1. ඇල්කතින් බට 2"&200' (60m) රොල් 50		50	50
2. 2" විදුලි ජල පොම්ප 08		08	08
සංවර්ධන වැඩසටහන සිදුකල ප්‍රදේශය		ලුණුම	
ප්‍රතිලාභීන් සංඛ්‍යාව		50	
සිදු කරන ලද පුහුණු වැඩමුළු		01	
සංවර්ධන වැඩසටහන		එළවළු වගාවේ එළදායීතාවය ඉහළ නැංවීම	
ක්ෂේත්‍ර නිරීක්ෂණ සංඛ්‍යාව		70	
ක්ෂේත්‍ර නිරීක්ෂණ කරන ලද නිලධාරි ක්ෂේත්‍රයේ ඡායාරූප 02 ක්		කෘෂිකර්ම උපදේශක, ලුණුම.	

ව්‍යවසායකත්ව කෘෂි අපනයන ගම්මාන වැඩසටහන දෙවන අදියර අලුත්ගම, නාවලපිටිය.

වෙන්කළ මුදල (රු.මී.)	9.34	*වියදම් කළ මුදල (රු.මී.)*	7.9026
අරමුණ			
ක්‍රියාත්මක සැලැස්මේ සඳහන් ක්‍රියාකාරකම්		***සපුරාගත යුතු ඉලක්කය මූල්‍ය භෞතික***	**අත්කරගත් ප්‍රගතිය මූල්‍ය භෞතික**
1. බිංදු ජල සම්පාදන කට්ටල 60 ක්, ලීටර් 500 හා 1500 ටැංකි 60ක් 70% රජයේ දායකත්වය යටතේ ලබා දීම.		8.16 100%	7.0416 100%
2. ඩිජිටල් තරාදි නොමිලේ ලබාදීම.		0.2 100%	0.167 100%
3. වියලන යන්ත්‍ර නොමිලේ ලබා දීම.		0.5 100%	0.252 100%
4. පුහුණු වැඩසටහන් / ක්ෂේත්‍ර චාරිකා හා මෙහෙයුම් ඇගයුම් සිදු කිරීම.		0.25 100%	0.25 100%
සංවර්ධන වැඩසටහන සිදුකළ ප්‍රෙද්ශය (දිස්ත්‍රික්කය/ ග්‍රාම නිලධාරී වසම)		*මහනුවර දිස්ත්‍රික්කයේ නාවලපිටිය අලුත්ගම.*	
ප්‍රතිලාභීන් සංඛ්‍යාව		*ප්‍රතිලාභීන් 60 . එක් ප්‍රතිලාභීන් 600ක් පමණ.*	
සිදුකරන ලද පුහුනු වැඩමුලු ක්ෂේත්‍ර නිරීක්ෂන සංඛ්‍යාව		*පුහුණු වැඩසටහන් 08 , ක්ෂේත්‍ර නිරීක්ෂණ 03*	

කෘෂිකර්ම අමාත්‍යාංශ ගොඩනැගිලි පරිශ්‍රයේ භූමි අලංකරණ ව්‍යාපෘතියේ සම්පූර්ණ නොවූ කාර්යන් ඉටුකිරීම

වෙන්කළ මුදල (රු.මි.)	1.09	වියදම් කළ මුදල (රු.මි.)	1.0817
ක්‍රියාත්මක සැලැස්මේ සඳහන් ක්‍රියාකාරකම්		සපුරාගත යුතු ඉලක්කය මූල්‍ය භෞතික	අත්කරගත් ප්‍රගතිය මූල්‍ය භෞතික
1. බෝග වගාව නඩත්තුව සඳහා කෘෂි රසායන, පොහොර හා අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීම.		0.16 100%	0.1597 100%
2. හෙළ බොජුන් හළ අසල හා රියදුරු විවේක ස්ථානයේ ඇලුමිනියම් පුටු, බංකු හා මේස සවිකිරීම.		0.35 100%	0.349 100%
3. අවශ්‍ය ස්ථානයන්හි පඩිපෙල හා අඩිපාරවල් සකස් කිරීම.		0.12 100%	0.116 100%
4. බිත්ති නිර්මාණ දෙකක් සකස් කිරීම.		0.20 100%	0.199 100%
5. හෙළ බොජුන් හළ පිවිසුමේ ආරුක්කුවක් සකස් කිරීම.		0.21 100%	0.208 100%
6. අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීම (කම්බි, පොලිතීන්, යකඩ ඇණ, නල පද්ධතියට අවශ්‍ය කොටස්)		0.05 100%	0.05 100%
සංවර්ධන වැඩසටහන සිදුකළ ප්‍රෙද්ශය (දිස්ත්‍රික්කය/ ග්‍රාම නිලධාරී වසම)		*කෘෂිකර්ම අමාත්‍යාංශ භූමි පරිශ්‍රය*	
ප්‍රතිලාභීන් සංඛ්‍යාව		*ප්‍රතිලාභීන් 2000ක් පමණ.*	

5.කෘෂිකර්ම අංශයේ ක්ෂේත්‍ර නිලධාරීන්ගේ මානව සම්පත් කුසලතා ඉහළ නැංවීම

දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ වරු **යටතේ** කෘෂිකර්ම අංශයේ ක්ෂේත්‍ර නිලධාරීන්ගේ මානව සම්පත් කුසලතා ඉහළ නැංවීම සහ කෘෂිතාක්ෂණය ග්‍රාමීය ප්‍රජාව වෙත ප්‍රවේශ කිරීම සඳහා පුහුණු කරුවන් පුහුණු කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කර ඇත.

වෙන්කළ මුදල (රු.)	12,000,000.00	වියදම් කළ මුදල (රු.)	10,702,355.46
ක්‍රියාත්මක සැලැස්මේ සඳහන් ක්‍රියාකාරකම් - ක්ෂේත්‍ර නිලධාරීන්ගේ කුසලතා වැඩිදියුණු කිරීම		සපුරා ගත යුතු ඉලක්කය 25	අත්කරගත් භෞතික ප්‍රගතිය 22
සංවර්ධන වැඩසටහන සිදුකළ ප්‍රදේශය (දිස්ත්‍රික්කය/ග්‍රාම නිලධාරී වසම)		මඩකලපුව, මුලතිව් හා මොණරාගල යන දිස්ත්‍රික්කයන් හැර සෙසු දිස්ත්‍රික්ක වල මෙ වැඩසටහන සිදුකර ඇත.	

6.තරුණ ව්‍යවසායකයින් සඳහා නව කෘෂි තාක්ෂණික සොයා ගැනීම් සඳහා පහසුකම්කරණය

විවිධ පාර්ශවයන්ගේ සහයෝගය ඇතිව නව නිපැයුම්කරුවන් සාර්ථක ව්‍යවසායකයන් බවට බලගැන්වීමේ ව්‍යාපෘතිය

කෘෂිකර්මාන්තය වෙත නව මුහුණුවරකින් බැලීමේ සන්ධිස්ථානයක් ලෙස මෙම ව්‍යාපෘතිය හැඳින්විය හැක. එයින් කෘෂි ගැටලුවලට කෘෂිකර්මාන්තය තුළින්ම පිළිතුරු සෙවීමට විකල්ප භාවිතයක් ලෙස නව නිර්මාණ හෝ පවතින තාක්ෂණයන් සාර්ථක භාවිතය මඟින් නවෝත්පාදන හඳුන්වාදීම හා එම නිර්මාණ තවදුරටත් තාක්ෂණිකව සන්නද්ධ කර අලෙවිකිරීමේ මාර්ග ඇති කරලීම සඳහා විවිධ ආයතන, විවිධ පාර්ශවයන්ගේ සහයෝගය ඇතිව ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතියකි.

සහය ලබන විවිධ පාර්ශවයන්

- ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම
- ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයන් - පශු වෛද්‍ය සහ සත්ත්ව විද්‍යා පීඨය, පේරාදෙණිය
- ගොවිපොල යන්ත්‍රෝපකරණ පර්යේෂණ මධ්‍යස්ථානය
- ජාතික පසු අස්වනු තාක්ෂණ ආයතනය
- කුරුඳු පර්යේෂණ සහ පුහුණු මධ්‍යස්ථානය
- ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ ආයතනය
- කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
- ජාතික ඉංජිනේරු පර්යේෂණ මධ්‍යස්ථානය
- කාර්මික තාක්ෂණ ආයතනය

අරමුණ

නව නිපැයුම්කරුවාටද දේශීය වෙළඳපලක් ඇති වී කෘෂි ක්ෂේත්‍රයේ නිබෙන ගැටළුවලට නව පිළියම් ලබාදීම මඟින් දෙපාර්ශවයටම වාසි සහගත තත්ත්වයක් ඇති කරන ප්‍රායෝගික ප්‍රවේශයක් නිර්මාණය කිරීම.

වැය ශීර්ෂය - 118-02-03-062-2509

මූල්‍ය ප්‍රගතිය

විස්තරය	වෙන් කළ මුදල (රු.මී.)	වියදම් කළ මුදල(රු.මී.)
විවිධ පාර්ශවයන්ගේ සහයෝගය ඇතිව නව නිපැයුම්කරුවන් සාර්ථක ව්‍යවසායකයන් බවට බලගැන්වීමේ ව්‍යාපෘතිය	**රු.මී.9.00**	**රු.මී. 1.673633**

භෞතික ප්‍රගතිය

ක්‍රියාත්මක සැලැස්මේ සඳහන් ක්‍රියාකාරකම්	සපුරාගත යුතු ඉලක්කය	අත්කරගත් භෞතික ප්‍රගතිය
1. නිපැයුම්කරුවන් විසින් ඉදිරිපත් කරන ලද අයදුම්පත් වල මූලික ඇගයීම (I සහ II)	මූලික ඇගයීම 1	ප්‍රගතිය 100% අයදුම්පත් 220 ක් සඳහා කරන ලද මූලික ඇගයීම සහ නිර්ණායක සංවර්ධනය අවසන් කර ඇත
2. කමිටු සාමාජික දැනුවත් කිරීමේ වැඩසටහන	සියලු පාර්ශවයන් දැනුවත් කිරීම	ප්‍රගතිය 100% කමිටු සාමාජිකයන් සියලු දෙනා දැනුවත් කර ඇත.
3. අදාළ ක්ෂේත්‍රවල තෝරාගත් නව නිපැයුම්කරුවන්ගේ අයදුම්පත් පිළිබඳ සම්මුඛ පරීක්ෂණ	නව උත්පාදකයින් 150ක් තෝරා ගැනීම සඳහා	ප්‍රගතිය 100% සම්මුඛ පරීක්ෂණය අවසන් කර ඇත.
4. නව නිපැයුම්කරුවන් පෞද්ගලික සමාගම්වලට හඳුන්වා දීම.	තෝරාගත් නවෝත්පාදකයින් 125 දෙනෙකු පෞද්ගලික හා රාජ්‍ය ආයතන සමඟ කාර්තුමය සංසද 2 පැවැත්වීම	තෝරාගත් නවෝත්පාදකයින් 45 දෙනෙකු සඳහා ආයෝජකයින්ගේ සංසදය ගන්නෝරුව, ශාක ජාන සම්පත් මධ්‍යස්ථානයේදී පවත්වන ලදී. එහිදී ඔවුන්ගේ නව නිපැයුම් එළිදැක්වීම සහ නව නිපැයුම්කරුවන් දිරිගැන්වීම සඳහා සහතික පත් ප්‍රදානය කිරීම
ක්‍රියාත්මක සැලැස්මේ සඳහන් ක්‍රියාකාරකම්	**සපුරාගත යුතු ඉලක්කය**	**අත්කරගත් භෞතික ප්‍රගතිය**
5. මූල්‍ය ආධාර සඳහා තෝරාගත් නවෝත්පාදකයින් පුද්ගලික අංශයට යොමු කිරීම	විද්වත් කමිටු නිර්දේශ මත තෝරා ගන්නා නවෝත්පාදකයින් සංවර්ධන කටයුතු සඳහා ආයතන වෙත යොමු කිරීම	තෝරාගත් නවෝත්පාදකයින් 45 දෙනෙකු සඳහා ආයෝජකයින්ගේ සංසදය ගන්නෝරුව, ශාක ජාන සම්පත් මධ්‍යස්ථානයේදී පවත්වන ලදී. එහිදී ඔවුන්ගේ නව නිපැයුම් එළිදැක්වීම සහ නව නිපැයුම්කරුවන් දිරිගැන්වීම සඳහා සහතික පත් ප්‍රධානය කිරීම
6. මූල්‍ය ආධාර සඳහා තෝරාගත් නවෝත්පාදකයින් විදේශීය අරමුදල් සහිත ව්‍යාපෘතියකට යොමු කිරීම	සාර්ථක නවෝත්පාදකයින් 20	ප්‍රගතිය 80% නව නිපැයුම්කරුවන් 7 දෙනෙකුගේ නව නපැයුම් 11 ක් SAAPP ආයතනය මඟින් මූල්‍යාධාරලබා ගැනීමට යොමු කර ඇත.
7. විද්වත් කමිටුවේ නිර්දේශිත පරිදි තෝරාගත් නවෝත්පාදකයින් සංවර්ධනය කිරීම	අදාළ ක්ෂේත්‍ර 5න් සාර්ථක නව නිපැයුම්කරුවන් 20ක් පමණ	ප්‍රගතිය 100% සාර්ථක නවෝත්පාදකයන් 20 දෙනෙකුගේ නිෂ්පාදන සංවර්ධනය කිරීමේ කටයුතු සඳහා පහත සඳහන් ආයතන වෙත ඉදිරිපත් කර ඇත. * ගොවිපොල යන්ත්‍රෝපකරණ පර්යේෂණ මධ්‍යස්ථාන - 18 *කෘෂිකර්ම දෙපාර්තමේන්තුව - 03 ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ ආයතනය - 01 *පශු වෛද්‍ය සහ සත්ව විද්‍යා පීඨය පේරාදෙණිය - 01 * ජාතික පසු අස්වනු තාක්ෂණ ආයතනය - 05 * කුරුඳු පර්යේෂණ සහ පුහුණු මධ්‍යස්ථානය - 01 * නව නිපැයුම්කරුවන්ගේ කොමිසම - 02

ක්‍රියාත්මක සැලැස්මේ සඳහන් ක්‍රියාකාරකම්	සපුරාගත යුතු ඉලක්කය	අත්කරගත් භෞතික ප්‍රගතිය
8. ක්ෂේත්‍ර ආදර්ශන සහ පුහුණු වැඩසටහන්	තෝරාගත් නවෝත්පාදකයින් 125ක් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම.	ප්‍රගතිය 100% පුහුණු වැඩසටහන් - 22 ක්ෂේත්‍ර ආදර්ශන - 16 (Zoom) තාක්ෂණය ඔස්සේ පැවැත්විනි.)
9. තෝරාගත් නව නිපැයුම්කරුවන්ගේ නව නිපැයුම් දේශීය රාජ්‍ය ආයෝජකයන්ට හඳුන්වාදීම සඳහා මාධ්‍ය වැඩසටහන් පැවැත්වීම	කෘෂිකර්ම ආශ්‍රිත ගැටළු සඳහා ව්‍යවසායකයින් 55 දෙනෙකු සමඟ නිර්මාණ 125 ක කෘෂි ප්‍රදර්ශනය	ප්‍රගතිය 100% පේරාදෙණිය, මහනුවර, ගම්පහ , මඩකලපුව, අනුරාධපුර, බදුල්ල, රත්නපුර, මාලඹේ, කැළණිය, කෑගල්ල, අම්පාර, මාතලේ, ගාල්ල, මාතර යන ප්‍රදේශ වල නවෝත්පාදකයින් 31 දෙනෙකුගේ නවෝත්පාදන 42ක් සඳහා මාධ්‍ය ආවරණ වැඩසටහන් 04ක් පවත්වන ලදි.
10. විද්වත් කමිටුව සමඟ නවෝත්පාදකයින්ගේ ප්‍රගතිය සමාලෝචනය	අදාළ ක්ෂේත්‍රයන්හි විද්වත් කමිටු නියෝජිතයින් 3 දෙනෙකු සමඟ ප්‍රගති සමාලේචන පැවැත්වීම	ප්‍රගතිය 100% වාර්ෂික ප්‍රගති සමාලෝචන රැස්වීම හෙක්ටර් කොඩ්බෑකඩුව ගොවි පර්යේෂණ ආයතනයේදී පවත්වන ලදි.
11. අදාල විද්වත් කමිටු නිර්දේශයන් සමඟ නවෝත්පාදකයන් පරීක්ෂා කිරීම	කමිටුව විසින් නිර්දේශ කරනු ලබන පරීක්ෂණ ගණන	ප්‍රගතිය 50% නව නිපැයුම්කරුවන් 12 දෙනෙකුගේ නව නිපැයුම් 31ක් පරීක්ෂණ සඳහා ITI වෙත යොමු කර ඇත. නව නිපැයුම් 02ක් ආතර් සී ක්ලාක් ආයතනයට සහ 03ක් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට යොමු කර ඇත.

ක්‍රියාත්මක සැලැස්මේ සඳහන් ක්‍රියාකාරකම්	සපුරාගත යුතු ඉලක්කය	අත්කරගත් භෞතික ප්‍රගතිය
සංවර්ධන වැඩසටහන සිදුකළ ප්‍රදේශය (දිස්ත්‍රික්කය/ග්‍රාම නිලධාරි වසම)	දිවයින පුරා	
ප්‍රතිලාභීන් සංඛ්‍යාව	125	
සිදුකරන ලද පුහුණු වැඩමුළු ක්ෂේත්‍ර නිරීක්ෂණ සංඛ්‍යාව	පුහුණු වැඩමුළු - 22 ක්ෂේත්‍ර ආදර්ශන - 16	

ක්ෂේත්‍ර නිරීක්ෂණ

1) මුං ඇටවලින් කරන නිෂ්පාදන





සහභාගී වී ඇති නිලධාරියා - කේ.ඒ.ආර්.ධර්මසේන (අධ්‍යක්ෂ, (ප්‍රතිපත්ති හා ව්‍යාපෘති ඇගයුම්)
නිරීක්ෂණ - මුං ඇටවලින් කරන නිෂ්පාදන
ප්‍රදේශය - ගාල්ල ඇතිලිගොඩ
දිනය - 2021.08.04

7.සංවර්ධන වැඩසටහන් හා ව්‍යාපෘති මෙහෙයවීම හා ඇගයීම -

වැයශීර්ෂ - 118-02-03-062-2509

අරමුණ - කෘෂිකර්ම අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන වැඩසටහන් වඩාත් කාර්යක්ෂම සිදුකරන්නේද යන්න නිරීක්ෂණය සහ එම වැඩසටහන් කාර්යක්ෂමව මෙහෙයවීම මඟින් ඉහළ ඵලදායීතාවයක් අත් කර ගැනීම

මූල්‍ය ප්‍රගතිය

විස්තරය	වෙන් කළ මුදල (රු.මි)	වියදම් කළ මුදල (රු.මි)
කෘෂිකාර්මික ව්‍යාපෘති අධීක්ෂණය හා ඇගයීම	**4.00**	**1.18**

භෞතික ප්‍රගතිය

ක්‍රියාත්මක සැලැස්මේ සඳහන් ක්‍රියාකාරකම්	සපුරාගත යුතු ඉලක්කය	අත්කරගත් භෞතික ප්‍රගතිය
අමාත්‍යාංශ නිලධාරීන් විසින් දිස්ත්‍රික් මට්ටමින් ක්ෂේත්‍ර අධීක්ෂණ පැවැත්වීම	ක්ෂේත්‍ර චාරිකා 50	ප්‍රගතිය 38% ක්ෂේත්‍ර චාරිකා 19 සිදු කර ඇත.
දිස්ත්‍රික් ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම	ප්‍රගති සමාලෝචන රැස්වීම්	Covid 19 වසංගතය හේතුවෙන් වසර තුළ මෙම ක්‍රියාකාරකම සිදු කිරීමට නොහැකි විය
ක්‍රියාත්මක සැලැස්මේ සඳහන් ක්‍රියාකාරකම්	සපුරාගත යුතු ඉලක්කය	අත්කරගත් භෞතික ප්‍රගතිය
දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටු රැස්වීම	මාසිකව දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටු රැස්වීම් 25ක් පැවැත්වීම	ප්‍රගතිය 37% රැස්වීම් 113 පවත්වා ඇත. Covid 19 වසංගතය හේතුවෙන් බොහෝ දිස්ත්‍රික්කවල DACs Zoom තාක්ෂණය හරහා සිදු කර ඇත.
දිස්ත්‍රික්කවල කෘෂි සංවර්ධන නිලධාරී මඟින් කෘෂිකාර්මික සංවර්ධන ව්‍යාපෘති අධීක්ෂණය කිරීම	දිස්ත්‍රික් මට්ටමින් සිදුකරන සියළුම ව්‍යාපෘති	ප්‍රගතිය 70% විදේශාධාර ව්‍යාපෘති යටතේ කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩ සටහන මඟින් අනුරාධපුරය, හම්බන්තොට , කුරුණෑගල, බදුල්ල, මාතර, ගම්පහ, පුත්තලම, වවුනියාව, මහනුවර, මොණරාගල, රත්නපුර සහ කෑගල්ල දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක ව්‍යාපෘති 30ක් අධීක්ෂණය කර අවසන්ව ඇත.
තිරසාර කෘෂිකර්මාන්තයක් සඳහා වන විද්වත් කමිටු රැස්වීම්	රැස්වීම් 04	ප්‍රගතිය 75% රැස්වීම් 03ක් පැවැත්වීම
සංවර්ධන වැඩසටහන සිදුකළ ප්‍රදේශය (දිස්ත්‍රික්කය/ග්‍රාම නිලධාරී වසම)	දිවයින පුරා	
සිදුකරන ලද පුහුණු වැඩමුළු ක්ෂේත්‍ර නිරීක්ෂණ සංඛ්‍යාව	ක්ෂේත්‍ර ආදර්ශන - 19	

විදේශ ණය ආධාර මත ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති

කෘෂිකාර්මික අංශය නවීකරණ ව්‍යාපෘතිය (ASMP)

හැඳින්වීම

මෙම ව්‍යාපෘතිය ලෝක බැංකුව මඟින් 2016 ජූනි 29 දිනට අනුමැතිය ලබාදී ඇති අතර, ජාත්‍යන්තර සංවර්ධන සංගමය (IDA) විසින් මූල්‍ය ප්‍රතිපාදන ලබා දෙනු ඇත. මෙම ව්‍යාපෘතිය ප්‍රදාන වශයෙන් ආර්ථිකයේ ව්‍යුහාත්මක පරිවර්තනයක් සඳහා සහාය වීම සහ ජීවනෝපාය වැඩිදියුණු කිරීම කෙරෙහි අවධානය යොමු කර ඇත. ඒ අතර

(අ) ග්‍රාමීය හා නාගරික ප්‍රදේශ අතර සම්බන්ධතා ශක්තිමත් කිරීමට සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය ව්‍යුහාත්මක පරිවර්තනයට පහසුකම් සැලසීමට කෘෂිකාර්මික ඵලදායීතාව සහ තරහකාරිත්වය වැඩිදියුණු කිරීම,

(ආ) ග්‍රාමීය ජීවනෝපාය සංවර්ධනය හා කෘෂිකර්මාන්තයේ රැකියා අවස්ථා සහ අගයදාම වැඩිදියුණු කිරීම මඟින් දිළිඳු සහ අවදානමට ලක්විය හැකි ජනතාව සඳහා වෙළඳපල ප්‍රවේශය, එමඟින් පසුගාමී ග්‍රාමීය ප්‍රදේශවල ආදායම් මාර්ග සහ ජීවනෝපාය සුරක්ෂිතභාවය වැඩිදියුණු කිරීම; හා

- (ඇ) දේශගුණික අවදානමට ලක්වන ප්‍රදේශ වල ජනතාව සඳහා නව්‍ය කෘෂිකාර්මික ප්‍රවේශයක් ලබා දීම මඟින් ගංවතුර සහ නියඟ වැනි විපත් කළමනාකරණයට දායක වීම. කෘෂිකාර්මික අංශයේ විවිධාංගීකරණය, අගය එකතු කිරීම සහ තරහකාරිත්වය වැඩි කිරීම මෙම ව්‍යාපෘතිය මගින් සිදු කෙරේ.

ශ්‍රී ලංකාව සඳහා කෘෂිකාර්මික අංශය නවීකරණය කිරීමේ ව්‍යාපෘතියේ සංවර්ධන අරමුණු වන්නේ කෘෂිකාර්මික ඵලදායීතාව ඉහළ නැංවීම, වෙළඳපල ප්‍රවේශය වැඩිදියුණු කිරීම සහ ව්‍යාපෘති ප්‍රදේශයන්හි කුඩා ව්‍යාපාර හිමියන්ගේ සහ කෘෂි ව්‍යාපාරවල අගය එකතු කිරීම සඳහා සහාය වීමයි.

දැක්ම

නවීකරණය තුළින් ආහාර සුරක්ෂිතතාවය සහ ජාතික සමෘද්ධිය සඳහා විචිත්‍රවත්, ගතික සහ ඵලදායී කෘෂිකාර්මික අංශයක්

මෙහෙවර

ව්‍යාපෘති ක්ෂේත්‍රවල ස්වභාවික සම්පත් තිරසර කළමනාකරණය තුළින්, සමාජීය වශයෙන් පිළිගත හැකි, නව්‍ය, වෙළඳපල-නැඹුරු සහ නවීනතම කෘෂිකර්මාන්තය තුළින් ගෝලීය වශයෙන් තරහකාරී නිෂ්පාදන, සැකසුම් සහ අලෙවිකරණ ව්‍යවසායන් සාක්ෂාත් කර ගැනීම.

අරමුණු

1. නවීන තාක්ෂණික ක්‍රම භාවිතා කරමින් තරහකාරී සහ අලෙවි කළ හැකි භාණ්ඩ නිෂ්පාදනය කිරීම (ඵලදායිතා වැඩි දියුණු කිරීම)
2. වඩා හොඳ වෙළඳපල අවස්ථා වලට ප්‍රතිචාර දැක්වීම පිණිස ඔවුන්ගේ හැකියාවන් වැඩිදියුණු කිරීම (නිෂ්පාදන සහ වෙළඳපල විවිධාංගීකරණය)
3. කෘෂිකාර්මික වාණිජකරණය වෙත ගමන් කිරීම (කෘෂිකර්මය ව්‍යාපාරයක් ලෙස)

ව්‍යාපෘති තොරතුරු

ව්‍යාපෘතිය ක්‍රියාත්මක වීම ආරම්භක දිනය	2017.07.24
අපේක්ෂිත කාර්ය සාධන දිනය	2021 දෙසැ. 31
මෙහෙයුම් ආරම්භක දිනය	2017 මාර්තු 22
නියාමනය ආරම්භක දිනය	2017 ජූලි
ව්‍යාපෘති දිගුව	2023 ජූනි මස අවසානය
අරමුදල් ප්‍රභවය	කෘෂිකාර්මික අංශ නවීකරණ ව්‍යාපෘතිය (අන්තර්ජාතික සංවර්ධන නියෝජිත ආයතනය) ව්‍යාපෘති අංකය: 5873-LK)

ව්‍යාපෘති තොරතුරු

කෘෂිකර්ම අමාත්‍යාංශය සඳහා පිරිවැය	ඇ.ඩො. මිලියන 64.23, රුපියල් මිලියන 9374.37 (මුදල් ඒකකය = ශ්‍රී ලංකා රුපියල් (LKR) ඇ.ඩො. 1 = රුපියල් 145.95)
ප්‍රායෝගික ක්ෂේත්‍රය (මූලික)	කෘෂිකර්මාන්තය
වගකිවයුතු ආයතනය	කෘෂිකර්ම අමාත්‍යාංශය
ඉලක්කගත ප්‍රදේශ	පළාත් සහ උතුරු - යාපනය, මුලතිව් නැගෙනහිර - මඩකලපුව උතුරු මැද - අනුරාධපුර, පොළොන්නරුව මධ්‍යම - මාතලේ ඌව - මොණරාගල
ප්‍රතිලාභීන්	ගොවි නිෂ්පාදන සංවිධාන, කුඩා ගොවිපල් කුටුම්භ සහ අනෙකුත් ගොවිපල් කුටුම්භ, කෘෂිකර්ම අමාත්‍යාංශය (MOA), අදාළ පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශ 05 ක්. වක්‍ර : වාණිජ බැංකු
සංරචක	**සංරචක නාමය** **වියදම (ඇ.ඩො. මිලියන)** 2. ඵලදායිතාව වැඩි දියුණු කිරීම සහ විවිධාංගීකරණ ආදර්ශන 57.73 3. ව්‍යාපෘති කළමනාකරණය මෙහෙයවීම සහ ඇගයීම 6.5
සංරචක 2 පහත උප-සංරචක සහ ක්‍රියාකාරකම් වලින් සමන්විත වේ. අ). 2.1: ගොවි පුහුණු සහ ධාරිතා වර්ධනය - (ඇ. ඩො. මි. 3.20) ආ). 2.2: නව්‍ය කෘෂිකර්ම තාක්ෂණික උද්‍යාන - (ඇ. ඩො. මි. 38.39) ඇ). 2.3: නිෂ්පාදන සහ අලෙවි යටිතල පහසුකම් - (ඇ. ඩො. මි. 15.14) ඈ). 2.4: විශ්ලේෂණ සහ ප්‍රතිපත්ති උපදේශන සහාය - (ඇ. ඩො. මි. 1.00)	

උපසංරචක අනුව ප්‍රගතිය

උප සංරචක 2.1 ගොවි පුහුණු සහ ධාරිතා වර්ධනය		
2021 දී වෙන් කරන ලද අරමුදල: රුපියල් මිලියන 21.53	වියදම රු. මිලියන 13.38	
ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් ක්‍රියාකාරකම්	**ඉලක්ක**	**භෞතික ජයග්‍රහණ**
ජාත්‍යන්තර සේවා සපයන්නා (ISP) විසින් නියමු ව්‍යාපෘති සඳහා සකස් කරන ලද විෂයමාලා සංශෝධනය කිරීම	ISP විසින් සංවර්ධනය කරන ලද නියමු ව්‍යාපෘති විෂය මාලාව සංශෝධනය කිරීම	සම්පූර්ණ කර ඇත. නියමු ව්‍යාපෘති සඳහා සකස් කරන ලද FBS විෂය මාලාවම ලබා ගැනීමට සහ නියමු ව්‍යාපෘති සඳහා සකස් කරන ලද පළමු FPO විෂයමාලා තුන මෙම කොටසට එක් කිරීමට තීරණය කරන ලදී.
ICT වේදිකාවේ ප්‍රචාරණය - FBS පුහුණුව	තනි ගොවීන්ගේ පුහුණුව සම්බන්ධ පුහුණුව ලබා දීම සඳහා ICT වේදිකාවක් සෑදීමට සේවා සපයන්නෙකු බඳවා ගැනීම	ToR සම්පූර්ණ කර ලෝක බැංකුව (WB) වෙත යවන ලදී.

ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් ක්‍රියාකාරකම්	ඉලක්ක	භෞතික ජයග්‍රහණ
නව සහ විශාලන ව්‍යාපෘතිවල FBS පුහුණුව	නව සහ විශාලන ව්‍යාපෘති සඳහා FBS පුහුණුව සම්පූර්ණ කිරීම	පුහුණුව සිදුවෙමින් පවතින අතර 2022 පෙබරවාරි මාසයේදී අවසන් කිරීමට සැලසුම් කර ඇත. ප්‍රතිලාභීන් 853 දෙනෙකු පුහුණු කරන ලදී.
ගොවි නිරාවරණ සංචාරය	ගොවි නිරාවරණ සංචාරය	කොවිඩ් 19 වසංගතය හේතුවෙන් නවත්වන ලදී.
නව සහ විශාලන ව්‍යාපෘතිවල FPO පුහුණුව	තිරසර ගොවි සංවිධාන සඳහා FPO පුහුණුව	තෝරාගත් සංවිධාන පුහුණු කර ඇත, සේවා සපයන්නෙකු බඳවා ගැනීමට සැලසුම් කර ඇති අතර, සේවා සපයන්නෙකු බඳවා ගැනීමට ToR සකස් කර ලෝක බැංකුවේ (WB) අදහස් ලබා ගැනීම පිණිස යවනු ලැබේ.
නියමු ව්‍යාපෘති සඳහා FPOs පිහිටුවීම සහ ලියාපදිංචි කිරීම	නියමු ව්‍යාපෘති වලින් FPOs 20 ක්	ගොවි සමාගම් සෑදීමට ව්‍යාපෘති තෝරාගෙන ලියාපදිංචි කරන ලදී. සේවා සපයන්නෙකු බඳවා ගැනීමට ToR සකස් කර ලෝක බැංකුවේ (WB) අදහස් ලබා ගැනීම පිණිස යවනු ලැබේ.

උප සංරචක 2.2 නව්‍ය කෘෂිකර්ම තාක්ෂණික උද්‍යාන		
2021 දී වෙන් කරන ලද අරමුදල්: රුපියල් මිලියන 1815.60	වියදම රු. මිලියන 1,484.74	
ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් ක්‍රියාකාරකම්	**ඉලක්ක**	**භෞතික ජයග්‍රහණ**
ISP විසින් පොකුරු සංවර්ධන සැලැසුම් (CDP) 09 ක් ඉදිරිපත් කිරීම සහ පිළිගැනීම	පොකුරු සංවර්ධන සැලැසුම් (CDP) 09	රාජාංගනය CDP 09 න් කෙසෙල් පොකුරේ CDP අනුමත කරන ලද අතර, අනුරාධපුර මිරිස් පොකුරේ CDP සමාලෝචක කණ්ඩායම වෙත ලැබී ඇත. ISP විසින් සංශෝධනය සිදු කර ඇත. අනුරාධපුර පේර පොකුරේ CDP කෙටුම්පත PD වෙත ඉදිරිපත් කරන ලද අතර එය අදාළ ව්‍යාපෘති කාර්ය මණ්ඩලයේ සමාලෝචනය යටතේ පවතී. අනෙකුත් CDP 06ක් ඉදිරිපත් කළ යුතුය.
ISP විසින් ව්‍යාපෘති දිස්ත්‍රික්ක 7ක බෝග පොකුරු 16ක් ස්ථාපිත කිරීම	ISP පොකුරු 16 ක බෝග පිහිටුවීම	ජාත්‍යන්තර සේවා සපයන්නා (ISP) විසින් ක්‍රියාත්මක කර ඇති පොකුරු 16 ක බෝග සිටුවීම ආරම්භ කර ඇති අතර, යෙදවුම් ප්‍රසම්පාදනය බොහෝ දුරට අවසන් කර ඇත. පොකුරු පිළිබඳ තොරතුරු පහත සඳහන් කර ඇත.
නියමු ව්‍යාපෘති 13ක් අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම	පුහුණු කිරීම් සහ ගොවීන්ගේ නිරාවරණ චාරිකා	කොවිඩ් 19 වසංගතය හේතුවෙන් වැඩසටහන් කිහිපයක් පැවැත් වූ අතර අනෙක් ඒවා සැලසුම් කළ පරිදි අවසන් කරන ලදී.

ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් ක්‍රියාකාරකම්	ඉලක්ක	භෞතික ජයග්‍රහණ
ව්‍යාපෘති දිස්ත්‍රික්ක 7ක නව සහ විශාලන ව්‍යාපෘති 12ක් අඛණ්ඩව පවත්වාගෙන යාම සහ සම්පූර්ණ කිරීම	පුහුණු කිරීම් සහ ගොවීන්ගේ නිරාවරණ චාරිකා. යෙදවුම් බෙදා හැරීම.	කොවිඩ් 19 වසංගතය හේතුවෙන් වැඩසටහන් කිහිපයක් පැවැත් වූ අතර අනෙක් ඒවා සැලසුම් කළ පරිදි අවසන් කරන ලදී.
නව දිස්ත්‍රික්ක 5 ක නියමු ව්‍යාපෘති 12 ක් ක්‍රියාත්මක කිරීම	නියමු ව්‍යාපෘති 12	බොහෝ දුරට අවසන් කර ඇත.
සෞභාග්‍යා වැඩසටහන		
උප සංරචක 2.3 නිෂ්පාදන සහ අලෙවි යටිතල පහසුකම්		
2021 දී වෙන් කරන ලද අරමුදල්: රුපියල් මිලියන 180.14	වියදම රු. මිලියන 126.76	
ක්‍රියාකාරකම්	**ඉලක්ක**	**භෞතික ජයග්‍රහණ**
කුඩා පරිමාණ වාරිමාර්ග යටිතල පහසුකම් සහ පවතින ජල ටැංකි සහ වාරිමාර්ග පද්ධති ප්‍රතිසංස්කරණය කිරීම/වැඩි දියුණු කිරීම, නිෂ්පාදන හා වෙළඳපොළ ප්‍රවේශ මාර්ග සහ නව ක්ෂේත්‍ර ප්‍රවේශ මාර්ග ඉදිකිරීම, , වියළන වේදිකා සහ මඩු, බෝග අපද්‍රව්‍ය කොම්පෝස්ට් කිරීමේ පහසුකම්, ගබඩා පහසුකම් සහ අනෙකුත් දෑ ඇතුලත් ගම් මට්ටමේ ගබඩා සහ නිෂ්පාදන හැසිරවීමේ පහසුකම්.		ප්‍රදානය කරන ලද යටිතල පහසුකම් ක්‍රියාකාරකම් 114 න් ක්‍රියාකාරකම් 14 ක් සිදුවෙමින් පවතින අතර, අනෙකුත් ක්‍රියාකාරකම් 100 ක් සම්පූර්ණ කර ඇත (2018 සිට 2021 දක්වා)

උප සංරචක 2.4 විශ්ලේෂණ සහ ප්‍රතිපත්ති උපදේශන සහාය		
2021 දී වෙන් කරන ලද අරමුදල: රුපියල් මිලියන 14.5	වියදම රු. මිලියන 11.50	
ක්‍රියාකාරකම්	**ඉලක්ක**	**භෞතික ජයග්‍රහණ**
තෝරාගත් ප්‍රදේශවල ප්‍රතිපත්ති පර්යේෂණ සඳහා ප්‍රදානයන් සහ පහසුකම් සැලසීම	පර්යේෂණ 2 ක් අවසන් කළ යුතුය	ප්‍රතිපත්ති පර්යේෂණ 9 න් පර්යේෂණ 8ක් අවසන් කර ඇති අතර අනෙක් පර්යේෂණ අවසන් අදියරේ පවතී.
සංරචක 3. ව්‍යාපෘති කළමනාකරණය, මෙහෙයවීම සහ ඇගයීම		
2021 දී වෙන් කරන ලද අරමුදල: රුපියල් මිලියන 189.37	වියදම රු. මිලියන 180.96	
මුළු ප්‍රතිපාදන 2021: රු. මිලියන 2221.14	**මුළු වියදම 2021: රුපියල් 1,817.35**	
ව්‍යාපෘති ප්‍රදේශ (දිස්ත්‍රික්ක)	යාපනය, මුලතිව්, අනුරාධපුර, පොළොන්නරුව, මඩකලපුව, මොනරාගල, මාතලේ	

නියමු ව්‍යාපෘති(2018) පුළුල් කරන ලද ව්‍යාපෘති , (2019-2020) තව දුරටත් පුළුල් කරන ලද ව්‍යාපෘති (2021) සිදු කර ඇති ප්‍රදේශ

පළාත, දිස්ත්‍රික්කය	**අංකය**	**ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය**	**ව්‍යාපෘති නාමය**	**ග්‍රාම නිලධාරී කොට්ඨාසය**
මධ්‍යම පළාත මාතලේ	1	දඹුල්ල	අඹ	වැවල වැව වෙලංගොල්ල නිකවටවන
	2	දඹුල්ල/ කිඹිස්ස	ලූණු බීජ	දිගම්පත සියඹලන්ගස්වැව, නාගලවැව අවුඩංගාව
	3	ගලේවෙල, නාඋල, මාතලේ, දඹුල්ල	එළවළු (දෙමුහුන් මිරිස් බීජ)	පලාපත්වෙල, නිල්කුල, ඉබ්බන්කටුව, බඹරගස්වැව, මොරගොල්ල, තලකිරියාගම

පළාත, දිස්ත්‍රික්කය	අංකය	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය	ව්‍යාපෘති නාමය	ග්‍රාම නිලධාරී කොට්ඨාසය
විශාලන ව්‍යාපෘති	4	දඹුල්ල	අඹ (TJC)	වැවල වැව අරවිල, හූඹස්ගමුව, වෙලංගොල්ල
	5	ගලේවෙල	පැෂන් ෆෘට්	බඹරගස්වැව, පට්ටිවෙල, අලුත්වැව, කොස්පිට, දඹුවගොල්ල බෙලිගමුව
මධ්‍යම පළාත මාතලේ විශාලන ව්‍යාපෘති 2021	6	දඹුල්ල/ කිඹිස්ස	ලූණු බීජ	දිගම්පත සියඹලන්ගස්වැව, නාගලවැව අවුඩංගාව
	7	ගලේවෙල, නාඋල, මාතලේ, දඹුල්ල	එළවළු (දෙමුහුන් මිරිස් බීජ)	පලාපත්වෙල, නිල්කුල, ඉබ්බන්කටුව, බඹරගස්වැව, මොරගොල්ල, තලකිරියාගම
උතුරු පළාත යාපනය	8	වාවාකච්චේරි	අඹ	මීසාලි, කෙට්පේලි, මන්තුවිල්, කොඩිකාමන්, ලියුමද්දුව
	9	වාවාකච්චේරි	අමු මිරිස්	කයිතඩි උතුර මිරුසුයිල්, වලලෙයි, වන්දුපුරම්
මුලතිව්	10	ඔඩ්ඩුසුඩාන්	රට කජු	මුතුවිනායගපුරම්, මුත්තයියන්කඩ්ඩුකුලම්, පණ්ඩරවිනි, පේරාරු, තද්දයමාලි, ගණෂපියුරම්, තණ්ඩුරන්, ඔඩ්ඩුසුඩාන්, කනකරත්නපුරම්
විශාලන ව්‍යාපෘති 2019 මුලතිව්	11	ඔඩ්ඩුසුඩාන්	රට කජු	මුත්තයියන්කඩ්ඩුකුලම්, පණ්ඩරවිනි, තද්දයමාලි, ගණෂපියුරම්, තණ්ඩුරන්, ඔඩ්ඩුසුඩාන්, තණ්ඩුවන්
	12	තුනුක්කායි, මාන්තෙයි-නැගෙනහිර	පැෂන් ෆෘට්	තෙරන්කන්දල්, වලනගර්, තිරුනගර්, මල්ලාවි, අම්බලපුරම්, වන්නිවිලන්කුලම් (මාන්කුලම්)
නව ව්‍යාපෘති 2021 මුලතිව්			වියළි මිරිස් නිෂ්පාදනය	
			වියළි මිරිස් නිෂ්පාදනය	
උඟව පළාත මොණරාගල	13	බුත්තල	පැෂන් ෆෘට්	මහසෙන්පුර වගුරුවෙල පැල්වත්ත, හොරබොක්ක, උඩාරව
	14	මැදගම	අන්නාසි	මැදගම කින්නරබෝව පිටදෙණිය මල්ලාගම, අලුත්වෙල, මොනරවාන
	15	සියඹලාණ්ඩුව	අඹ (TJC)	මාදුගම, කොඩයාන, නුගගහකිවෙල, කරබගොඩ, ගුරුහෙල, කිවුලෙයාය මහකළුගොල්ල,
විශාලන ව්‍යාපෘති මොණරාගල	16	බුත්තල	පැෂන් ෆෘට්	වගුරුවෙල, කකුරමෝල, හොරබොක්ක, උඩඅරාව මහසෙන්පුර පැල්වත්ත, මොරටුගමුව, යටියල්ලතොට, පෙට්ටගම්වෙල
	17	මැදගම	අන්නාසි	බණ්ඩියාව, යකුන්නාව, පොතුබඳන, කොටබෝව
	18	සියඹලාණ්ඩුව	අඹ	මඩුගම, කොඩයාන, සූරියතලාව, කළුඔබ්බ
නව ව්‍යාපෘති	19	වැල්ලවාය	මුරුංගා	මහ අරගම, පුබුදුවැව, සිරිපුරගම, අඩවෙලයාය වේරයාය
	20	බඩල්කුඹුර මැදගම	මී මැසි පාලනය	හිඟුරුකඩුව බඩල්කුඹුර සේනාපතිය පොතුබඳන අයිවල බණ්ඩියාව කොටබෝව

පළාත, දිස්ත්‍රික්කය	අංකය	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය	ව්‍යාපෘති නාමය	ග්‍රාම නිලධාරී කොට්ඨාසය
නව ව්‍යාපෘති 2021			වියළි මිරිස් නිෂ්පාදනය	
නැගෙනහිර පළාත මඩකලපුව	21	වහාරි (කෝරලපත්තු උතුර)	එළවළු නිෂ්පාදනය - කොළ පිපිඤ්ඤා	කතිරාවලි, වහාරි උතුර සහ මධ්‍යම, කිරිමිච්චි, මාර්න්කර්නි දකුණ සහ මධ්‍යම, පල්ච්චානි, අම්පන්තනාවේලි, උරියන්කඩ්ඩු
	22	කතිරවේලි	රට කජු	කතිරවේලි, පුච්චක්කර්නි
	23	කළුතාවලයි	අමු මිරිස්	කළුතාවලෙයි 1,2,3,4 කළුතාවලෙයි - මධ්‍ය සහ දකුණ - ශාන්තිපුරම්
2021		කළුතාවලයි	වියළි මිරිස්	
උතුරු මැද පළාත අනුරාධපුරය	25	NPC NPE රාජාංගනය ආර්-බී නොච්චියාගම තලාව නාච්චාදූව ගලෙන්බිදූනවැව	කරවිල	දුටුවැව, හල්මිල්ලකුලම, කුරුන්දන්කුලම, තුරුවෙල, මඩවෙලගම, පාවක්කුලම, අල්වෙල, ජනසිරිගම, යාය-06, රන්දූණුගම, රන්කෙත්ගම, මහකලතාව, කීරිකුලම, කවරකුලම, මිහිරිපුර, මහමංකඩවෙල, නාබොදවැව, පහළත්තල්වැව
	26	ඉපලෝගම විලච්චිය තිරප්පනේ තලාව	පේර	ඉපලෝගම ගෝනපතිරාව, මානව, කඩියංගල්ල, සංගුතවැව, සඳමාලිය, තුක්පිටිය, සෙලස්තිමඩුව, මාවතවැව, තල්ලමඩුව7
	27	ඉපලෝගම	බිම්මල්	ඉපලෝගම, කුච්චිකුලම, ඉහළගම, මානව, ගන්තිරියාගම, කුඩාමීගස්ගම, කඩියංගල්ල
	28	NPC NPE රාජාංගනය ආර්-බී විලච්චිය නොච්චියාගම තලාව නාච්චාදූව තිරප්පනේ	මිරිස්	දුටුවැව, ගැටලාව, කොකාවැව, තුරුවෙල, හල්මිලන්කුලම, ඔයාමඩුව, අල්වෙල, ජනසිරිගම, අලුත්දුටුවැව, කවරක්කුලම, මහකලතවැව, යාය 6,7, කිරලපිටිය, අත්දන්කල්ල, රන්දූව, මනරම්හන්දිය, මහවෙලච්චිය, සඳමාලිගම, එරන්කෙත්ගම, මිහිරිපුර, උළුක්කුලම, ඉලන්දගහ වැව, පුලියන්කුලම, කුට්ටිකුලම, කැටකැල, කරගස්වැව, මාවතවැව, නබොඩවැව
	29	නාච්චදූව රාජාංගනය	බිම්මල්	හැදෝගම, දිවුල්වාව, තුරුවිල, මහනෙල්බෑව යාය 3,4, කළුආරච්චිගම, අංගමුව
නව ව්‍යාපෘති - අනුරාධපුර	30	විලච්චිය NPC නොච්චියාගම	කෝමාරිකා	ඔයාමඩුව, කුකුල්කටුව, අන්දරවැව, මානිංගමුව
	31	විලච්චිය NPC නොච්චියාගම	මුරුංගා	පේමඩුව, ඔයාමඩුව, ඇලයපතුව, අන්දරවැව, අත්දන්කල්ල, උළුක්කුලම, හෙල්මඩගස්වැව
පොළොන්නරුව	32	ඇලහැර	ගස්ලබු (අමු)	කිරිඔය එලහාර අතරගල්ලවැව ධමනයාය බකමූණ
	33	ඇලහැර මැදිරිගිරිය හිඟුරක්ගොඩ තමන්කඩුව ලංකාපුර	මිරිස්	ඇලහැර, ඇත්තේරගල්ලෑව, කෝට්ටපිටිය දකුණ, දමනයාය, බුබුල, නිකපිටිය, යටිගල්පොත්ත, රජඇල, මහසෙන්ගම, රොටවැව, මීගස්වැව, දම්සෝපුර, තලකොළවැව, මහඅඹගස්වැව, කාලිංගඇල, ලක්සුඅයන, දමන ගැමුණුපුර, ගල්තඹරාව, සේනානායකපුර, සංඝබෝධිගම, මහින්දගම
	34	තමන්කඩුව දිඹුලාගල හිඟුරක්ගොඩ මැදිරිගිරිය ඇලහැර	කරවිල	දමනයාය, කිරිඔය, නිකපිටිය, බුබුල, සරුබිම, ගල්ඔය, රොටුවැව, මහසෙන්පුර, නගරපුර, විජයපුර, පලුගස්දමන, ලක්ෂඑයන, දමනගමුනුපුර, කාලිංගඇල

පළාත, දිස්ත්‍රික්කය	අංකය	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය	ව්‍යාපෘති නාමය	ග්‍රාම නිලධාරී කොට්ඨාසය
	35	දිඹුලාගල	බිම්මල්	වේරගම, සිංහපුර, මනම්පිටිය, වෙහෙරගම නැගෙනහිර, දළුකන්න
නව ව්‍යාපෘති - පොළොන්නරුව	36	දිඹුලාගල වැලිකන්ද	කෝමාරිකා	මහවැව, වෙහෙරගම, නවම්ල්ලාන, බෝගස්වැව, නවගහඇල
විශාලන ව්‍යාපෘති - පොළොන්නරුව	37	ඇලහැර	ගස්ලබු (අමු)	කිරිඔය ඇළහර, අතරගල්ලවැව, ධමනයාය, කෝට්ටපිටිය දකුණ, ගංගේයාය
එකතුව				
ප්‍රතිලාභීන් සංඛ්‍යාව		6483 (ආරම්භයේ සිට නියමු ව්‍යාපෘති සහ ISP පොකුරු)		
පුහුණු වැඩසටහන් සහ ක්ෂේත්‍ර නිරීක්ෂණ ගණන		පුහුණු සැසි 395 ක් පවත්වා ඇති අතර පැවති කොවිඩ් වසංගත තත්වය යටතේ වුවද ක්ෂේත්‍ර නිරීක්ෂණ නියමිත පරිදි සිදු කර ඇත.		

කුඩා කෙසෙල් නිෂ්පාදන පොකුරු ගම්මානය (සුළු පරිමාණ ව්‍යාපෘති), අනුරාධපුරය

ක්ෂේත්‍ර නිරීක්ෂණය සඳහා සහාගිවන නිලධාරීන්: ව්‍යාපෘති අධ්‍යක්ෂ, ලෝක බැංකුවේ නේවාසික කළමනාකරු සහ නේවාසික අධ්‍යක්ෂ, කෘෂිකර්ම විද්‍යාඥ - උතුරු මැද පළාත,











ජාත්‍යන්තර සේවා සපයන්නා (ISP) විසින් ස්ථාපිත කර ඇති නිෂ්පාදන පොකුරු සහ ප්‍රගතිය

දිස්ත්‍රික්කය	පොකුරු නාමය	භෞතික ප්‍රගතිය
යාපනය	අර්තාපල් සහ රතු ලූනු නිෂ්පාදනය	මුලදී ප්‍රතිලාභීන් 100ක් සමඟින් අක්කර 50 ක ආරම්භ කරන ලදී. යෙදවුම් ප්‍රසම්පාදනය අවසන් කර ඇති අතර, අර්තාපල් සිටුවීම 2021 දෙසැම්බර් 19 වන දින ආරම්භ කරන ලද අතර, එය සිදුවෙමින් පවතී.
	කුඩා කෙසෙල් නිෂ්පාදන පොකුර	ගොවීන් 50 දෙනෙකු සඳහා දෙසැම්බර් පළමුවන සතියේදී පෙර අස්වනු තාක්ෂණ පැකේජය හඳුන්වා දෙන ලදී. එක් ගොවියෙකු සඳහා එක් අක්කරයක බිම් කැබැල්ලක නව වගාවක් ස්ථාපිත කරන ලද අතර, එය ගොවීන් 50 දෙනෙකු සමඟ අඛණ්ඩව සිදු කෙරේ. යෙදවුම් ප්‍රසම්පාදනය අවසන් කර ඇති අතර, වාරි පද්ධති සැපයීමට නියමිතය.
මුලතිව්	වියළි මිරිස් අතුරු බෝග වගාව සමග දෙළුම් නිෂ්පාදන පොකුර	ගොවීන් 50 දෙනෙකු තෝරා ගන්නා ලදී. “ බගවාන්" නමැති නව ප්‍රභේදයක් සමඟ එක් ආදර්ශන බිම් කොටසක් ස්ථාපිත කරන ලදී; එය ගොවීන් 50 දෙනෙකු සමඟ දිගටම කරගෙන යනු ඇත. යෙදවුම් ප්‍රසම්පාදනය අවසන් කරන ලදී. මිරිස් අතුරු බෝග වගාව 2022 ජනවාරි මාසයේදී ආරම්භ කෙරේ.
	වියළි මිරිස් අතුරු බෝග වගාව සමග කෝලිකුට්ටු කෙසෙල් නිෂ්පාදන පොකුර	අක්කර 50 සහිත ගොවීන් 100 දෙනෙකු තෝරා ගැනීම, අවසන් කර ඇත. එක් ගොවියෙකු සඳහා අක්කර 1/2 බිම් කොටසක නව වගාවක් ආරම්භ කරන ලද අතර, එය ගොවීන් 100 දෙනෙකු සමඟ අඛණ්ඩව සිදු කෙරේ. යෙදවුම් ප්‍රසම්පාදනය අවසන් කරන ලදී.
මොනරාගල	වියළි මිරිස් අතුරු බෝග වගාව සමග කැවෙන්ඩිෂ් කෙසෙල් නිෂ්පාදන පොකුර	ගොවීන් 500 ක් තෝරා ගැනීම සිදු වෙමින් පවතී. එක් ආදර්ශන බිම් කොටසක් ස්ථාපිත කර ඇති අතර, යෙදවුම් ප්‍රසම්පාදනය සිදු වෙමින් පවතී.
	වියළි මිරිස් අතුරු බෝග වගාව සමග අඹ නිෂ්පාදන පොකුර	ගොවීන් 200 දෙනෙකු තෝරා ගැනීම සිදු වෙමින් පවතී. එක් ආදර්ශන බිම් කොටසක් ස්ථාපිත කර ඇති අතර, යෙදවුම් ප්‍රසම්පාදනය සිදු වෙමින් පවතී.
	MD2 අන්නාසි නිෂ්පාදන පොකුර	හෙක්ටයාර 1ක නියැදි බිම් කොටසක් සැලසුම් කරන ලද අතර, 2022 ජනවාරි මස මුලදී නියැදි මූලාංකුර (මොට්) 1000ක් ලැබෙනු ඇත.
මඩකලපුව	වියළි මිරිස් අතුරු බෝග වගාව සමග දෙළුම් නිෂ්පාදන පොකුර	ප්‍රතිලාභීන් තෝරා ගැනීම අවසන් කර ඇති අතර, ඉඩම් සකස් කිරීම සිදු වෙමින් පවතින අතර, අක්කර 4.5 ක රෝපණය කිරීම අවසන් කරන ලදී.
අනුරාධපුරය	කුඩා කෙසෙල් නිෂ්පාදන පොකුර	යෙදවුම් ප්‍රසම්පාදනය අවසන් කරන ලදී. අක්කර 948 න් අක්කර 147 ක අපනයනය සඳහා ගුණාත්මක මිටි සඳහා පෙර අස්වනු තාක්ෂණය හඳුන්වා දෙන ලදී. පොකුරු 41075ක තත්ත්වය වැඩි දියුණු කිරීම සඳහා පළතුරු ආවරණය සිදු කරන ලදී. සැකසුම් මධ්‍යස්ථානය හරහා කිලෝ 22000ක් විකුණා ඇත. කෙසෙල් තවාන් 50ක් දැනටමත් පිහිටුවා ඇත. කි.ග්‍රෑ. 1ක් ඇ. ඩොං. 2.01 ක බැගින් කි. ග්‍රෑ. 11068 ක් අපනයනය කරන ලදී.

දිස්ත්‍රික්කය	පොකුරු නාමය	භෞතික ප්‍රගතිය
	වියළි මිරිස් නිෂ්පාදන පොකුර	යෙදවුම් ප්‍රසම්පාදනය අවසන් කරන ලදී. පළමු වගාව 2021 මැයි මාසයේදී අර්ධ තාක්ෂණයෙන් යුත් ගොවීන් 100 දෙනෙකු සමඟ ආරම්භ කරන ලද අතර, අස්වනු නෙලීම සිදු වෙමින් පවතී. අක්කර 150 ක ගොවීන් 300ක් සමඟින් රෝපණය කිරීමේ කටයුතු 2022 ජනවාරි මාසයේ සිදු කෙරේ. බිම් සැකසීම සිදු වෙමින් පවතී.
	පේර නිෂ්පාදන පොකුර	පළතුරු ආවරණ මලු 82500ක් ගොවීන් 45 දෙනෙකු අතර බෙදා දෙන ලදී. කසළ මලු 1000ක් ලබා ගන්නා ලදී. අක්කර ½ ආදර්ශන බිම් කොටසක් ආරම්භ කරන ලද අතර, එය නව ගොවීන් 50 දෙනෙකු සමඟ අඛණ්ඩව සිදු කරනු ඇත. ප්‍රසම්පාදනය සිදුවෙමින් පවතී.
පොළොන්නරුව	වියළි මිරිස් නිෂ්පාදන පොකුර	ප්‍රසම්පාදනය අවසන් කරන ලදී. පළමු වගාව 2021 මැයි මාසයේදී ගොවීන් 87 දෙනෙකු සමඟ අර්ධ තාක්ෂණයෙන් ආරම්භ කරන ලද අතර, අස්වනු නෙලීම සිදු වෙමින් පවතී. 2022 ජනවාරි මාසයේදී ගොවීන් 300ක් සමඟ අක්කර 150 වගා කිරීම සිදු කරනු ලැබේ. බිම් සැකසීම සිදු වෙමින් පවතී.
මාතලේ	ලොකු ලූනු අතුරු බෝග වගාව සමඟ අඹ නිෂ්පාදන පොකුර	ගොවීන් 65 දෙනෙකු සඳහා පැල 18200ක් නිකුත් කර ඇති අතර, රෝපණ කටයුතු සිදු වෙමින් පවතී.
	පේර නිෂ්පාදන පොකුර	අක්කර 1/2 ආදර්ශන බිම් කොටසක් ආරම්භ කරන ලද අතර, එය නව ගොවීන් 50 දෙනෙකු සමඟ අඛණ්ඩව සිදු කරනු ඇත. ගොවීන් තෝරා ගැනීම සිදු වෙමින් පවතී.
	MD2 අන්නාසි නිෂ්පාදන පොකුර	හෙක්ටයාර 1ක නියැදි බිම් කොටසක් සැලසුම් කරන ලද අතර, 2022 ජනවාරි මස මුලදී නියැදි මූලංකුර (මොට්) 1000ක් ලැබෙනු ඇත.

සෞභාග්‍ය වැඩසටහනේ ප්‍රගතිය

අ/අ	බෝගය	ප්‍රතිපාදන රු. මී.	මූල්‍ය ප්‍රගතිය		භෞතික ප්‍රගතිය	
			(රු. මී.)	%	*විස්තරය*	%
1.	මිරිස් නිෂ්පාදනය	1021.27	1021.27	100.00	මාතලේ දිස්ත්‍රික්කයේ නියමු ව්‍යාපෘති යටතේ ඉදිකරන ලද බහු උමං මාර්ග 10ක් වෙන් කරනු ලදුව, 2 වැනි වගාව දැනටමත් දෙමුහුන් බීජ නිෂ්පාදනය ආරම්භ කර ඇත. මේ දක්වා බීජ කිලෝග්‍රෑම් 150 ක් නෙලාගෙන ඇත. නව බහු උමං 10ක් ඉදි කිරීම අවසන් කර ගොවීන් වෙත භාර දෙන ලදී. නව බහු උමංවල රෝපණ කටයුතු අවසන් වීමට ආසන්නය. ප්‍රතිලාභීන් 3500 ක් එක්ව අක්කර 1600 ක මිරිස් නිෂ්පාදනය කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරන ලද අතර, එයින් අක්කර 117 ක (ප්‍රතිලාභීන් 234ක්) වගාව අවසන් කර අස්වනු නෙලමින් පවතී. තවත් අක්කර 810 (ප්‍රතිලාභීන් 1682ක්) වගා කිරීමට බිම සැකසුම් සිදු කරමින් පවතී. නව දිස්ත්‍රික්කවල වගා කරන ලද අක්කර 450 (ප්‍රතිලාභීන් 900) ඉඩම්වල අස්වනු නෙලීම 2022 අප්‍රේල් මාසයේදී සිදු කළ හැකිය. අක්කර 200 ක (ප්‍රතිලාභීන් 918 ක්) පළතුරු බෝග වගාව යටතේ මිරිස් අතුරු බෝග වගාව ඉඩම් සකස් කිරීම සිදු කරන ලදී. වියළි මිරිස් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 12800 ක් වන අතර, සාමාන්‍ය අස්වැන්න කිලෝග්‍රෑම් 8000 කි. නිෂ්පාදන ප්‍රමාණය ජාතික අවශ්‍යතාවයෙන් 21.2% කි. සම්පූර්ණ ව්‍යාපෘති දායකත්වය රු. මිලියන 1021.27 කි.	100
2	බඩඉරිඟු බීජ නිෂ්පාදනය	33.91	34.49	101.71	කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් මිලදී ගත් මව් බීජ භාවිතා කර අක්කර 100 ක වගා කිරීම ආරම්භ කරන ලදී. බීජ කිලෝග්‍රෑම් 40000ක් ලබා ගැනීමෙන් අස්වනු නෙලීම අවසන් විය. ගොවීන්ගෙන් සාම්පල 28ක් ලබාගත් අතර, සාම්පල 3ක් සුදුසු ලෙස හඳුනාගන්නා ලදී. අනෙකුත් සාම්පලවල තෙතමනය මට්ටම ඉහළය. ගොවීන්ගෙන් ගුණාත්මක නියැදිය මිලදී ගැනීම සඳහා, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙහි ගිවිසුම්පත්‍රයක් නොමැති අතර, මිලදී ගැනීම සඳහා පෞද්ගලික අංශය හඳුන්වා දීමට ඔවුන් පොරොන්දු විය.	100
3.	රටකජු නිෂ්පාදනය	20.18	3.74	18.53	අක්කර 613 ක වගා කිරීම ආරම්භ කර ඇත. පසුගිය මාස කිහිපය තුළ පැවති අයහපත් කාලගුණික තත්ත්වය හේතුවෙන් වගාවේ කොටසක් හානියට පත් වූ අතර, ඉතිරි අස්වනු නෙළා ඇත.	60

අ/අ	බෝගය	ප්‍රතිපාදන රු. මී.	මූල්‍ය ප්‍රගතිය		භෞතික ප්‍රගතිය	
			(රු. මී.)	%	*විස්තරය*	%
4	ලොකු ලූනු නිෂ්පාදනය	55.8	51.55	92.38	නියමු ව්‍යාපෘති යටතේ ඉදිකරන ලද ඒකක 15 ක් යොදා ගනිමින් සත්‍ය බීජ නිෂ්පාදනය ආරම්භ කරන ලදී. නව ගබඩා 35 ක් ඉදිකර අවසන් කර, 26 ක් ගොවීන් වෙත භාර දෙන ලදී. අනෙක් 09 කොන්ත්‍රාත්කරු වෙත අවසන් ගෙවීම සිදු කිරීමෙන් පසු භාර දිය යුතුය. එක් ගබඩාවක ලූනු බල්බ කිලෝ ග්‍රෑම් 2500 ගබඩා කළ හැකිය.	95
5	රතු ලූනු නිෂ්පාදනය	0.75			යාපනය දිස්ත්‍රික්කයේ අර්තාපල් නිෂ්පාදන පොකුරේ සිරුමාරු බෝගයක් ලෙස 2022 යල කන්නයේදී වගාව ආරම්භ කිරීමට ප්‍රසම්පාදන සැලසුම් කර ඇත.	
6	අර්තාපල් නිෂ්පාදනය	105.13	38.8	36.91	බදුල්ල දිස්ත්‍රික්කයේ පළමු අදියර ලෙස ප්‍රතිලාභීන් 40ක් (අක්කර 30) විසින් මෙ. ටොන් 288 ක් නිෂ්පාදනය කරන ලදී. දෙවන අදියර ලෙස ප්‍රතිලාභීන් 20ක් (අක්කර 11.5) විසින් මෙ. ටොන් 47.2 ක් නිෂ්පාදනය කරන ලදී. තෙවන අදියර ලෙස ප්‍රතිලාභීන් 120 දෙනෙකු සඳහා යෙදවුම් ප්‍රසම්පාදනය සිදු කෙරේ. යාපනයේ වාණිජ වගාව සඳහා ප්‍රතිලාභීන් 100 ක් (අකක්ර 50) සඳහා යෙදවුම් ප්‍රසම්පාදනය කෙරේ. 2021 දෙසැම්බර් 19 වන දින බීජ බෙදා හැරීම සහ රෝපණ කටයුතු ආරම්භ කරන ලදී.	65
	එකතුව	**1237.04**	**1149.85**			92.952

දේශගුණ සුහුරු වාරි කෘෂි ව්‍යාපෘතිය (CSIAP)

හැදින්වීම

ශ්‍රී ලංකාව දේශගුණය ආශ්‍රිත ස්වභාවික විපත්වලට ගොදුරු වන බැවින් එහි අහිතකර බලපෑම ආර්ථිකයට විශාල වශයෙන් බලපානු ලැබේ. දීර්ඝ කාලීනව ගංවතුර, සුළි කුණාටු හෝ අධික සුළං, නියහ සහ නායයෑම් නිසා වාර්ෂිකව නිවාස, යටිතල පහසුකම් හා කෘෂිකර්මාන්තයට සිදුවන හානිය රුපියල් බිලියන 50 (US$ මිලියන 327) ලෙස ගණන් බලා ඇත. මෙය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 0.4 ට හෝ ශ්‍රී ලංකා රජයේ වියදම් වලින් සියයට 2.1 කට සමාන වේ. රටේ ආර්ථික සංවර්ධනය ඉහල යාමත් සමඟ අපේක්ෂාවන් ඉහළ යාමට සමගාමීව ඉහළ දේශගුණික විචල්‍යතා පවතින ප්‍රදේශවල අවදානමට ලක්වී සිටින ගොවි ජනතාවගේ ජීවනෝපාය සංවර්ධනය සඳහා දේශගුණික සුහුරු කෘෂිකාර්මික ක්‍රියාකාරකම් භාවිතයෙන් සහ ජල තාක්ෂණය ප්‍රවර්ධනය කිරීම මඟින් ජල ඵලදායිතාව වැඩි කිරීමටත්, ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීමටත් සහ ගෘහස්ථ ආර්ථිකය ශක්තිමත්ව සහ ඔරොත්තු දීමට හැකිවන පරිදි ශක්තිමත් කිරීම අවශ්‍ය වේ.

එබැවින්, එල්ලංගා පද්ධති තුළ වැඩිදියුණු කරන ලද වාරි පහසුකම් තුලින් කෘෂිකර්ම නිෂ්පාදනාවය වැඩි කිරීමට දේශගුණික සුහුරු කෘෂිකාර්මික මැදිහත්වීම් තුලින් දේශගුණික විපර්යාසයටන්ට ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු කිරීම රටේ කාලීන අවශ්‍යතාවයකි.

එමනිසා, ශ්‍රී ලංකාවේ තෝරාගන්නා ලද දේශගුණික අවදානම් වලට ලක්විය හැකි ප්‍රදේශ වල ගොවි ප්‍රජාවන්ගේ දේශගුණික විපර්යාසයන්ට ඔරොත්තු දීමේ හැකියාව සහ වාරි කෘෂිකර්මයේ ඵලදායිතාව වැඩිදියුණු කිරීම සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශය සහ ලෝක බැංකුව සමඟ සහයෝගයෙන් දේශගුණ සුහුරු වාරි කෘෂි ව්‍යාපෘතිය සකස්කර ඇමරිකානු ඩොලර් මිලියන 125 ක් ආයෝජනය කිරීමට ක්‍රියාත්මක වේ.

දේශගුණයට ඔරොත්තු දෙන කෘෂිකාර්මික ක්‍රම භාවිතයෙන් සහ තාක්ෂණය තුලින්, කෘෂිකාර්මික ඵලදායිතාව වැඩිදියුණු කිරීම සහ ඉලක්කගත කුඩා ගොවි නිෂ්පාදක ප්‍රජාවන් සඳහා වෙළඳපල ප්‍රවේශය වැඩි දියුණු කිරීම තුළින් මෙම අරමුණ සාක්ෂාත් කරගනු ඇත.

ව්‍යාපෘතිය මගින් දිවයිනේ උතුරු පළාත (කිලිනොච්චිය සහ මුලතිව්), නැගෙනහිර පළාත (මඩකළපුව, අම්පාර සහ ත්‍රිකුණාමලය), උතුරුමැද පළාත (අනුරාධපුර සහ පොළොන්නරුව), වයඹ පළාත (කුරුණෑගල සහ පුත්තලම), දකුණු පළාත (හම්බන්තොට) සහ ඌව පළාත (මොණරාගල) යන පළාත් 6 ආවරණය වන පරිදි පරිපාලන දිස්ත්‍රික්ක 11 ක දේශගුණික විපර්යාසයන් හි බලපෑම නිසා අවදානමට ලක්වන ප්‍රදේශ ආශ්‍රිතව කුඩා ගොවීන් 470,000 කට අධික ප්‍රමාණයකට සහ ගොවි පවුල් 57,838 කට සෘජු ප්‍රතිලාභ සලසමින් හෙක්ටයාර් 375,000 ක පමණ වගා බිම් ප්‍රමාණයක් ආවරණය කිරීම සහතික කෙරේ.

ලෝක ආහාර වැඩසටහන (WFP), ජාත්‍යන්තර ජල කළමනාකරණ ආයතනය (IWMI) සහ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව (DAD) විසින් ඒකාබද්ධව සිදු කරන ලද සහයෝගීතා අභ්‍යාසයක් තුලින් ලබා ගන්නා ලද වඩාත් විශ්වාසදායක දත්ත පදනම් කරගත් ප්‍රවේශයක් තුලින් දේශගුණ විපර්යාසයන්හි තීව්‍ර විචල්‍යයන්ට ලක්වන ප්‍රදේශ අනුව මෙම දිස්ත්‍රික්ක තෝරාගෙන ඇත.

දැක්ම: දේශගුණික සුහුරු වාරි කෘෂිකාර්මික පිළිවෙත් අනුගමනය කිරීම තුළින් සහ කාර්යක්ෂම ජල ඵලදායිතාව තුලින් විශ්වාසදායක වාරි ජල සැපයුම තහවුරු කිරීම මඟින් ජල නිෂ්පාදනාව වැඩි දියුණු කිරීම.

මෙහෙවර: දේශගුණ විපර්යාසයන්හි අහිතකර බලපෑමට ලක්වන ප්‍රදේශවල කෘෂිකාර්මික නිෂ්පාදන සඳහා ඉහළ දේශගුණික විචල්‍යතාවයේ බලපෑම අවම කිරීමට එල්ලංගා පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීම සහ දේශගුණික සුහුරු කෘෂිකාර්මික භාවිතයන් අනුගමනය කිරීම තුලින් කෘෂිකාර්මික නිෂ්පාදනය සඳහා වාරි ජල සැපයුම සහතික කිරීම.

අරමුණු: තෝරාගන්නා ලද දේශගුණ විපර්යාසයන්හි බලපෑමට ලක්වන ප්‍රදේශ වල ගොවි ජනතාවගේ කෘෂිකර්මාන්තයේ ඵලදායිතාව සහ දේශගුණික ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු කිරීම.

ව්‍යාපෘතියේ විස්තර

ව්‍යාපෘතියේ විස්තර	
ව්‍යාපෘතිය ආරම්භක දිනය	2019 ජූනි
අපේක්ෂිත කාල සීමාව	වසර 06(2019 ජූනි සිට 2026 ජූනි දක්වා
මෙහෙයුම් ආරම්භ කළ දිනය	2019 ජූනි
ව්‍යාපෘති දිගුව	අදාල නොවේ
මූල්‍ය සැපයුම් මූලාශ්‍ර	IBRD/IDA - ලෝක බැංකුව ශ්‍රී ලංකා රජය සහ ප්‍රතිලාභීන්
බැංකු මූල්‍ය සැපයුම, කෘෂිකර්ම අමාත්‍යාංශයට	කොවිඩ් සම්බන්ධ CERC ක්‍රියාකාරකම් සඳහා ඇ. ඩො. මි. 15 ක් වෙන් කරන ලදී.
අදාළ ක්ෂේත්‍රය	දේශගුණික විපර්යාසයන්හි අභිතකර බලපෑමට ඔරොත්තු දීමේ හැකියාව සහ ජල ඵලදායිතාව වැඩිදියුණු කිරීම
වගකිවයුතු ආයතනය	කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලැබේ ක්‍රියාත්මක කිරීම, පළාත් සභා (පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව, පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව), දිස්ත්‍රික්ක 11 ක දිස්ත්‍රික් ලේකම්වරුන් සහ ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් සිදු කරනු ලැබේ.

සංරචක	
ප්‍රධාන සංරචක	සංරචක අනුව පිරිවැය (සංශෝධිත)
1. කෘෂිකාර්මික නිෂ්පාදනය සහ අලෙවිකරණය	ඇ. ඩොලර් මිලියන 31.3
2. කෘෂිකර්මාන්තය සඳහා ජලය	ඇ. ඩොලර් මිලියන 73 කි
3. ව්‍යාපෘති කළමනාකරණය	ඇ. ඩොලර් මිලියන 5.7
4. හදිසි ප්‍රතිචාර සඳහා සංචිත	ඇ. ඩොලර් මිලියන 15

ප්‍රධාන සංරචකයට අනුව ප්‍රගතිය

සංරචක-1: කෘෂිකාර්මික නිෂ්පාදනය සහ අලෙවිකරණය			
වෙන් කළ ප්‍රතිපාදන (රු. මිලියන)	1144	වියදම (රු. මිලියන)	551 (48.2%)
අරමුණු: දේශගුණික සුහුරු කෘෂිකාර්මික ක්‍රියාකාරකම් අනුගමනය කිරීම සහ ගොවිපල ජල කළමනාකරණය වැඩිදියුණු කිරීම තුළින් කෘෂිකාර්මික ඵලදායිතාව වැඩි දියුණු කිරීම සහ විවිධාංගීකරණය.			

ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් ක්‍රියාකාරකම්	සාක්ෂාත් කරගත යුතු ඉලක්ක	ලබාගත් භෞතික ප්‍රගතිය
1. කෘෂිකාර්මික නිෂ්පාදනය සහ අලෙවිකරණය		
1.1 දේශගුණික සුහුරු කෘෂිකර්ම තාක්ෂණය, භාවිතයන් සහ ජල තාක්ෂණය		
- කෘෂි උපදේශකවරුන් සඳහා දේශගුණ සුහුරු වාරි කෘෂි කර්මය සහ කෘෂිකර්ම තාක්ෂණය පිළිබඳ පුහුණු පැවැත්වීම	කෘෂි උපදේශකවරු 1000	
- ව්‍යාපෘති ප්‍රතිලාභීන් සඳහා දේශගුණ සුහුරු වාරි කෘෂි කර්මය සහ කෘෂිකර්ම තාක්ෂණය පිළිබඳ පුහුණු පැවැත්වීම	ගොවීන් 11335	
- ව්‍යාපෘති ප්‍රතිලාභීන් සඳහා තිරප්පනේ ගොවිපල පුහුණු පාසලේ දේශගුණ සුහුරු වාරි කෘෂිකර්මය පිළිබඳ පුහුණු පැවැත්වීම	වැඩසටහන් 39	
- ප්‍රතිලාභීන් සඳහා අත්දැකීම් ලබා ගැනීමේ චාරිකා	වැඩසටහන් 49	
- ආදර්ශ ගම්මාන සහ ආදර්ශන පිහිටුවීම	ආදර්ශන 94	ගොවීන් 14,064
- පොකුරු ගම්මාන පිහිටුවීම	ගම්මාන 33 හෙක්. 264	පාසලේ ඉදිකිරීම් කටයුතු අඛන්ඩව කරගෙන යනු ලැබේ.
- දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ක්‍රම භාවිතයෙන් යල වැඩසටහන	හෙක්. 1857	වැඩසටහන් 6.
-දේශගුණ සුහුරු වාරි කෘෂිකර්මය භාවිතයන් මැද කන්නය වැඩසටහන	හෙක්. 1695	ආදර්ශන 15.
- දේශගුණ සුහුරු වාරි කෘෂිකර්මය යටතේ මහ කන්න වැඩසටහන	වී ගොවිතැන හෙක්. 1298	හෙක්. 321
	වෙනත් ක්ෂේත්‍ර බෝග	හෙක්. 1194
	ගොවීන් 3113	

- ගෙවතු සංවර්ධනය - කොම්පෝස්ට් නිෂ්පාදන වැඩසටහන 1.2 නිෂ්පාදක කණ්ඩායම් (PG) පිහිටුවීම මගින් දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ක්‍රියාකාරකම් භාවිතයන් ඉහළ නැංවීමට සහාය වීම 1.2.1නිෂ්පාදක සමිති පිහිටුවීම 1.2.2 නිෂ්පාදක සංගම් පිහිටුවීම	හෙක්. 153.5 ගොවීන් 19392 297 47	හෙක්. 721 හෙක්. 5519 ක වී සහ වෙනත් ක්ෂේත්‍ර බෝග වගා කර ඇත. 535 ක් හඳුනාගෙන ඇත. ඝන පොහොර මෙ.ටොන් 34.5 ක් සහ දියර පොහොර ලීටර් 24787 ක් නිෂ්පාදනය කර ඇත. 120ක් පිහිටුවා 65ක් ලියාපදිංචි කර ඇත. ගොවීන් 262 දෙනෙකුගෙන් ආරම්භය කර ඇත.
1.3 ගොවිජන සේවා මධ්‍යස්ථාන බහු විධ සේවා මධ්‍යස්ථාන ලෙස සංවර්ධනය කිරීම		
1.3.1 පවතින ගො.සේ.ම. ගොඩනැගිලි සංවර්ධනය කිරීම	33	37 ක් සම්පූර්ණ කර ඇත. 9 ක් ක්‍රියාත්මක වෙමින් පවතී. එක් කොන්ත්‍රාත්තුවක් පිරිනැමිය යුතුය.
1.3.2 ගො.සේ.ම. 47 ක් සඳහා ගොවිපල යන්ත්‍රෝපකරණ සැපයීම	ඒකක 568	බීජ වක්කරනයන් 95 ක් ගො. සේ. ම. 47ක් අතර බෙදාහරින ලදී.
1.3.3 ගොවිජන සේවා මධ්‍යස්ථාන සඳහා පාංශු පරීක්ෂණ කට්ටල ලබා දීම	කට්ටල 100	කෘෂිකර්ම උපදේශකවරුන් අතර කට්ටල 100 ක් බෙදා දෙන ලදී.
1.3.4 කෘෂිකාර්මික මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම	කි.මී. 46	මාර්ග 82 ක් සඳහා ඇස්තමේන්තු සකස් ඇත. මාර්ග 20 ක් සඳහා ප්‍රදානය කර ඇත. මාර්ග 14 ක වැඩ ආරම්භ කර ඇත.
1.3.5 කුඩා පරිමාණයේ ධාන්‍ය ගබඩා ඉදිකිරීම	93	130 ක් හඳුනාගෙන ඇත. 22 ක් සඳහා ඇස්තමේන්තු අවසන් කර කොන්ත්‍රාත් ප්‍රදානය කර ඇති අතර, 3ක වැඩ අවසන් කර ඇත.
1.3.6 මධ්‍යම ප්‍රමාණයේ ධාන්‍ය ගබඩා ඉදිකිරීම	2	උතුරු මැද පළාතේ එක් ධාන්‍ය ගබඩාවක් ඉදිකිරීම ආරම්භ කර ඇති අතර 40% ක් වැඩ අවසන් කර ඇත.
1.3.7 දැනට පවතින කෘෂි ළිං ප්‍රතිසංස්කරණය කිරීම	184	430 ක් හඳුනාගෙන ඇත. 336 ක වැඩ ආරම්භ කර ඇත. 124 ක වැඩ අවසන්කර ඇත.

සංරචකය - 2 : කෘෂිකර්මාන්තය සඳහා ජලය			
වෙන් කළ ප්‍රතිපාදන (රු. මිලියන)	1767.5	වියදම (රු. මිලියන)	553 (31.3%)

අරමුණු:

- දේශගුණික සුහුරු වාරි කෘෂිකාර්මික කටයුතු සඳහා ජල සහ වෙනත් යටිතල පහසුකම් සැලසුම් කිරීමට උදව් කිරීම.
- සැලසුම් කළ යටිතල පහසුකම් ඉදි කිරීමට උදව් කිරීම.

ඉදිකරන ලද යටිතල පහසුකම් මධ්‍යම හා පළාත් ආණ්ඩු සමඟ පළාතේ ජනතාව ඒ්කාබද්ධව නඩත්තු හා මෙහෙයුම් සිදු කිරීමට උදව් කිරීම.

ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් ක්‍රියාකාරකම්	සාක්ෂාත් කරගත යුතු ඉලක්ක	ලබා ගත් භෞතික ප්‍රගතිය
2.1 වාරිමාර්ග පද්ධති පුනරුත්ථාපනය කිරීම 2.1.1 දේශගුණ සංවේදී ප්‍රදේශ වල කෘෂිකර්ම සංවර්ධන සැලසුම් (HSAADP) වල ඉතිරි වැඩ කටයුතු නිම කිරීම. 2. 1.2 ජල විද්‍යාත්මක අධ්‍යයන (අදියර 1 සහ ii) 2.1.3 ඉංජිනේරු සමීක්ෂණ අදියර i 2.1.4 ඉංජිනේරු සමීක්ෂණ අදියර ii 2.2 වැව් ප්‍රතිසංස්කරණය 2.2.1 සැලසුම් සහ ඇස්තමේන්තු සකස් කිරීම 2.2.2 ටෙන්ඩර් පත්‍රිකා සකස් කිරීම 2.2.3 ටෙන්ඩර් කැඳවීම 2.2.4 පිරිනැමීම 2.2.5 වැව් ප්‍රතිසංස්කරණය - සිවිල් වැඩ 2.2 වාරිමාර්ග පද්ධතිය ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම	සැලසුම් 47 ක් ද්‍රෝණි 8 වැව් 182 වැව් 677 වැව් 268 වැව් 268 වැව් 268 වැව් 268 වැව් 268 වැව් 268	100% වැඩ අවසන්. 100% වැඩ අවසන්. 100% වැඩ අවසන්. වැව් 779 ක් සඳහා කොන්ත්‍රාත් ප්‍රදානය කර ඇති අතර වැව් 619 ක වැඩ අවසන් කර ඇත. (74% සම්පූර්ණ කර ඇත) වැව් 241ක් සඳහා සැලසුම් නිම කර ඇති අතර වැව් 232ක් සඳහා ඇස්තමේන්තු නිම කර ඇත. වැව් 96 ක් සඳහා ටෙන්ඩර් පත්‍රිකා සූදානම් කර ඇත. වැව් 96ක් සඳහා ටෙන්ඩර් කැඳවා ඇත. වැව් 48 ක් සඳහා කොන්ත්‍රාත් ප්‍රදානය කර ඇත. වැව් 48 ක ඉදිකිරීම් කටයුතු ආරම්භ කර ඇති අතර 24 ක ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇත.
2.2.1 සමාජ විගණන කමිටුවක් පිහිටුවීම සහ ධාරිතාව සංවර්ධනය	166 කි.	සාමාජිකයින් 728ක් සහිතව කමිටු 102ක් පිහිටුවා ඇත.
2.2.2 ඒල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු පිහිටුවීම සහ ඔවුන් පුහුණු කිරීම	27 කි.	සාමාජිකයින් 288ක් සහිතව කමිටු 4ක් පිහිටුවා ඇත.

සංරචකය -3 : ව්‍යාපෘති කළමනාකරණය			
වෙන් කළ ප්‍රතිපාදන (රු. මි.)	298.5	වියදම (රු. මි.)	වැටුප් පිරිවැය, මෙහෙයුම් පිරිවැය, කාර්යාල උපකරණ මිලදී ගැනීම ප්‍රසම්පාදනය, වාහන කුලියට ගැනීම සහ ගොඩනැගිලි කුලියට ගැනීම ප්‍රසම්පාදනය ආදී වියදම් සඳහා
3.1 තොරතුරු අධ්‍යාපනික සන්නිවේදන (IEC) වැඩසටහන් පැවැත්වීම		වැඩසටහන් 300	වැඩසටහන් 355 ක් පවත්වා ඇති අතර පුද්ගලයින් 12654 ක් සහභාගි වී ඇත.
3.2 පළාත් සහ ජාතික වාර්ෂික ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම සහ ප්‍රගති වාර්තා පිළියෙල කිරීම		24	සැලසුම් 24 ක් සකස් කර භාර දී ඇත.
3.3 දුක්ගැනවිලි පිළිබඳව කටයුතු කිරීමේ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම		11	යාන්ත්‍රණය ස්ථාපිත කර ලැබී ඇති ගැටළු නිරාකරණය කර ඇත
3.4 මධ්‍ය කාලීන සමාලෝචනය හා තක්සේරුව		1	උපදේශක සමාගම හඳුනාගෙන කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර ක්‍රියාත්මක වෙමින් පවතී.



දේශගුණ සුහුරු වාරි කෘෂිකාර්මික ක්‍රම අනුගමනය කරමින් කහ වගාව - නෙළුවගල - වැල්ලවාය



දේශගුණ සුහුරු වාරි කෘෂිකාර්මික ක්‍රම අනුගමනය කරමින් අඹ වගාව - බුත්තල



පොකුරු ගම්මාන සංවර්ධනය වැඩසටහන යටතේ රටකජු බීජ නිෂ්පාදනය - අක්කරායන්, කිලිනොච්චි

කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර හවුල්කාරිත්ව වැඩසටහන (SAPP)

හඳුන්වාදීම : කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වන අන්තර්ජාතික අරමුදල (IFAD) සහ ශ්‍රී ලංකා රජය ඒකාබද්ධව කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර හවුල්කාරිත්ව වැඩසටහන (SAPP) සඳහා අරමුදල් සපයයි. සිය ශක්‍යතාව වැඩිදියුණු කරගැනීමට හා සහනික කරන ලද වෙළඳපොලක් සඳහා වාණිජමය හවුල්කාරිත්ව සහ වෙළඳපොල සබඳතා නිර්මාණය කිරීමට පාර්ශ්වකරුවන් (පෞද්ගලික සමාගම්, ගොවි සංවිධාන සහ කුඩා පරිමාණ ගොවීන්) වෙත සහනාධාරයට යටත් පොලී අනුපාතයක් මත ප්‍රදාන සහ ණය ලබාදීමේ රාජ්‍ය පෞද්ගලික නිෂ්පාදන හවුල්කාරිත්වය (Public Private Producer Partnership) හෙවත් 4P ප්‍රවේශය මගින් කෘෂිකාර්මික භාණ්ඩවල තෝරාගත් අගයදාම ශක්තිමත් කිරීම සඳහා මෙම වැඩසටහන මගින් සහාය ලබා දෙයි.

තවදුරටත්, පුහුණුව සහ තාක්ෂණික දැනුම ලබා දෙමින් හා වාසිදායක ප්‍රතිපත්තිමය පරිසරයක් සඳහා අනුබල ලබා දෙමින් කෘෂිකර්ම මාවත් සහ අමුණු වැනි යටිතල ව්‍යුහ පහසුකම් වැඩිදියුණු කිරීම මගින් සිය ගොවි සංවිධාන ශක්තිමත් කිරීමට SAPP මගින් කුඩා පරිමාණ ගොවීන් වෙත සහාය ලබා දේ.

ඉලක්කය : කුඩා පරිමාණ ගොවීන්ගේ දරිද්‍රතාව හා තරහකාරිත්වය සඳහා දායකත්වය ලබා දීම

අරමුණ : වාණිජ පරමාර්ථයෙන් නිෂ්පාදන හා අලෙවි කටයුතුවල නිරත කුඩා පරිමාණ ගොවීන්ගේ (ගෘහස්ථ ඒකක 57,000) ආදායම (20%-30%කින්) සහ ආහාර වේල්හි ගුණාත්මකබව තිරසර ලෙස ඉහළ නැංවීම

ඉලක්ක:

1. පෞද්ගලික අංශය හා එක්ව කුඩා පරිමාණ ගොවීන් සහ ඔවුන්ගේ සංවිධාන වෙළඳපොලට ප්‍රවේශ වීම ඉහළ නැංවීම.
2. SAPP යටතේ කුඩා පරිමාණ ගොවීන් හට තිරසර ලෙස සහ දැරිය හැකි මිල ගණන්වලට ග්‍රාමීය මූල්‍ය සේවාවන් ලබාගත හැකි බව ඉහළ නැංවීම.
3. කුඩා පරිමාණ ගොවීන් මූලාශ්‍ර කරගත් සමාන සහ තිරසර කෘෂි-ව්‍යාපාර සංවර්ධනය වෙනුවෙන් ප්‍රතිපත්තිමය පරිසරය වැඩිදියුණු කිරීම.

ව්‍යාපෘතියේ විස්තර

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ දිනය	2017 ජුනි 26	
අපේක්ෂිත ව්‍යාපෘති කාලසීමාව	අවුරුදු 06	
මෙහෙයුම් ආරම්භ කළ දිනය	2017 ජුනි 26	
ව්‍යාපෘති කාලසීමාව දීර්ඝ කිරීම	-	
මූල්‍යකරණ මූලාශ්‍රය (විදේශ අරමුදල්)	කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර අරමුදල (IFAD) (ඇමෙරිකා එක්සත් ජනපද ඩොලර් මිලියන 54.4)	
මූල්‍යකරණ මූලාශ්‍රය (ප්‍රතිපාර්ශ්වීය අරමුදල්)	මහා භාණ්ඩාගාරය, ශ්‍රී ලංකා රජය (ඇමෙරිකා එක්සත් ජනපද ඩොලර් මිලියන 19.3)	ඒකාබද්ධ අරමුදල (බදු සහ ද්විතියික කාර්යමණ්ඩල වැටුප් සඳහා)
		වක්‍රීය අරමුදල (ණය සඳහා)
අදාල අංශය	කෘෂිකාර්මික සංවර්ධනය	
වගකිව යුතු ආයතනය	ව්‍යාපෘති කළමනාකරණ ඒකකය - කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ SAPP	

සංරචක

ප්‍රධාන සංරචක	සංරචකවලට අනුව ව්‍යාපෘති පිරිවැය (ශ්‍රී ලංකා රුපියල් මිලියන)	සංරචකවලට අනුව පිරිවැය (ශ්‍රී ලංකා රුපියල් මිලියන) 2021
1.වාණිජමය හවුල්කාරිත්වය සඳහා ප්‍රවේශය	5,966	848.5
2. ග්‍රාමීය මූල්‍ය පහසුකම් සඳහා ප්‍රවේශය	5,086	1,100.0
3. වැඩසටහන් කළමනාකරණය සහ ප්‍රතිපත්ති පිළිබඳ සංවාදය	1,004	144.6
මුළු පිරිවැය (IFAD + ශ්‍රී ලංකා රජය)	**12,056**	**2100.0**

ප්‍රධාන සංරචකවලට අනුව ප්‍රගතිය

සංරචකය - 01. වාණිජමය හවුල්කාරිත්වය සඳහා ප්‍රවේශය

සංරචකය	01. වාණිජමය හවුල්කාරිත්වය සඳහා ප්‍රවේශය මෙම සංරචකය තවත් උප සංරචක දෙකකින් සමන්විත වේ: (1.1) 4P ස්ථාපිත කිරීම; සහ (1.2) ආයතනික වශයෙන් ශක්තිමත් කිරීම සහ නිෂ්පාදන කණ්ඩායම්හි ධාරිතාව සංවර්ධනය කිරීම (වෙළඳපොල අරමුණු කරගත් ආකෘතියක් තුල). මෙම ව්‍යාපෘතිය අවසානයේ සෘජුවම 4P යෝජනා ක්‍රම හා ආයතනික ශක්තිමත් කිරීම් නිවාස ඒකක 43,000ක් කරා ළඟා කිරීම සඳහා මැදිහත්වීමට අපේක්ෂා කෙරේ. 4P මගින් උත්පාදනය කරන නිෂ්පාදිත හෝ සේවාවන් සඳහා පවතින ඉල්ලුමට ප්‍රතිචාරීව ව්‍යවසායකයින් බවට පත්වීම උදෙසා තවත් තරුණ, තරුණියන් 2,500ක් වෙත සහාය ලබා දෙනු ඇත.		
වෙන්කිරීම් (ශ්‍රී ලංකා රුපියල් මිලියන)	848.5	**වියදම (ශ්‍රී ලංකා රුපියල් මිලියන)**	523.3

අරමුණ : පෞද්ගලික අංශය සමඟ හවුල්කාරිත්වයෙන් කුඩා පරිමාණ ගොවීන් හා ඔවුන්ගේ සංවිධාන වෙළඳපොලට ප්‍රවේශ වීම ඉහළ නැංවීම

ක්‍රියාකාරකම	**ඒකකය**	**ඉලක්කය**	**ළඟාකරගත් ප්‍රගතිය**
ගොවිපොල සංවර්ධනය සඳහා ප්‍රදාන හා ආරම්භක අරමුදල් ගැලපීම	ප්‍රතිලාභීන් ගණන	**5,647**	**9,746**
1.1පෞද්ගලික අංශය මගින් මෙහෙයවනු ලබන තනි පුද්ගලයින් විසින් මූල්‍ය පහසුකම් සපයනු ලබන නව රාජ්‍ය-පෞද්ගලික නිෂ්පාදක හවුල්කාරිත්වයන් (4P) සඳහා ප්‍රදාන ගැලපුම් ලබා දීම. SAPP සතුව පෞද්ගලික අංශය මගින් මෙහෙයවනු ලබන 4P 15ක් ඇත.		2,926	2,086
1.2 SAPP වැඩසටහනට පෙර IFAD අරමුදල් සමඟින් ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන වැඩසටහනේ පරිමාණය ඉහළ නංවන ලද 4P සඳහා ප්‍රදාන ගැලපීම් ලබාදීම ක්‍රියාත්මක කරන ලදී. එකී වැඩසටහන මගින් පෞද්ගලික අංශය මෙහෙයවනු ලබන 4P 17ක් පිහිටුවා ඇත. SAPP මගින් පරිමාණය ඉහළ නැංවීම සඳහා එවැනි හවුල්කාරිත්වයන් 4ක් තෝරාගෙන ඇති අතර, ඉහත සඳහන් පරිදි, සමාගම් විසින් තෝරාගත් ගොවීන් සමඟ නැවත මිලදීගැනීමේ තනි ගිවිසුම්වලට අත්සන් තබා ඇත.		350	287
1.3 ගොවි සංවිධාන වෙත ආරම්භක අරමුදල් ලබාදීම මෙම කාර්යය යටතේ, ගොවි සංවිධාන ප්‍රවර්ධකයින් ලෙස කටයුතු කරන අතර, ගොවීන්ගේ අස්වැන්න මිලදීගැනීමට ගොවීන් සමඟ ගිවිසුමක් අත්සන් කැබිය යුතු වන ව්‍යාපෘති කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා සමස්ත වගකීම දරනු ලබයි. ඉන් අනතුරුව, ගොවි සංවිධාන අගය එකතු කිරීම හෝ සමස්ත අස්වැන්නම පෞද්ගලික අංශයේ ගැණුම්කරුවෙකු වෙත අලෙවි කිරීම සිදු කරනු ලබයි. ගොවි සංවිධානවල සාමාජිකයින් එනම්, ප්‍රතිලාභීන් වෙත ගොවි සංවිධාන හරහා ආදායම් හිමිවන අතර, සිය සම්බන්ධීකරණය, මෙහෙයුම් සහ නඩත්තු කිරීම් වෙනුවෙන් ගොවි සංවිධානවලටද ආදායම් හිමි වනු ඇත. දැනට, SAPP මගින් ගොවි සංවිධාන සමඟ එවැනි හවුල්කාරිත්වයන් 15ක් පවත්වාගෙන යයි.		2,371	7,391

ක්‍රියාකාරකම	ඒකකය	ඉලක්කය	ළඟාකරගත්
ගොවිපොලෙන් පිටත පහසුකම් සංවර්ධනය කිරීම ගොවිපොල සංවර්ධන කටයුතු සඳහා කුඩා පරිමාණ ගොවීන් වෙත සහාය ලබාදීම හැර, කෘෂි මාවත්, කුඹුරුවල ඇළ මාර්ග අලුත්වැඩියා කිරීම/ඉදි කිරීම හා ග්‍රාමීය කෘෂිකර්මයට අදාල වෙනත් කටයුතු වැනි ගොවිපොලෙන් පිටත සංවර්ධන කටයුතු සඳහා SAPP මගින් සහාය ලබා දෙයි.	ව්‍යාපෘති ගණන	28	දැනට සිදු කෙරෙන 16
ගොවි නිෂ්පාදක සංවිධාන සඳහා ආරම්භක අරමුදල් සහාය ලබා දීම	සහාය ලබා දී ඇති ගොවි නිෂ්පාදක සංවිධාන සංඛ්‍යාව	11	1
තරුණයින් සඳහා ආරම්භක අරමුදල් ලබා දීම මෙම කාර්යය යටතේ, ව්‍යවසායකයෙකු බවට පත්වීම සඳහා තරුණයින් වෙත SAPP මගින් ප්‍රදාන ලබා දෙයි.	ප්‍රතිලාභීන් සංඛ්‍යාව	550	476
සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කර ඇති ක්ෂේත්‍රය	සමස්ත දිවයින (ඇගයීමක්/තෝරාගැනීමේ ක්‍රියාවලියක් හරහා අඩු ආදායම්ලාභී සහ කෘෂි නිෂ්පාදන හැකියාව ඉතා ඉහළ දිස්ත්‍රික්ක කෙරෙහි විශේෂ අවධානයක් හා වරණයක් යොමු කර තිබුණද, මෙම වැඩසටහනේ ක්‍රියාකාරකම් දිවයින පුරා ව්‍යාප්තව ඇත.)		
ප්‍රතිලාභීන් සංඛ්‍යාව -	10,222 (සමුච්චිත වශයෙන් 21,541)		
ප්‍රතිලාභීන්ගේ සංඛ්‍යාව මගින් ව්‍යාපෘතියට සම්බන්ධ වන නිවාස ඒකක ගණන නියෝජනය කෙරේ. නිවාස ඒකකයකින් එක් ප්‍රතිලාභියෙකු පමණක් මෙම වැඩසටහන සඳහා තෝරා ගැනේ. වයස අවුරුදු 40ට අඩු තනි පුද්ගලයෝ තරුණ ප්‍රජාව නියෝජනය කරති. මෙම ව්‍යාපෘති මගින් 4P හවුල්කාරිත්වය යටතේ නිවාස ඒකක 43,500කටද, තරුණ ප්‍රතිලාභීන් 2,500කටද සේවය සලසනු ලැබේ. වර්තමානයේ සිය ගොවිපොල කටයුතු ශක්තිමත් කිරීම සඳහා ස්ථාපිත කර ඇති 4P ව්‍යාපෘති 34කට කුඩා පරිමාණ ගොවීන් 39,212දෙනෙකු හවුල් වී ඇති අතර, මේ දක්වා 47%ක සමුච්චිත ප්‍රගතිය අත්කර ගනිමින්, සමස්ත සමුච්චිත නිවාස ඒකක 21,541ක් දක්වා ළඟාවෙමින් මෙම වර්ෂය තුල මුළු නිවාස ඒකක 10,222ක් වෙත ප්‍රදාන හිමි වී ඇත.			
පවත්වන ලද පුහුණු සැසි/ක්ෂේත්‍ර චාරිකා සංඛ්‍යාව	• ව්‍යාපාර සංවර්ධනය සහ FOP/COOPහි ආයතනික ශක්තිමත්භාවය සඳහා තාක්ෂණික සහායන් 02 • තාක්ෂණික පුහුණු හා උපදේශක සේවා යටතේ 219දෙනෙකු පුහුණු කරවන ලදී • ප්‍රායෝගික අත්දැකීම් ලබා දෙන චාරිකා 16ක් අවසන් කරන ලදී • අගය දාම නොරතුරු එක්රැස්කරන්නන්/ව්‍යාපෘති නොරතුරු එක්රැස්කරන්නන් සඳහා පුහුණු සැසි 02		

ක්ෂේත්‍ර නිරීක්ෂණ

2021 ඔක්තෝබර් 23වන දින රුවන්සිරි කිරි ව්‍යාපෘතියේ ප්‍රතිලාභීන් වෙත කිරි නිපදවීමේ යන්ත්‍ර ලබාදීම 2021 ඔක්තෝබර් 23වන දින පවත්වන ලදී

අනුර මහතා (BD විශේෂඥ), සජිත් මහතා (ව්‍යාපෘති නිලධාරි) සහ අනිල් මහතා - (RPC) නිලධාරීන් ලෙස නියෝජනය කරන ලදී.





සංරචකය - 02. ග්‍රාමීය මූල්‍ය සඳහා ප්‍රවේශය

සංරචකය	02.ග්‍රාමීය මූල්‍ය සඳහා ප්‍රවේශය මෙම සංරචකය තවත් උප සංරචක දෙකකින් සමන්විතය: (2.1) 4P සඳහා මූල්‍ය පහසුකම් සැලසීම; සහ (2.2) මූල්‍ය සේවා අංශය සඳහා ආයතනික ශක්තිමත්භාවය. මෙම සංරචකය මගින් සංරචක 1 යටතේ (4පී සහ තරුණ ව්‍යවසායකයින්ගේ ණය අවශ්‍යතා සපුරාලීම) පැන නැගෙන උපායමාර්ග, මැදිහත්වීමේ ක්‍රම සහ ආයෝජන අවස්ථා අනුගමනය කරන අතර, බොහෝ දුරට පුහුණුව සහ තාක්ෂණික සහාය හරහා තිරසර අයුරින් ග්‍රාමීය මූල්‍ය සේවා සඳහා ප්‍රවේශවීමට පහසුකම් සලසාදීම අරමුණු කෙරේ.		
වෙන් කිරීම (ශ්‍රී ලංකා රුපියල් මිලියන)	1,100	**වියදම (ශ්‍රී ලංකා රුපියල් මිලියන)**	1,018

අරමුණ: SAPP යටතේ කුඩා පරිමාණ ගොවීන් හට තිරසර ලෙස සහ දැරිය හැකි මිලගණන්වලට ග්‍රාමීය මූල්‍ය සේවාවන් ලබාගත හැකි බව ඉහළ නැංවීම

ක්‍රියාකාරකම	**ඒකකය**	**ඉලක්කය**	**ළඟාකරගෙන ඇති**
1. IFAD අරමුදල් සමඟ ණය මාලාව භාවිත කරමින් 4P නිවාස හිමියන් සහ තරුණයින් වෙත ණය ලබා දීම	ප්‍රතිලාභීන් සංඛ්‍යාව	2,415	2,284
2. චක්‍රීය අරමුදල් සමඟ ණය මාලාව		2,655	1,888
සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කර ඇති ක්ෂේත්‍රය	සමස්ත දිවයින (ප්‍රධාන වශයෙන් කෘෂි නිෂ්පාදන හැකියාව ඉහළ මට්ටමක ඇති අඩු ආදායම්ලාභී දිස්ත්‍රික්ක)		
ප්‍රතිලාභීන් සංඛ්‍යාව	4,172 (සමුච්චිත වශයෙන් 12,302)		

ප්‍රතිලාභීන්ගේ සංඛ්‍යාව මගින් ව්‍යාපෘතියට සම්බන්ධ වන නිවාස ඒකක ගණන නියෝජනය කෙරේ. නිවාස ඒකකයකින් එක් ප්‍රතිලාභියෙකු පමණක් මෙම වැඩසටහන සඳහා තෝරාගැනේ. වයස අවුරුදු 40ට අඩු තනි පුද්ගලයෝ තරුණ ප්‍රජාව නියෝජනය කරති.
මෙම සංරචකය යටතේ කාණ්ඩ 03ක් මගින් ණය ලබාදෙයි (එනම්, 4පී ප්‍රතිලාභීන්, තරුණ හා ආදායම් ජනනය කරන ණය). මෙම සංරචකය සඳහා සමස්ත ඉලක්කය ප්‍රතිලාභීන් 39,213කි. දැනට 31%ක සමුච්චිත ප්‍රගතියක් ළඟාකරගෙන ඇත. 4පී ණය 9,535ක්, ආදායම් ජනනය කරන ණය 1,048ක් සමුච්චිතව ලබා දී ඇත.

පවත්වන ලද පුහුණු සැසි/ක්ෂේත්‍ර චාරිකා සංඛ්‍යාව	• CBSL/PFI සහ ප්‍රතිලාභීන් ශක්තිමත් කිරීම (තාක්ෂණික සහාය සහ මූල්‍ය සාක්ෂරතාව පිළිබඳ පුහුණුව) යටතේ 2,500දෙනෙකු පුහුණු කරන ලදී.

ක්ෂේත්‍ර නිරීක්ෂණ



"ගුරුළුවන ගැමුණු සණස සමිතිය" ණය බෙදාදීම 2021 දෙසැම්බර් 19වන දින පවත්වන ලදී. බණ්ඩාර මහතා (උපදේශක MF) සහ නිශාන්ත මහතා (RPC) නිල නියෝජිතයෝ වූහ.



සංරචකය - 03. වැඩසටහන් කළමනාකරණය සහ ප්‍රතිපත්ති පිළිබඳ සංවාදය

සංරචකය	03. වැඩසටහන් කළමනාකරණය සහ ප්‍රතිපත්ති පිළිබඳ සංවාදය		
වෙන්කිරීම් (ශ්‍රී ලංකා රුපියල් මිලියන)	144.6	වියදම (ශ්‍රී ලංකා රුපියල් මිලියන)	96.8
අරමුණ : කුඩා පරිමාණ ගොවීන් මූලාශ්‍ර කරගත් සමාන සහ තිරසර කෘෂි-ව්‍යාපාර සංවර්ධනය වෙනුවෙන් ප්‍රතිපත්තිමය පරිසරය වැඩිදියුණු කිරීම			

ක්‍රියාකාරකම	ඒකකය	ඉලක්කය	ළඟාකරගත්
1. අලුත් ව්‍යාපාර, සංවේදීකරණය පිළිබඳ හා අධ්‍යාපනික වැඩමුළු පැවැත්වීම (සංඛ්‍යාව)	නැත	1	1
2. පාර්ශ්වකරුවන්ගේ වාර්ෂික සැලසුම් හා සමාලෝචන වැඩමුළු පැවැත්වීම (සංඛ්‍යාව)		1	1
3. වාර්ෂික ව්‍යාපාර සංසද (සංඛ්‍යාව)		1	
4. සංසන්දනය කිරීමේ සාධක, වාර්ෂික ප්‍රතිඵල හා බලපෑම් පිළිබඳ සමීක්ෂණ/පීසීඅාර් (සංඛ්‍යාව)			
4.1 සංසන්දනය කිරීමේ සාධක පිළිබඳ සමීක්ෂණ		20	8
4.2 ඉලක්ක කිරීම් පිළිබඳ සමීක්ෂණ		10	10
5. කෘෂිකර්මාන්තය ආශ්‍රිත තාක්ෂණික අධ්‍යයන පැවැත්වීම		1	
6. තොරතුරු හා සන්නිවේදනයට අදාල මාධ්‍ය		7	7
7. පුහුණු කිරීමේ අත්පොත්		3	1
8. පාරිසරික/දේශගුණික වෙනස්කම් පිළිබඳ අත්පොත් වැඩිදියුණු කිරීම		1	1
9. පාර්ශ්වකරුවන්ගේ රැස්වීම්		2	3
10. ප්‍රතිපත්තිමය ගැටලු පිළිබඳ පර්යේෂණ අධ්‍යයනයන්		2	-
** එසේම, කාර්යමණ්ඩලය සඳහා වැටුප් ගෙවීම, උපදේශක සේවා වියදම්, කාර්යාලය නඩත්තු කිරීම සහ මෙහෙයුම් වියදම් සඳහා මෙම සංරචකය යොදාගැනේ.			
සංවර්ධන වැඩසටහන් පවත්වන ලද ක්ෂේත්‍රය	දිවයින පුරා		
පවත්වන ලද පුහුණු සැසි/ක්ෂේත්‍ර චාරිකා සංඛ්‍යාව	අඟය දාම තොරතුරු සපයන්නන් සඳහා අධීක්ෂණය හා ඇගයීම සහ දත්ත එක්රැස්කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන් **02** 4P ප්‍රතිලාභීන් සඳහා පෝෂණය පිළිබඳ පුහුණු වැඩසටහන් **07** 4P ප්‍රතිලාභීන් සඳහා ස්ත්‍රීපුරුෂභාවය පිළිබඳ පුහුණු වැඩසටහන් **14**		

ක්ෂේත්‍ර නිරීක්ෂණ

ස්ත්‍රී පුරුෂභාවය, පෝෂණය හා පරිසර සංරක්ෂණය පිළිබඳ අනුරාධපුරයේදී පවත්වන ලද පුහුණු වැඩසටහන

2021 ඔක්තෝබර් 20වන දින පනියන්කඩවල මිරිස් ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන පරිශ්‍රයේදී මුදලිගේ මහතා (උපදේශක - පෝෂණය) හා ෆ්‍රැන්ක් මහතා (උපදේශක - දේශගුණය) විසින් අතිසාර්ථක ලෙස පවත්වන ලදී





ව්‍යාපෘතියේ (සංශෝධිත) ප්‍රතිලාභීන්ගේ ඉලක්ක බෙදාහැරීම සහ සමුච්චිත එක්රැස්කිරීම්

කාණ්ඩය	ඉලක්කය	සමුච්චිත (ණය/ප්‍රදාන)	එක්රැස්කිරීම්
පෞද්ගලික අංශය මෙහෙයවන ලද **4P**	24,500		7,374
පරිමාණය ඉහළ නංවන ලද ජාතික කෘෂිකර්ම සංවර්ධන වැඩසටහන	5,500		/5,392
4P මගින් මෙහෙයවනු ලබන කොටස් නිකුත් කිරීම	13,000		9,548
මුළු 4P	**43,000**		**22,314**
තරුණයින් වෙත ආරම්භක අරමුදල්	2,500		1,048
ආයෝජන ණය	12,000		1,698
මුළු එකතුව	**57,500**		**25,060**

ප්‍රධාන සංරචක දෙකක් ඔස්සේ ප්‍රතිලාභීන් බෙදාහැරීම

සංරචකය	ඉලක්ක	සමුච්චිත අත්පත්කරගැනීම්
වාණිජමය හවුල්කාරිත්වය සඳහා ප්‍රවේශය	**45,500**	**21,541**
පෞද්ගලික සමාගම් මගින් මෙහෙයවනු ලබන නව 4P	24,500	6,746
පරිමාණය ඉහළ නංවන ලද ජාතික කෘෂිව්‍යාපාර සංවර්ධන වැඩසටහන 4P	5,500	4,840
4P මගින් මෙහෙයවනු ලබන කොටස් නිකුත් කිරීම	13,000	9,426
තරුණයින් සඳහා ප්‍රදාන/අරමුදල්	2,500	529
ග්‍රාමීය මූල්‍ය සඳහා ප්‍රවේශය	**39,213**	**12,281**
4P	24,713	9,535
ජාතික කෘෂිව්‍යාපාර සංවර්ධන වැඩසටහන 4P /ආදායම් ජනනය	12,000	1,048
තරුණ	2,500	1,698

මූල්‍ය අත්පත්කරගැනීම් 2021

සංරචක	සංරචකය	වාර්ෂික සැලසුම්ගත ඉලක්කය (රු.මිලියන)	වාර්ෂික ගෙවීම් (රු.මිලියන)	ප්‍රගතිය
සංරචකය 1	**වාණිජමය හවුල්කාරිත්වය සඳහා ප්‍රවේශය**	**848.5**	**523.3**	**62%**
සංරචකය 2	**ග්‍රාමීය මූල්‍ය සඳහා ප්‍රවේශය**	**1,107.0**	**1018.1**	**92%**

සංරචක	සංරචකය	වාර්ෂික සැලසුම්ගත ඉලක්කය	වාර්ෂික ගෙවීම් (රු.මී)	ප්‍රගතිය
සංරචකය 3	වැඩසටහන් කළමනාකරණය සහ ප්‍රතිපත්තිමය සහාය	**144.5**	**97.0**	**67%**
මුළු ප්‍රදාන	මුළු	**2,100.0**	**1,638.4**	**78%**

සමුච්චිත මූල්‍ය අත්පත්කරගැනීම්

සංරචක	සංරචකය	සැලසුම්ගත ඉලක්කය (රු.මී)	සමුච්චිත ගෙවීම් (රු. මී)	ප්‍රගතිය
සංරචකය 1	වාණිජමය හවුල්කාරිත්වය සඳහා ප්‍රවේශය	**5,966.0**	**990.2**	**17%**
සංරචකය 2	ග්‍රාමීය මූල්‍ය සඳහා ප්‍රවේශය	**5,086.0**	**2657.4**	**52%**
සංරචකය 3	වැඩසටහන් කළමනාකරණය සහ ප්‍රතිපත්තිමය සහාය	**1,004.0**	**397.4**	**40%**
මුළු ප්‍රදාන		**12,056.0**	**4,045.0**	**34%**

කුඩා පරිමාණ කිරි නිෂ්පාදකයින්ගේ සමූපකාර සමිති සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය

ශ්‍රී ලංකාවේ කිරි කර්මාන්තය නගාසිටුවීමේ අරමුණින් ප්‍රංශ ජනරජයේ සහයෝගිතාවය ඇතිව කුඩා පරිමාණ කිරි නිෂ්පාදකයින්ගේ සමූපකාර සමිති/ ගොවි සමිති 06 ක් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියෙහි සම්බන්ධීකරණ කටයුතු පශු සම්පත්, ගොවිපොළ ප්‍රවර්ධන සහ කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය මඟින් සිදු කරනු ලබයි. ඒ සඳහා යූරෝ මිලියන 13.9 ක ණය මුදලක් ලබා ගැනීමේ මූල්‍ය එකඟතා ගිවිසුමට (Financial Protocol) මුදල් අමාත්‍යාංශය ප්‍රංශ ජනරජය සමඟ 2017/12/27 සහ ව්‍යාපෘතියේ මූල්‍ය ගිවිසුමට (Financial Agreement) 2018/09/28 දින අත්සන් තබා ඇත. තවද, ව්‍යාපෘතියට අදාළ කොන්ත්‍රාත් ගිවිසුම (Contract/ Supply Agreement) 2019/02/27 දින අත්සන් තබා ඇත. ප්‍රංශ ජනරජයේ විශේෂඥයින් සමඟ එක්ව සංවර්ධනය කිරීමට අපේක්ෂිත පහත සඳහන් කුඩා පරිමාණ කිරි සැකසුම් මධ්‍යස්ථාන 06 ක් හඳුනාගන්නා ලදී.

01. අත්තනගල්ල කිරි නිපදවන්නන්ගේ සමූපකාර සමිතිය
02. කුඩා පරිමාණ කිරි පට්ටි සංවර්ධන සමිතිය, වාරියපොළ
03. සී/ස පොළොන්නරුව දිස්ත්‍රික් කිරි සැපයුම්කරුවන්ගේ සමූපකාර සමිතිය
04. සක්සීඩ් ඉන්ටර්නැෂනල් (පුද්.) සමාගම, වෙන්නප්පුව
05. සී/ස නාවලපිටිය විවිධ සේවා සමූපකාර සමිතිය, නාවලපිටිය
06. හෙරිටේජ් හෙළ ගොවි සංවර්ධන සමිතිය, කැප්පෙටිපොළ

ව්‍යාපෘතියෙහි අරමුණු

මෙම ව්‍යාපෘතියෙහි මූලික අරමුණු වනුයේ අගය එකතු කළ කිරි නිෂ්පාදන අදාළ ප්‍රදේශවලම නිෂ්පාදනය කර කිරි පරිභෝජනය ඉහළ දැමීම මඟින් ළමුන්ගේ සහ වැඩිහිටියන්ගේ පෝෂණ මට්ටම ඉහළ නැංවීමත්, ජාතික කිරි කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමත් වේ.

ව්‍යාපෘති විස්තර	**කුඩා පරිමාණ කිරි නිෂ්පාදකයින්ගේ සමුපකාර සමිති සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය**
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ආරම්භක දිනය	2019.02.17
අපේක්ෂිත කාලය	වසර 02
මෙහෙයුම් කටයුතු ආරම්භක දිනය	2019.02.17
ව්‍යාපෘතිය දීර්ඝ කිරීම	දීර්ඝ කර නැත .
මූල්‍ය සැපයුම් ප්‍රභවය	ප්‍රංශ රජය - ශ්‍රී ලංකා රජය
අදාළ ක්ෂේත්‍රය	දියර කිරි නිෂ්පාදනය
වගකීම් දරන ආයතනය	පශු සම්පත්, ගොවිපොළ ප්‍රවර්ධන කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය, ප්‍රංශයේ BOCCARD SA ආයතනය සහ Foresight Engineering (Pvt) Ltd ආයතනය.

සංරචක (කුඩා පරිමාණ කිරි සැකසුම් මධ්‍යස්ථාන ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය)		
ප්‍රධාන සංරචක	**සංරචක අනුව පිරිවැය**	
01. කිරි සැකසුම් කර්මාන්තශාලාවලට අවශ්‍ය යන්ත්‍රෝපකරණ ආනයනය. 02. අදාළ යන්ත්‍රෝපකරණ සවිකිරීම් කටයුතු සිදු කිරීම සහ නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීම.	ගිවිසුමෙහි මෙම සංරචක සඳහා වෙන් වෙන් වශයෙන් පිරිවැය බෙදා වෙන් කිරීමක් සිදු කර නොමැති අතර, ව්‍යාපෘතියෙහි සමස්ථ පිරිවැය යූරෝ. 13,899,998.00 / රු. 2,821,699,594.00 වේ.	
ප්‍රධාන සංරචක	**සංරචක අනුව පිරිවැය**	
03. යන්ත්‍රෝපකරණ ආනයනයන්ට අදාළ බදු ගෙවීම් කටයුතු	මෙම ගෙවීම් කටයුතු ව්‍යාපෘතියෙහි දේශීය ප්‍රතිපාදන හරහා සිදු කෙරෙන අතර, ශ්‍රී ලංකා රේගුව විසින් ඉදිරිපත් කරන ලද ගණනය කිරීම්වලට අනුව ඉදිරියේදී බදු ගෙවීම් සිදු කල යුතුය.	
සංරචකය 01	කිරි සැකසුම් කර්මාන්තශාලාවලට අවශ්‍ය යන්ත්‍රෝපකරණ ආනයනය.	
ක්‍රියාත්මක සැළැස්මේ සඳහන් ක්‍රියාකාරකම්	සපුරාගත යුතු ඉලක්කය	අත්කරගත් භෞතික ප්‍රගතිය
1. වෙන්නප්පුව කිරි සැකසුම් මධ්‍යස්ථානය 2. වාරියපොළ කිරි සැකසුම් මධ්‍යස්ථානය 3. අත්තනගල්ල කිරි සැකසුම් මධ්‍යස්ථානය 4. පොළොන්නරුව කිරි සැකසුම් මධ්‍යස්ථානය 5. නාවලපිටිය කිරි සැකසුම් මධ්‍යස්ථානය	අවශ්‍ය යන්ත්‍රෝපකරණ දිවයිනට ආනයනය කිරීම.	යන්ත්‍රෝපකරණ දිවයිනට ආනයනය කර ඇත.
6. කැප්පෙටිපොළ කිරි සැකසුම් මධ්‍යස්ථානය		යන්ත්‍රෝපකරණ 2022 ජනවාරි මසදී දවයිනට ආනයනය කිරීමට නියමිතය.

ක්‍රියාත්මක සැළැස්මේ සඳහන් ක්‍රියාකාරකම්	සපුරාගත යුතු ඉලක්කය	අත්කරගත් භෞතික ප්‍රගතිය
සංරචකය 02	අදාළ යන්ත්‍රෝපකරණ සවිකිරීමේ කටයුතු සිදු කිරීම සහ නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීම.	
1. වෙන්නප්පුව කිරි සැකසුම් මධ්‍යස්ථානය	අදාළ යන්ත්‍රෝපකරණ සවිකිරීමේ කටයුතු සිදු කිරීම, යටිතල පහසුකම් සම්පූර්ණ කිරීම සහ නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීම.	95%
2. වාරියපොළ කිරි සැකසුම් මධ්‍යස්ථානය		96%
3. අත්තනගල්ල කිරි සැකසුම් මධ්‍යස්ථානය		96%
4. පොළොන්නරුව කිරි සැකසුම් මධ්‍යස්ථානය		95%
5. නාවලපිටිය කිරි සැකසුම් මධ්‍යස්ථානය		2022 ජනවාරි මසදී සවිකිරීම් කටයුතු ආරම්භ කිරීමට නියමිතය.
6. කැප්පෙටිපොළ කිරි සැකසුම් මධ්‍යස්ථානය		
සංවර්ධන වැඩසටහන සිදුකළ ප්‍රදේශය (දිස්ත්‍රික්කය/ ග්‍රාම නිලධාරී වසම)	පුත්තලම, කුරුණෑගල, ගම්පහ, පොළොන්නරුව, මහනුවර සහ කළුතර දිස්ත්‍රික්ක	
ප්‍රතිලාභීන් සංඛ්‍යාව	ප්‍රතිලාභී ගොවි පවුල් 10,000	
සිදු කරන ලද පුහුණු වැඩමුළු ක්ෂේත්‍ර නිරීක්ෂණ සංඛ්‍යාව	01	

2021 04.07 දින ක්ෂේත්‍ර නිරීක්ෂණය - වෙන්නප්පුව කුඩා පරිමාණ කිරි සැකසුම් මධ්‍යස්ථානය ඉදි කිරීම සම්බන්ධ ප්‍රගතිය සහ උද්ගතව ඇති ගැටළු, අධ්‍යක්ෂ/ ව්‍යාපෘති කළමනාකරණ හා ඇගැයුම් දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය, ව්‍යාපෘති අධ්‍යක්ෂ/ Foresight Engineering (Pvt) Ltd PEREZ Jean-Laurent/ site manager, BOCCARD, ඒ.ඒ.එස්.පී. අදිකාරි, සංවර්ධන නිලධාරී, පශු සම්පත් රාජ්‍ය අමාත්‍යාංශය





බඩල්ගම නව කිරි නිෂ්පාදනාගාරයක් ස්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය

මිල්කෝ (පුද්ගලික) සමාගම කෘෂිකර්ම අමාත්‍යාංශයේ විෂය පථයට අයත් පූර්ණ රජය සතු සමාගමකි. නාරාහේන්පිට, දිගන, අඹේවෙල සහ පොළොන්නරුව යන ප්‍රදේශවල කිරි සැකසුම් කර්මාන්තශාලා හතරක් ඇති මෙම රාජ්‍ය ව්‍යවසාය, දේශීය දියර කිරි ප්‍රසම්පාදනය, සැකසීම සහ "හයිලන්ඩ්" වෙළඳනාමය යටතේ විවිධ කිරි නිෂ්පාදන අලෙවිය සඳහා සම්බන්ධ වන අතර එය ක්‍රියාත්මක වූ දා සිට කිරි සැකසුම් ක්ෂේත්‍රයෙහි ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම සන්නාමය බවට පත්ව ඇත.
මිල්කෝ සමාගමට අයත් කිරි කර්මාන්ත ශාලා හතරෙහි පවතින යන්ත්‍රෝපකරණ වසර 40ට අධික පැරණි වන අතර, නිෂ්පාදන කාර්යක්ෂමතාවයට එය දිගු කලක සිට අහිතකර ලෙස බලපා තිබිණි. මෙම ගැටළුව නිරාකරණය පිණිස සහ මිල්කෝ ආයතනයෙහි නාරාහේන්පිට කර්මාන්තශාලාව පිහිටි භූමි භාගය නාගරික සංවර්ධන අධිකාරිය හරහා ක්‍රියාත්මක නගර සංවර්ධන ව්‍යාපෘතීන් සඳහා යොදවා ගැනීමට රජය විසින් තීරණය කරන ලද බැවින්, බඩල්ගම පිහිටි ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට අයත් සිරිංගපාත ගොවිපොළෙන් ලබා ගත් භූමියක ඒ වෙනුවෙන් නව කිරි සැකසුම් කර්මාන්ත ශාලාවක් ස්ථාපනය කිරීමට තීරණය කරන ලදී.

ව්‍යාපෘතියෙහි අරමුණු

මෙම කර්මාන්ත ශාලාව ඉදි කිරීම මඟින් නැවුම් කිරි ලීටර් 200,000 භාවිතා කරමින් පාස්චරීකෘත කිරි, අධිතාප ප්‍රතිකාර කරන ලද කිරි (UHT), යෝගට්, මිශ්‍ර යෝගට්, පානීය යෝගට් සහ අයිස්ක්‍රීම් දෛනිකව සැකසීමේ හැකියාව පවතී.

ව්‍යාපෘති විස්තර	බඩල්ගම කිරි සැකසුම් මධ්‍යස්ථානයක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ආරම්භක දිනය	2016.05.10
අපේක්ෂිත කාලය	වසර 3 මාස 06
මෙහෙයුම් කටයුතු ආරම්භක දිනය	2016.05.10
ව්‍යාපෘතිය දීර්ඝ කිරීම	2019.11.10 – 2021.12.31
මූල්‍ය සැපයුම් ප්‍රභවය	ඩෙන්මාර්ක් රජය, ශ්‍රී ලංකා රජය HSBC Bank (LONDON)
අදාළ ක්ෂේත්‍රය	දියර කිරි නිෂ්පාදන ක්ෂේත්‍රය
වගකීම් දරන ආයතනය	පශු සම්පත්, ගොවිපොළ ප්‍රවර්ධන කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය, මිල්කෝ (පුද්.) සමාගම, DESMI Contracting A/S ආයතනය
සංරචක (බඩල්ගම ව්‍යාපෘතිය)	
ප්‍රධාන සංරචක	**සංරචක අනුව පිරිවැය**
01.කර්මාන්තශාලා ගොඩනැගිල්ල සහ අනෙකුත් ඉදිකිරීම් සිදු කිරීම	යුරෝ 38,719,945.00
02.ව්‍යාපෘතියට අදාළ යන්ත්‍රෝපකරණ ආනයනය	යුරෝ 25,215,692.00
03.යන්ත්‍රෝපකරණ ආනයනයන්ට අදාළ බදු ගෙවීම්	රු. 902,155,553.66

සංරචකය 01	කර්මාන්තශාලා ගොඩනැගිල්ල සහ අනෙකුත් ඉදි කිරීම්	
වෙන් කළ මුදල - යුරෝ 38,719,945.00	වියදම් කළ මුදළ - යුරෝ 37,635,232.00	
අරමුණ (ව්‍යාපෘතියේ සමස්ත අරමුණ)	නැවුම් කිරි ලීටර් 200,000 භාවිතා කරමින් පාස්චරීකෘත කිරි, අධිතාප ප්‍රතිකාර කරන ලද කිරි (UHT), යෝගට්, මිශ්‍ර යෝගට්, පානීය යෝගට් සහ අයිස්ක්‍රීම් දෛනිකව සැකසීම.	
ක්‍රියාත්මක සැළැස්මේ සඳහන් ක්‍රියාකාරකම්	**සපුරාගත යුතු ඉලක්කය**	**අත්කරගත් භෞතික ප්‍රගතිය**
1.කර්මාන්තශාලා ගොඩනැඟිල්ල ඉදි කිරීම 2. පරිපාලන ගොඩනැඟිල්ල ඉදි කිරීම 3. නිල නිවාස, ආපන ශාලා ඇතුළු පහසුකම් කර්මාන්ත ශාලා භූමිය සහ යටිතල පහසුකම්	100% 100% 100% 100%	98% 99% 98% 99%
සංරචකය 02	ව්‍යාපෘතියට අදාළ යන්ත්‍රෝපකරණ ආනයනය	
වෙන් කළ මුදල - යුරෝ 25,215,692.00	වියදම් කළ මුදල යුරෝ - 22,902,987.00	
ක්‍රියාත්මක සැළැස්මේ සඳහන් ක්‍රියාකාරකම්	**සපුරාගත යුතු ඉලක්කය**	**අත්කරගත් භෞතික ප්‍රගතිය**
1. ව්‍යාපෘතියට අදාළ යන්ත්‍රෝපකරණ ආනයනය 2. යාන්ත්‍රික සහ විදුලි ආශ්‍රිත සවිකිරීම්	අවශ්‍ය සියළු යන්ත්‍රෝපකරණ ආනයනය යන්ත්‍රෝපකරණ සවි කිරීම් අවසන් කිරීම	89% 87%
සංවර්ධන වැඩ සටහන සිදුකළ ප්‍රදේශය (දිස්ත්‍රික්කය /ග්‍රාම නිලධාරී වසම)	ගම්පහ,බඩල්ගම	
ප්‍රතිලාභීන් සංඛ්‍යාව	මිල්කෝ සමාගමට ඒකාබද්ධ ස්වයංපාලිත කිරි ගොවි සමිති සාමාජිකයින් (සමස්ත දියර කිරි නිෂ්පාදකයින්)	
සිදුකරන ලද පුහුණු වැඩමුළු ක්ෂේත්‍ර නිරීක්ෂන සංඛ්‍යාව	02	

ක්ෂේත්‍ර නිරීක්ෂණය සහභාගි වූ නිලධාරීන්

පී.අයි.ඕ. ප්‍රනාන්දු මයා - සාමාන්‍යාධිකාරී/ මිල්කෝ ආයතනය
එම්. සරවනභවන් මයා - අළෙවි කළමනාකරු/ මිල්කෝ ආයකනය
පී. තිරුකේෂ්වරන් මයා - කළමනාකරු(මිලදීගැනීම්)/ මිල්කෝ ආයතනය
දුෂාන් වන්දෙස්කර මයා - ඉංජිනේරු/ මිල්කෝ ආයතනය





ජාතික ශාක නිරෝධායන සේවාව (ශ්‍රී ලංකාවේ ශාක නිරෝධායන සේවාව නවීකරණය) (KOICA) හි පරීක්ෂණ පහසුකම් වැඩිදියුණු කිරීම

වෙන් කිරීම (රු. මිලියන)	25	වියදම (රු. මි)	කෘ.අ මගින් සෘජුවම ගෙවීම් සිදු කෙරේ
අරමුණු	ශාක නිරෝධායන ධාරිතාව වැඩි දියුණු කිරීම මගින් ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික නිෂ්පාදනවල අපනයන තරඟකාරිත්වය වැඩි දියුණු කිරීම		
ක්‍රියාකාරී සැලැස්මේ ක්‍රියාකාරකම්		**සාක්ෂාත් කරගත යුතු ඉලක්කය**	**භෞතික ප්‍රගතිය**
ජාතික ශාක නිරෝධායන සේවා ගොඩනැගිල්ල ඉදිකිරීමට පෙර භූ තාක්ෂණික විමර්ශන, Seaport නව ගොඩනැගිල්ල		භූ තාක්ෂණික වාර්තාව	සම්පූර්ණ කරන ලදී.
පවතින ගොඩනැගිල්ල කඩා දැමීම		නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා ඉඩම	දැනට පවතින ගොඩනැගිල්ල කඩා ඉවත් කිරීමේ කටයුතු අවසන් කර ඇති අතර එහි පිරිවැය UNOPS අයවැයට ඇතුළත් කෙරේ. මෙම ගෙවීම අවශ්‍ය නොවේ (හරිත ගොඩනැගිලි සහතික කිරීම සඳහා සැලැස්ම සහ තාක්ෂණික ලේඛන ඉදිරිපත් කිරීමේදී පළමු සැකසුම් ගාස්තුව ගෙවිය යුතුය)
නාගරික සංවර්ධන අධිකාරියේ අනුමැතිය සඳහා ගෙවීම		නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ අනුමැතිය	වරාය සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව සඳහා ගෙවීම් කරන ලදී. හරිත සහතිකය ලැබුණි.
නිර්මාණ සේවාව සඳහා වැට බද්ද		නව ගොඩනැගිල්ලක් සැලසුම් කිරීම	මෙම ගෙවීම අවශ්‍ය නොවේ
උපකරණ මිලදී ගැනීම සඳහා වැට බද්ද		ජාතික ශාක නිරෝධායන සේවා රසායනාගාර සඳහා නව උපකරණ	රටේ පවතින තත්ත්වය හේතුවෙන් උපකරණ මිලදී ගැනීම ප්‍රමාද විය. උපකරණ මිලදී ගැනීම 2022 දී අඛණ්ඩව සිදු කෙරේ
රේගු නිෂ්කාශන ගෙවීම		ජාතික ශාක නිරෝධායන සේවා රසායනාගාර සඳහා නව උපකරණ	
ඉදිකිරීම් සඳහා වැට බද්ද		ජාතික ශාක නිරෝධායන සේවා වරාය සඳහා නව ගොඩනැගිල්ල	2022 දී ඉදිකිරීම් අඛණ්ඩව සිදු කෙරේ
ක්‍රියාත්මක කළ ප්‍රදේශය (දිස්ත්‍රික්ක/ ග්‍රා.සේ කොට්ඨාශය)		ජාතික ශාක නිරෝධායන සේවය,කටුනායක	
ප්‍රතිලාභීන් සංඛ්‍යාව		1500	

ජාතික නිරෝධායන සේවාවේ අළුත්වැඩියා කටයුතු සහ උපකරණ මිලදී ගැනීම (JICA)

වෙන් කිරීම (රු. මිලියන)	40	වියදම (රු. මි)	කෘ.අ මහින් සෘජුවම ගෙවීම් සිදු කෙරේ
අරමුණු	ජාතික ශාක නිරෝධායන සේවයේ තාක්ෂණික ධාරිතාවය වැඩිදියුණු කිරීම.		
ක්‍රියාකාරී සැලැස්මේ ක්‍රියාකාරකම්		**සාක්ෂාත් කරගත යුතු ඉලක්කය**	**භෞතික ප්‍රගතිය**
උපකරණ 44ක් සඳහා පිරිවැය ඇස්තමේන්තුව සකස් කිරීම		උපකරණ 44 ක් මිලදී ගැනීම	සම්පූර්ණ කරන ලදී.
තාක්ෂණික ඇගයීම් කමිටුව පත් කිරීම			
දැන්වීම් පළ කිරීම			
ලංසු ලේඛනය සකස් කිරීම			
පිරිවිතර සකස් කිරීම			
තාක්ෂණික ඇගයීම් කමිටුව රැස්වීම්			
තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ටෙන්ඩර් ලේඛනය අනුමත කිරීම			
ප්‍රචාරණය සහ ලංසු විවෘත කිරීම			ගෙවීම් වවුචර කෘ.අ වෙත යොමු කරන ලදී.
ලංසු ඇගයීම			සම්පූර්ණ කරන ලදී.
ටෙන්ඩර් පිරිනැමීම			
ගෙවීම			ගෙවීම් වවුචර 2022 ජනවාරි 2 වන සතියේදී යවනු ලැබේ.
ක්‍රියාත්මක කළ ප්‍රදේශය (දිස්ත්‍රික්ක/ ග්‍රා.සේ කොට්ඨාශය)		ජාතික ශාක නිරෝධායන සේවය, කටුනායක	
ප්‍රතිලාභීන් සංඛ්‍යාව		දිවයින පුරා විසිරී සිටින සියලුම ශාක හා ශාක නිෂ්පාදන ආනයනකරුවන් සහ අපනයනකරුවන්	

වෙනත් සංවර්ධන වැඩසටහන් - කෘෂි තාක්ෂණික යෙදවුම් සඳහා බදු සහන නිර්දේශ ලබාදීම - (කෘෂිතාක්ෂණ අංශය)

1.කෘෂි තාක්ෂණික යෙදවුම් සඳහා අදාල වන පනත් යටතේ ලබාදී ඇති තීරු බදු, වැට් සහ සෙස් සහන සඳහා ඉල්ලුම් කිරීමේදී නිර්දේශ ලබාදීම සිදු කෙරේ.
2021.12.31 වන විට එම නිර්දේශ ලබාදීමේ තත්වය පහත ආකාර වේ .

i.	**තීරු බදු නිර්දේශ**	**- 264**
ii.	**බඩඉරිගු සඳහා නිර්දේශ**	**- 20**
iii.	**සෙස් නිර්දේශ**	**- 267**
iv.	**පොහොර සඳහා නිර්දේශ ලිපි**	**- 16**
v.	**පළිබෝධනාශක සඳහා නිර්දේශ ලිපි**	**- 04**

2. ගස් හෙළීමේ පාලන පනතට අදාලව කටයුතු කිරීම.

1951අංක 09 දරන ගස් හෙළීමේ පාලන පනත

ආහාරමය වැදගත්කමක් සහිත ඵල දරන කොස් ගස්, දෙල් ගස් හා ගැහැණු වර්ගයේ තල් ගස් ආරක්ෂා කර ගැනීම සඳහා 2000 අංක 01 දරන ගස් හෙළීම් පාලනය කිරීමේ (සංශෝධන) පනත හා 1951 අංක 09 දරන ගස් හෙළීම් (පාලන) පනත යටතේ අපේක්ෂිත අරමුණු සඵල කර ගැනීම සඳහා පරිපාලන විධිවිධාන ක්‍රියාත්මක කිරීමට තීරණය කර ඇත. ගස් හෙළීම් පාලන පනතට අදාලව 2021 වසර තුල කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත යොමු කරන ලද අයදුම්පත් හා ලිපිලේඛන සඳහා අනුමැතිය ලබා දීම.

ගස් හෙළීම් පාලන පනතට අදාලව 2021වසර තුල කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත යොමු කරන අයදුම්පත් හා ලිපිලේඛන සම්බන්ධයෙන් ක්‍රියාකිරීම

අනු අංකය	දිනය	දිස්ත්‍රික්කය	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය	ඉල්ලුම් කිරීමට හේතුව	ඉල්ලුම් කර ඇති අයදුම්පත් සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ගය
01.	2021.04.05	නුවරඑලිය	අඹගමුව	පොල්පිටිය සිට හම්බන්තොට දක්වා දිවෙන ද. වෝ. 220 විදුලි රැහැන් මාර්ගයට බාධාවන ලෙස පිහිටීම.	කොස් ගස් 40 ක් ඉල්ලුම් කර ඇති අතර එම ගස් 40 හෙළීම සඳහා අනුමැතිය ලබා දී ඇත.
02.	2021.11.22	කැගල්ල	අරණායක	මොළගොඩ සිට ගැවිලිපිටිය දක්වා දිවෙන ද. වෝ. 33 විදුලි රැහැන් මාර්ගයට බාධාවන ලෙස පිහිටීම.	කොස් ගස් 19 ක් ඉල්ලුම් කර ඇති අතර අදාළ අයදුම්පත් කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කර ඇත.
03.	2021.11.22	මහනුවර	කුණ්ඩසාලේ	ඉඩම් කටිටි කිරීමේ ව්‍යාපෘතිය සඳහා බාධාවක්ව පැවතීම	කොස් ගස් 35 ක් ඉල්ලුම් කර ඇති අතර අදාළ අයදුම්පත් කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කර ඇත.

ගස් හෙළීම සඳහා කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්ගේ අවසරය ලබාගත යුතු බැවින් ලැබෙන ඉල්ලුම්පත්‍ර කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට යොමු කරනු ලැබේ.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව (DOA)

ඉදිරි දැක්ම

ජාතික සෞභාග්‍ය උදෙසා කෘෂිකාර්මික විශිෂ්ඨත්වය සාක්ෂාත් කර ගැනීම.

මෙහෙවර

නව දියුණු කෘෂිකාර්මික තාක්ෂණය ජනනය කර ව්‍යාප්ත කිරීම සහ අදාල සේවාවන් ගොවීන් වෙත වැඩි අවධාරණයක් සහිතව සියළුම පාර්ශවකරුවන් වෙත ලබාදීමෙන් ජාතියේ ආහාර සහ පෝෂණ සුරක්ෂිතතාව තහවුරු කිරීම සඳහා යෝග්‍ය සහ තිරසාර කෘෂිකාර්මික සංවර්ධනයක් අත්පත්කර ගැනීම.

අරමුණු

- ආහාර බෝග වගාවේ නිෂ්පාදන විභවයන් වැඩිදියුණු කිරීම.
- තිරසාර ගොවිතැන සුරක්ෂිත කරලීම.
- ශ්‍රම සහ ඉඩම් කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම.
- කෘෂිකර්මාන්තයේ නියැලි සියළු පාර්ශව බලගැන්වීම.
- කෘෂිකර්මාන්තය තුල මානව සම්පතෙහි ශක්‍යතාවය වර්ධනය කිරීම.
- පාර්ශවකරුවන් සඳහා ගුණාත්මක තත්ත්වයේ බීජ සහ රෝපණ ද්‍රව්‍යවල සුලභතාවය සහතික කිරීම.
- ඉඩම් සහ ජල සම්පත ප්‍රශස්ත මට්ටමෙන් භාවිත කිරීම.
- සැලසුම්, ප්‍රතිපත්ති තීරණ සහ ප්‍රතිපත්ති මඟපෙන්වීම් සැපයීම.
- බීජ සහ රෝපණ ද්‍රව්‍ය මෙන්ම කෘෂි නිෂ්පාදනවල ගුණාත්මක ප්‍රමිතීන් සුරක්ෂිත කරලීම.
- හානිකර විදේශීය විශේෂවලින් දේශීය ශාක විශේෂ ආරක්ෂා කිරීමට කටයුතු කිරීම.
- කෘෂි නිෂ්පාදන තුලින් විදේශ විනිමය වැඩිකිරීම සඳහා නීරෝගී ශාක සහ ශාක නිෂ්පාදන අපනයනය සඳහා පහසුකම් සැපයීම.
- පළිබෝධනාශකවල අයහපත් බලපෑම්වලින් මහජනයා සහ පරිසරය ආරක්ෂා කිරීමට කටයුතු කිරීම.
- පැළෑටි ජාන සම්පත් තිරසාර ලෙස භාවිතයට ගැනීම පිළිබඳ සහතිකවීම.

ප්‍රධාන කාර්යයන්

- පර්යේෂණ මඟින් උචිත නව ප්‍රභේද හා කෘෂි තාක්ෂණයන් ජනනය කිරීම.
- නව දියුණු කෘෂි තාක්ෂණය ගොවි ප්‍රජාව අතර ව්‍යාප්ත කිරීම.
- උසස් ගුණාත්මක බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය හා බෙදා හැරීම.
- පැළෑටි ජාන සම්පත් සංරක්ෂණය කිරීම.
- බීජ පනත, පැළෑටි සංරක්ෂණ පනත, පළිබෝධ නාශක පාලන පනත සහ පාංශු සංරක්ෂණ පනත ක්‍රියාත්මක කිරීම.
- කෘෂිකාර්මික අධ්‍යාපනය තුලින් කෘෂිකර්මය පිළිබඳ ජාතික වෘත්තීය පුහුණු (NVQ) 5 හා 6 මට්ටමේ ඩිප්ලෝමා පාඨමාලා පවත්වා ගෙන යාම, ගොවීන් සහ නිලධාරීන්ගේ හැකියා වර්ධනයට අවශ්‍ය පුහුණු වැඩසටහන් පැවැත්වීම.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රගතිය සහ කෘෂිකර්ම අමාත්‍යාංශ වැය ශීර්ෂ (ජාතික ආහාර සුරක්ෂිතතා වැඩසටහන) යටතේ 2021 වසරේ විශේෂ ව්‍යාපෘතිවල ප්‍රගතිය පිළිබඳ සාරාංශය පහත දැක්වේ.

1. මූල්‍ය ප්‍රගතිය

වගුව 1: 2021 වර්ෂය සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ලද ප්‍රතිපාදන සහ 2021 දෙසැම්බර් 31 දක්වා වියදම්

ව්‍යාපෘතිය	පුනරාවර්තන		මූලධන	
	ප්‍රතිපාදන (රු.මිලියන)	වියදම (රු. මිලියන)	ප්‍රතිපාදන (රු.මිලියන)	වියදම (රු. මිලියන)
1. පරිපාලන හා ආයතනික සේවා	507.15	492.79	59.35	48.54
2. කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන	1,817	1,618.9	337.05	270.16
3. ව්‍යාප්ති හා පුහුණු	1,434.05	1,317.56	418.1	284.87
4. බීජ සහතික කිරීම හා පැළෑටි සංරක්ෂණ	1,315.49	1,257.56	1,185.6	949.21
එකතුව	**5,073.69**	**4,686.81**	**2,000.1**	**1,552.78**

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ සාරාංශය

1. කෘෂිකාර්මික පර්යේෂණ හා සංවර්ධනය

- 2021 වර්ෂයේදී නව වී ප්‍රභේද තුනක් නිදහස් කරන ලදී. ඒවායින් දෙකක් (At 313, Bg 314) මාස 3 වයස් කාණ්ඩයට අයත් නාඩු වර්ග වන අතර අනෙක් වර්ගය මාස 3½ වයස් කාණ්ඩයට අයත් සම්බා ප්‍රභේදයකි (Bg 375).
- වී ශාකයේ ප්‍රතිශක්ති උත්තේජන සිලිකන් නිෂ්පාදනයක් පැල ස්ථාපිත කර සති දෙකේ දී භාවිතා කිරීමෙන් පැල ගොයමට හානි කරන පැල මැක්කාගේ හානිය සැලකිය යුතු ලෙස අඩුකර ගත හැකි බව නිරීක්ෂණය කළ අතර පසු අවස්ථාවල දී ඇතිවන දුඹුරු පැල කීඩෑ හානිය, පුරුක් පණු හානිය, කොළ හකුලන දළඹුවාගේ හානිය හා ගොයම් මකුණාගේ හානියද සැලකිය යුතු ලෙස අඩු කරගත හැකි බව නිරීක්ෂණය කරන ලදී. පර්යේෂණ කටයුතු තවදුරටත් ක්‍රියාත්මක වේ.
- ආසියාතික ආහාර හා කෘෂිකර්ම සහයෝගිතාවය යටතේ 2019, 2020 හා 2021 වසර වල ක්‍රියාත්මක කල ලවණතාවයට ඔරොත්තු දෙන අභිජනන පෙළපත් තේරීමේ වැඩසටහනින් ආසියාතික රටවල් 7ක් අතරින් කැපී පෙනෙන රට ලෙස හිමි වන සම්මානය 2021 වසරේදී වී පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ අභිජනන අංශයේ ආර්.එම්.එන්.එච්. සේනානායක මහත්මිය විසින් දිනා ගන්නා ලදී.
- කව්පි සහ මුං බෝග වගාවේදී පිදුරු වසුන් යෙදූ සහ වසුන් නොයෙදූ අවස්ථාවලට සාපේක්ෂව පොලිතින් වසුන් භාවිතා කිරීමෙන් මනා වර්ධනයක් සහ ඉහළ අස්වනු කාර්ය සාධනයක් පෙන්නුම් කරන ලදී.
- මුං, කව්පි, රටකජු හෝ උඳු යන රනිල බෝග අතරින් ඕනෑම බෝගයක් ශ්‍රී ලංකාවේ වියළි කලාපයෙහි විශේෂයෙන්ම පළමු කන්නය තුළදී කෙසෙල් සමඟ අතරමැදි බෝගයක් ලෙස සාර්ථකව වගා කළ හැකි බව පර්යේෂණ මගින් අනාවරණය විය.
- "අග්‍රා" නැමැති කෝලිකුට්ටු කෙසෙල් ප්‍රභේදයේ පුංමය පුෂ්ප යොදා ගනිමින් නිපදවන ලද නාලස්ථ පුනර්ජනනීය පැළවල සුවිශේෂ ලක්ෂණ (ඵලයේ දැඩි කැටිතිමය ස්වභාවය නොමැති වීම හා රසය) වෙනස් නොවිණි.

- අඩ වශයෙන් හානියට පත් වූ රටකජුවල පැළ වීම, ප්‍රාණවත් බව හා අස්වැන්න ඉහළ නැංවීම සඳහා හයිඩ්‍රෝ - ප්‍රයිමීම (Hydro - priming) තාක්ෂණික ක්‍රමවේදය ඵලදායි බව හඳුනා ගන්නා ලදී.
- පර්යේෂණ ප්‍රතිඵල තහවුරු කරමින් යල සහ මහ යන දෙකන්නයේදීම ගොවි ක්ෂේත්‍රවලදී කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිර්දේශිත N, P සහ K අනුපාත හා සසඳන කළ බීජ ආමුකූලනය සමඟ මූලික බණිජ N පොහොර (යුරියා) අනුපාතයෙන් 1/3ක් සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිර්දේශිත P සහ K පොහොර අනුපාත සැපයූ විට 13%ක සිට 25% දක්වා අස්වනු වැඩිවීමක් වාර්තා විය.
- අඩු නිෂ්පාදන පිරිවැයක් සහිතව සත්ත්ව ආහාර නිෂ්පාදනය සඳහා HY1 හා HY2 යන MI දෙමුහුම් බඩඉරිඟු ප්‍රභේද මෙන්ම MI ස්වීට් සෝගම් ප්‍රභේදය ද උචිත බව සොයා ගන්නා ලදී.
- විශේෂයෙන්ම මහ කන්නය තුලදී දුර්වල ජලවහන තත්ත්වය යටතේ බීජ පැළවීමේදී සිදුවන හානි අවම කර ගැනීමට බහු අවයවික ආලේපිත සෝයා බෝංචි බීජ ඵලදායි බව හඳුනා ගැණින.
- තීරු දෙකක් අතර පරතරය 90cm වනසේ 45cm x 30cm ප්‍රමාණයේ පේළි 4 පාත්තිවල බඩ ඉරිඟු වගා කිරීම, අස්වනු හානියක් නොමැතිව සේනා දළඹු පාලනය සඳහා රසායනික ද්‍රව්‍ය යෙදීම සහ බීජ වැපිරීම සඳහා පහසු වන වගා පරතරයක් බව හඳුනාගන්නා ලදී.
- කොම්පෝස්ට් (10 t/ha) හෝ ජෙව අඟුරු (10 t/ha) සමඟ කොම්පෝස්ට් (10 t/ha) ආකාරයෙන් කාබනික ද්‍රව්‍ය යෙදීම ලොකු ඵැණුවල අස්වැන්න ඉහළ නැංවීමේදී ඵලදායි බව හඳුනා ගැණින. ලොකු ඵැණු අස්වැන්න තවදුරටත් වැඩි කිරිමෙහිලා පිදුරු (5 t/ha) හෝ පරාවර්තිත පොලිතීන් වසුන් අමුද්‍රව්‍ය ලෙස යොදා ගැනීම බෙහෙවින් ඵලදායි විය.
- විළඳ (Popcorn) වගාව සඳහා ඵලදායි ශෂ්‍ය විද්‍යාත්මක කළමනාකරණ පැකේජයක් වශයෙන් එක් වලකට එක් පැළයක් වන සේ 45cm x 30cm පරතරයේ පැළ සිටුවා N-P-K මුල ද්‍රව්‍ය පිළිවෙලින් 150-46-30 kg/ha යෙදීම හඳුනා ගන්නා ලදී.
- සේනා දළඹුවා නිසා සිදුවන අස්වනු හානි පියවීමට ඒකාබද්ධ පළිබෝධ පාලන ප්‍රවේශයක් වශයෙන් නයිට්‍රජන් පොහොර අධි මාත්‍රාවකින් (>200 kg/ha) යොදා ගැනිමෙන් සේනා දළඹුවා පාලනයට පළිබෝධනාශක යොදා ගැනීම ප්‍රතිස්ථාපනය කළ හැකි බව පිරිවැය - ප්‍රතිලාභ ඇගයීම හා අස්වනු වැඩිවීම් ප්‍රතිශතය ඇගයීම මඟින් පෙන්නුම් කෙරිණ.
- *Trichoderma* නිෂ්පාදනවල ඝන අවස්ථාව යොදාගනිමින් ඵැණු කළු පැහැති දිලිරය පාලනය කිරීම සඳහා ක්ෂේත්‍ර යෙදවුම් ප්‍රොටොකෝලයක් ගොඩනගන ලදී.
- මිරිස් බෝගයට වැළදෙන ඇන්ත්‍රැක්නෝස් රෝගය පාලනයට ඇසොක්සිට්‍රොබින් 60 හා ක්ලෝරොතැලොනිල් 500g/l SL ඵලදායී බව සොයා ගැණින.
- රටකජු මලකඩ (Groundnut Rust) රෝගයට පිළියම් වශයෙන් සල්ෆර් 80 WDG උචිත බව යළි තහවුරු කරන ලදී.
- බඩඉරිඟු වගාවේ සේනා දළඹුවා පාලනය කිරීම සඳහා 3G ද්‍රාවණය ජලය සමඟ 10% (v/v) අනුපාතයෙන් යෙදීම ඵලදායි විය. කීටයක් හට ගන්නා මුල් අවධියේහිදීම සවස් කාලයේ දී එම ද්‍රාවණය යෙදීම මනා ප්‍රතිඵල ලබා දුන්නේය.
- කරල් හටගන්නා අවධියේ දී පත්‍රවලට ඉසිනයක් වශයෙන් MLE 100% (මුරුංගා පත්‍ර නිස්සාරකය) යෙදීම මිරිස්වල උසස් තත්ත්වයේ කරල් සමඟින් ඉහළ අස්වනු ලබා දෙන ඵලදායි ක්‍රමයක් බව හඳුනා ගැණින.
- ශ්‍රී ලංකාවේ උතුරු පළාතේ රටකජුවල (*Arachis hypogea*) කඳ කුණුවීමේ රෝගය හා සම්බන්ධ දිලිරමය ව්‍යාධිජනකයන් වශයෙන් *Sclerotium* විශේෂ දහ අටක් හඳුනා ගැණින.
- 30 kg/h ක යෙදවුම් ධාරිතාවයකින් යුත් මිරිස් බීජ නිස්සාරකයක මූලාකෘතියක් සාර්ථක අන්දමින් නවීකරණය කරන ලදී.
- වාණිජමය වගාව සඳහා 16-20 t/ha ක සාමාන්‍ය අමුමිරිස් අස්වැන්නක් ලබා දෙන විදේශීය මිරිස් දෙමුහුම් තුනක් නිර්දේශ කෙරිණ.

- මහ කන්නයේදී වැසි තත්ත්වයන් යටතේ දේශීයව නිෂ්පාදිත MIBO 1 සහ දඹුල්ල වරණය ප්‍රභේද සමඟ ARES නමැති විදේශීය ලොකු ඵෑණු ප්‍රභේදය සංසන්දනාත්මක කාර්ය සාධනයක් පෙන්නුම් කළේය. නමුත් සලකා බලන ලද දේශීය ප්‍රභේද සමඟ සංසන්දනාත්මකව බැලීමේදී ගබඩා කිරීමේ හැකියාව අඩු බව වාර්තා විය.
- චොකලට් බෝල කර්මාන්තය සඳහා සරිලන >2.5t/ha ක සාමාන්‍ය අස්වැන්නක් ලබා දෙන කුඩා බීජ සහිත රටකජු ප්‍රභේදය සාමාන්‍ය වගාව සඳහා ANKGN4 ප්‍රභේදය නමින් නිදහස් කරන ලදී.
- 1 t/ha ක පමණ දළ අස්වැන්නක් ලබා දෙන කඳ හා මුල් කුණුවීමේ රෝගයට මධ්‍යස්ථ වශයෙන් ඔරොත්තු දෙන කළු පැහැති බීජ සහිත තල ප්‍රභේදය ANKSE3 නමින් සාමාන්‍ය වගාව සඳහා නිදහස් කරන ලදී.
- 20 - 22 t/ha ක දළ අස්වැන්නක් ලබා දෙන පොකුරු ඵෑණු ප්‍රභේදය ANKCLO1 නමින් සාමාන්‍ය වගාව සඳහා නිදහස් කෙරිණ.
- සිම්පල් සීකුවන්ස් රිපීට් (SSR) සළකුණු භාවිතයෙන් ගොඩනංවන ලද ප්‍රොටොකෝලය ග්‍රෝ අවුට් ටෙස්ට් (GOT) හා සැසඳීමේදී වඩා විශ්වසනීය මෙන්ම කාර්යක්ෂම බව හඳුනා ගන්නා ලදී. මෙම ක්‍රමවේදය MICH HY 1 හා MICH HY 2 මිරිස් දෙමුහුම්වල බීජ සහතිකකරණ ක්‍රියාපටිපාටියේදී ප්‍රයෝජනවත් වනු ඇත. තවද මෙම සොයා ගැනීම් MICH HY 1 හා MICH HY 2 මිරිස් දෙමුහුම් බීජ තොගවල දෙමුහුම් නොවන ආකාරයේ මිශ්‍ර වීම් හඳුනා ගැනීමට අභිජනකයන්ට මෙන්ම වගාකරුවන්ටද ප්‍රයෝජනවත් වනු ඇත.
- කළු තල වලින් තෙල් නිස්සාරණය කිරීමේ ක්‍රියාවලියේ දී විශිෂ්ට තත්ත්වයේ ඉහළ තෙල් ප්‍රමාණයක් ලබා ගැනීමේ උචිතම ක්‍රමවේදය 180 ^{0}C උෂ්ණත්වයේ මිනිත්තු 15ක් පිළිස්සීම බව සොයා ගැණින.
- සෝයා කිරි නිෂ්පාදනය සඳහා PM 13 හා PM 25 ආර (පෙළ) වඩාත් යෝග්‍ය බව හඳුනා ගන්නා ලදී.
- කාබනික ගොවිතැනෙහිදි ශාක පළිබෝධ පාලනය සඳහා ජෛව තාක්ෂණ ක්‍රමවේදයක් වශයෙන් *Trichoderma* දිලීරය යොදා ගනිමින් ජෛව විද්‍යාත්මක දිලීර නාශකයක් නිෂ්පාදනය කරන ලදී.
- එළවළු බෝග කීටයන් සහ සේනා දළඹු කීටයන් පාලනය සඳහා බිත්තර පරපෝෂි *Telenomus remus* කෘමීන් කෘත්‍රිම වශයෙන් බහුගුණනය කොට ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ප්‍රදේශවලට මුදා හරින ලදී.
- එළවළු බෝගවල දළඹුවන් පාලනය සඳහා රාත්‍රී කාලයේ දී විශේෂ කහ ආලෝක බල්බ භාවිතය හඳුන්වා දෙන ලදී.
- කාබනික එළවළු වගාවේ දී පෝෂක කළමනාකරණ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා යෝග්‍ය පාංශු ප්‍රතිකාර හඳුන්වා දෙන ලදී.
- අඩු කාබනික යෙදවුම් සඳහා සුදුසු එළවළු ප්‍රභේද හඳුන්වා දෙන ලදී.
- කෙටි කාලයක් තුළ කොම්පෝස්ට් නිෂ්පාදනය සඳහා අවශ්‍ය තාක්ෂණය සංවර්ධනය කෙරෙමින් පවතියි.
- ඉකුත් වසර හා සසඳන කළ මේ වසරේදී පාංශු නියැදි විශ්ලේෂණය කිරීමේ ආයතනය සතු ධාරිතාවය සිවු ගුණයක් දක්වා ඉහළ නැංවීම පිණිස විද්‍යාගාර පහසුකම් වැඩි දියුණු කරන ලදී. (නියැදි 163 සිට 655 දක්වා)
- පුෂ්ප හටගැනීම ආරම්භක අවධියේ දී පැළයකට 15 kg ප්‍රමාණයෙන් ඩොලමයිට් පසට එක් කිරීමෙන් මැංගුස්ටීන්වල කහ යුෂ අසාමාන්‍යතාව අඩු කළ හැකි බව සොයා ගැණින.
- වැඩිදුර ඇගයීම සඳහා බලාපොරොත්තු තැබිය හැකි අන්නාසි දෙමුහුම් හයක් (06) තෝරා ගන්නා ලදී.
- නලස්ථ තත්ත්ව යටතේ දී 'වෙල් අනෝදා' මූලස්කන්ධයට අනෝදා (Sour sop) සාර්ථක ලෙස බද්ධ කළ හැකි බව හඳුනා ගැණින.

- වාණිජමය වගාව සඳහා විකල්ප ප්‍රචාරණ අංගයක් වශයෙන් පත්‍ර පොහොර සමඟ අන්නාසි කිරුළ භාවිතය සාර්ථක බව හඳුනා ගන්නා ලද අතර ඵලයේ ප්‍රමාණය හා ගුණාත්මය කෙරෙහි කිරුළේ ප්‍රමාණය බල නොපාන බවද හඳුනාගන්නා ලදී. රෝපණය කිරීමෙන් සති දෙකකට පසු දෙමසක කාලයක් දක්වා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිර්දේශිත පත්‍ර පොහොර ඉසීම සිදු කළ යුතුය.
- අන්නාසි පේළි දෙකක් අතර කව්පි වගා කර දින 45කින් පළමු අස්වැන්න නෙළීමෙන් පසු කව්පි පැළ පස හා මුසු කිරීම, තත්ත්වයෙන් උසස් අන්නාසි ඵල ලබා ගැනීමේ සාර්ථක ඒකාබද්ධ ශාක පෝෂක කළමනාකරණ ක්‍රමවේදයක් බව හඳුනා ගැණින.
- *Annona muricata* (අනෝදා) හි පාතෙනොඵලිත ඵල හටගැනීම උත්ප්‍රේරණය සඳහා ගිබරලික් අම්ලය (GA 3) හා නැප්තලීන් අම්ලය (NAA) භාවිතා කළ හැකි බව පර්යේෂණ මඟින් හෙළි විය.
- කෘෂි - කාලගුණ උපදේශනයෙහි තත්ත්වය උසස් කිරිමෙහිලා දෙපාර්තමේන්තුව තුළ හා ඉන් පිටත විශේෂඥ අදහස් ලබා ගැනීමට වැඩ පිළිවෙලක් ආරම්භ කරන ලදී.
- මහවැලි - වලව කලාපයෙහි අක්කර 10 බැගින් වූ ගොවිපල 5ක් සඳහා ක්ෂුද්‍ර ජල තාක්ෂණ පද්ධති සැලසුම් කිරිම සඳහා තාක්ෂණික සහාය සලසා දුනි.
- මධ්‍යම පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ ගොවින් 60 ක් සඳහා ආරක්ෂිත ගෘහ සහ ජල සම්පාදන පද්ධති සැකසීම සඳහා තාක්ෂණික සහය සපයන ලදී.
- "පාංශු හා ජල සංරක්ෂණ තාක්ෂණික සංග්‍රහය" නමැති ග්‍රන්ථය සම්පාදනය කොට පළ කරන ලදී.
- "අනාගත පරපුරට ද භාවිතයට ඉඩ සලසමින් ජල සම්පත ප්‍රශස්ථ ලෙස පරිභෝජනය කරමු" නමින් තිරසාර ජල කළමනාකරණය සම්බන්ධ අත් පොතක් ප්‍රකාශයට පත්කරන ලදී.
- 2021 වර්ෂය තුළ 2020/21 මහ කන්නය සඳහා වගා පිරිවැය සඳහා ක්ෂේත්‍ර දත්ත රැස් කිරිම අඩ වශයෙන් නිම කරන ලද අතර කොවිඩ් - 19 වසංගතය හේතුවෙන් ක්ෂේත්‍ර වැඩසටහන ප්‍රමාද විය. 2021 වසර සඳහා තෝරාගනු ලැබූ ආහාර බෝග වගා පිරිවැයෙහි පළාත්බද ඇස්තමේන්තු සකස් කරන අතරම 2021 යල කන්නය සඳහා ප්‍රාථමික දත්ත රැස් කිරීම සැලසුම් කරන ලදී.
- පශ්චාත් 2020/21 මහ, 2021 යල හා පුර්ව 2021/22 මහ කන්න ආවරණය කරමින් 2021 වර්ෂය තුළ බෝග පුරෝකථනය වාර්තා 10ක් (කන්නයනට පහ බැගින්) සකස් කරන ලදී.
- ක්ෂේත්‍ර මට්ටමේ සිට ජාතික මට්ටම දක්වා කාර්යක්ෂම දත්ත ගලායමක් සහතික කරමින් "බෝග පුරෝකථන තොරතුරු පද්ධතිය - Croplook.net" මෘදුකාංගය වැඩිදියුණු කිරීම් සිදු කරන ලදී.
- දත්ත ඇතුළත් කරන්නා වූ කාර්ය මණ්ඩලය පරිපාලනය සහ නියාමනය සඳහා පාලන පද්ධති (පැනල) පහසුකමක් ගොඩ නංවන ලද අතර ප්‍රභේදමය වශයෙන් එළවළු බෝග නිෂ්පාදනය පිළිබඳ වාර්තා ගොඩනැංවීමට පහසුකමක් යොදන ලදී. තවද අතිරේක ආහාර බෝග සඳහා දිස්ත්‍රික්කමය වශයෙන් ප්‍රභේදීය ව්‍යාප්ති වාර්තාවක් නව අතිරේකයක් ලෙස ඇතුළත් කරන ලදී.
- 2020 වසර සඳහා දත්ත අඩංගු AgStat XVIII වෙළුම දත්ත සම්පාදනයෙහි අවසන් අදියරෙහි පවතින අතර මාර්ගගත ක්‍රමය ඔස්සේ නුදුරේ දීම ලබා ගත හැකි වනු ඇත.
- බෝග ව්‍යවසාය අයවැය - 2020 නමැති වී, අතිරේක ආහාර බෝග හා එළවළු සඳහා දත්ත අඩංගු ප්‍රකාශන මුද්‍රණය කොට මාර්ගගත ක්‍රමය ඔස්සේ ප්‍රකාශයට පත් කරන ලදී.

2. <u>බීජ නිෂ්පාදනය හා ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම</u>

- බීජ පනත සංශෝධනය කර කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් විසින් නම් කරන ලද කමිටුවක් මඟින් කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත යොමු කරන ලදී.
- GAP සහතිකකරණයට අදාළව සියලුම ISO17065 ජාත්‍යන්තර ප්‍රමිතිය අනුව සහතිකකරණ ක්‍රමවේදය සකස් කරන ලදී.
- බීජ වී මෙට්‍රික් ටොන් 12,397ක් හා එළවළු බීජ මෙට්‍රික් ටොන් 84 ක් බීජ සහතික කිරීමේ සේවයේ ප්‍රමිතීන්ට අනුකූල ලෙස පිළි ගන්නා ලදී.

- අතිරේක ආහාර බෝග (බඩඉරිඟු, මුංඇට, රටකජු, තල, කව්පි, කුරක්කන්, උඳු, කොල්ලු හා සෝයා බෝංචි) මෙ. ටො. 2,024 ක් නිපදවනු ලැබූ අතර මින් 87% ක ප්‍රමාණයක් බීජ සහතික කිරීමේ සේවයේ ප්‍රමිතීන්ට අනුකූල ලෙස පිළි ගන්නා ලදී.
- ග්‍රැනෝලා වර්ගයේ බීජ අර්තාපල් මෙ. ටො. 1,159 ක් ප්‍රමිතීන්ට අනුකූල ලෙස සහතික කර ඇත. ආරක්ෂිත ගෘහයන් යටතේ වගා කරන ලද බීජ අර්තාපල් මෙට්‍රික් ටොන් 46 ක් හා මූලික පන්තියේ කුඩා ස්කන්ධ ආකන්ද 3,278,051 ක් බීජ සහතික කිරීමේ සේවය ප්‍රමිතීන්ට අනුකූල ලෙස පිළි ගන්නා ලදී.
- බද්ධ පලතුරු පැළ 1,212,320 ක් සඳහා ගුණාත්මය තහවුරු කර සහතික ලේබල් යොදා ඇත. එමෙන්ම බද්ධ පලතුරු පැළ නිපදවීම සඳහා මව් ශාක 674 ක් ද සහතික කර ඇත.
- බීජ සහතික කිරීමේ සේවයේ ප්‍රමිතීන්ට අනුකූලව සහතික කරන ලද බීජ, ආනයනික බීජ හා බීජ අර්තාපල් හා වෙළඳපොල තුළින් අහඹු ලෙස ලබාගත් බීජ නියැදි 1,303 ක් සඳහා පශ්චාත් පාලන ක්ෂේත්‍ර පරීක්ෂා සිදුකර ගුණාත්මය තහවුරු කර ඇත.
- අළුතින් ප්‍රභේද නිදහස් කිරීමේදී නව ප්‍රභේදයක් ලෙස තහවුරු කිරීම සඳහා සිදු කරන විශේෂත්වය, ඒකාත්මිකතාව හා ස්ථායිතා (DUS) පරීක්ෂාව, අපේක්ෂිත වී ප්‍රභේද 3ක්, එළවළු ප්‍රභේද 27 ක්, අතිරේක ආහාර බෝග ප්‍රභේද 8 ක් හා පලතුරු ප්‍රභේද 65 ක් සඳහා සිදුකරන ලදී.
- 2003 අංක 22 දරණ බීජ හා රෝපණ ද්‍රව්‍ය පනත යටතේ බීජ හසුරුවන්නන් 1,160 ක් ලියාපදිංචි කළ අතර 968 ක ලියාපදිංචිය අළුත් කිරීම ද සිදුකරන ලදී.
- යහපත් කෘෂිකාර්මික පිළිවෙත් අනුගමනය කරන ගොවිපල්වල ගුණාත්මය තහවුරු කිරීම සඳහා ගොවිපල් 635 ක් විගණනයට භාජනය කළ අතර ඉන් ගොවිපල් 561 ක් යහපත් කෘෂිකාර්මික ගොවිපල් ලෙස සහතික කරන ලදී.
- වී වගාවේ ප්‍රධාන පලිබෝධකයින් සඳහා පළිබෝධ ආවේක්ෂණ වැඩසටහන් වී වගා කරන ප්‍රධාන දිස්ත්‍රික්ක හතක නියමු ව්‍යාපෘතියක් ලෙස ආරම්භ කරන ලදී.
- බඩඉරිඟු වගාවේ සේනා දළඹු පාලනයට කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් හඳුන්වා දී ඇති පරිසර හිතකාමී පාලන ක්‍රමවේදය ගොවීන් අතර ප්‍රචලිත කරන ලදී.
- වඩාත් කාර්යක්ෂම සේවාවක් සඳහා කටුනායක, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළේ ශාක නිරෝධායන ස්ථානය සඳහා මධ්‍යම රජයේ ආධාර යටතේ ගොඩනැගිල්ලක් ඉදිකර පිවිසුම්පළ නිරෝධායන කටයුතු වඩාත් පුළුල් අන්දමින් කරගෙන යාම සඳහා පහසුකම් ඇති කරන ලදී.
- කොළඹ වරාය පිවිසුම්පළ නිරෝධායන කටයුතු වඩාත් පුළුල් අන්දමින් ඉටුකිරීම සඳහා නවගොඩනැඟිල්ලක් කොරියානු ආධාර යටතේ ඉදිකිරීමට කටයුතු කරන ලදී.
- ශාක හා ශාකමය ද්‍රව්‍ය තැපැල් මඟින් හුවමාරුවීමේදී ඇතිවිය හැකි පළිබෝධ අවදානම අවම කිරීම සඳහා කොළඹ මධ්‍යම තැපැල් හුවමාරුවෙහි ශාක නිරෝධායන ඒකකයක් පිහිටුවන ලදී.
- අඹ හා අන්නාසි භෝග සඳහා ජෝර්දාන ශාක ආරක්ෂණ සංවිධානය මඟින් පනවා තිබූ ශාක නිරෝධායන තහනම ඉවත් කර ගැනීම සඳහා වූ ද්විපාර්ශවික තාක්ෂණික වැඩසටහන සාර්ථක ලෙස නිම කර අඹ සහ අන්නාසි ජෝර්දානයට අපනයනය සඳහා වෙළඳ බාධක ඉවත් කොට අන්තර්ජාතික වෙළඳාම සඳහා පහසුකම් සලසන ලදී.
- යුරෝපා සංගමයේ රටවල් 27 සඳහා නිරෝධායන ව්‍යාධි ජනකයෙකු වන *Xylella fastidiosa* හි ධාරක ශාක අපනයනය සඳහා පනවා තිබූ සම්බාධක ඉවත්කර ගැනීමට අදාළ පර්යේෂණ වාර්තා ඉදිරිපත් කරන ලදී.
- අන්තර්ජාතික ශාක ආරක්ෂක සංවිධානයේ මූලිකත්වයෙන් සම්පාදනය කරනු ලබන අන්තර්ජාතික ශාක ස්වස්ථතා සම්මුති අංක 15 යටතේ සල්ෆියුරයිල් ෆ්ලෝරයිඩ් (Sulfuryl fluoride) දැවමය භාණ්ඩ අසුරන ද්‍රව්‍ය ප්‍රතිකාර කිරීම සඳහා යොදා ගැනීම පිළිබඳ තාක්ෂණ

කමිටු සාමාජිකත්වය සඳහා ජාතික ශාක නිරෝධායන සේවයේ අතිරේක අධ්‍යක්ෂ තේරී පත්විය.

- ශ්‍රී ලංකාවේ කාබනික කෘෂිකර්මය සඳහා අත්‍යවශ්‍ය ශාක පෝෂක ආනයනය සඳහා සම්මත ශාක නිරෝධායන නිර්දේශයන් ඉදිරිපත් කරන ලදී.
- ශාක ආනයනය හා අපනයන කටයුතු කාර්යක්ෂමව හා විනිවිදභාවයකින් යුතුව පවත්වාගෙන යාම සඳහා ශ්‍රී ලංකා රේගුව විසින් ක්‍රියාත්මක කරනු ලබන ASYCUDA පද්ධතිය සමඟ සම්බන්ධ වන ලදී.
- ඉලෙක්ට්‍රොනික ශාක ස්වස්ථතා සහතිකය මගින් ආනයන අපනයන කටයුතු රටවල් 9ක් සමඟ සාර්ථකව සිදු කර යුරෝපා සංගමයේ රටවල් 27 සහ දකුණු කොරියාව සමඟ සිදුකළ අත්හදා බැලීම සාර්ථකව නිම කරන ලදී.
- JICA ව්‍යාපෘතිය යටතේ ශාක නිරෝධායන විද්‍යාගාර සඳහා විද්‍යාගාර උපකරණ වර්ග 13 කට අදාළ උපකරණ 78 ක් ලබා ගන්නා ලදී.
- ජෛව ආරක්ෂණ ව්‍යාපෘතිය හරහා ජෛව තාක්ෂණය පිළිබඳ විශ්ලේෂණ සඳහා නව රසායනාගාර ආරම්භ කරන ලදී (GMO and LMO) .
- ක්ෂේත්‍ර ගවේෂණ මෙහෙයුම් මගින් බෝග ජනක ප්ලාස්ම සහ ඒවායෙහි වල් දර්ශයන් 246ක සමස්ත එකතුවක් රැස් කරගන්නා ලද අතර බෝග ප්‍රභේද 82ක් පර්යේෂණායතනවලින් ලබා ගන්නා ලදී. ඊට අමතරව විදේශීය බෝග ජනක ප්ලාස්මා 271ක් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිලධාරින්ගෙන් ලබා ගන්නා ලදී.
- 2021 වර්ෂයේදී නව එකතූන් 244ක් ජාන බැංකුවෙහි සංරක්ෂණය කරන ලදී. ඊට අමතර වශයෙන් බහුගුණනය කරන ලද එකතූන් 393ක් සංරක්ෂණය කෙරිණ. පැළැටි ජාන සම්පත් මධ්‍යස්ථානයේ ජාන බැංකුවෙහි මේ වන විට බෝග ජනක ප්ලාස්මා 16,497ක් සංරක්ෂණය කරනු ලැබ ඇති අතර බතල, අර්තාපල්, *Dioscorea*, ඉන්නල සහ කෙසෙල් ඇතුළුව නියැදි 384ක් නලස්ථ සංරක්ෂණයට ලක් කෙරිණ.
- ජනක ප්ලාස්ම උපයෝජනය සඳහා ඉල්ලුම මත ගොවීන්, පර්යේෂණ ස්ථාන පෞද්ගලික සමාගම් සහ විශ්වවිද්‍යාල අතර විවිධ බෝග විශේෂවල එකතූන් 338ක් බෙදා හරින ලදී.
- බෝග ජනක ප්ලාස්ම නියැදි 706ක් බහු ගුණනය කොට සංරක්ෂණය සඳහා ඉදිරිපත් කරන ලදී. සංරක්ෂණය කරන ලද බණ්ඩක්කා එකතූන් 101ක්, මෑ එකතූන් 77ක් හා කැකිරි එකතූන් 33ක් රූපාණු විද්‍යාත්මක ලක්ෂණ භාවිතා කරමින් වර්ගීකරණය කරන ලදී.
- තෝරා ගනු ලැබූ කුලවලට අයත් බෝග වල් දර්ශවල අණුකමය වර්ගීකරණය ද හඳුනා නොගත් ජනක ප්ලාස්මවල DNA කේතකරණයද සම්පූර්ණ කරන ලදී. නිර්දේශිත දෙමුහුම් ප්‍රභේදවල ජානමය පවිත්‍රතාව පරීක්ෂා කිරීම සඳහා ප්‍රොටොකෝලයක් ගොඩ නංවන ලද අතර ඕනටි හා මා වී යන සාම්ප්‍රදායික වී ප්‍රභේද අණුකමය හා රූපාණුදර්ශීයවද, හොඬරවාලු වී එකතූන් 21ක් රූපාණුදර්ශීයවද වර්ගීකරණය කරන ලදී. වෙනත් පාරම්පරික ප්‍රභේද 29ක් දුඹුරු පැළ කීඩැවාට ප්‍රතිරෝධිතාවක් දක්වන එකතූන් හඳුනා ගැනීමට අණුකමය වශයෙන් වර්ගීකරණය කරන ලදී.
- සියදිවි හානි කර ගැනීම් වැළැක්වීම පිළිබඳ ජාතික ප්‍රතිපත්ති ක්‍රියාකාරී සැලැස්මෙහි 2021 අනාගත ප්‍රතිපත්ති සඳහා විශේෂ සම්මානය පළිබෝධනාශක ලියාපදිංචි කිරීමේ කාර්යාලය විසින් දිනා ගන්නා ලදී.
- ලියාපදිංචි බීජ වී බුසල් 150,013 ක් පමණ නිෂ්පාදනය කරන ලදී.
- සහතික කළ බීජ වී බුසල් 56,552ක් පමණ මිලදී ගන්නා ලදී.
- සමස්තයක් ලෙස බීජ වී බුසල් 185,233ක් අළෙවි කරන ලදී.
- අතිරේක ආහාර බෝගවල විවිධ බීජ කාණ්ඩයන්හි බීජ ටොන් 1,348 ක් පමණ නිෂ්පාදනය කරන ලදී.

- බඩඉරිඟු බීජ කි.ග්‍රෑ. 92,159ක්, රටකජු බීජ කි.ග්‍රෑ.248,655ක්, සෝයා බෝංචි කි.ග්‍රෑ 115,314ක්, මුං බීජ කි.ග්‍රෑ 401,663ක්, උඳු බීජ කි.ග්‍රෑ 234,615ක් හා කව්පි බීජ කි.ග්‍රෑ 85,501ක් පමණ නිෂ්පාදනය කර අළෙවි කරන ලදී.
- මූලික එළවළු බීජ කි.ග්‍රෑ 1,560ක් සහ සම්මත එළවළු බීජ 19,300ක් පමණ නිෂ්පාදනය කරන ලදී.
- අර්තාපල් මූලික බීජ සහ සහතික කළ බීජ මෙ.ටො. 1,079ක් හා ග්‍රැනෝලා වර්ගයේ ක්ෂුද්‍ර ආකන්ද 2,477,800ක් පමණ නිෂ්පාදනය කර අළෙවි කරන ලදී.
- පළතුරු පැල 1,170,397ක් පමණ (බද්ධ පැල 592,687ක් ඇතුළුව) නිෂ්පාදනය කර අළෙවි කරන ලදී.

3. <u>කෘෂිකර්ම ව්‍යාප්තිය සහ සන්නිවේදනය</u>

- "සෞභාග්‍යා" බෝග සංවර්ධන වැඩසටහන යටතේ,
  - දිවයින පුරා හෙක්ටයාර 328,332ක් වෙනුවෙන් අතිරේක ආහාර බෝගවල බීජ සඳහා සහනාධාර සපයන ලදී.
  - ක්ෂේත්‍රය තුළ බඩඉරිඟු වගා සහ නිෂ්පාදන වැඩසටහන් සාර්ථක අන්දමින් ක්‍රියාත්මක කරන ලද අතර ව්‍යාප්ති කඳවුරු, මාධ්‍ය වැඩසටහන් සහ 2020/21 මහ කන්නය තුළ ෆෙරමෝන් උගුල් මඟින් මෙහෙයුම් යාන්ත්‍රණයක් ස්ථාපනය කිරීම යනාදී ලෙස දිවයින පුරා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මඟින් සේනා දළඹු හානිය සාර්ථක ලෙස පාලනය කරන ලදී.
  - විශේෂයෙන්ම මිරිස්, උඳු, කව්පි, තල යනාදී අතිරේක ආහාර බෝගවල ගුණාත්මක නිෂ්පාදන හා ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා වැඩසටහන් සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීමෙන් ගොවි ක්ෂේත්‍ර සඳහා ටාපොලින් 3126ක් සපයන ලදී.
  - 2021 වසරේදී ගොවි ක්ෂේත්‍රවල පූර්ණ වශයෙන් යාන්ත්‍රීකරණය කරන ලද පොලි ගෘහවල මිරිස්වල MICH HY 1 ප්‍රභේදයේ දෙමුහුම් බීජ නිෂ්පාදනය කරන ලදී.
  - 2021 වර්ෂයේදී උතුරු පළාතේද බඩඉරිඟු දෙමුහුම් බීජ නිෂ්පාදනය සිදු කෙරිණ.
  - විශේෂයෙන්ම කව්පි හා උඳු බෝග සඳහා ගොවි ක්ෂේත්‍රවලින් වන සතුන් පළවා හැරීමට සූර්ය බලශක්තියෙන් ක්‍රියා කරන විදුලි උපකරණයක් හඳුන්වා දෙන ලදී.
  - තුන්වන කන්නය සඳහා මුං සාර්ථක ලෙස වගා කරන ලද අතර ඒ හේතුවෙන් වසරේ සිවු වන කාර්තුවේදී මුං ඇට මිල පහත වැටිණි.
- කොවිඩ් 19 වසංගතය තිබියදීත් 2021 යල සහ 2020/2021 මහ කන්නය තුළදී කෘෂි නිෂ්පාදන ප්‍රවර්ධන වැඩසටහන් දෙකක් සාර්ථක ලෙස පවත්වන ලදී.
- සාම්ප්‍රදායික කෘෂි කර්මාන්තයේ සිට කාබනික කෘෂිකර්මාන්තය දක්වා පරිවර්තනය සඳහා පළාත්, අන්තර් පළාත් ප්‍රදේශ, මහවැලි කලාප හෝ වෙනත් පාර්ශ්වකරුවන් පළාත් අතර මනා සහයෝගීතාවක් පවත්වා ගැනීමට 2021 යල කන්නය ආරම්භ වීමට පෙර වැඩසටහන් හතරක් පවත්වන ලදී. කාබනික කෘෂිකර්මාන්තය සඳහා පළාත්, අන්තර් පළාත් සහ මහවැලි නිලධාරීන් සඳහා පුහුණුකරුවන් පුහුණු කිරීමේ (TOT) වැඩසටහන් දහයක් පවත්වන ලදී.
- පැළ තවාන් කළමනාකරණය, බිම්මල් නිෂ්පාදනය, පැණි නිෂ්පාදනය සහ ආහාර පිරිසැකසුම සම්බන්ධව කුඩා පරිමාණ කෘෂි - ව්‍යවසායකයන්ට අදාළව යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන ලදී.
- මාතලේ අලුවිහාරේ සහ අනුරාධපුර ශ්‍රී මහා බෝධිය යන ආගමික ස්ථානවල හෙළ බොජුන් හල් දෙකක ඉදිකිරීම් කටයුතු අවසන් අදියරට පැමිණ තිබේ.
- කෘෂිකර්ම නිෂ්පාදනය තාක්ෂණය (NVQ 5) ජාතික ඩිප්ලෝමා පාඨමාලාව සඳහා බඳවා ගැනීමේ විභාගය අනුරාධපුරය, බිබිල, වාරියපොළ, ලබුදූව, පරන්තන් සහ පාලමුනෙයි යන කෘෂිකර්ම විද්‍යාලවල පවත්වන ලදී.

- 2021 වර්ෂයේදී NVQ 6 විද්‍යාලවල ශිෂ්‍යයන් 787ක් කෘෂිකර්ම නිෂ්පාදන තාක්ෂණ උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාවද, NVQ 5 විද්‍යාලවල ශිෂ්‍යයන් 258ක් කෘෂිකර්ම නිෂ්පාදන තාක්ෂණ ජාතික ඩිප්ලෝමා පාඨමාලාවද හදාරන ලදී.
- 2021 වර්ෂයේදී ශිෂ්‍යයන් 206ක් කෘෂිකර්ම නිෂ්පාදන තාක්ෂණ උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාව (NVQ 6) ද, ශිෂ්‍යයන් 114ක් කෘෂිකර්ම නිෂ්පාදන තාක්ෂණ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව (NVQ 5) ද සාර්ථකව නිම කරන ලදී.
- GAP පිළිබඳ මහජන දැනුම්වත් කිරීම්, ගොවි හා නිලධාරි පුහුණු කිරීම් ඇතුළුව පුහුණු වැඩසටහන් 80 ක් පවත්වන ලද අතර SL - GAP ගොවිපලවල් 545 ක් වර්ෂය තුළ දී සහතික කරන ලදී.
- GAP ගම්මානවල යටිතල පහසුකම් සැලැස්ම සඳහා AFACI - GAP ව්‍යාපෘතිය සාර්ථකව ක්‍රියාවට නංවන ලදී.
- SAARC සංවර්ධන අරමුදලේ මූල්‍ය සහාය ලබාගනිමින් "අගය දාම කෙරෙහි අවධානය යොමු කරමින් කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර ඔස්සේ SAARC කලාපවල කුඩා ගොවීන්ගේ ජීවනෝපාය ඉහළ නැංවීම" පිළිබඳ වැඩසටහන තවදුරටත් සිදු කරගෙන යන ලදී. දේශීය ආහාර බෝග (ප්‍රදේශයට විශේෂිත වූ) සැකසීම සඳහා අනුරාධපුර හා මොණරාගල ප්‍රදේශවල පිරිසැකසුම් මධ්‍යස්ථානය දෙකක් ස්ථාපනය කරන ලදී.
- ගොවි ප්‍රජාව හා අදාළ වෙනත් පාර්ශ්වකරුවන් වෙත නව කෘෂිකාර්මික තාක්ෂණය බෙදා හැරීම සඳහා රූපවාහිනී වැඩසටහන් 161ක් ද විශේෂ වීඩියෝ වැඩසටහන් 277ක් ද කෙටි විඩියෝ පණිවුඩ 25ක් ද වසර තුළදී විකාශය කරන ලද අතර යූ ටියුබ් කෙටි විඩියෝ පට 256ක් අන්තර්ජාලයට ඇතුලත් කරන ලදී.
- කෘෂිකර්මාන්තය හා සම්බන්ධ කරුණු සහ ගැටළු පිළිබඳ ගුවන් විදුලි වැඩසටහන් 1,676ක් සහ කෙටි පණිවුඩ 480ක් වසර තුළ දී විකාශය කෙරිණි.
- කෘෂිකර්මාන්තය සම්බන්ධයෙන් නව පොත් 70ක් (පිටපත් 122,191) ද පත්‍රිකා 45ක් (පිටපත් 1,826,128) ද පෝස්ටර් පිටපත් 51,430ක් ද නිමකර බෙදා හරින ලදී.
- නව පිටු 346ක් සමාජ මාධ්‍ය ජාලවලට එකතු කරන ලදී.
- කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සඳහා පරිශීලනයට පහසු නව වෙබ් අඩවියක් නිර්මාණය කරන ලද අතර එහි පිටු 118ක් යාවත්කාලීන කරන ලදී.
- රුපියල් මිලියන 4.25ක ආදායමක් වාර්තා කරමින් ගන්නෝරුව හා බටඅත කෘෂි උද්‍යානය නැරඹූ පිරිස 34,316ක් විය.
- කෘෂිකාර්මික ප්‍රකාශන අලෙවියෙන් ඉපැයූ ආදායම රුපියල් මිලියන 2.21කි.
- පාංශු පරීක්ෂණ වාර්තා කළමනාකරණ පද්ධතියෙහි I වන අදියර, පළිබෝධනාශක ලියාපදිංචි කිරීම, බීජ වෙළඳපොල පද්ධතිය සහ වත්කම් කළමනාකරණ දත්ත පද්ධතිය සම්පූර්ණ කරන ලදී. මූල්‍ය දත්ත පද්ධතිය, පැළැටි ජාන සම්පත් MIS - I වන අදියර, පාංශු පරීක්ෂණ වාර්තා කළමනාකරණ ක්‍රමවේදයෙහි දත්ත පද්ධතිය යනාදිය සංවර්ධනය කිරීමේ කටයුතු තවදුරටත් සිදු කෙරෙමින් පවතී.
- කෘෂිකර්මාන්තය ආශ්‍රිතව පැන නැගුණු ගැටළුවලින් 73,718කට 1920 කෘෂි උපදේශන සේවාව ඔස්සේ පිළිතුරු සපයන ලදී.
- කාබනික නිෂ්පාදනය පිළිබඳව විශේෂ මාධ්‍ය ප්‍රචාරයක් රූපවාහිනී වැඩසටහන් 32ක් ද රූපවාහිනී කෙටි පණිවිඩ 5ක් ද වෙළඳ දැන්වීමක්ද LED පැනල් හරහා දිනපතා කෙටි පණිවුඩ මුදා හරිමින් මෙන්ම සිංහල හා දෙමළ යන භාෂා දෙකෙන්ම පත්‍රිකා 1,212,000ද පෝස්ටර 28,350ක් ද නිකුත් කරන ලදී. සතිපතා ගුවන්විදුලි වැඩසටහන් 35, කෘෂි ටීවී යූ ටියුබ් කෙටි විඩියෝ පට 34ක්, කොම්පෝස්ට් නිෂ්පාදනය පිළිබඳව ලියැවුණ පොත්වල පිටපත් 30,800ක්, පුවත් ලිපි 46ක් ද මේ යටතේ මුදා හරින ලද අතර දැනුම්වත්භාවය ඉහළ නංවමින් ZOOM පුහුණු වැඩසටහන් 8ක් පැවැත්වීමද සමාජ මාධ්‍ය දැන්වීම් සහ විඩියෝ පට 148ක් මුදා හැරීම ද සිදු කෙරිණ.

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය (AAIB)

දැක්ම

දේශීය කෘෂිකර්මාන්තයේ අග්‍රගන්‍ය රැකවලාවීම තුලින් දකුණු ආසියාවේ පරමාදර්ශී කෘෂි රක්ෂණ ආයතනය වීම.

මෙහෙවර

කෘෂිකාර්මික රක්ෂණය හා ආරක්ෂණය සැලසීම සඳහා සාමූහික ප්‍රයත්නයන් හා අදාළ ආයතන සම්බන්ධීකරණය තුළින් ජාත්‍යන්තරව පිළිගත හැකි විශිෂ්ඨ සේවාවක් සැපයීම.

අරමුණු

- දේශීය කෘෂිකර්මාන්තයේ අවදානම අවම කිරීමට සහ ආයතනයේ මූල්‍ය ස්ථාවරත්වය ඇති කිරීමට පවත්නා රක්ෂණ යෝජනා ක්‍රම යාවත්කාලීන කිරීම සහ නව රක්ෂණ යෝජනා ක්‍රම හඳුන්වාදීම.
- දේශීය කෘෂිකාර්මිකයාට ස්ථාවරත්වයක් ලබාදීම සඳහා පවතින සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම යාවත්කාලීන කිරීම සහ නව ආරක්ෂණ යෝජනා ක්‍රම හඳුන්වාදීම.
- ආයතනයට අදාළ වන දේශීය හා ජාත්‍යන්තර තත්ත්ව සහතික ලබාගැනීම.
- අදාළ අනිකුත් ආයතන සමඟ මනා සම්බන්ධීකරණයක් පවත්වා ගැනීම.
- තෘප්තිමත් පාරිභෝගික කණ්ඩායමක් පවත්වා ගැනීම.
- ආයතනයේ මානව හා භෞතික සම්පත් සංවර්ධනය සහ පරිපාලනය ක්‍රමවත්ව හා විධිමත්ව පවත්වාගෙන යාම.

<u>පනතට අනුව ආයතනය ;-</u>

හදිසි ආපදා තත්ත්වයන් හමුවේ දේශීය කෘෂිකර්මාන්තය හා කෘෂිකාර්මිකයා සුරක්ෂිත කිරීමෙහිලා රජය වෙත පැවරී ඇති වගකීම ඉටුකිරීම සඳහා 1973 අංක 27 දරණ කෘෂිකර්ම රක්ෂණ පනත මඟින් කෘෂිකාර්මික රක්ෂණය වෙනුවෙන්ම වූ එකම රාජ්‍ය රක්ෂණ ආයතනය වශයෙන් කෘෂිකර්ම රක්ෂණ මණ්ඩලය පිහිටුවා ඇත. 1999 අංක 20 දරණ කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ පනත මඟින් කෘෂිකර්ම රක්ෂණ මණ්ඩලය, කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය ලෙස නැවත ස්ථාපිත කරන ලදී.

<u>කාර්යයන්:</u>-

1. කෘෂිකාර්මික අවදානම් කළමනාකරණය

අවදානම් කළමනාකරණ ක්‍රමවේදයක් වශයෙන් ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ක්ෂේත්‍රයට බෝග, පශු, හා - සාමාන්‍ය රක්ෂණ යන අංශ යටතේ කෘෂි රක්ෂණ ක්‍රමවේද හඳුන්වා දීම මගින් කෘෂිකාර්මික අවදානම් කළමනාකරණ සඳහා දායක වීම, හදිසි ආපදාවකදී ගොවි ජනතාවට සිදුවන ආර්ථික බිඳවැටීම් අවමකර ගැනීම සඳහා සහය වීම හා කෘෂිකාර්මික ණය ලබාදෙන මූල්‍ය ආයතනවලට සිය මූල්‍ය ස්ථාවරත්වය වර්ධනය කර ගැනීම සඳහා උපකාරී වීම

- වගා රක්ෂණ යෝජනා ක්‍රම (වී හා අනෙකුත් බෝග)
- පශු සම්පත් රක්ෂණ යෝජනා ක්‍රම
- ජීවිත රක්ෂණ යෝජනා ක්‍රම
- සුවසෙත සෞඛ්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය
- හදිසි අනතුරු රක්ෂණ යෝජනා ක්‍රමය
- කෘෂි උපකරණ රක්ෂණ යෝජනා ක්‍රමය
- ගබඩා රක්ෂණ යෝජනා ක්‍රමය

- රෝද 2, රෝද 4 ට්‍රැක්ටර් සහ අනෙකුත් තෙවන පාර්ශවීය රක්ෂණ යෝජනා ක්‍රම

2. සමාජ සුභසාධනය

සමාජ ආරක්ෂණ ක්‍රමවේද හඳුන්වා දීම මඟින්, ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ක්ෂේත්‍රය හා සම්බන්ධව සිටින ගොවීන්ගේ විශ්‍රාමික දිවිය සුරක්ෂිත කිරීමට දායක වීම.

- ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
- ධීවර විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය

2021.12.31 දක්වා සමස්ත මූල්‍ය ප්‍රගතිය

විස්තරය	වෙන් කළ මුදල රු. (මිලියන)	වියදම් කළ මුදල රු. (මිලියන)*
පුනරාවර්තන	**4,000**	**4,000***
ප්‍රාග්ධන	**1,040**	**1,020**

2021.12.31 දක්වා මූල්‍ය හා භෞතික ප්‍රගතිය

රක්ෂණ යෝජනා ක්‍රමයන්හි වාරික ආදායම හා වන්දි ගෙවීම් - 2021 දෙසැම්බර් 31 දක්වා

රක්ෂණ යෝජනා ක්‍රමය	2021 දෙසැම්බර් 31 දක්වා	
	වාරික ආදායම (රු.මි)	වන්දි ගෙවීම් (රු.මි)
අනිවාර්ය රක්ෂණය වාරික ආදායම	57.8	1,086.5

ගොවි /ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමය වාරික ආදායම හා විශ්‍රාම වැටුප් ගෙවීම්- 2021 දෙසැම්බර් 31 දක්වා

යෝජනා ක්‍රමය **118-02-03-049-1509**	දායක සංඛ්‍යාව	ආදායම (රු.මි)	විශ්‍රාම ලාභීන් සංඛ්‍යාව	විශ්‍රාම වැටුප් ගෙවීම් (රු.මි)
ගොවි විශ්‍රාම වැටුප්	959,254	18.9	167,626	3,755.7
ධීවර විශ්‍රාම වැටුප්	69,049	0.3	5,354	77.5

*රාජ්‍ය දායකත්වය - (ගොවි හා ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා දැරීමට සිදුවන මෙහෙයුම් හා පරිපාලන වියදම රු.මිලි.247ක මුදල ද ඇතුලත් වේ)

- **2021 වර්ෂයේ ක්‍රියාත්මක වන සංවර්ධන වැඩසටහන් වල භෞතික ප්‍රගතිය**

1. දර්ශක මත පදනම් වූ රක්ෂණ ක්‍රමයක් හඳුන්වාදීමේ ව්‍යාපෘතිය

- මෙම ව්‍යාපෘතිය දැනට වවුනියාව, කිලිනොච්චි, අනුරාධපුරය, අම්පාර, හම්බන්තොට, කුරුණෑගල හා ගම්පහ යන දිස්ත්‍රික්කයන්හි ක්‍රියාත්මක කෙරේ. හානි තක්සේරු කිරීමේ ක්‍රියාවලිය සඳහා අවශ්‍ය අවස්ථා වලදී වන්ද්‍රිකා ඡායාරූප හා ඩ්‍රෝන තාක්ෂණය යොදා ගැනීම සිදු කරමින් පවතී.
- මෙම ක්‍රමවේදය යටතේ, 2021 යල කන්නය සඳහා අනුරාධපුර, හම්බන්තොට, වවුනියාව, ගම්පහ, කිලිනොච්චිය, අම්පාර හා කුරුණෑගල යන දිස්ත්‍රික්කයන් සඳහා මෙම ක්‍රමවේදය යටතේ වන්දි ගණනය කිරීම්, ක්ෂේත්‍ර අධීක්ෂණ හා වගා හානි වාර්තාවීම් සමඟ විශ්ලේෂණය කිරීමේ කටයුතු සිදු කරමින් පවතී.
- 2021/2022 මහ කන්නය සඳහා ද මෙම නව ක්‍රමවේදය අනුගත කර ගැනීමට සැලසුම් කර ඇත.

2. කළමනාකරණ දත්ත පද්ධතියක් සහිත පරිගණක මෘදුකාංගයක් (AIMS) ගොඩනැගීමේ වැඩසටහන

- කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය විසින්, ජාත්‍යන්තර මූල්‍ය සංස්ථාවේ තාක්ෂණික සහය ඇතිව, පළමු අදියරේ වෙබ් හා ජංගම යෙදවුම සකස් කිරීමේ කටයුතු අවසන් කර ඇත.
- හම්බන්තොට දිස්ත්‍රික්කයේ කුඹුරු ඉඩම් සිතියම්ගත කිරීමේ කටයුතු යාය මට්ටමින් සම්පූර්ණයෙන් අවසන් කර ඇත. එමෙන්ම ගම්පහ දිස්ත්‍රික්කයේ කුඹුරු ඉඩම් කොටසක්ද, බදුල්ල දිස්ත්‍රික්කයේ අර්තාපල් වගා බිම් බොහොමයක්ද සිතියම්ගත කොට අවසන් කර ඇති අතර, ගොවීන් ලක්ෂ 8කට අධික ප්‍රමාණයක මූලික තොරතුරු මෙම දත්ත පද්ධතියට ඇතුළත් කර ඇත. මෙම සියළු දත්ත ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයෙහි (ICTA) දත්ත ගබඩා කිරීමේ අවකාශයෙහි (Lanka Government Cloud) ගබඩා කර ඇත.
- මෙය ඉදිරියේදී කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සඳහා සහ මෙහි වැයබර අවම කරගැනීම සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශය හා තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය එක්ව ඒකාබද්ධ ව්‍යාපෘතියක් වශයෙන් ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමේ ජාතික වැදගත්කම සාකච්ඡා කොට ඇත. ගරු කෘෂිකර්ම අමාත්‍යතුමාගේ සෘජු මැදිහත්වීම හා කෘෂිකර්ම අමාත්‍යාංශයේ මෙහෙයවීම හා තොරතුරු තාක්ෂණය පිළිබඳ ජාත්‍යන්තර මට්ටමේ අත්දැකීම් ලත් ශ්‍රී ලාංකික මෘදුකාංග ඉංජිනේරුවන්ගේ උපදේශනය යටතේ දැනට මෙම ව්‍යාපෘතිය වඩාත් කඩිනම්ව ක්‍රියාත්මක කරමින් පවතී. මෙම යෙදවුම ඉදිරි මාස කිහිපය තුළ ක්ෂේත්‍ර නිලධාරීන් හට හඳුන්වා දෙමින්, ක්ෂේත්‍ර මට්ටමින් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.
- ඒ සඳහා පහත දිස්ත්‍රික්ක වල නිලධාරී පුහුණු කිරීම් වල මූලික අදියර අවසන් කරන ලදී. මෙම පුහුණු වැඩසටහන් වලට ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ ගොවිජන සංවර්ධන නිලධාරීන් හා සංවර්ධන නිලධාරීන් සහභාගී කරවගන්නා ලදී.

දිනය	විස්තරය	පුහුණු වැඩසටහන පැවැත්වූ ස්ථානය	සහභාගී වූ නිලධාරීන් ගණන
03/11/2021	ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ නිලධාරීන් සඳහා පැවැති දැනුවත් කිරීමේ වැඩසටහන	Water's Edge, Battaramulla.	61
11/11/2021	ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් කොමසාරිස්වරුන් සඳහා පැවැති දැනුවත් කිරීමේ වැඩසටහන	Hotel Grand Monarch, Thalawathugoda.	75
01/12/2021	කොළඹ දිස්ත්‍රික් ගොවිජන සේවා දෙපාර්තමේන්තු ගොවිජන සංවර්ධන නිලධාරීන් හා සංවර්ධන නිලධාරීන් දැනුවත් කිරීමේ මූලික වැඩසටහන	Hotel Sapphire, Colombo 05.	50
01/12/2021	ගම්පහ දිස්ත්‍රික් ගොවිජන සේවා දෙපාර්තමේන්තු ගොවිජන සංවර්ධන නිලධාරීන් හා සංවර්ධන නිලධාරීන් දැනුවත් කිරීමේ මූලික වැඩසටහන	Senuri Reception Hall, Diyulapitiya.	140
01/12/2021	කළුතර දිස්ත්‍රික් ගොවිජන සේවා දෙපාර්තමේන්තු ගොවිජන සංවර්ධන නිලධාරීන් හා සංවර්ධන නිලධාරීන් දැනුවත් කිරීමේ මූලික වැඩසටහන	Hotel Panorama, Kalutara	125
02/12/2021	පුත්තලම දිස්ත්‍රික් ගොවිජන සේවා දෙපාර්තමේන්තු ගොවිජන සංවර්ධන නිලධාරීන් හා සංවර්ධන නිලධාරීන් දැනුවත් කිරීමේ මූලික වැඩසටහන	Hotel Far Inn Beach, Chilaw	110
03/12/2021	කුරුණෑගල දිස්ත්‍රික් ගොවිජන සේවා දෙපාර්තමේන්තු ගොවිජන සංවර්ධන නිලධාරීන් හා සංවර්ධන නිලධාරීන් දැනුවත් කිරීමේ මූලික වැඩසටහන	Hotel Green Serenity, Kurunagala	350

දිනය	විස්තරය	පුහුණු වැඩසටහන පැවැත්වූ ස්ථානය	සහභාගී වූ නිලධාරීන් ගණන
10/12/2021	හම්බන්තොට දිස්ත්‍රික් ගොවිජන සේවා දෙපාර්තමේන්තු ගොවිජන සංවර්ධන නිලධාරීන් හා සංවර්ධන නිලධාරීන් දැනුවත් කිරීමේ මූලික වැඩසටහන	Hotel Rain Tree, Hambantota	125
14/12/2021	ගාල්ල දිස්ත්‍රික් ගොවිජන සේවා දෙපාර්තමේන්තු ගොවිජන සංවර්ධන නිලධාරීන් හා සංවර්ධන නිලධාරීන් දැනුවත් කිරීමේ මූලික වැඩසටහන	Hotel Grand Palace, Galle	200
14/12/2021	මාතර දිස්ත්‍රික් ගොවිජන සේවා දෙපාර්තමේන්තු ගොවිජන සංවර්ධන නිලධාරීන් හා සංවර්ධන නිලධාරීන් දැනුවත් කිරීමේ මූලික වැඩසටහන	Hotel Balagala Tea Garden, Akuressa	150
24/12/2021	රත්නපුර දිස්ත්‍රික් ගොවිජන සේවා දෙපාර්තමේන්තු ගොවිජන සංවර්ධන නිලධාරීන් හා සංවර්ධන නිලධාරීන් දැනුවත් කිරීමේ මූලික වැඩසටහන	Hotel Kethumatee and Banquet, Rathnapura	170

2021.09.31 දක්වා අතුරු සම්මත ගිණුම් මත සංවර්ධන වැඩසටහන් ඇතුලත් මූල්‍ය ඉලක්කය හා ප්‍රගතිය -පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් ඇතුලත් වියදම් වාර්තාවේ සාරාංශය

අ/ඇ	ව්‍යාපෘතිය /වැඩසටහන	**2021 වර්ෂය සඳහා වෙන්කළ මුදල (රු.මී)**	**දෙසැම්බර් 31 වීට මූල්‍ය ප්‍රගතිය**		**දෙසැම්බර් 31 වීට අයවැය ප්‍රතිපාදන ලැබීම් (රු.මී)**
			වියදම් (රු.මී)	%	
සමස්ත අයවැය		5,040.0	5,020.0	99.6	4,020.0
	පුනරාවර්තන	4,000.0	4,000.0	100	4,000.0
	ප්‍රාග්ධන	1,040.0	1,020.0	98.1	-
01.	ගොවි හා ධිවර විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා (118-02-03-049-1509)	4,000.0	4,000.0	100	4,000.0
	පුනරාවර්තන	4,000.0	4,000.0	100	4,000.0
02.	ප්‍රාග්ධන වියදම (118-02-03-049-2201)	40.0	20.0	50.0	20
	ප්‍රාග්ධන	40.0	20.0	50.0	20

අ/ඇ	ව්‍යාපෘතිය /වැඩසටහන	**2021 වර්ෂය සඳහා වෙන්කළ මුදල**	**2021 දෙසැම්බර් වන විට මූල්‍ය ප්‍රගතිය**		**2021 දෙසැම්බර් වන විට අයවැය ප්‍රතිපාදන ලැබීම් (රු.මී)**
			වියදම (රු.මී)	%	
03.	අනිවාර්ය රක්ෂණ 118-02-03-43-2202	1,000.0	1,000.0	100.0	-
	ප්‍රාග්ධන	1,000.0	1,000.0	100.0	-

2021 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවැය ප්‍රතිපාදන හා දරා ඇති වියදම

වැය ශීර්ෂය (vote)	2021 වර්ෂයේ ඉලක්ක (රු.මි)	2021 දෙසැම්බර් අයවැය ප්‍රතිපාදන ලැබීම් (රු.මි)	2021 දෙසැම්බර් වන විට දරා ඇති වියදම් (රු.මි)
ගොවි හා ධීවර විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා (118-02-03-049-1509)	4,000.0	4,000.0	4,000.0
ප්‍රාග්ධන වියදම (118-02-03-049-2201)	40.0	20.0	20.0
අනිවාර්ය රක්ෂණ (118-02-03-43-2202)*	1,000.0	-	1,000.0

*2020 වර්ෂය සඳහා අනිවාර්ය බෝග රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ රු. මිලියන 1,950ක මුදලක් ඉල්ලුම් කර ඇත. ඒ වෙනුවෙන් 2021 වර්ෂයේදී ද මිලියන 1000ක් පමණක් වාර්ෂික අයවැය ප්‍රතිපාදන තුළ ඇතුලක් කර ඇත. නමුත් 2021 වර්ෂය සඳහා වන්දි ගෙවීමට රු. මිලියන 1900ක් පමණ අවශ්‍ය වේ. ඒ අනුව අමතර ප්‍රතිපාදන වශයෙන් රු. මිලියන 2850ක් 2021 වර්ෂය සඳහා අවශ්‍ය වේ.

<u>සෞභාග්‍යයේ දැක්ම'' ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අනුරූපව අමාත්‍යාංශය /ආයතනය විසින් ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණ</u>

''සෞභාග්‍යයේ දැක්ම'' ජාතික ප්‍රතිපත්තිය	**ප්‍රතිපත්තිමය තීරණ**
ගොවි විශ්‍රාම වැටුප නැවත ස්ථාපනය කිරීම	විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ප්‍රති ව්‍යුහගත කරමින් වර්තමානයට අවශ්‍ය කරන ගැලපීම් සිදු කිරීම සම්බන්ධව ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව සඳහා ලැබුණු තීරණ මත පදනම්ව නව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් සකස් කිරීම හා එය ගොවීන් වෙත හඳුන්වාදීමේ හා බඳවාගැනීම් ආරම්භ කිරීමේ මූලික කටයුතු අවසන් කර ඇති අතර නිල වශයෙන් ආරම්භ කිරීමට දිනයක් බලාපොරොත්තුවෙන් සිටී.
වගාවේ අවදානම ගොවියා අධෛර්යයට පත් වන බැවින් ඉහල ප්‍රතිලාභ හිමි වන වගා රක්ෂණ ක්‍රමයක් හඳුන්වා දෙනු ලැබේ.	භාණ්ඩාගාරයේ පූර්ණ රක්ෂණ වාරික දායකත්වය සහිතව වී, බඩඉරිඟු, අර්තාපල්, ලොකු එණු, මිරිස් හා සෝයා යන බෝග 6 සඳහා අනිවාර්ය වගා රක්ෂණ යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම. 2021 යල කන්නය සඳහා, ගොවීන් වෙත පූර්ණ වගා රක්ෂණ ක්‍රමවේදයක් සැකසීම සඳහා, අවම වාරිකයක් යටතේ වගා රක්ෂණාවරණයන් ලබා දීමට අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් සකස් කර අමාත්‍යාංශය වෙත යොමු කර ඇත.
පසුගිය කාලය තුල ගොවියා මුහුණ දුන් වගා හානි සඳහා ගෙවන වන්දි මාස හයක් ඇතුලත ගෙවා නිම කෙරේ	වගා හානි ඉල්ලුම් පත්‍ර ලැබී දින 90ක් ඇතුලත වගා හානි ඇස්තමේන්තු කර වන්දි ගණනය කර ගෙවීම සඳහා සූදානම් කරනු ලබන අතර භාණ්ඩාගාරයෙන් මුදල් ප්‍රතිපාදන ලබා දුන් වහාම ගෙවීම් කටයුතු සිදු කිරීමට කටයුතු කෙරේ. තොරතුරු කළමනාකරණ දත්ත පද්ධතිය සකස් කිරීමෙන් අනතුරුව මෙම වන්දි සකස් කිරීමේ කටයුත්ත කාර්යක්ෂමව සිදු කල හැකි වනු ඇති නමුත් මහා භාණ්ඩාගාරයෙන් මුදල් ලැබීම ප්‍රමාද නොවෙනම් කඩිනමින් ගෙවීම් කළ හැකිය.
සෑම ගොවියෙකුගේම කෘෂි වගාවන් රක්ෂණය කිරීමේ පහසු ක්‍රමවේදයක් හා නොපමාව වන්දි ලබා දීමේ නව ක්‍රමවේදයක් හඳුන්වා දෙනු ලැබේ.	කෘෂිකාර්මික තොරතුරු කළමණාකරණ පද්ධතියක් (AIMS) හා Index Base Insurance රක්ෂණ යෝජනා ක්‍රමය සකසමින් පවතී. මෙමඟින් නව රක්ෂණ ක්‍රමවේදයන් හා කාර්යක්ෂම රක්ෂණ ක්‍රියාවලියක් ගොවීන් වෙත හඳුන්වා දෙනු ලැබේ.
ධීවර ප්‍රජාව සඳහා ඵලදායී රක්ෂණ ක්‍රමයක් හඳුන්වා දීමට කටයුතු කෙරේ	ධීවර ප්‍රජාව සඳහා ඵලදායී විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් හඳුන්වාදීමට පියවර ගනිමින් ඇති අතර ධීවර අමාත්‍යාංශය සමඟ සාකච්ඡාවට කිහිපයක් පවත්වා අවසන් කර ඇත. ධීවර අමාත්‍යාංශය විසින් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ඉදිරිපත් කළ විගස ක්‍රියාත්මක කළ හැකිය.

ජනතා වතුසංවර්ධන මණ්ඩලය (JEDB)

දැක්ම : ප්‍රාදේශීය මට්ටමින් හොඳම මැදරට පාරම්පරික තේ නිෂ්පාදකයා වීම මඟින් ඉහළම ශුද්ධ අලෙවි මිලක් ලබා ගැනීමෙන් ලාභ ලබන හා ශක්තිමත් රාජ්‍ය ආයතන අතරින් එකක් බවට පත්වීම.

මෙහෙවර : උපරිම කැපවීමකින් පවතින සම්පත් ප්‍රයෝජනයට ගනිමින් පුද්ගල නිපුණතාවයන් සංවර්ධනයට වැඩි සැලකිල්ලක් දක්වමින් කණ්ඩායම් ක්‍රියාකාරිත්වය හරහා අරමුණු කරා ලගාවීම තුලින් කර්මාන්ත අභිවෘර්ධියේ ප්‍රතිලාභ සමස්ථ රටටම හිමිකර දීම.

මූල්‍යමය ප්‍රගතිය - 2021

විස්තරය	ඇස්තමේන්තු මුදල (රු මි.)	සත්‍ය මුදල (රු මි)
ප්‍රාග්ධන වියදම්	599.27	132.65
පුනරාවර්තන වියදම්	1797.58	1614.26 (නොවැම්බර් දක්වා 2021)

සංවර්ධන ව්‍යාපෘතිවල භෞතික ප්‍රගතිය:

සාරාංශය

කෘෂිකර්මාන්තය සඳහා වූ ඵලදායී දායකත්වය මුල් කොට ගෙන ප්‍රාග්ධන වියදම් වෙනුවෙන් වැඩිම මුදලක් මෙම වර්ෂයේදි වැය කොට ඇති අතර, තේ නැවත වගාව, නඩත්තුව පාළු සිටුවීම තේ පැල තවාන් ස්ථාපිත කිරීම, කාබනික පොහොර නිෂ්පාදනය කිරීම ආදී ක්‍රියාකාරකම් මෙම වර්ෂයේදී ආරම්භ කර ඇත. තවද, 2020 වර්ෂයට සාපේක්ෂව 2021 නොවැම්බර් මස වන විට අමු තේ දළු කිලෝ ලක්ෂ 10 පමණ වැඩිපුර නෙලා ගැනීමට හැකිවීම අප ආයතනය ලද සුවිශේෂී ජයග්‍රහණයකි.

සංවර්ධන ව්‍යාපෘතිවල භෞතික හා මූල්‍යමය ප්‍රගතිය :

ව්‍යාපෘතිය	මූල්‍යමය (රු මි)		භෞතික	
	ඇස්තමේන්තුගත මුදල	සත්‍ය වියදම	ඇස්තමේන්තුගත මුදල	සත්‍ය වියදම
නැවත වගාව - තේ රබර්	125.16 47.03	28.06	58.00 55.79	14.51 Ha
නඩත්තු/බිම් සැකසීම තේ රබර්	47.16 49.40	11.75 33.98	24.00 149.75	10.50 ha 147.75 ha
පාළු සිටුවීම	57.47	9.58	27.10	8 ha
වන වගාව හා නඩත්තු	10.19	5.38	56.5	14 ha(පැල 49500)
වෙනත් භෝග හා කාබනික පොහොර	74.88	17.99	110.80	(කාබනික පොහොර මෙ ටොන් 1173, ගම්මිරිස් 3.5 හෙක්,කෝපි පැල 8440)
තේ කර්මාන්තශාලා අළුත්වැඩියාව	64.22	8.02		හෝප්, ලෙවලන් හා ලූල්කදුර තේ කර්මාන්තශාලා
1. තේ පැල තවාන්	27.61	17.46	1350000 පැල	509309 පැල
2. වාහන	46.77	0.11		
3. කෘෂි මෙවලම්	5.44	0.32		
4. වෙනත්	43.94	-		
එකතුව	**599.27**	**132.65**		

ප්‍රගති සමාලෝචනය–2021 නොවැම්බර් මස දක්වා (කළමනාකරන ගිණුම් වලට අනුව)

විස්තරය	2021 වර්ෂය	2020 වර්ෂය	වැඩිවීම අඩුවීමේ අගය	% ලෙස
තේ නිෂ්පාදනය අමු තේ දළු (වතුයාය)	6,902,149.00	5,934,207.74	867,941.26	16.31 %
කම්කරුවන් වෙත බදු දීමෙන් ලබා ලන්නා දළු	136,374.00	69,311.00	67,063.00	96.76 %
එකතුව	7,038,523.00	6,003,518.74	1,035,004.26	17.24 %
තේ නිෂ්පාදනය නිමි තේ				
තේ නිෂ්පාදනය නිමි තේ (වතුයාය)	1,507,993.90	1,237,655.00	270,338.90	21.84 %
කම්කරුවන් වෙත බදු දීමෙන් ලබා ලන්නා නිමි තේ	29,329.00	15,363.00	13,966.00	90.91 %
එකතුව	1,537,322.90	1,253,018.00	284,304.90	22.69 %
තේ ඵලදාව ලබා ගන්නා ඉඩම් ප්‍රමාණය (හෙක්) තේ හෙක්ටයාරයකට අස්වැන්න	2,808.32 537	2,778.49 445	91.	20.55 %
කිලෝ එකකට විකුණුම් මිල	429.55	425.96	3.60	0.84 %
කිලෝ එකකට නිෂ්පාදන වියදම	664.01	692.78	(28.77)	(4.15) %
රබර් නිෂ්පාදනය කිලෝ	370,665	410,890	(40,225.00)	(9.79) %
අස්වැන්න හෙක්ටයාරකට කිලෝ	727	767	(40)	(5.31) %
කිලෝ එකකට නිෂ්පාදන වියදම	425.17	264.74	160.43	60.60 %
රබර් නිෂ්පාදනය කිලෝ	322.75	277.06	45.70	16.49 %
මුළු ආදායම	**1,403,707,937.00**	**1,068,485,051.12**	**335,222,886.08**	**31.37 %**
වතුයාය -තේ	660,362,399.71	533,732,545.19	126,629,794.52	23.73 %
රබර්	157,594,900.08	108,779,883.97	48,815,016.11	44.88 %
පාරිභෝගික සේවය	331,756,098.87	295,949,367.00	35,806,731.87	12.10 %
ප්‍රධාන කාර්යාලය	108,848,163.11	66,187,453.26	42,660,709.85	64.45 %
විවිධ ආදායම්	145,146,435.43	638,35,801.70	81,310,633.73	127.37 %
මුළු වියදම	1,614,267,899.45	1,407,132,682.55	207,135,216.90	14.72 %
වතුයාය -තේ	1,020,804,955.06	868,065,503.15	152,739,451.91	17.60 %
රබර්	119,633,595.62	113,840,336.12	5,793,259.50	5.09 %
පාරිභෝගික සේවය	272,992,801.99	240,530,521.85	32,462,280.14	13.50 %
ප්‍රධාන කාර්යාලය	200,836,546.78	184,696,321.43	16,140,225.35	8.74 %
විවිධ ආදායම්	-			
ශුද්ධ ලාභය/අලාභය රු				
වතුයාය -තේ	**(360,442,615.36)**	**(334,332,957.96)**	**(26,109,657.39)**	**7.81 %**
රබර්	37,961,304.46	(5,060,452.15)	43,021,756.61	(850.16) %
පාරිභෝගික සේවය	58,763,296.88	55,418,845.15	3,344,451.73	6.03 %
ප්‍රධාන කාර්යාලය	(91,988,383.67)	(118,505,868.17)	26,520,484.50	(22.37) %
විවිධ ආදායම්	145,146,435.43	63,835,801.70	81,310,633.73	127.37 %
මුළු ඵකතුව (රු.මී)	**(210,559,962.25)**	**(338,647,631.43)**	**128,087,669.18**	**(37.82) %**

පසුගිය වර්ෂයට සාපේක්ෂව පාඩුව රු මී 128.08 න් (37.82%) ප්‍රතිශතයකින් අඩුවී ඇත.

ලංකා පොස්ෆේට් සමාගම (LPC)

සමාගම පිහිටුවීම සහ නෛතික ආකෘතිය

සී/ස ලංකා පොස්පේට් ආයතනය 1992 ජූලි මස 10වන දින සීමිත වගකීමක් ඇති සමාගමක් වශයෙන් 1982 අංක 17 දරණ සමාගම් පනත යටතේ සංස්ථාපිත කරන ලද්දේ රාජ්‍ය කැනීම් හා ඛණිජ සංවර්ධන සංස්ථාවේ එප්පාවල පොස්පේට් ව්‍යාපෘතිය , 1987 අංක 23 දරණ පොදු සංස්ථා හෝ රජයට අයිතිය පවරා ගන්නා පොදු සමාගම් වශයෙන් පරිවර්තනය කිරීමේ පනත යටතේය. කෙසේ නමුත්, 2007 අංක 7 දරණ සමාගම් අඥා පනත යටතේ මෙකී සමාගම නැවත ලියා පදිංචි කරනු ලැබ ඇත.

අත්‍යන්ත මව් සමාගම

සමාගමෙහි නිකුත් කරන ලද කොටස්, ශ්‍රී ලංකා රජය වෙනුවෙන් භාණ්ඩාගාර ලේකම්වරයාට සම්පූර්ණයෙන්ම හිමි වේ.

<u>දැක්ම</u>

"එප්පාවල පොස්පේට් නිධිය ප්‍රශස්ත ලෙස භාවිතා කර ගනිමින් පෝෂ්‍යදායී පොස්පරස් මඟින් අපගේ මාතෘභූමිය සාරවත් පසකින් සාරවත් කිරීම".

<u>මෙහෙවර</u>

"පරිසර හිතකාමී සහ නව ක්‍රමවේදයන් හරහා පොස්පරස් වලින් ස්වයංපෝෂිත වෙමින් ජාතික පොස්පේට් අවශ්‍යතාවය සැපිරීම".

<u>සමාගමේ කාර්යයන්</u>

<u>මූලික ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් ස්වභාවය</u>

සමාගමේ මූලික කටයුතු ලෙස කෘෂි භෝග සඳහා පොස්පේට් පාෂාණ කැනීම් කිරීම, සැකසීම සහ අලෙවිය සිදු කරයි.

<u>අපගේ මෙහෙය</u>

- ඛනිජ ගවේෂණය
- ගල්වලවල් කැණීම
- සැකසීම/ තැලීම සහ ඇඹරීම
- අයවැය/ තත්ත්ව පාලනය/ විකුණුම් විශ්ලේෂණය
- ගබඩා කටයුතු
- ප්‍රවාහනය / පැටවීම
- නඩත්තු කටයුතු
- පුහුණුව
- මූල්‍ය ගිණුම්කරණය
- පර්යේෂණ හා සංවර්ධන
- අලෙවිකරණය සහ විකුණුම්
- නිෂ්පාදන දැනුවත් කිරීමේ වැඩසටහන්
- ආයතනික සමාජ කටයුතු
- සේවක සුබසාධනය

1.0 ලාභදායිත්වය

විස්තරය	2020/21	2019/20	විචල්‍යතාව	%
පිරිවැටුම - ප්‍රමාණය (මෙ.ටො.)	64,392	44,429	19,963	44.9%
රු. (මිලියන)	**750.37**	**510.00**	**240.37**	47.1%
නිෂ්පාදනය - ප්‍රමාණය (මෙ.ටො.)	61,487	46,364	15,123	32.6%
වෙනත් ආදායම – රු. (මිලියන)	29.52	36.32	(6.80)	(18.7%)
සමස්ථ වියදම - සෘජු (මිලියන)	405.00	321.28	(83.72)	(26.0%)
- වක්‍ර (මිලියන)	241.32	213.87	(27.45)	(12.8%)
දළ ලාභය / (අලාභය)	**345.37**	**188.72**	**156.65**	**83%**
මෙහෙයුම් ලාභය / (අලාභය)	**120.96**	**(22.84)**	**143.80**	
බදු පෙර ලාභය / (අලාභය)	**150.58**	**13.48**	**137.10**	

2.0 2021.03.31 දිනට මූල්‍ය තත්ත්වය

විස්තරය	2020/21	2019/20	විචල්‍යතාව
ජංගම නොවන වත්කම්	343.93	380.36	(37.43)
ජංගම වත්කම්	755.76	567.29	188.48
මුළු වත්කම්	**1,099.69**	**948.65**	**151.04**
දිගු කාලීන වගකීම්	78.22	78.30	(0.74)
ජංගම වගකීම්	77.59	38.97	38.62
මුළු වගකීම්	**155.81**	**117.27**	**38.54**
සම කොටස් / කොටස් කරුවන්ගේ අරමුදල	**943.87**	**831.34**	**112.49**

භෞතික ප්‍රගතිය







<u>අතැති ව්‍යාපෘති</u>

ව්‍යාපෘතිය	ප්‍රගතිය	සම්පූර්ණ කිරීමට අපේක්ෂිත දිනය
නව ඇඹරුම් යන්ත්‍රය ස්ථාපනය කිරීම	යාන්ත්‍රික කටයුතු සහ ඉදිකිරීම් කටයුතු සිදු වෙමින් පවතී	**2022 පෙබරවාරි**
කුඩු කිරීමේ යන්ත්‍රෝපකරණ ප්‍රතිසංස්කරණය කිරීම	යාන්ත්‍රික කටයුතු සහ ප්‍රසම්පාදන කටයුතු සිදු වෙමින් පවතී	**2022 අගෝස්තු**
පොහොර ඇසුරුම් ඒකකය ස්ථාපනය කිරීම	යාන්ත්‍රික කටයුතු සහ ප්‍රසම්පාදන කටයුතු සිදු වෙමින් පවතී	**2022 අප්‍රේල්**
බලශක්ති බෙදා හැරීමේ පද්ධතිය සහ පොරොත්තු ජනක පද්ධතිය වැඩිදියුණු කිරීම	ව්‍යාපෘති වාර්තාව සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය අපේක්ෂිතය	**2022 අගෝස්තු**
එප්පාවල අමුද්‍රව්‍ය ගබඩා ඉදිකිරීම	ප්‍රසම්පාදන කටයුතු සිදුවෙමින් පවතී	**2022 අගෝස්තු**

වී අළෙවි මණ්ඩලය (PMB)

ප්‍රධාන මූල්‍ය නිලධාරි
කෘෂිකර්ම අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

3.8 මු.රෙ.208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

වාර්ෂික ඇස්තමේන්තුවේ සඳහන් පරිදි වැඩසටහන් අංකය	වියදමෙහි නම	අයවැය ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (1)	පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (2)	මු.රෙ. 66/69 මාරු කිරීම් (3)	මුළු ශුද්ධ ප්‍රතිපාදන (4)=(1)+(2)+(3)	මුදල් පොතට අනුව වියදම (5)	මු.රෙ. 208 යටතේ අනෙකුත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු විසින් දැරූ වියදම් (භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව) (6)=(4)-(5)	මුළු වියදම	ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය /(ඉක්මවීම්) (6)=(4)-(5)
වැඩසටහන (1)	(1) පුනරාවර්තන	959,600,000	-	(223,000)	959,377,000	386,814,713	487,248,714	874,063,428	85,313,572
	(2) ප්‍රාග්ධන	83,300,000	-	223,000	83,523,000	30,331,495	5,175,424	35,506,919	48,016,081
	උප එකතුව	**1,042,900,000**	-	-	**1,042,900,000**	**417,146,208**	**492,424,138**	909,570,347	133,329,653
වැඩසටහන (2)	(1) පුනරාවර්තන	4,000,000,000	-	-	4,000,000,000	-	4,000,000,000	4,000,000,000	-
	(2) ප්‍රාග්ධන	11,643,000,000	100,921,469	-	11,743,921,469	1,620,228,945	5,394,427,540	7,014,656,485	4,729,264,984
	උප එකතුව	**15,643,000,000**	**100,921,469**	-	**15,743,921,469**	**1,620,228,945**	**9,394,427,540**	11,014,656,485	4,729,264,984
	මුළු එකතුව	**16,685,900,000**	**100,921,469**	-	**16,786,821,469**	**2,037,375,153**	**9,886,851,678**	11,924,226,832	4,862,594,637

.....

ප්‍රධාන මූල්‍ය නිලධාරී/ ප්‍රධාන ගණකාධිකාරී/
අධ්‍යක්ෂ (මුදල්) /කොමසාරිස් (මුදල්)
දිනය : 2022/05/18

[illegible]
ප්‍රධාන මූල්‍ය නිලධාරී
කෘෂිකර්ම අමාත්‍යාංශය
අංක. [illegible], "නොවිස්ත මන්දිරය",
[illegible]

3.9

ඒසීඒ-6

මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශය - 2021



සමුච්චිත මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශය - මධ්‍යම රජය 2021

ඉඩම්-9153:	286,700,000.00	වගුව:	SA 82
ගොඩනැගිලි-9151:	737,800,000.00	වර්ෂය:	2021
යන්ත්‍රෝපකරණ-9152:	768,492,099.31	වාර්තාවේ දිනය	2/3/2022 10:10
නොනිමි වැඩ -9160:	0	ශීර්ෂය	118
අස්පෘශ්‍ය-9154:	0		
කල්බදු-9180:	0		

ලෙජරය	කාණ්ඩය	අයිතමය	කේත අංකය	ආරම්භක ශේෂය	ආරම්භක ශේෂය එකතු කිරීම	හුවමාරු	මිලදී ගැනීම්	අපහරණය	ශේෂය
9151-->	නිවාස නොවන ගොඩනැගිලි		61112	737,800,000	-	-	-	-	737,800,000
		කාර්යාල ගොඩනැගිලි	****6111201	737,800,000	-	-	-	-	737,800,000
9152-->	යන්ත්‍රෝපකරණ								
9152-->	2.1-ප්‍රවාහන උපකරණ		61121	514,736,970	-	-	-	-	514,736,970
		මගී වාහන	****6112101	514,316,970	-	-	-	-	514,316,970
		යතුරු පැදි	****6112109	420,000	-	-	-	-	420,000
9152-->	2.2- වෙනත් යන්ත්‍ර හා උපකරණ		61122	245,949,109	2,313,300	-	6,085,778	593,058	253,755,129
		කාර්යාලීය උපකරණ	****6112201	14,445,334	451,116	-	440,626	106,758	15,230,319
		පරිගණක උපකරණ	****6112202	53,382,271	1,756,065	-	3,849,280	486,300	58,501,316
		විද්‍යුත් උපකරණ	****6112203	3,878,465	9,350	-	87,498	-	3,975,313
		සන්නිවේදන උපකරණ	****6112204	33,268,044	-	-	18,900	-	33,286,944
		ගෘහභාණ්ඩ	****6112205	140,959,365	96,769	-	1,689,474	-	142,745,608
		ඉදිකිරීම් උපකරණ	****6112213	15,630	-	-	-	-	15,630
9153-->	4.1- ඉඩම්		61410	286,700,000	-	-	-	-	286,700,000
		ඉඩම්	****614100	286,700,000	-	-	-	-	286,700,000

3.10 විගණකාධිපති නිරීක්ෂණ (අමුණුමක් ලෙස පිටුපස පිටුවේ සඳහන් කර ඇත.)

04) පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100 % - 90%	75% - 89%	50% -74%
1.බෝගවල ඵලදායීතාවය වැඩි දියුණු කිරීමේ පර්යේෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම	√		
2. පුහුණු, කුසලතා සංවර්ධනය, කෘෂි තාක්ෂණික ව්‍යාප්ති වැඩසටහන් ක්‍රියාත්මක කිරීම	√		
3. ගුණාත්මයෙන් ඉහළ බීජ නිෂ්පාදනය හා ප්‍රචලිත කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම	√		
4. ජාන සම්පත් සංරක්ෂණ හා උපයෝජන වැඩසටහන ක්‍රියාත්මක කිරීම	√		

05) පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනා ගන්නා ලද තිරසාර සංවර්ධන අරමුණු

ඉලක්කය/ අරමුණ	**වැඩසටහන**	**තිරසාර සංවර්ධන ඉලක්ක අංකය**	**තිරසාර සංවර්ධන දර්ශක අංකය**	**තිරසාර සංවර්ධන ප්‍රගතිය**		
				0 - 49%	**50 -74%**	**75 -100%**
අරමුණ 2: සාගින්න දුරලීම, ආහාර සුරක්ෂිතතාවය සහ වැඩිදියුණු පෝෂණය සාක්ෂාත් කරගැනීම,සහ තිරසාර කෘෂිකර්මය ප්‍රවර්ධනය	1. බෝගවල ඵලදායීතාවය වැඩි දියුණු කිරීමේ පර්යේෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම	2.3	2.3.1 2.3.2	-	-	√
	2. . පුහුණු, කුසලතා සංවර්ධනය, කෘෂි තාක්ෂණික ව්‍යාප්ති වැඩසටහන් ක්‍රියාත්මක කිරීම	2.3	2.3.1 2.3.2	-	-	√
	3. ගුණාත්මයෙන් ඉහළ බීජ නිෂ්පාදන හා ප්‍රචලිත කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම	2.3	2.3.1 2.3.2	-	-	√
	4. ජාන සම්පත් සංරක්ෂණ හා උපයෝජන වැඩසටහන ක්‍රියාත්මක කිරීම	2.5	2.5.1	-	-	√

5.2 තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

අභියෝග

- වෙළඳපොලේ මිල ඒකාධිකාරයක් පැවතීම.
- දියුණු කෘෂිකාර්මික සංවර්ධනයක් ඇති සංවර්ධිත රටවලට සාපේක්ෂව අධි තාක්ෂණික සම්පත් නොමැතිවීම.
- කුඩා පරිමාණ ගොවීන්ට ජාත්‍යන්තර වෙළඳපොළවල සමඟ තරඟ කිරීමට අපහසු වීම.
- දළ දේශීය නිෂ්පදනයෙන් කෘෂිකර්මයට වන දායකත්වය ඉහළ නැංවීම
- දේශගුණික විපර්යාසයන් සඳහා වඩාත් ඔරොත්තු දෙන බීජ වල ආකාර බහුල කිරීම හා දේශීය බීජ සංරක්ෂණය
- නව සන්නිවේදන තාක්ෂණය ලබාගැනිමට ඇති හැකියාව තවදුරටත් ප්‍රශස්ත නොවීම

විසඳුම්

- ඒකාබද්ධ කෘෂිකාර්මික පද්ධති ස්ථාපිත කිරීම.
- උපායමාර්ගික ආහාර සංචිත ස්ථාපිත කිරීම.
- මැදිහත්කරුවෙකු නොමැතිව ගොවියාට නිසි මිලක් ලබා දීමට කටයුතු කිරීම.
- ආහාර නිෂ්පාදනය සඳහා දත්ත සමුදායන් ඇති කිරීම.
- සාධාරණ වෙළඳ ප්‍රවේශයන් ස්ථාපිත කිරීම.
- ආහාර නිෂ්පාදනය පෝෂණ අවශ්‍යතා සමඟ සම්බන්ධ කිරීම.

ආහාර පද්ධතීන් සඳහා අනුහුරු විමේ හැකියාව වැඩි දියුණු කිරීම සඳහා පවතින අභියෝග සහ ඒ සඳහා ඇති විසඳුම්

අභියෝග

- සහනාධාර මත යැපීමේ සංකල්පය (පොහොර, බීජ වැනි දේ) වෙනුවට නිෂ්පාදන ආර්ථිකයක් ඇති කිරීම.
- ගොවීන් ගේ සදාකාලීන ණය ගැති බව සහ මූල්‍ය සාක්ෂරතාවය නොමැති වීම.
- ස්වාභාවික විපත් වලට මුහුණ පෑමට සිදුවීම.
- ගොවීන් අතර ඩිජිටල්කරණය කළ දත්ත වලට ප්‍රවේශය නොමැති වීම.
- නව මූල්‍ය ආකෘති හඳුන්වා දීම
- විවිධ කෘෂි යෙදවුම්(රසායනික පොහොර, හා විවිධ කෘමි, පලිබෝධ නාශක) හේතුවෙන් ඇතිවන සෞඛය ගැටළු මහහරවා ගැනීම

විසඳුම්

- ගොවීන් සඳහා තිරසාර මූල්‍ය යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීම
- ගොවි ප්‍රජාව ණය ගැතිභාවයෙන් මුදවා ගැනිම
- පෞද්ගලික අංශයේ මැදිහත් වීම ඉහළ නැංවීම.
- කාන්තාවන් සහ තරුණ ප්‍රජාව තිරසාර නිෂ්පාදන හා මූල්‍ය කටයුතු කෙරෙහි බල ගැන්වීම.

අවදානමට ලක්විය හැකි කෘෂිකාර්මික ප්‍රජාවන්ට සහ කුඩා නිෂ්පාදන කණ්ඩායම් සඳහා මූල්‍ය ප්‍රවේශය සඳහා පවතින අභියෝග සහ ඒ සඳහා ඇති විසඳුම්

අභියෝග

- දුර්වල මූල්‍ය පද්ධති සහ කළමනාකරණය ක්‍රමවේද ක්‍රියාත්මක වීම. (විවිධ ආයතන මගින් එකම වැඩසටහන සඳහා ද්‍රව්‍ය ආධාර ලබා දීම
- රජයන් හෝ විදේශ ආධාර මඟින් ලබා දෙන ණය මුදල් මඟින් සිදුකරන සංවර්ධන වැඩසටහන් වල ප්‍රතිලාභ මත එකී ණය නොපියවීම නිසා රජය ණය ගැකි භාවයට පත්වීම
- ගෘහස්ථ මුදල් ප්‍රවාහය දුර්වල වීම හා ගෘහස්ථ හිංසනය ඇතිවීම
- අවිධිමත් හා ලියාපදිංචි නොකළ ආහාර නිෂ්පාදකයින් බහුල වීම.
- ඉඩම් පිළිබඳ ආරවුල් සහ අපැහැදිලි / තරඟකාරී ඉඩම් අයිතීන් පැවතීම.

විසඳුම්

- අවදානමට ලක්විය හැකි ප්‍රජාවන්ට අරමුදල් ලබා ගැනීම සඳහා රජය ප්‍රමුඛ ක්‍රියාදාමයන් ඇති කිරීම , ඒවා නිසි පරිදි මෙහෙයවීම හා මාර්ගෝපදේශන් ඇති කිරීම සහ ඒවා ප්‍රචාරය කිරීම.
- තරුණයින් ප්‍රජාව ගේ කාර්යක්ෂම දායකත්වය ලබා ගැනීම .
- වැඩමුළු සහ ධාරිතා වර්ධන වැඩසටහන් සඳහා ගොවීන් සක්‍රීයව සහභාගී කරවා ගැනීම.
- අවදානම් කළමනාකරණය හා සමාජ ආරක්ෂණ ක්‍රම වල විශ්වසනීයත්වය සහ ක්‍රමවත් බවක් ඇති කිරීම
- රාජ්‍ය සහ පෞද්ගලික හවුල්කාරිත්වය වැඩි දියුණු කිරීම.

6 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

අ/අ	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාංව	ඇබෑර්තු / (අතිරික්ත)
ජ්‍යෙෂ්ඨ	72	60	12
තෘතීයක	9	4	5
ද්විතියික	1017	817	200
ප්‍රාථමික	126	113	13
එකතුව	1227		230

6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලබන ආකාරය

මෙම අමාත්‍යාංශය සඳහා තනතුරු 1227 ක් අනුමත ව පවතින අතර ඒ අතුරින් තනතුරු 230 ක් ම පුරප්පාඩු ව පවතී. සමස්ථයක් ලෙස එම පුරප්පාඩු පැවතීම මෙම අමාත්‍යාංශයේ එදිනෙදා කාර්යයන් සිදු කර ගෙන යාමට මෙන්ම වෙනත් විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී ද බාධාවක් වී ඇත.

I. මෙම අමාත්‍යාශය සඳහා අනුමත ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය 72 කි. එහි තථ්‍ය සේවක සංඛ්‍යාව 60 වන අතර ඒ අතුරින් නිලධාරීන් 06 දෙනෙකුම වැඩ බලන නිලධාරීන් වේ. ඒ අනුව ජ්‍යෙෂ්ඨ මට්ටමේ පවතින පුරප්පාඩු 12 කි. එම පුරප්පාඩු 12 අතුරින් 06 ක් ම ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II/III ශ්‍රේණියේ පුරප්පාඩු වේ. එම තනතුරු පුරප්පාඩු වී තිබීම පාලන I, පාලන II, ප්‍රසම්පාදන සහ ප්‍රතිපත්ති හා ව්‍යාපෘති ඇගයුම් යන අංශවල කාර්යයන් සඳහා විශාල බාධාවක් වී ඇත.

II. මෙම අමාත්‍යාංශය සඳහා තෘතීයක මට්ටමේ තනතුරු 09 ක් අනුමත ව පවතින අතර එහි පූර්ණකාලීනව සේවය කරන නිලධාරීන් තිදෙනෙකු සහ වැඩ බැලීමේ පදනම මත එක් නිලධාරියෙක් සේවය කරනු ලබයි. ඒ අනුව තෘතීයක මට්ටමේ තනතුරු 05ක් පුරප්පාඩු වී ඇති අතර එයින් පරිපාලන නිලධාරී තනතුරු සහ භාෂා පරිවර්තක සේවයේ තනතුරු රාජකාරි බහුල තනතුරු වන අතර එම තනතුරු සැලකිය යුතු කාලයක පටන් පුරප්පාඩු වී පැවතීම මහත් ගැටළුකාරී තත්ත්වයකි.

III. මෙම අමාත්‍යාංශය සඳහා අනුමත කාර්ය මණ්ඩලයේ ද්විතියික මට්ටමේ පුරප්පාඩු 200 ක් පවතින අතර සියලුම අංශවල පාහේ පවතින මෙම ද්විතියික මට්ටමේ / විෂය නිලධාරීන්ගේ හිඟය එම අදාළ කටයුතුවල ප්‍රමාදයන් ඇති වීමට හේතුවක් වී ඇත.

IV. එමෙන්ම ප්‍රාථමික මට්ටමේ තනතුරු අතුරින් කාර්යාල සේවක සේවයේ සහ ඒකාබද්ධ රියදුරු සේවයේ පුරප්පාඩු වී පැවතීම අදාළ සහයෝගි කාර්යයන් සිදු කිරීමේදී තවදුරටත් ගැටළුකාරී තත්ත්වයන් ඇති කරයි.

6.3 මානව සම්පත් සංවර්ධනය - (6.3.1) දේශීය පුහුණු

අංකය	වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩ සටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය (රු.)
01	උපාධිධාරී අභ්‍යාසලාභී පුහුණු පාඨමාලාව	100	2021.01.11 – 2021.01.22	330,000.00
02	කාර්යාල සේවක සේවය සඳහා පුහුණු පාඨමාලාව	20	2021.02.17 – 2021.02.18	32,324.00
03	රියදුරන් සඳහා පුහුණු පාඨමාලාව	25	2021.02.24 – 2021.02.25	35,000.00
04	වැටුප් ලේඛනය පවත්වාගෙන යාම	02	2021.07.12, 2021.07.14 2021.07.16	10,000.00
05	පෞද්ගලික ලිපි ගොනු නඩත්තුව	30	2021.08.05 – 2021.08.06	15,000.00
06	නිවාඩු සහ අතිකාල පිළිබඳ පුහුණු පාඨමාලාව	20	2021.10.07 – 2021.10.08	12,200.00
07	හානි පාඩු හා මු.රෙ. 104 යටතේ වූ පරීක්ෂණය	04	2021.11.02	20,000.00
08	ගබඩා කළමනාකරණය, ඉන්වෙන්ට්‍රි පාලනය හා වත්කම් අපහරණය පිළිබඳ වැඩමුළුව	04	2021.11.11 – 2021.11.23	28,000.00
09	කාර්යාල කළමනාකරණය හා මූල්‍ය රෙගුලාසි	04	2021.11.11 – 2021.11.12	40,000.00
10	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය	04	2021.11.19, 2021.11.26, 2021.12.02	60,000.00
11	විශ්‍රාම වැටුප් පිළිබඳ පුහුණු පාඨමාලාව	50	2021.11.23	33,700.00
12	රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් B ගිණුම පිළියෙල කිරීම	02	2021.11.24	7,500.00
13	රාජ්‍ය නිලධාරීන් සඳහා අවශ්‍ය ආයතන සංග්‍රහයේ විධිවිධාන හා ගිණුම් ක්‍රම (මූල්‍ය රෙගුලාසි ආශ්‍රයෙන්)	04	2021.11.24 හා 2021.11.30	8,000.00

6.3 මානව සම්පත් සංවර්ධනය - (6.3.2) විදේශීය පුහුණු (මාර්ගගත)

විදේශ පුහුණු සඳහා සහභාගි වී ඇති නිලධාරීන් - සාරාංශය

මාණ්ඩලික නිලධාරීන්	55
සංවර්ධන නිලධාරීන්	35
කළමනාකරණ සේවා නිලධාරීන්	01
උපාධිධාරී අභ්‍යාසලාභී පුහුණු	20
සහභාගී වී ඇති සමස්ත නිලධාරීන්	**111**

ස්ත්‍රී පුරුෂ භාවය අනුව පුහුණු ලාභීන්

පුරුෂ - 42
කාන්තා - 69
සමස්තය - 111

7) පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

අංකය	අදාල කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නෙවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නෙවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අනුකූල වේ		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අනුකූල වේ		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අනුකූල වේ		
1.6	වෙනත්			
2.	පොත් පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)			
2	පොත් පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)	අනුකූල වේ		
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත් කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛණ/ පුද්ගල පඩිනඩි කාඩ්පත් වත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛණය යාවත් කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත් කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත් කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත් කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GAN 20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
3	මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම - (මු.රෙ 135)			
3.1	ආයතනය තුළ මූල්‍ය බලතල පවරා තිබීම	අනුකූල වේ		

අංකය	අදාල කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
3.2	මූල්‍ය බලතල පවරා තිබීම පිළිබඳව ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරීවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	වාර්ෂික සැලසුම් සකස් කිරීම			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
5	විගණන විමසුම			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට , සියළුම විගණන විමසුම වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ		
6	අභ්‍යන්තර විගණනය			
6.1	මු.රෙ (134) (2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව,	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව , සියළුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		

අංකය	අදාල කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නෙවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නෙවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
7	විගණන හා කළමනාකරණ කමිටු			
7.1	DMA/1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ		
8	වත්කම් කළමනාකරණය			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොන්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව , එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම.සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත්කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොන්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම.	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපති වරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත , ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම.	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ 772 අනුව සිදුකිරීම.	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ 103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		

අංකය	අදාල කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නෙවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නෙවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
9.5	2016.12.29. දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව , වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම.	අනුකූල වේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව , බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම.	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම.	අනුකූල වේ		
11.2	මු.රෙ 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කල පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එලඹීම	අනුකූල වේ		
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන් වලට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ 571 ප්‍රකාරව කටයුතු කර තිබීම.	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත් කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම.	අනුකූල වේ		

අංකය	අදාල කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නෙවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නෙවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
14.2	මු.රෙ 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
14.3	මු.රෙ 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම.	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම සිදු කොට තිබීම.	අනුකූල වේ		
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිනුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම.	අනුකූල වේ		
15.3	මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියළුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා /චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		

අංකය	අදාල කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නෙවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නෙවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018 (1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි /සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි /සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම.	අනුකූල වේ		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම.	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය	අනුකූල වේ		
19.4	ඉහත චක්‍රලේඛයේ (19.1 හි සඳහන්) 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම , ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කොට තිබීම.	අනුකූල වේ		
20.	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩු පාඩු නිවැරදි කොට තිබීම .	අනුකූල වේ		

කාර්යසාධන වාර්තාව 2021 (කෘෂිකර්ම අමාත්‍යාංශය, වැයශීර්ෂ 118)

ප්‍රකාශන කළමනාකරණය

ලේකම් -කෘෂිකර්ම අමාත්‍යාංශය

ඩී.එම්.එල්.බණ්ඩාරනායක මහතා

අධ්‍යක්ෂ ජනරාල් – (ක්‍රමසම්පාදන) කමනි සූරිආරච්චි මිය

සම්බන්ධීකරණය

එච්.එල්.සී.එන්.සෙව්වන්දි මිය **(අධ්‍යක්ෂ සැලසුම්)**

එච්.ඊ.පී.එම්.තිසේරා මයා **(නියෝජ්‍ය අධ්‍යක්ෂ) (සැලසුම්)**

එල්.ඒ.ඩබ්.ඩී.ලියනආරච්චි මයා **(නියෝජ්‍ය අධ්‍යක්ෂ) (සැලසුම්)**

තොරතුරු ලබා දීම සහ ඡායාරූප

රාජ්‍ය අමාත්‍යාංශ -සැලසුම් අංශය (අධ්‍යක්ෂ) (සැලසුම්)

- කාබනික පොහොර නිෂ්පාදන ප්‍රවර්ධන හා සැපයුම් නියාමන සහ වී හා ධාන්‍ය, කාබනික ආහාර, එළවළු, පළතුරු, මිරිස්, එණු හා අර්තාපල් වගා ප්‍රවර්ධන, බීජ නිෂ්පාදන හා උසස් තාක්ෂණ කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශය (වැයශීර්ෂ 425/426)
- පශු සම්පත්, ගොවිපොළ ප්‍රවර්ධන සහ කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය
- **පසුගාමී ප්‍රදේශ සංවර්ධන සහ ගෘහාශ්‍රිත සත්ත්ව පාලන හා සුළු ආර්ථික භෝග වගා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය**
- **දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ වරු**
- **සංඛ්‍යාලේඛන පිළිබඳ තොරතුරු- අධ්‍යක්ෂ (සංඛ්‍යාන) /සංඛ්‍යා ලේඛන නිලධාරී , ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව (කෘෂිකර්ම අමාත්‍යාංශය)**
- කෘෂිකර්ම අමාත්‍යාංශයේ අංශ ප්‍රධානීන්, විෂයභාර නිලධාරීන් /කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ ඇති ආයතන වල ආයතන ප්‍රධානීන් සහ විෂය භාර නිලධාරීන්

වාර්තාව සකස් කිරීම

අයි.එස්.ඒ.හේවාපතිරණ මිය (සංවර්ධන නිලධාරී) - සැලසුම් අංශය

භාෂා පරිවර්තනය (සිංහල/දෙමළ/ඉංග්‍රීසි)

සිංහල /දෙමළ - එම්.එල්.එම්.රිල්වාන් මයා - **ඩුබායි තානාපති කාර්යාලය**

ෆර්සාන් රාසික් මහතා (සංවර්ධන නිලධාරී) - ජාතික පොහොර ලේකම් කාර්යාලය

සිංහල /ඉංග්‍රීසි - නයෝමි චතුරිකා සමරවීර මිය (අග්‍රාමාත්‍ය කාර්යාලය)

මුද්‍රණය සඳහා තාක්ෂණ සහාය

ප්‍රසම්පාදන අංශය - කෘෂිකර්ම අමාත්‍යාංශය

පිටකවරය

ළහිරු පෙරේරා මයා

ගරු කෘෂිකර්ම අමාත්‍යතුමා ඇතුළු නිලධාරීන්ගේ ක්ෂේත්‍ර ඡායාරූප

මාධ්‍ය ලේකම් - මාධ්‍ය ඒකකය සහ විදේශ ආධාර ලබන ව්‍යාපෘති මඟින්

ප්‍රකාශනය - සැලසුම් අංශය,කෘෂිකර්ම අමාත්‍යාංශය

විද්‍යුත් ලිපිනය – pmeagri@gmail.com

වෙබ් අඩවිය http://www.agrimin.gov.lk

තිරසාර සංවර්ධනය හා කෘෂිකර්ම සංවර්ධනයට අදාල වෙනත් තොරතුරු මූලාශ්‍ර - Webography – (අන්තර්ජාල පරිශීලනය මඟින්)

80/5, "ගොවිජන මන්දිරය", රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල
80/5,"கொவிஜன மந்திரய", ரஜமல்வத்தை ஒழுங்கை, பத்தரமுல்லை
80/5, "Govijana Mandiraya", Rajamalwatta Avenue, Battaramulla

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. ඒආර්අයි/ඒ/එම්ඒ/2022/26

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date 2022 ජූලි 26 දින

කෘෂිකර්ම අමාත්‍යාංශය
ලේකම් කාර්යාලය
26 JUL 2022 269
අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී
කෘෂිකර්ම අමාත්‍යාංශය

කෘෂිකර්ම අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

කෘෂිකර්ම අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වන වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට කෘෂිකර්ම අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34
+94 11 2 88 72 23
ag@auditorgeneral.gov.lk
www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වනනමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ ඉකොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මම ප්‍රකාශ කරමි.

(අ) ඉකුත් වර්ෂය සමඟ අනුරූපවන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

1.6.1.1 ආදායම් ලැබීම්

(අ) රජයේ වී මිලදී ගැනීම් වැඩසටහනෙහි පෙර වර්ෂයෙහි ගිණුම් අනුව හිඟ ආදායම රු.439,123,225 ක් වුවත් ප්‍රවර්තන වර්ෂයෙහි අවසන් ගිණුම් තුළ ඊට අතිරේකව රු.47,019,598 ක මුදලක් හිඟ ආදායම් ලෙස දක්වා තිබුණි. මේ අනුව වී මිලදී ගැනීමේ වැඩසටහනෙහි හිඟ ආදායම් පිළිබඳ විශ්වාසනීය වාර්තා පවත්වා ගැනීමක් සිදුව නොමැති බව නිරීක්ෂණය කෙරේ.

(ආ) උක්ත වී මිලදී ගැනීමේ වැඩසටහනෙහි පසුගිය වර්ෂයේ හිඟ ආදායමින් රු. 138,204,923 ක් හා ප්‍රවර්තන වර්ෂය තුළ රු. 209, 107,022 ක හිඟ ආදායම් ඇතුළුව එකතුව රු. 347,311,945 ක ආදායම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. එම ශේෂ අය නොවීම මතභේදාත්මක කරුණක් ලෙස නිරීක්ෂණය කෙරේ.

1.6.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

1.6.2.1 මූල්‍ය නොවන වත්කම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කෘෂිකර්ම අමාත්‍යාංශයේ භාවිතයේ ඇති වෙනත් රාජ්‍ය අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වලට අයත් වාහන 15 ක අයිතිය පවරානොගෙන ඒවායේ රු. 51,500,000 ක වටිනාකම, මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයට ඇතුළත් කර තිබුණි.

(ආ) අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි වී ඇති එකතුව රු.77,500,000 ක් වටිනා එහෙත් අමාත්‍යාංශය භාරයේ නොමැති වාහන 14 ක් මූල්‍ය ප්‍රකාශ තුළ මූල්‍ය නොවන වත්කම් ලෙස නිරූපණය කර තිබුණි.

(ඇ) අමාත්‍යාංශය නමින් හිමිකාරීත්වය පවතින අමාත්‍යාංශය විසින් භාවිතයට ගනු ලබන එකතුව රු. 8,360,000 ක් වටිනා වාහන 04 ක් අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය නොවන වත්කම් වලට ඇතුළත් කර නොතිබුණි.

(ඇ) භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්වරයාගේ 2017 දෙසැම්බර් 21 දිනැති අංක 2/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය අනුව අමාත්‍යාංශය විසින් වෙනත් අමාත්‍යාංශයක් වෙත වාහන පැවරීමේදී පැවරුම්ලාභී අමාත්‍යාංශයක් නමින් ලියාපදිංචි කර ගැනීමට අවස්ථාව ලබා දිය යුතු වුවත් එසේ නොකර කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි, වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් භාවිතා කරන රු. 259,300,000 ක් වටිනාකම් වූ වාහන 39 ක් මෙම අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර තිබුණි. රාජ්‍ය අමාත්‍යාංශ වල විෂය පථය වරින් වර සංශෝධනය වෙමින් රාජ්‍ය අමාත්‍යාංශ අහෝසි වෙමින් නැවත මෙම අමාත්‍යාංශ වෙත එක් වෙමින් පවතින බැවින් නිශ්චිත වශයෙන් ඇතැම් වාහන එම රාජ්‍ය අමාත්‍යාංශ වෙත පවරා දීම ගැටළු සහගත නිසා එම වාහන කැබිනට් අමාත්‍යාංශය ලෙස මෙම අමාත්‍යාංශයේ මූල්‍ය නොවන වත්කම් ලෙස තබා ගෙන සිටින බව විධිදුරටත් නිරීක්ෂණය කොරේ.

2. මූල්‍ය සමාලෝචනය

2.1 ආදායම් කළමනාකරණය

සමාලෝචිත වර්ෂය සඳහා ආදායම සංකේත 2003.07.00 දරන රජයේ වී මිලදී ගැනීමේ වැඩ සටහන යටතේ රැස්කර ගැනීමට ඇස්තමේන්තු කර තිබුණු ආදායම රු. 1,500,000,000 ක් වුවත් රැස්කළ ආදායම රු. 453,206,587 ක් වූ අතර එය ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 30 කි.

2.2 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වර්ෂය ආරම්භයේ සිටම ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර නොතිබීම නිසා ප්‍රාග්ධන වැය විෂයයන් 03ක එකතුව රු. 278,000,000 ක ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම ඉතිරි වී තිබුණි.

(ආ) ඇස්තමේන්තු සැකසීමේදී නිවැරදි පුරෝකථන සිදු නොකිරීම හේතුවෙන් ප්‍රාග්ධන වැය විෂයයන් 20 ක හා පුනරාවර්තන වැය විෂයයන් 16 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 13 සිට 99 දක්වා වූ පරාසයක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. උක්ත ප්‍රාග්ධන හා පුනරාවර්ත වැය විෂයයන් සඳහා සලසා තිබූ ශුද්ධ ප්‍රතිපාදනය රු. 8,395, 977,000 ක්වූ අතර ඉන් රු. 4,540,336,242 ක් එනම් සියයට 54 ක් ඉතිරි වී තිබුණි.

2.3 **බැරකම් හා බැදීම්වලට එළඹීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශයේ මූලධන වැය විෂයයක් සඳහා සලසා තිබුණු රු.1,000,000,000 ක ශුද්ධ ප්‍රතිපාදනය වර්ෂය තුළ සම්පූර්ණයෙන්ම උපයෝජනය කර තිබුණු මුත් එම ඉතිරිය ඉක්මවා රු. 3,250,000,000 ක බැරකම් සඳහා බැඳී තිබුණි.

(ආ) වර්ෂයට අදාළ රු. 283,686 ක්වූ බැරකම් මූල්‍ය ප්‍රකාශනවල බැරකම් හා බැඳීම් ප්‍රකාශයට [සටහන - (iii)] ඇතුළත් කර නොතිබුණි.

(ඇ) වගා හානි සඳහා වන්දි ලබා දීම පිණිස 118-2-3-43-2202 වැය විස්තරය යටතේ 2020 හා 2021 වර්ෂ වලදී පිළිවෙලින් රු. මිලියන 1,514 ක් හා 1,000 ප්‍රතිපාදන වෙන්කර තිබුණු අතර අදාළ වර්ෂයන්හිදී උක්ත මුළු ප්‍රතිපාදන වටිනාකම කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය වෙත ලබාදී තිබුණි. ලියාපදිංචි ගොවීන්, වන්දි ලබා ගැනීමට අදාළ වගා හානිවූ ගොවීන් හා වන්දි ගෙවීම් ලද ගොවීන් ඇතුළුව උක්ත මුදල් උපයෝජනය සම්බන්ධයෙන් කෘෂිකර්ම අමාත්‍යාංශය පසු විපරම් කර නොතිබුණු අතර වන්දි ගෙවීම් සඳහා බැරකමක් ජනනයවූ බවට කිසිදු ලිඛිත සාක්ෂි ලබා ගැනීමකින් තොරව කෘෂිරක්ෂණ මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල් ලබා දුන් ලිපියක් පදනම් කර ගනිමින් 3,250,000,000 ක බැරකම් ගිණුම්ගත කර තිබුණි.

2.4 **නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

නීති රීති රෙගුලාසි වලට යොමුව	අනුකූල නොවීම
(අ) අංක 02/2017 හා 2017 දෙසැම්බර් 21 දිනැති භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්වරයාගේ වත්කම් කළමනාකරණ චක්‍රලේඛය	ලියාපදිංචි අයිතිය නොමැතිව පරිහරණය කරන වාහන, ලියාපදිංචි අයිති ආයතනයේ එකඟතාවය මත, තම ආයතනයේ නමින් ලියාපදිංචි කරගැනීමට හෝ ලියාපදිංචි අයිතිය ඇති ආයතනය වෙත විධිමත්ව පවරාදීමට කටයුතු කළ යුතු නමුත් චක්‍රලේඛය ප්‍රකාරව පවරා ගැනීමට හෝ නැවත භාරදීමට කටයුතු නොකළ වෙනත් ආයතනයන්හි හිමිකාරිත්වයට යටත් වාහන 25 ක් කෘෂිකර්ම අමාත්‍යාංශ භාවිතයේ පවතී.

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මු.රෙ. 1646	වාහනවල ගමන් පිළිබඳ මාසික සාරාංශවල මුල් පිටපත් හා ධාවන සටහන් ඊළඟ මාසයේ 15 වැනි දිනට පෙර විගණකාධිපති වෙත එවිය යුතු වුවත් 2021 වර්ෂයට අදාළව අප්‍රේල් සිට දෙසැම්බර් දක්වා නිල වාහන 13 ක මාසික සාරාංශයද 2021 මාර්තු සිට දෙසැම්බර් දක්වා සංචිත වාහන 26 ක ධාවන සටහන් හා මාසික සාරාංශ 2022 ආප්‍රේල් 07 දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

2.5 අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම

මුදල් රෙගුලාසි 371 (5) ප්‍රකාරව කාර්යය නිමකර දින 10 ක් ඇතුළත ලබාගත් තත්කාර්යය අතුරු අග්‍රිමය නිරවුල් කළයුතු වුවත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ නිලධාරීන් 23 දෙනෙකු විසින් අවස්ථා 53 කදී ලබාගෙන තිබුණු රු.892,540 ක අතුරු අග්‍රිම පියවීමට දින 02 සිට දින 106 දක්වා කාල පරාසයක් ගෙන තිබුණි.

2.6 පාඩු හා අත්හැරීම්

රජයේ නිලධාරීන්ගේ රු.44,596 ක අත්තිකාරම් ණය ශේෂ 2 ක් 2021 වර්ෂය තුළ කපා හැර තිබුණු අතර එම ණය ශේෂ පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශනයේ පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයට [සටහන- (i)] ඇතුළත් කර නොතිබුණි.

3 මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ දුර්වලතා

3.1.1 කෘෂිකර්ම අමාත්‍යාංශයට ලබාගත් ගොඩනැගිල්ලේ කුලී ගිවිසුම අවසන් කිරීම

කෘෂිකර්ම අමාත්‍යාංශය සඳහා කුලියට ගත් ගොඩනැගිල්ලේ අයිතිකාර පෞද්ගලික සමාගම හා කෘෂිකර්ම අමාත්‍යාංශය අතර වූ අංක 2178 දරන බදු ගිවිසුම අහෝසිකිරීම සහ රු.මිලියන 63 ක ආපසු ගෙවිය යුතු තැන්පත් මුදල් නිදහස් කර ගැනීම සම්බන්ධව පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) බදු ගිවිසුම් කාලය අතරතුර අවශ්‍ය වුවහොත් බදු ගැනුම්කරුට සහ බදු දීමනාකරුට ගිවිසුම අවසන් කළ හැකි ආකාරය පිළිබඳ කොන්දේසියක් බදු ගිවිසුමට ඇතුළත්ව නොතිබුණි. එම අඩුපාඩුව නිසා වසර 5 කට බදුගත් මෙම දේපළ සිව්වන අවුරුද්දේදී ආපසු භාරදෙන අවස්ථාවේ ඉතිරිව ඇති බදු කාලයට සමානුපාතිකව කුලී ප්‍රමාණයක් අඩු කර ගැනීමට අවස්ථාව අහිමිව ගොස් තිබුණු අතර ගොඩනැගිල්ල භාවිතා නොකළ කාලපරිච්ඡේදය වෙනුවෙන් රු.310,939,139 ක බදු මුදලක් ගෙවා තිබුණි. එම වියදම අනාර්ථික වැයක් ලෙස නිරීක්ෂණය කෙරේ.

(ආ) බදු කාලය තුළ බදුගැණුම්කාර පාර්ශවය වෙතින් බදු ගොඩනැගිල්ලට සිදුවී ඇති හානිය සම්බන්ධයෙන් අමාත්‍යාංශයෙහි ඉංජිනේරු අංශයේ නිලධාරීන් හා තක්සේරු දෙපාර්තමේන්තුවෙහි නිලධාරීන් එක්ව 2021 මාර්තු, අප්‍රේල් කාලය තුළ පරීක්ෂාවක් සිදුකර ඇති අතර, උක්ත පරීක්ෂාව සඳහා සහභාගී වන ලෙස බදු දීමනාකාර පාර්ශවය වෙත දැනුම්දී ඇතත්, බදු දීමනාකාර සමාගම උක්ත පරීක්ෂාව සඳහා සහභාගීවීම ප්‍රතික්ෂේපකර ඇත. බදු දේපළෙන් ඉවත්වීමේදී දෙපාර්ශවයේ සහභාගිත්වයෙන් සුදුසු තාක්ෂණික ආයතනයක් මගින් අලාභහානි වාර්තාවක් කැඳවිය යුතු බවට ගිවිසුම තුළ කොන්දේසි ඇතුළත්කර නොතිබීම හේතුවෙන් කෘෂිකර්ම අමාත්‍යාංශයෙහි නිලධාරීන් විසින් සිදු වී ඇති හානිය ලෙස රු.12,710,236 කටත් බදු දීමනාකාර සමාගම ගොඩනැගිල්ලට සිදුවූ හානිය රු.28,250,056 කටත් තක්සේරුකර වාර්තා සකස් කිරීම හේතුවෙන් පාර්ශවයන් අතර හානි පාඩු සම්බන්ධයෙන් මතභේදාත්මක තත්ත්වයන් නිර්මාණය වී ඇති අතර කෘෂිකර්ම අමාත්‍යාංශයේ කිසිදු සහභාගිත්වයකින් තොරව බදු දීමනාකාර විසින් ඒකපාර්ශවිය පිළියෙල කරන ලද තක්සේරු වාර්තාවකට අනුව රු.15,539,820 ක වැඩිපුර බැරකමක් ඇතිවීමේ අවදානමක් නිර්මාණය වී තිබුණි.

(ඇ) ගිවිසුම් කොන්දේසි අංක II අනුව ගිවිසුම අවසන්වී බදු දේපළ භාරදීමෙන් එක් මසක කාලයක් තුළ බදු දීමනා කරු විසින් රු. මිලියන 63 ක ආපසු ගෙවිය යුතු තැන්පතු මුදල බදුගැණුම්කරු වෙත ලබා දීමට කටයුතු කළ යුතු වේ. එහෙත් බදු ගැණුම්කරු බදු දේපළ භාරදී ගිවිසුම අවසන් කිරීමට ක්‍රියාකරන ලද සෑම අවස්ථාවකදීම බදු දීමනාකාර පාර්ශවය ඊට එරෙහිවීම හා ගිවිසුමේ මූලික කොන්දේසි වලට අනනුකූලව ක්‍රියාකරමින් ඇති නිසා උක්ත තැන්පතුව ලබා ගැනීමට නොහැකි වී තිබුණි.

3.1.2 රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමේ අය නොවූ ශේෂ

(අ) 2020 ගිණුම් වර්ෂයේදී රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ශේෂ ලැස්තුව හා සැසඳුම් ප්‍රකාශනය අනුව ශේෂය අතර රු. 1598 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර සමාලෝචිත වර්ෂයේදී එම වෙනස රු. 1610 ක්ව පැවතිය අතර මෙම දෝෂය නිවැරදි කිරීමට පියවර ගෙන නොතිබුණි.

(අ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 26/2015 හා 23/2020ට අනුව අස්තිකාරම් ලබා දුන් දින සිට මාස 10 කදී අදාළ ගිණුම් වර්ෂය තුළ අය කර ගෙන අවසන් කළ යුතු වුවත් කිලිනොච්චි දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අනුයුක්තව සේවය කරන නිලධාරීන් 4 දෙනෙකු වෙත 2020 වර්ෂයේදී ලබා දී ඇති එකතුව රු. 16,000 ක විශේෂ අත්තිකාරම් ශේෂයන් ප්‍රවර්තන වර්ෂය අවසාන දින වන විටත් අයකර ගැනීම් ආරම්භකර හෝ නොතිබුණි.

(ඇ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 21/2015 ට අනුව ලබාදුන් දින සිට මාස 08 ක් තුළ උත්සව අත්තිකාරමේ අයකර ගත යුතු වුවත් දිස්ත්‍රික් ලේකම් කාර්යාල වලට අනුයුක්ත නිලධාරීන් 07දෙනෙකු වෙත 2021 අප්‍රේල් මාසය තුළ ලබා දී ඇති එකතුව රු. 70,000 ක උත්සව අත්තිකාරම් මුදලින් ගිණුම් වර්ෂය තුළ කිසිදු අයකිරීමක් සිදු කර නොතිබුණි.

(ඈ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයන් වෙත අනුයුක්ත කර ඇති නිලධාරීන් 07 දෙනෙකු වෙත 2020 වර්ෂයේදී ලබා දී තිබුණු උත්සව අත්තිකාරම් හා විශේෂ අත්තිකාරම් මුදලින් 2021 වර්ෂයේදී අයකර ගතයුතුව තිබුණු රු. 14,850 ශේෂයෙන් ප්‍රවර්තන වර්ෂය තුළ කිසිදු අයකිරීමක් සිදු කර නොතිබුණි.

(ඉ) කෘෂිකර්ම අමාත්‍යාංශයට අනුයුක්තව දිස්ත්‍රික් ලේකම් කාර්යාල වල සේවයේ නියතු නිලධාරීන් 27 දෙනෙකුගෙන් වැරදීමකින් වැඩිපුර අයකරන ලද එකතු වටිනාකම රු. 127,960 ක ශේෂය එම නිලධාරීන් වෙත නැවත ගෙවීම සඳහා කටයුතු කිරීමකින් තොරව වෙනත් දෙපාර්තමේන්තු හා අමාත්‍යාංශ වෙත නිරවුල් කලයුතු ශේෂයන් ලෙස දක්වා ගිණුම් පිළියෙල කර තිබුණි.

(ඊ) වසර 2කට වඩා වැඩි කාලයක සිට පැවත එන මියගිය නිලධාරියකුගෙන් අයවිය යුතු රු.2,500 ක උත්සව අත්තිකාරම් ශේෂය අයකර ගැනීම සඳහා ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 4.6 ඡේදයේ විධිවිධාන පරිදි රජයට අයවිය යුතු මුදල් ප්‍රධාන ණයකරුගෙන් හෝ ඇපකරුගෙන් ද, ප්‍රධාන ණයකරු මියගොස් ඇත්නම් ඔහුගේ උරුමක්කාරයින්ගෙන් ද අයකර ගත හැකි නොහැකි නම්, ඒ සම්බන්ධයෙන් අප්‍රමාදව නීතිපතිගෙන් උපදෙස් ලබා ගත යුතු වුවත් එපරිදි කටයුතු කර නොතිබුණි.

(උ) අමාත්‍යාංශ ස්ථිර කාර්යය මණ්ඩලයට අයත් නොවන අමාත්‍යවරයෙකුගේ රියදුරකු ලෙස කටයුතු කළ පුද්ගලයකු වෙත ලබාදී තිබූ උත්සව අත්තිකාරම් මුදල වූ රු.5,000 ක අගයෙන් කිසිදු වාරික ගෙවීමකින් තොරව සේවය අතහැර ගොස් තිබුණි. වසර 3 කට අධික කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂය වගකිවයුත්තන්ගෙන් අයකර ගැනීමට ක්‍රියාකර නොතිබුණි.

4. මානව සම්පත් කළමනාකරණය

කෘෂිකර්ම අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 12 ක්ද, තෘතියික මට්ටමේ තනතුරු 5 ක්ද, ද්විතියික මට්ටමේ තනතුරු 200 ක්ද සහ ප්‍රාථමික මට්ටමේ තනතුරු 13 ක්ද පුරප්පාඩුව පැවතියද එම තනතුරු වලට බඳවා ගැනීමට හෝ කාලීනව අනුමත සේවක සංඛ්‍යාව සංශෝධනය කර ගැනීමට ක්‍රියාකර නොතිබුණි.

ආර්.එම්.රත්නායක
නියෝජ්‍ය විගණකාධිපති,
විගණකාධිපති වෙනුවට.

ආර්.එම්. රත්නායක
නියෝජ්‍ය විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය